සබඳතා හා විශ්වාසය තුළින් සංවර්ධනය

වාර්ෂික වාර්තාව 2018



ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank
RDB
nt Bank

දැක්ම

දූයේ සමාජ ආර්ථික සෞභාග්‍යය වේගවත්ව ඉදිරියට ගෙන යන දිරිමත් ව්‍යවසායකයින් පෝෂණය කිරීම.

මෙහෙවර

ප්‍රාදේශීය සමාජ ආර්ථික සෞභාග්‍යය ඵලදායී ලෙස ඉහළ නැංවීම සඳහා ඊට කැප වූ උද්යෝගිමත් වෘත්තිකයින් කණ්ඩායමක් මගින් මූල්‍ය හා උපදේශන සේවා ලබා දීම.

සබඳතා හා විශ්වාසය තුළින් සංවර්ධනය

අපගේ ව්‍යාපාර ආදර්ශය ග්‍රාමීය ජනතාව සමඟ දැඩි ලෙස පදනම් වන අතර සබඳතා සහ විශ්වාසයේ කුළුණු මත ගොඩ නැගේ. අපි ජාතියේ උත්සාහයට සහය වෙමින් කාන්තා ව්‍යවසායකයින් සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ අංශ වෙත ප්‍රශස්ථ සංවර්ධන අවස්ථා ඇති කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරමු. කල්පවත්නා සම්බන්ධතා ඉදිරියට ගෙන යාම සහ අනම්‍ය විශ්වාසය ගොඩනැගීම තුළින් රටපුරා අදාළ සහ තිරසාර ආර්ථික සංවර්ධනය පිරිනැමීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහය වී ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව...

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) ආරම්භය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වර්ගීකරණය යටතේ පැවති දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපිත කරන ලද 1985 වසර දක්වා දිවයයි.

1997 දී එවැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දහහතක් රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු වශයෙන් පළාත් මට්ටමේ බැංකු හයකට එකාබද්ධ කරන ලදී.

මෙම ප්‍රාදේශීය බැංකු හය ජාතික මට්ටමේ සංවර්ධන බැංකුවක් ලෙස 2010 මැයි තවදුරටත් ඒකාබද්ධ කරන ලද අතර, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හෝ RDB) ලෙස නම් කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ග්‍රාමීය ජනතාව නගා සිටුවීම සඳහා දායකවන පිවිසියහැකි සහ දැරියහැකි මූල්‍ය සේවා ලබාදෙමින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම දීර්ඝ කාලීනව අරමුණු කරගනිමින් සම්පූර්ණයෙන් රජයට අයත් ජාතික මට්ටමේ බැංකුවක් ලෙස 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපිත කරන ලදී.

මූලිකවම 'සීමාරහිත බැංකුකරණ සංකල්පය' මත පදනම් වී, ආදායම් පිරමීඩයේ මධ්‍යම සහ පහළ මට්ටමේ පුද්ගලයින් සඳහා නව්‍යකරණ, සරල සහ ඵලදායී මූල්‍ය උපකරණ (ප්‍රධාන වශයෙන් තැන්පතු සේවයේ යෙදවීම සහ ණයදීම) ලබාදීමට බැංකුව උත්සාහ දරයි. ක්ෂුද්, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල ගනුදෙනුකරුවන්, කාන්තා ව්‍යවසායකයින් මෙන්ම කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර සහ අනෙකුත් කුඩා කර්මාන්තවල ගනුදෙනුකරුවන් සවිබලගැන්වීම කෙරෙහි බැංකුව උනන්දුව දක්වන අතර මේවා රටේ ආර්ථික සංවර්ධනය කරා දායකවනු ඇත. එමෙන්ම පාසල් සිසුන් සහ බාලවයස්කරුවන් ඉතිරිකිරීම සඳහා දිරිගන්වමින් ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු මත වඩා ඉහළ ප්‍රතිලාභ ලබාදෙමින් ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා ද බැංකුව පියවර ගෙන ඇත.

වර්තමානයේ, ශාඛා 273 කින් අනුපූරණය කරන සහ 2,340කට වැඩි ව්‍යාප්තීය ස්ථීර කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් බලගන්වන ලද මිලියන හයකට වැඩි විශ්වාසවන්ත ගිණුම් හිමියන් සමඟ, අප රටේ සමාජ-ආර්ථික සෞභාග්‍ය වේගයෙන් ඉදිරියට ගෙන යන ව්‍යවසායකයින් පෝෂණය කිරීම පිළිබඳ එහි දැක්ම ක්‍රියාත්මක කිරීමට RDB මනාව සන්නද්ධ කර ඇත.



1. සන්ධිස්ථාන
[පිටුව: 4]

2. මූල්‍යමය වැදගත් සිදුවීම්
[පිටුව: 6]

3. සභාපතිතුමන්ගේ ප්‍රකාශය
[පිටුව: 8]

4. සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරිතුමන්ගේ සමාලෝචනය
[පිටුව: 10]

5. කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය
[පිටුව: 12]

මූල්‍ය සමාලෝචනය	13
ගනුදෙනුකරු සහ සබඳතා සමාලෝචනය	16
සමාජ සහ පාරිසරික සමාලෝචනය	23
සේවක සමාලෝචනය	26
විශේෂ සිදුවීම්	28

6. කළමනාකාරිත්වය
[පිටුව: 32]

අධ්‍යක්ෂ මණ්ඩලය	33
ආයතනික කළමනාකරණ කණ්ඩායම	36
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරු/ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරිවරු	38
සහකාර සාමාන්‍යාධිකාරිවරු/ අංශ ප්‍රධානීන්	40
අවදානම් කළමනාකරණය	42
ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව	54
ආයතනික පාලනය	55
අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවලට පැමිණීම	73
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	74
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වාර්තාව	80
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු (BNC) වාර්තාව	82
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටු (BITSC) වාර්තාව	84
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු (IRMC) වාර්තාව	85
ප්‍ර. වි.නි. ගේ සහ ප්‍ර.මූ. නි. ගේ වගකීමේ ප්‍රකාශනය	86
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම	88
අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව	90
අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය	91

7. මූල්‍යමය වාර්තා
[පිටුව: 93]

විගණකාධිපති වාර්තාව	94
ආදායම් ප්‍රකාශනය	98
විස්තීරණ ආදායම් ප්‍රකාශනය	99
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	100
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	101
හිමිකම වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය	102
මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්	103
තුන් වසරක සාරාංශය	181
ආයෝජක තොරතුරු	183
ශාඛා භූගෝලීය වශයෙන් බෙදීයාම	184

ප්‍රාදේශීය සංවර්ධන බැංකු හය ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් ලෙස ඒකාබද්ධ කිරීමෙන් පසු සාර්ථකත්වයේ කථාව

“RDB 2010 දී ඒකාබද්ධ කිරීමෙන් පසු වසර අටකට වැඩි කාලයක් තුළ මුළු වත්කම් රු. බිලියන 175 ඉක්මවන ලදී.”

මෙහෙයුම් ලාභ වර්ධනය රු.මි. 371 සිට රු.මි. 3,606 දක්වා	872 (%)
මුළු ස්කන්ධ වර්ධනය රු.බි. 3 සිට රු.බි. 15 දක්වා	400 (%)
මුළු වත්කම් වර්ධනය රු.බි. 41 සිට රු.බි. 177 දක්වා	332 (%)
මුළු තැන්පතු වර්ධනය රු.බි. 32 සිට රු.බි. 142 දක්වා	344 (%)
මුළු ණය සහ අත්තිකාරම් වර්ධනය රු.බි. 30 සිට රු.බි. 138 දක්වා	360 (%)

2010 මැයි සිට 2018 දෙසැම්බර් 31 දක්වා වර්ධනය

(රු. මිලියන)



1985 සිට 2009 දක්වා වසර විසි හතරක කාලසීමාව තුළ ප්‍රාදේශීය සංවර්ධන බැංකු (එනම් රජරට, රුහුණ, වයඹ, කඳුරට, ඌව සහ සබරගමුව සංවර්ධන බැංකු) විසින් අත්කර ගත් ප්‍රතිඵල පෙර සියලුම පළාත් සංවර්ධන බැංකු ඒකාබද්ධ කරමින් 2010 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) ස්ථාපිත කිරීමෙන් පසු වසර අටක කාලසීමාව (2010 - 2018) තුළ ප්‍රබල අයුරින් වර්ධනය වී ඇත.

2010 මැයි සිට 2018 දෙසැම්බර් දක්වා

RDB හි මුළු තැන්පතු රු.මි. 32,350 සිට රු.මි. 141,560 දක්වා රු.බි. 109කින් වැඩි වී ඇත.

RDB හි මුළු ණය සහ අත්තිකාරම් රු.මි. 30,311 සිට රු.මි.137,770 දක්වා රු.බි. 107කින් වැඩි වී ඇත.

RDB හි මුළු වත්කම් රු.මි. 41,018 සිට රු.මි. 176,937 දක්වා රු.බි. 136කින් වැඩි වී ඇත.

RDB හි ඉතිහාසය

1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත අනුව, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වර්ගය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු 1985 දී ස්ථාපිත කිරීම ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) ආරම්භයන් ලෙස සනිටුහන් කළ හැකිය. ඉන්පසුව 1997 දී, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දහ හතක් රජරට, රුහුණ, වයඹ, කඳුරට, ඌව සහ සබරගමුව සංවර්ධන බැංකු නමින් පළාත් සංවර්ධන බැංකු හයකට ඒකාබද්ධ කරන ලදී. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත හඳුන්වාදීමත් සමඟ, මෙම බැංකු හය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) ලෙස 2010 මැයි 01 දින ජාතික ආයතනයක් බවට ඒකාබද්ධ කරන ලදී.

2015 දී, RDB එහි 30ස් වැනි සංවත්සරය සමරන ලදී. ජාතික මට්ටමේ රජයට අයත් සංවර්ධන බැංකුවක් වන RDB හි පරමාර්ථ වන්නේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳාම, වාණිජ, පශු සම්පත්, ධීවර වැනි සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත මූල්‍ය සහයෝගය ලබාදෙමින් කාන්තාවන් සවිබලගැන්වීමයි.

මූල්‍යමය වැදගත් සිදුවීම්

- මූල්‍ය සංවර්ධනය සඳහා කැප වූ මූල්‍ය ආයතනයක් ලෙස, රටතුළ සමාජීය සහ ආර්ථික සංවර්ධන කටයුතු නගා සිටුවීමේදී RDB විසින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් අඛණ්ඩව ඉටු කරනු ලබයි. මූල්‍ය සම්පාදකයෙක් ලෙස සැලකියයුතු කාර්යභාරයක් ඉටුකරමින් දිවයින තුළ සියලුම සංවර්ධන වැඩසටහන්වලදී බැංකුව ප්‍රමුඛස්ථානයේ සිට ඇත. අපගේ ප්‍රධාන වත්කම් වන්නේ උතුර සහ නැගෙනහිර ඇතුළුව රට පුරා පැතිරුණු මිලියන හයකට වැඩි අපගේ ගනුදෙනුකාර පදනමයි. රට සහ එහි ජනතාව සංවර්ධනය කිරීම බැංකුවේ ප්‍රධානතම අවධානය වේ. එබැවින්, බැංකුව ඔවුන් සවිබලගැන්වීම සඳහා කැප වී සිටින අතර ඒ තුළින් දිවයින පුරා ජාලය තුළ ශාඛා 273ක් තුළින් ජනතාව සංවර්ධනය කරයි.
- බැංකුවේ මුළු ආදායම පසුගිය වසරට සාපේක්ෂව 18%කින් වැඩි වී ඇත. 2018 වසර තුළ, මෙහෙයුම් ලාභය රු.මි. 3,606 දක්වා වැඩි වූ අතර එය 2017 දී වාර්තාකළ රු.මි. 3,307ක් වූ මෙහෙයුම් ලාභයට වඩා 9%ක වැඩිවීමකි. බදු පෙර වත්කම් මත ඉපයීම (ROA) 2.08% ලෙස වාර්තා කර ඇති අතර එය 2017 දී 2.2%ක් විය.

අපගේ ගනුදෙනුකරුවන්ට සහය සේවා

- **NDB සමඟ වෙස්ටර්න් යූනියන්** - විදේශ රටක සිට අපගේ රට වෙත සම්පූර්ණ ආරක්ෂාව සහිතව අරමුදල් මාරු කිරීම සඳහා වෙස්ටර්න් යූනියන් තුළින් මුදල් හුවමාරු කිරීම වඩා පහසු සහ වේගවත් මාර්ගයක් වන අතර ගනුදෙනුකරුවන්ට ග්‍රාමීය සහ උප-නාගරික ප්‍රදේශවල පිහිටා ඇති RDB හි සියලුම ශාඛා තුළින් එම මුදල් ලබාගත හැකිය.
- **DFCC සමඟ ලංකා මුදල් හුවමාරුව (LMT)** - ලංකා මුදල් හුවමාරුව තුළින් යම් කාලයක් නොමැතිවම ගනුදෙනුකරුවන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම සහ ක්ෂණිකව මුදල් ප්‍රේෂණය කරනු ලබයි. ලංකා මුදල් හුවමාරුව 275කට වැඩි ස්ථානවලින් සමන්විත පුළුල් ජාත්‍යන්තර ජාලයක් සහිත වන අතර, මෙම සේවාව දිවයින පුරා RDB ශාඛා 273දීම ලබාගත හැකිය.
- **ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා විදුලිබල මණ්ඩලය (CEB),** ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය (NWSDB) සමඟ උපයෝගිතා බිල්පත් ගෙවීම් සේවාව.
- **RDB ATM සහ LankaPay ATM පහසුකම** - දැන් අපගේ ගනුදෙනුකරුවන්ට දිවයින පුරා 3,800කට වැඩි ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM) තුළින් තම මුදල් ආපසු ලබාගැනීමට හැකිය. ආසන්න වශයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් 150,000ක් දැනට ගනුදෙනුකරුවන් වෙත නිකුත් කර ඇත.
- **පොදු විද්‍යුත් අරමුදල් මාරු කිරීමේ (CEFT) ක්‍රමය** - අන්තර් බැංකු අරමුදල් මාරුකිරීමේ පහසුකම අපගේ ගනුදෙනුකරුවන්ට ලබාගත හැකිය.
- **මුදල් තැන්පතු යන්ත්‍ර (CDM)** - තෝරාගත් ශාඛාවලදී ලබාගත හැක.

	2018 රු. '000	2017 රු. '000	වෙනස %
වසර සඳහා මෙහෙයුම් ප්‍රතිඵල			
දළ ආදායම	26,070,611	22,016,072	18
එ.අ.බදු (VAT) පෙර මෙහෙයුම් ලාභය	3,606,330	3,306,995	9
බදුකරණය	2,532,744	2,023,065	25
බදු පසු ලාභය	1,073,586	1,283,930	-16
කොටස්හිමියන්ට ආරෝපනය වන ලාභය	993,559	1,113,803	-11
වත්කම් සහ වගකීම්			
ගනුදෙනුකාර තැන්පතු	141,559,974	139,827,365	1
ණය සහ ලැබිය යුතු	137,769,683	130,324,846	6
මුළු වත්කම්	176,937,319	169,259,202	5
මුළු වගකීම්	162,227,205	159,646,453	2
කොටස්හිමියන්ගේ අරමුදල	14,710,115	9,612,749	53
ලාභදායිතාව			
වත්කම් මත ඉපයීම (මෙහෙයුම් ලාභ) %	2.08	2.20	
ස්කන්ධය මත ඉපයීම %	10.70	16.45	
අක්‍රිය ණය අනුපාතය %	5.40	3.27	

	2018	අවම අවශ්‍යතාව %	2017	අවම අවශ්‍යතාව %
නියාමන අනුපාතය				
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (බාසල් III අනුව)				
පොදු ස්කන්ධ පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.58	7.00	8.73	6.375
මුළු පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.58	8.50	8.73	7.875
මුළු ප්‍රාග්ධන අනුපාතය	13.61	12.50	12.57	11.875
ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය	24.27	20.00	26.27	20.00

දළ ආදායම

(රු. මිලියන)



2018
18%

2017
40%

ගනුදෙනුකාර තැන්පතු

(රු. මිලියන)



2018
1%

2017
31%

බදු පෙර මෙහෙයුම් ලාභය

(රු. මිලියන)



2018
9%

2017
55%

ණය සහ ලැබිය යුතු

(රු. මිලියන)



2018
6%

2017
21%

බදු පසු ලාභය

(රු. මිලියන)



2018
(16%)

2017
100%

කොටස්හිමියන්ගේ ස්කන්ධය

(රු. මිලියන)



2018
53%

2017
60%



බැංකුව ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ, මැදි සහ පහළ ආදායම් කණ්ඩායම් නගා සිටුවීමේ සහ ඔවුන් අතර ඉතිරිකිරීම් ඇති කිරීමේ මාවත තුළ අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි. එසේ සිදුකරමින්, ජාතික ඉතුරුම් වැඩි කිරීම මගින් ශ්‍රී ලාංකීය ආර්ථිකයට ද දායක වී ඇත.

හිතවත් කොටස්හිමියනි,

බැංකුව වෙනුවෙන් සාර්ථක සහ වැදගත් සිද්ධීන්ගෙන් යුක්ත වසර පිළිබඳ ඔබට වාර්තා කිරීමට ලැබීම මට සතුටකි. අපගේ මෙහෙයුම් ලාභය රු.බි. 3.3 සිට රු.බි. 3.6 දක්වා වැඩිවී ඇති අතර, අපගේ වත්කම් රු.බි. 169.3 සිට රු.බි. 176.9 දක්වා 5%ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේවෙතත් බදුකරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් හේතු කොට ගෙන, බදු පසු ලාභය පසුගිය වසරට සාපේක්ෂව තරමක් පහත වැටුණි. එමෙන්ම, SLFRS 9 යටතේ සැලකියයුතු ලෙස වඩා ඉහළ හානිකරණ අයකිරීම ද මෙම පහත වැටීම සඳහා දායක විය.

සමාලෝචිත වර්ෂය තුළ, අකාබනික වර්ධනය ප්‍රවර්ධනය කිරීමට ප්‍රධාන පියවර බැංකුව විසින් ගනු ලැබීය. 2016 අයවැය යෝජනාවට අනුකූලව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ 100%ක හිමිකාරත්වයක් බැංකුව අත්කර ගන්නා ලදී. මිලදී ගැනීමේ ප්‍රතිඵලය මහ භාණ්ඩාගාරය වෙත නව කොටස් නිකුතුව මගින් නිරවුල් කළේය. කොටස්හිමියන්ගේ ස්කන්ධය රු.බි. 9.6 සිට රු.බි. 14.7 දක්වා 53%ක සැලකියයුතු වැඩිවීමකට මෙය ප්‍රධාන හේතුව විය.

ද්විතීක ණයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 50ක ණයක් පිළිබඳ සාකච්ඡාව වසර තුළ තවත් එක් ප්‍රධාන පියවරක් වූ අතර ඉන් බැංකුවේ මුළු ප්‍රාග්ධනය ශක්තිමත් කරනු ඇත.

අදාළ ගිවිසුම 2019 ජූනි අත්සන් කරන ලදී. මෙම ණය රජයේ ඇපයකට අනුව ලබා දෙන අතර එය එකවර ගෙවීමක් ලෙස වසර 12.75කට පසු ආපසු ගෙවිය යුතුය.

වසර තුළ අපට මුහුණපෑමට සිදු වූ ප්‍රධාන අභියෝගයක් වූයේ මෙයට පෙර තැන්පතුවල ඉහළ ප්‍රතිශතයකට දායක වූ "සමෘද්ධි" සංගම් විසින් සිදුකළ තැන්පතු සැලකියයුතු ලෙස ආපසු ගැනීමයි. කෙසේවෙතත්, "සමෘද්ධි" තැන්පතු මත අපගේ අධික රඳාපැවැත්ම අඩුකර ගනිමින් අපගේ පුද්ගල තැන්පතු වැඩිකිරීම මගින් අපි මෙය ජයගෙන ඇත.

බැංකුව එහි වසර 30ක පැවැත්ම තුළ සිදුකරමින් සිටි පරිදි ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ සහ මැදි සහ පහළ ආදායම් කණ්ඩායම් නගාසිටුවීමේ එහි ප්‍රධාන පරමාර්ථය තුළ ශක්තිමත්ව නොනැවතී ඉදිරියට ගෙන ගොස් ඇත. ග්‍රාමීය ජනතාවගෙන් බහුතරය බැංකුව "අපගේ බැංකුව" ලෙසින් සලකනු ලබන්නේය යන කාරණය අපගේ කාර්යභාරය අපි ඉටුකර ඇති ඵලදායිත්වයට ගෞරවයක් වන අතර, "ශ්‍රී ලාංකිකයන් සවිබලගැන්වීම" යන අපගේ තේමා පාඨය සනාථ කරයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන සංවර්ධන ක්‍රමෝපායක් වන "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන යටතේ අප බැංකුව සක්‍රීය සහභාගිත්ව හවුල්කරුවෙක් වන අතරම ඉහළම ණය ප්‍රමාණයක් ලබාදෙන ලද බැංකුවක් ද වේ. බැංකුව විසින් ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමට කටයුතු කරමින් සිටින අතර ඒ තුළින් ජාතික ඉතුරුම් වැඩි කිරීම මගින් ශ්‍රී ලාංකීය ආර්ථිකයට දායකවීම සිදුකරයි.

අපි සෑමවිටම ආයතනික පාලනය පිළිබඳ ඉහළම ප්‍රමිතිවලට අනුකූල වී ඇති අතර ඉදිරියටද එසේ කරන්නෙමු. අපි ක්ෂේත්‍රය තුළ මනා පරිචයන් අධ්‍යයනය කරන අතර බැංකුවේ මෙහෙයුම් අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ඒවා යොදා ගනිමින් ඒවාට අනුකූලවීමට අපි උත්සාහ ගනිමු.

ඉදිරිය දෙස බැලීම

ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඒ.ඩො.මි 1ක ණය සහ අමතර තාක්ෂණික දීමනාව අමතර කාර්ය මණ්ඩලය බඳවාගැනීම ශක්තිමත් කරනු ඇත. විශේෂයෙන් කාන්තාවන් ඇතුළුව ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින්ට අපගේ ණය දීම තවදුරටත් වැඩි කරන ලද වසරක් බවට 2019 වසර පත් වනු ඇති බවට මම බලාපොරොත්තු වෙමි. තාක්ෂණික සහය දීමනාව සුළු හා මධ්‍ය පරිමාණ කාන්තා ව්‍යවසායිකාවන් පුහුණු කිරීම සඳහා භාවිතා කරනු ලැබේ. ඔවුන්ගේ කර්මාන්ත උසස් කිරීම සඳහා පහසුකම ඇතිකිරීමට, නියාමන අවශ්‍යතා පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට මෙන්ම ඔවුන්ගේ ව්‍යාපෘතිවල මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීමට අපි අපේක්ෂා කරමු.

බැංකුවේ ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශය ඉදිරියට ගෙනයාම තුළ අපගේ කාර්යභාරය තුළින් බැංකුවේ අඛණ්ඩ තිරසාරභාවය සහතික කරනු ඇත. කලාපීය අවධානය යොමු කරමින් ග්‍රාමීය ආර්ථිකය සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශය නගා සිටුවීම සඳහා අපගේ අනාගත අවධානය යොමු කරවමු. 2019 දී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එහි අනෙකුත් පරමාර්ථ අත්කර ගනිමින් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ අංශය වෙත ණය ලබාදීම අඛණ්ඩව සිදුකිරීමට අරමුණු කරයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාර්ථකත්වය පසුපස ප්‍රධාන සාධකයක් වන්නේ ශාඛා 273ක් වන අපගේ දිවයින පුරා ජාලය තුළින් මෙරට අවශ්‍ය ජනතාව වෙත අපගේ අසමසම ප්‍රවේශයයි.

පිළිගැනීම්

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ගරු අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා වෙත ඔවුන්ගේ මඟපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මගේ කෘතඥතාව පළකිරීමට මම කැමැත්තෙමි. එමෙන්ම, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා, මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු එරාන් වික්‍රමසිංහ මැතිතුමා සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් වෙත ඔවුන්ගේ උපදෙස් සහ සහය වෙනුවෙන් මගේ ස්තුතිය පිරිනමමි.

මහ බැංකුවේ අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ සහ නිලධාරීන් වෙත වසර තුළ ධනාත්මක කාර්යසාධනය අත්කර ගැනීම සඳහා අපව නියාමනය සහ මෙහෙයවීම වෙනුවෙන් මගේ අගයකිරීම පළකර සිටිමි.

සභාපති වශයෙන් මාගේ රාජකාරි කරගෙන යාමට මාව ශක්තිමත් කළ අධ්‍යක්ෂ මණ්ඩලයේ මාගේ සහයකයින්ගේ අඛණ්ඩ දායකත්වය සහ සහයෝගය වෙනුවෙන් ඔවුන් වෙත ස්තුතිය පිරිනැමීමට ද මම කැමැත්තෙමි. එමෙන්ම 2019 ජනවාරි 31 දින සේවයෙන් විශ්‍රාම ගිය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ටී.ඒ. ආරියපාල මහතාට, වර්තමාන වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ටී. කුහාන් මහතාට සහ ආයතනික කළමනාකාරිත්වයට සහ අනෙකුත් විවිධ මට්ටමේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත බැංකුවේ අරමුණු අත්කර ගැනීම සඳහා ඔවුන්ගේ වෙහෙස නොබලා සිදුකළ උත්සාහයන් වෙනුවෙන් මගේ අගයකිරීම පළකර සිටිමි.

අවසාන වශයෙන්, අපගේ බැංකුව කෙරෙහි තබන ලද විශ්වාසය සහ භක්තිය වෙනුවෙන් මිලියන ගණනාවක් වන අපගේ ගනුදෙනුකරුවන් සහ පාර්ශ්වකරුවන් වෙත මාගේ ස්තුතිය පිරිනමමි. ඔවුන්ගේ දිගුකල් පවත්නා සහය අපගේ ඉහළම වත්කම වන අතර ඔවුන් විසින් ඉදිරි වර්ෂයන්හි දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඉදිරියට සහ ඉහළට ඔසවා තබනු ඇත.



ජේ. ටී. එස්. පී. කාරියවසම්

සභාපති



2018 වසර තුළ, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්කර ගනිමින් බැංකුව අකාබනිකව වර්ධනය වූ අතර එය නියාමන අවශ්‍යතා ඉක්මවන පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තුළ වැඩිවීමකට හේතු විය. එමෙන්ම බැංකුව ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.එ. ඩොලර් මි. 50ක ණයක් සඳහා සාකච්ඡා කරන ලද අතර එම මුදල ප්‍රධාන වශයෙන් කාන්තා ව්‍යවසායිකාවන් සවිබලගැන්වීම සඳහා භාවිතා කරනු ලැබේ.

අපගේ නම තුළින්ම යෝජනා කරන පරිදි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) යනු වසර 30ක කාලයක් පුරාවට ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය ප්‍රදේශවලට සේවය කිරීම සඳහා කැප වී ඇති බැංකුවකි.

වර්තමානයේ මෙම බැංකුව සම්පූර්ණයෙන් රජයට අයත් සුවිශේෂී සංවර්ධන බැංකුව වන අතර ග්‍රාමීය ජනතාව අතර බැංකුවක් ලෙස පමණක්ම නොව, අවශ්‍ය වේලාවේදී මූල්‍ය සහය ලබාදෙන සහ ඔවුන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරණ හිතවතෙක් ලෙස විශ්වාසය දිනාගෙන ඇත. එබැවින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ග්‍රාමීය ප්‍රජාව තුළ ඔවුන්ගේ බැංකුව ලෙස එහි අනන්‍යතාව තහවුරු කර ගෙන ඇත. මීන් මූල්‍ය ආයතන අතර තරඟකාරී වාසියක් ලබා දී ඇති අතර එය ආදායම් පිරමීඩය තුළ ලාභය කෙරෙහි අවධානය යොමු කරයි.

අහිතකර සාර්ව ආර්ථික කොන්දේසිවල අභියෝගවලට මුහුණ දෙමින් 2018 වසර තුළ, අපි අපගේ වර්ධනීය ගමන් මඟ ඉදිරියට ගෙන ගියෙමු. අතීතයේදී මෙන්, අකාබනිකව තවදුරටත් වර්ධනය වූ අතර, 2016 අයවැය යෝජනා පරිදි, 2018 දෙසැම්බර් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව (LDB) අත්කර ගනු ලැබීය. මෙම ඒකාබද්ධ කිරීම 2019 අප්‍රේල් මාසය තුළ සම්පූර්ණ කරන ලදී.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්කර ගැනීම තුළින් බැංකුවට බාසල් III යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමිත සලකුණ ඉක්මවා යන පරිදි එහි පළමු පෙල ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව ශක්තිමත් කර ගැනීමට මඟපාදා දී ඇත. මුළු ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමට ද්විතියික ණයක් ලෙස ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 50ක ණයක් සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ සාකච්ඡා 2018 වසර තුළ ආරම්භ කරන ලදී. එම සාකච්ඡා අවසන් කරන ලද අතර මේ සම්බන්ධ ගිවිසුම 2019 ජූනි අත්සන් කරන ලදී. ඒ තුළින් තවදුරටත් අපගේ ප්‍රාග්ධන ස්ථාවරත්වය ශක්තිමත් කරනු ඇති අතර ඉදිරි වර්ෂයන් තුළ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ප්‍රමාණවත් මාවත නිර්මාණය කරනු ඇත.

බැංකුව දිවයින පුරා 3,800කට වැඩි ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර හරහා ලංකා පේ ජාලයේ වාසිය ලබා ගනිමින් එහි පැවැත්ම පුළුල් කර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2018 වසර තුළ සංවර්ධන සහයකයින් ලෙස කණිෂ්ඨ මට්ටමේ සේවකයින් 320ක් බඳවාගැනීම තුළින් කාර්ය මණ්ඩලය ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇති අතර එය 2019 දී සම්පූර්ණ කරන ලදී.

රාජ්‍ය සංවර්ධන බැංකුවක් ලෙස, රජය විසින් දියත් කරන ලද එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන තුළ සක්‍රිය අයුරින් සහභාගි වූ අතර 2018 දී මෙම වැඩසටහන යටතේ සැලකියයුතු ප්‍රමාණයක් ණය ලබාදී ඇත.

ආසියානු සංවර්ධන බැංකුවේ යෝජිත ඇ.එ. ඩොලර් මි. 50ක මුදල ප්‍රධාන වශයෙන් භාවිතා කිරීමට අදහස් කරන කාන්තා ව්‍යවසායකයින් සවිබලගැන්වීම තුළින් අපගේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපායන් නගා සිටුවීම කෙරෙහි බැංකුව අඛණ්ඩව අවධානය යොමු කරයි. ඇ.එ. ඩොලර් මි. 1 ක තාක්ෂණික ප්‍රදානය ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ තාක්ෂණික අවශ්‍යතාවන්වලදී පුහුණු කිරීම සඳහා යොදා ගනු ලැබේ.

බැංකුව වත්කම් පදනම් තුළ වාර්ෂික වර්ධනයක් සිදුකර ඇති අතර එය රු.බි. 7.26ක අක්‍රීය ණය කළඹක් තබා ගනිමින් 2017 දී පැවති රු.බි. 169.26 සිට රු.බි. 174,94 දක්වා වැඩි වී ඇත. එමෙන්ම බැංකුව 2018 වසර සඳහා රු.බි. 26.07ක දළ ආදායමක් සහ රු.බි. 3.61ක මෙහෙයුම් ලාභයක් අත්කරගෙන ඇත. තවද, බැංකුව 2018 වසර තුළ රු.බි. 2.10ක බදු පෙර ලාභයක් සහ රු.බි. 1.07ක බදු පසු ලාභයක් ද අත්කරගන්නා ලදී.

මෙම අරමුණු අත්කර ගනු ලැබුවේ ක්‍රමෝපායික සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ ඒකාබද්ධ උත්සාහයන් සමඟ නිෂ්පාදන කළඹ වැඩි කිරීම තුළින්ය.

පසුගිය වසර පුරා, සමෘද්ධි සංගම්වල සැලකියයුතු තැන්පතු දරමින් සංකේන්ද්‍රණ අවධානමකට මුහුණ පාමින් සිටි අතර එහිදී තනි තැන්පතුකරුවෙක් මත රඳාපැවැත්ම දක්නට ලැබුණි. 2018 දී සමෘද්ධි තැන්පතුවලින් සැලකියයුතු කොටසක් ආපසුගැනීම බැංකුවට තනිපුද්ගල තැන්පත්කරුවන්ගේ ගණන වැඩි කිරීමට පොළඹවන ලද අතර අවසානයේදී අපට සමබර තැන්පතු කළඹක් පවත්වා ගැනීමට 2018 අවසානය වන විට හැකි වූ බව වාර්තා කිරීමට ලැබීම මට සතුටකි.

2018 දී බැංකුව පරිගණක සහ සර්වර් වැනි නව දෘඩාංග උසස්කිරීමේ සහ ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම ක්‍රියාවලිය 2019 වසර තුළ සම්පූර්ණ කිරීමට නියමිතය.

2018 වසර අවසාන කොටසේදී මෙම අංශය තුළ දක්නට තිබුණු ක්‍රියාදාමක් වන වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස හානිකරණ අයකිරීම් මෙන්ම ඵලදායී බදු බර ඉහළයාම හේතු කොට ගෙන ලාභදායිතාව කෙරෙහි බලපෑම් සිදුවිය හැකි බැවින් 2019 වසර අභියෝගාත්මක වසරක් ලෙස අපි දකිමු. කෙසේවෙතත්, 2019 දී එම අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය අමතර සේවා බලකාය සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකය සමඟ බැංකුව සන්නද්ධ කර ඇත.

අවසාන වශයෙන්, ගනුදෙනුකරුවන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ විශ්වාසය සහ අනුග්‍රහය වෙනුවෙන් සහ අපගේ සභාපති, සුජිත් කාරියවසම් මහතාට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඔවුන්ගේ මඟපෙන්වීම සහ දිරිමත් කිරීම වෙනුවෙන් මෙන්ම හිටපු සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ටී.ඒ. ආරියපාල මහතා ඇතුළු බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත 2018 දී බැංකුවේ අරමුණු අත්කර ගැනීම සඳහා ලබාදුන් ඔවුන්ගේ සහයෝගය සහ කැපවීම වෙනුවෙන් මාගේ අවංක කෘතඥතාව පළකර සිටිමි.

එමෙන්ම 2018 වසර තුළ අප බැංකුව වෙත ලබාදෙන ලද සහයෝගය සහ සහය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් වෙත මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ ආයතන වෙත මගේ අවංක අගය කිරීම මෙයින් පළ කර සිටිමි.



ටී. කුහාන්

වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

5.

කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ

ගතික සහ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් තුළ, ආයතනික සාර්ථකත්වය සහ තිරසාර වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා සක්‍රීයවීම අපට අවශ්‍යය. අපගේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකම නිර්මාණය කිරීමට අපගේ සූදානම තුළ සම්පත් සහ ප්‍රවීනත්වය අප භාවිතා කරන ආකාරය මෙම කොටසින් ඉස්මතු කොට දක්වයි.

මූල්‍ය සම්පාදකයෙක් ලෙස අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරමින් දිවයින තුළ බොහෝ සංවර්ධන වැඩසටහන්වලදී බැංකුව ප්‍රමුඛස්ථානයේ සිටී.

සංවර්ධන මූල්‍යකරණය සඳහා කැප වූ මූල්‍ය ආයතනයක් ලෙස, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) රට තුළ සමාජ සහ ආර්ථික සංවර්ධන කටයුතු නගා සිටුවීම තුළ අත්‍යවශ්‍ය කාර්යභාරයක් අඛණ්ඩව ඉටුකරමින් සිටී. මූල්‍ය සම්පාදකයෙක් ලෙස අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටුකරමින් දිවයින තුළ බොහෝ සංවර්ධන වැඩසටහන්වල බැංකුව ප්‍රමුඛස්ථානයේ සිටී. මෙම සංවේදි සහ නවීන තරඟකාරී භූමිය තුළ බොහෝ මූල්‍ය ආයතන සක්‍රීයව සහභාගිවීමට අකැමැත්තක් දක්වන ආර්ථිකයේ ක්ෂේත්‍ර වෙත සේවය කරමින් දිවයින තුළ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අසමසම මූල්‍ය ආයතනයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වර්තමානයේ මතුවී ඇත. උතුර සහ නැඟෙනහිර ඇතුළුව රට පුරා විසිරුණු මිලියන හයකට වැඩි අපගේ ගනුදෙනුකාර පදනම අපගේ ප්‍රධාන වත්කම වේ. රටේ සහ එහි ජනතාවගේ සංවර්ධනය බැංකුවේ ප්‍රධාන අවධානය වේ. එබැවින් බැංකුව ඔවුන්ව සවිබලගැන්වීමට කැප වී සිටින අතර ඒ තුළින් දිවයින පුරා පැතිරුණු ශාඛා 273ක පුළුල් ජාලය තුළින් ජාතිය සංවර්ධනය කරයි.

ලාභදායිතාව

බැංකුවේ මුළු ආදායම පසුගිය වසරට සාපේක්ෂව 18%කින් වැඩි වී ඇත. 2018 වසර තුළ, මෙහෙයුම් ලාභය රු.මි. 3,606 දක්වා වැඩි වූ අතර එය 2017 දී වාර්තාකළ රු.මි. 3,307ක් වූ මෙහෙයුම් ලාභයට වඩා 9%ක් වැඩි වීමකි. බදු පෙර වත්කම් මත ඉපයීම (ROA) 2.08%ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2017 දී 2.2%ක් විය. එමෙන්ම, බැංකුව 2018 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් රු.බි. 177 දක්වා ලඟා වූ අතර එය පසුගිය වසරට වඩා 5%ක වර්ධනයකි.

අයවැය අනුව කාර්යසාධනය

	සැබෑ රු. '000	අයවැයගත රු. '000	අත්කරගැනීම %
දළ ආදායම	26,070,611	25,275,013	103
මෙහෙයුම් ලාභ	3,606,330	3,739,023	96
බදු පසු ලාභය	1,073,586	1,039,621	103

RDB, හි කාර්තුමය මූල්‍ය කාර්යසාධනය

RDB හි කාර්තුමය මූල්‍ය කාර්යසාධනය 2018 වසර තුළ වර්ධනය වී ඇත.

	2018				2017
	දෙසැම්බර් 31 රු. '000	සැප්තැම්බර් 30 රු. '000	ජූනි 30 රු. '000	මාර්තු 31 රු. '000	දෙසැම්බර් 31 රු. '000
ශුද්ධ මෙහෙයුම් ආදායම	11,442,195	8,193,908	5,359,378	2,672,652	10,157,834
බදු පෙර ලාභය	3,606,330	2,223,463	1,558,242	828,415	3,306,995
බදු පසු ලාභය	1,073,586	617,368	459,014	270,816	1,283,930
ණය සහ ලැබීම්	137,769,683	138,490,039	136,505,968	133,670,053	130,324,846
ගනුදෙනුකාර තැන්පතු	141,559,974	141,277,294	138,092,116	139,889,222	139,827,365
මුළු වත්කම්	176,937,319	176,474,864	171,343,914	174,091,364	169,259,202
කොටස්හිමියන්ගේ අරමුදල	14,710,115	10,230,116	10,071,762	9,883,564	9,612,749

ආදායම

බැංකුවේ මුළු ආදායම රු.බි. 22 සිට රු.බි. 26.1 දක්වා 18%ක වාර්ෂික වැඩිවීමක් පෙන්නුම් කළේය. මුළු ආදායම වැඩිවීම සඳහා ප්‍රධාන දායකයා වූයේ 19%කින් වර්ධනය වූ පොළී ආදායම සහ 8%කින් වර්ධනය වූ ගාස්තු සහ කොමිස් ආදායමයි.

මුළු ආදායමේ සංයුතිය

	රු. '000
පොළී ආදායම	24,865,109
ගාස්තු සහ කොමිස් ආදායම	1,186,795
අනෙකුත් මෙහෙයුම් ආදායම	18,706
මුළු ආදායම	26,070,610

ශුද්ධ පොළී ආදායම (NII)

ශුද්ධ පොළී ආදායම 2018 මූල්‍ය වසර තුළ 23%කින් සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, එය රු.මි. 9,676 සිට රු.මි. 11,906 දක්වා වැඩිවිය.

ශුද්ධ පොළී ආදායම - වර්ධනය (රු. මිලියන)



2018
23%

2017
27%

ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

1% ක වර්ධනයක් 2018 වසර තුළ වාර්තා කරන ලදී. එය 2017 දී වාර්තාකළ රු.මි. 921ට සාපේක්ෂව 2018 වසර තුළ රු.මි. 928 දක්වා ලඟාවිය.

ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම - වර්ධනය (රු. මිලියන)



2018
1%

2017
18%

බදුකරණය

	2018 රු. '000	2017 රු. '000	වෙනස %
මූල්‍ය සේවා මත VAT	1,158,678	984,943	18
ජාතිය ගොඩනැගීමේ බදු	154,490	131,326	18
ආදායම් බදු	1,029,496	906,796	14
ණය ආපසු ගෙවීමේ බදු	190,080	–	–
මුළු බදු වියදම	2,532,744	2,023,065	25

2018 වසර තුළ, රු.මි. 1,313ක් වූ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, ජාතිය ගොඩ නැගීමේ බදු සහ රු.මි. 1,029ක් වූ ආදායම් බදු බැංකුව දරා ඇත. වසර තුළ බදු ලෙස රු.මි. 2,533ක් දරා ඇත.

වත්කම් මත ඉපැයීම (ROA)

බැංකුව 2017 වසර සඳහා වාර්තා කළ 2.2%ට අනුව 2018 වසර සඳහා 2.1%ක වත්කම් මත ඉපයීම (ROA) (මෙහෙයුම් ලාභ) වාර්තා කළේය.

වත්කම් මත ඉපයීම (ROA) - වර්ධනය (%)



2018
(5%)

2017
23%

හිමිකම මත ඉපැයීම (ROE)

බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගැනීමට සිදුකළ නව කොටස් නිකුතුව හේතුවෙන් හිමිකම මත ඉපැයීම පසුගිය වසරට සාපේක්ෂව 10.7% දක්වා සැලකිය යුතු අඩු වීමකට ලක් වී ඇත.

හිමිකම මත ඉපැයීම (ROE) - වර්ධනය (%)



2018
(35%)

2017
49%

මුළු වත්කම්

බැංකුව පෙර වසරට වඩා 2018 වසර අවසානයේදී මුළු වත්කම් තුළ 5%ක වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, මුළු වත්කම් පදනම රු.බි. 175 සලකුණ පසුකරමින් රු.බි. 177 දක්වා ලඟා විය.

මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය

බැංකුවේ මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය 2018 වසර අවසානයට සැලකියයුතු මෙහෙයුම් ප්‍රතිඵල සහ මහා භාණ්ඩාගාරය විසින් රු.මි. 4,176ක නව ප්‍රාග්ධන ඇතුළත් කිරීමක් සමඟ රු.මි. 14,710 දක්වා ලඟා විය.

මුළු කොටස්හිමියන්ගේ ස්කන්ධය - වර්ධනය (රු. මිලියන)



2018
53%

2017
60%

වත්කම්වල ගුණාත්මකභාවය

බැංකුවේ අක්‍රීය ණය අනුපාතය (NPL) 2018 දෙසැම්බර් 31 දිනට 5.40% දක්වා වැඩි වූ අතර එය පසුගිය වසර අවසානයට 3.27%ක් විය. බාහිර අහිතකර සාධක වසර තුළ අක්‍රීය ණය තුළ පුරෝකථනය කළනොහැකි වැඩිවීමකට හේතු විය.

අක්‍රීය ණය (NPL) අනුපාතය (%)



2018
5.40%

2017
3.27%

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම් වී බැංකුවේ අක්‍රීය ණය පිළිබඳ විශ්ලේෂණයක් පහත දක්වේ:

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම් වී බැංකුවේ අක්‍රීය ණය (රු. මිලියන)



ද්‍රවශීලතාව

	2018 %	2017 %
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR)	24.27	26.27

බැංකුව නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළින් එහි ද්‍රවශීලතා මට්ටම් ස්ථීර වශයෙන් පවත්වාගෙන ඇත. 2018 වසරේ 3 වැනි සහ 4 වැනි කාර්තු තුළ සමහර ආයතනික තැන්පතුවල අනපේක්ෂිත පිටවයාම පසුගිය වසරට සාපේක්ෂව වඩා පහළ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයකට හේතු වී ඇත.

ණය සහ මෙහෙයුම්

ජාතික පැවැත්මක් ඇති සංවර්ධන බැංකුවක් ලෙස ජාතිය ගොඩ නැගීම සඳහා සැලකියයුතු දායකත්වයක් සිදු කිරීම බැංකුවෙන් අපේක්ෂා කෙරේ. මෙම පරමාර්ථය සපුරාලීමේදී බැංකුව විසින් භාවිතා කරන වඩාත් වැදගත් උපකරණය වන්නේ ණය ලබාදීමයි. රටේ කෘෂිකර්මය, කුඩා කර්මාන්ත, ධීවර, සත්ත්ව නිෂ්පාදනය, නිවාස සහ සේවා අංශය වැනි වැදගත් අංශ උත්තේජනය කිරීමට ණය භාවිතා කළ හැකි අතර ඒ තුළින් ජාතික ආදායම වෙත මෙවැනි අංශයන් විසින් සිදුකරන දායකත්වයන් වැඩි කළ හැක. බැංකුවේ වඩාත් සැලකියයුතු ලක්ෂණයක් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල එහි ශක්තිමත් පැවැත්ම වන අතර එය 1986 සිට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ආරම්භයේ සිට අඛණ්ඩව සිදුකර ඇත.

එමනිසා, බැංකුව ණය දීමේ මෙහෙයුම් ඇතුළුව සියලුම බැංකුකරණ කටයුතුවල දෙනලද පරමාර්ථ සපුරාලීමට ක්‍රමෝපායන් ගණනාවක් ක්‍රියාවට නංවා ඇත. සහන පොළී අනුපාත සහ පහසු ඇප අවශ්‍යතා මත වඩාත් පහසු සහන කාලසීමාවන් සහිත පහසුවෙන් නිර්මාණය කළ නැවත ගෙවීමේ සැලසුම් පිරිනමමින් අවශ්‍ය අංශවලට ගැලපීම සඳහා ණය පහසුකම්වල නියමයන් සැලසුම්කරන ලදී. ඊට අමතරව, ව්‍යවසායකත්ව සංවර්ධනය, පුහුණුකිරීම, කළමනාකරණය පිළිබඳ උපදේශන සහය සහ අලෙවිකරණය වැනි අමතර ණය පහසුකම් බැංකුව ලබාදී ඇත. අමතර ණය සේවාවන් ණයදීමේ අවදානම අඩුකිරීමට සහයවන අතර ඒ තුළින් ණයදීම සඳහා ඇප සුරැකුම් මත රඳාපැවැත්ම අඩු කරයි.

වර්තමානයේ, සියලුම ගනුදෙනුකාර වර්ගීකරණයන්ගේ විවිධ අවශ්‍යතා සඳහා සැලසුම්කළ විවිධ ණය යෝජනා ක්‍රම පිළිබඳ තෝරාගැනීමක් බැංකුව ක්‍රියාත්මක කරමින් සිටී. සංවර්ධන ණය වැඩසටහන් වැඩි කොටසක් මෙහෙයවීම සඳහා අරමුදල් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපීය ආයෝජන බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව වැනි බහුපාර්ශ්වික සංවිධාන විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම තුළින් ලබාගනී.

ඒ අනුව, සමාලෝචිත වසර තුළ, එවැනි ප්‍රතිමූල්‍යකරණ වැඩසටහන් 15ක් යටතේ සහභාගිත්ව ණය ආයතනයක් (PCI) ලෙස බැංකුව අඛණ්ඩව කටයුතු කරයි. මින් වැඩසටහන් හයක් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත්ය. බැංකුව ශක්තිමත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම ප්‍රතිමූල්‍යකරණ යෝජනාක්‍රම තුළ සහභාගි වෙමින් ඒ තුළ නියෝජනය කරන ලදී.

සමාලෝචිත වසර තුළ, "ගුදම් ලැබීම් මූල්‍යකරණය" නමින් ණයදීම සඳහා නව උපකරණ තවදුරටත් පුළුල් කිරීම සඳහා වන ස්ථාවරයක් බැංකුව ගෙන ඇත. ගොවි ප්‍රජාවට සහය වීම සඳහා බැංකුවක් විසින් මූල්‍යකරණය සඳහා එවැනි නව්‍ය උපකරණයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කළ පළමු අවස්ථාව මෙය විය. ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදනය වඩා අඩු මිලගණන්වලට අලෙවි කිරීම වෙනුවට අස්වනු නෙලීමේ කාලසීමාව තුළ තොග ඔඩපනය කිරීම මගින් තාවකාලික අරමුදල් ලබාගැනීමට මෙම උපකරණය මගින් ගොවීන්ට පහසුකම් ඇති කරනු ඇත. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ උපුල්දෙනිය, මොනරාගල දිස්ත්‍රික්කය තුළ බුත්තල, මන්නාරම දිස්ත්‍රික්කය තුළ මුරුන්කන් හී ගුදම්කිරීමේ ව්‍යාපෘති හයක කළමනාකරණය බැංකුව දැනටමත් ආරම්භ කර ඇති අතර රජය වෙනුවෙන් ලෝක බැංකුවේ සහයෝගය සමඟ 2018 දී ඉදිකරන ලද පොලොන්නරුව, ඇඹිලිපිටිය සහ කිළිනොච්චිවල අළුතින් ආරම්භ කරන ලදී. නිෂ්පාදන අලෙවි කිරීම වෙනුවට මිල මට්ටම් ස්ථාවර වනතුරු මෙවැනි ගබඩාවල ගොවීන්ට ඔවුන්ගේ අස්වැන්න ගබඩා කිරීමට පහසුකම් ලබාදීම සිදු කරමින්, මිලගණන් සාධාරණ මට්ටමක් දක්වා පැමිණි පසු අස්වැන්න බැහැරකරන තුරු හදිසි මුදල් අවශ්‍යතා සපුරාගැනීමට ගුදම්කිරීම ලැබීම මත කෙටිකාලීන ණය ලබාගැනීමට ගොවීන්ට හැකිය.

2018 වසර තුළ බැංකුව විසින් ලබාදෙන ලද ණය සම්බන්ධයෙන් රක්ෂණ කටයුතු ලබාදෙමින් ගාස්තු ආදායම උත්පාදනය කිරීම අඛණ්ඩව සිදුකරයි.

මෙම අරමුණ සඳහා, කෘෂිකර්ම රක්ෂණය, පශුසම්පත් රක්ෂණය, වාහන ණය රක්ෂණ, නිවාස ණය රක්ෂණ යනාදිය වැනි රක්ෂණ ප්‍රතිපත්ති ලබාගැනීමට රක්ෂණ සමාගම් නවයක සේවාවන් බැංකුව ලබාදෙනු ඇත. 2018 වසර තුළ, උපයන ලද ගාස්තු ආදායම රු.මි. 11ක් විය. මෙම අත්දැකීම මත පදනම් වී, රක්ෂණ කටයුතු විධිමත් කර පුළුල් කිරීම සඳහා බැංකුව විසින් බැංකු ආරක්ෂණ ඒකකය තවදුරටත් ශක්තිමත් කර ඇත.

එමෙන්ම, බැංකුව එහි ශාඛා ජාලය තුළින් උපයෝගිතා බිල්පත් ගෙවීම් පහසුකම පුළුල් කරන ලද අතර, මෙය ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සි බිල්පත් නිරවුල් කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට පහසුකම් ඇතිකරමින් 2017 දී ආරම්භ කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අනෙකුත් සේවා සපයන්නන් සඳහාද අනාගතයේදී මෙම පහසුකම් තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කරයි.

වේගයෙන් වෙනස්වන සාර්ව ආර්ථික පරිසරයක් තුළ, පසුගිය වසරවලට සාපේක්ෂව ආක්‍රමණශීලීව බැංකුව ණය ලබාදී නොමැත. කෙසේවෙතත්, බැංකුව රජයේ දැක්ම හා සමගාමී වෙමින් සහන පොළී අනුපාත සහිත ණය නිෂ්පාදන සමඟ ආර්ථිකයේ අවශ්‍ය අංශ වෙත ණයදීමේදී පසුගිය වසර තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කර ඇත.

ණය සහ අත්තිකාරම් වර්ධනය (රු. මිලියන)



ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදනය අනුව

වර්ගය	2018 රු.මි.	2017 රු.මි.
උකස්කිරීම	11,455	10,261
සේවක ණය	3,479	3,506
කෙටිකාලීන	9,181	7,892
දිගුකාලීන	113,655	108,666
එකතුව	137,770	130,325

ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදනය අනුව (රු. මිලියන)



ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව

වර්ගය	2018 රු.මි.	2017 රු.මි.
කෘෂිකර්මය සහ ධීවර	36,860	31,115
නිෂ්පාදනය	22,907	21,566
ප්‍රවාහනය	244	339
ඉදිකිරීම/නිවාස	28,086	32,268
වෙළෙඳාම	22,819	20,532
තැන්පතු අනුව පරිභෝජනය/ කාර්ය මණ්ඩලය/සංචාරක	26,852	24,506
එකතුව	137,770	130,325

ණය සහ අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව (රු. මිලියන)



අයකරගැනීම්

2018 වසර තුළ, බැංකුව විසින් එහි අක්‍රීය ණය (NPL) කළඹ කළමනාකරණය කිරීමට විශේෂ අවධානය යොමු කරන ලද අතර, එය 2018 අවසානයට මුළු කළඹ තුළ 3.27%ට ආසන්න විය. ගන්නා ලද විශේෂ උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සහ, අපගේ ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙක් මුහුණපාන ලද යම් අවාසනාවන්ත පරිසර සාධක හේතු කොට ගෙන ඇතිවන පීඩනයන්ට නිසිලෙස මුහුණ දෙමින්, වසර තුළ තරමක ණය වර්ධනයක් තබාගනිමින් 2018 දෙසැම්බර් 31 දිනට 5.40%ක අක්‍රීය ණය අනුපාතයක් පවත්වා ගැනීමට බැංකුවට හැකි විය.

අක්‍රීය වර්ගය	2018 රු.මි.	2017 රු.මි.
විශේෂයෙන් සඳහන්	1,323	986
උපප්‍රාමාණික	2,080	885
අඩමාණ	1,431	533
අලාභ	2,429	1,787
මුළු අක්‍රීය ණය	7,263	4,191
අක්‍රීය ණය අනුපාතය %	5.40	3.27

තැන්පතු වර්ධනය

බැංකුවේ තැන්පතු පදනම රු.බි. 142 දක්වා වැඩි වූ අතර 2018 වසරේ 3 සහ 4 වැනි කාර්තුවල සමහර ආයතනික තැන්පතු සැලකියයුතු ලෙස ආපසු ගැනීම නොසලකා පසුගිය වසර පුරා 1%ක වර්ධනයක් නියෝජනය කර ඇත. එමෙන්ම, වසර තුළ ඉතුරුම් තැන්පතු රු.බි. 3 කින් වැඩිකර ගැනීමට බැංකුව සමත් විය.

තැන්පතු වර්ධනය

(රු. මිලියන)



2018
1%

2017
31%

තැන්පතු මුසුව

තැන්පතු වර්ගය	2018 රු.මි.	2017 රු.මි.
ඉතුරුම් තැන්පතු	51,520	48,988
ස්ථාවර තැන්පතු	90,040	90,839
එකතුව	141,560	139,827

තැන්පතු මුසුව

(රු. මිලියන)



2018 වසර තුළ තොරතුරු තාක්ෂණ ජයග්‍රහන

නවීන තාක්ෂණීකමය ක්‍රියාත්මක කිරීම් තුළින් අගනා ගනුදෙනුකාර සේවාවන්ගේ අඛණ්ඩ වර්ධනය ලබාදෙන ලද බැවින් 2018 වසර බැංකුවට තවත් එක් සාර්ථක ජයග්‍රාහී වසරක් විය.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) කාඩ්පත් 150,000කට වැඩි ප්‍රමාණයක් අගනා ගනුදෙනුකරුවන් වෙත නිකුත් කර ඇති අතර බැංකුවට අයත් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හතලිස් දෙක දක්වා වැඩි කර ඇත. මෙම වසර තුළ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) එහි පළමු මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) ආරම්භ කරන ලද අතර, 24 පැය බැංකුකරණ සේවා ලබාදීම පිණිස තෝරාගත් RDB ශාඛා/ස්ථානවල මුදල් තැන්පතු යන්ත්‍ර 5ක් ස්ථාපිත කරන ලදී. ATM සහ CDM මෙහෙයුම්වල ආරක්ෂක මට්ටම වැඩි කිරීම පිණිස SMS සංඥා පහසුකම ද ක්‍රියාත්මක කරන ලදී.

24 පැය මෙහෙයුම් ඇමතුම් මධ්‍යස්ථානයක් SLT පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද අතර එහි සියලුම කාර්ය මණ්ඩලය වෘත්තීමය වශයෙන් සහ භාෂා තුනෙන් මිත්‍රශීලී සහ ඵලදායී ගනුදෙනුකාර සේවාව ලබාදීම සඳහා පුහුණු කර ඇත. ඇමතුම් මධ්‍යස්ථානය විසින් RDB කාඩ්පත් හිමියන්ට සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට සහය ලබා දේ.

බැංකුව එහි ග්‍රාමීය මට්ටමේ ගනුදෙනුකරුවන් වෙත ඵලදායී ජංගම ඉතුරුම් එකතුකිරීම ලබාදීම සඳහා එහි දොරින් දොර ක්‍රමයට නව ජංගම උපාංග සියයක් එකතුකරන ලදී. වර්තමානයේ 420කට වැඩි දොරින් දොර ගනුදෙනුකාර සහයකයින් පිරිසක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යේෂ්ඨ කළමනාකරිත්වයට පහසුකම ලබාදෙමින් ඔවුන්ද ඇතුළත් කළ පරිගණක පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. මෙම පද්ධතියේ සහය ඇතිව, අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බෙදාහැරීම විද්‍යුත් මාර්ගයෙන් සිදුකරන අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ භෞතික පැමිණීම නොමැතිව පැවැත්විය හැකිය. මෙම පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පැවැත්වීමට භාවිතා කරන අතර, වඩාත් වෘත්තීය සහ කාර්යක්ෂම ආකාරයෙන් බැංකුව තුළ උපාය මාර්ගික මට්ටමේ තීරණ ගැනීමකට ද එය සහය වේ.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් මට්ටමින් බැංකුවට අයත් මෝටර් රථ කළමනාකරණය කිරීම සඳහා මෝටර් රථ කළමනාකරණ ක්‍රමයක් (VMS) සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී. මෙය එදිනෙදා මෙහෙයුම්, මෝටර් රථ සේවා කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ තීරණ කාලීන සහ වඩාත් කාර්යක්ෂම ආකාරයෙන් ගැනීම සඳහා කළමනාකරණයට සහය වේ.

RDB කැකුළු - බාලවයස්කාර ඉතුරුම් ගිණුම

රාජ්‍ය බැංකුවක් ලෙස, RDB විසින් වයස අවුරුදු 14ට අඩු ළමුන් වෙනුවෙන් විශේෂයෙන් සැලසුම්කළ “RDB කැකුළු” නමින් සුවිශේෂී ඉතුරුම් ගිණුමක් දියත් කර ඇත. අප මව්බිමේ සැම ළමයෙකුටම දීප්තිමත් අනාගතයක් සඳහා RDB සමඟ ඉතුරු කිරීමට මින් හැකියාව ලබා දේ. බාල වයසේ සිටම ඉතුරු කිරීමේ පුරුද්ද ඇති කරමින් සහ ආර්ථිකය පිළිබඳ මෙම පාඩම කියා දෙමින් ශ්‍රී ලාංකීය දූ පුතුන්ගේ අනාගත ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීම සඳහා බැංකුව කටයුතු කරයි. පාසල් සිසුන් සහ බාලවයස්කරුවන් ඉතිරි කිරීම සඳහා දිරිගැන්වීම පිණිස ඉතුරුම් මත ඉහළම ප්‍රතිඵල ලබා දේ. එමෙන්ම, RDB විසින් පාසල් සිසුන්ට ඉතිරි කිරීම ක්‍රියාවේ යෙදවීම සඳහා ඔවුන් පෙළඹවීමට පාසල් ඉතිරි කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇත. මෙම ගිණුම මගින් අමතර පරමාර්ථ අත්කර ගැනීමට සැලසුම් කෙරේ. එනම් - ළමුන්ගේ අධ්‍යාපනයට සහයවීම මෙන්ම යහපත් පුරවැසියන් බවට පත් කිරීමට ඔවුන්ට සහයවීමයි. RDB විසින් ආකර්ෂණය කර ගැනීමක් ලෙස සෑම නව ගිණුමක් සඳහා නව ඉතුරුම් මුදල් කැටයක් පිරිනමයි. තවද, විවිධ මට්ටම්වලදී ගිණුම් තුළ ශේෂ සඳහා පිරිනැමීමට විශේෂයෙන් සකස් කළ කුඩ, පාසල් බෑග්, ශබ්දකෝෂ ත්‍යාග වවුචර සහ ළමා පාපැදි වැනි ත්‍යාග අයිතම රාශියක් ද ඇත. 5 වසර ශිෂ්‍යත්වය සහ සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල අත්කර ගන්නා ගිණුම් හිමියන් සඳහා තෑගි/ත්‍යාග පිරිනමුන් ලබයි. එමෙන්ම, ඉහත විභාගය සඳහා පෙනී සිටින ගිණුම් හිමියන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ සූදානම් කෙරේ.

RDB 14 ප්ලස්

විශේෂ ඉතුරුම් මෙවලමක් වන RDB 14+ ගිණුම මෑත කාලීනව RDB බැංකුව විසින් ඉතුරුම් පුරුදු සංවර්ධනය කිරීමට තරුණ ප්‍රජාව දිරිගැන්වීම සඳහා හඳුන්වා දෙනු ලැබීය. මෙම ගිණුම් විශේෂයෙන් සැලසුම් කරනු ලැබුවේ වයස අවුරුදු 14 හෝ ඊට ඉහළ තරුණ ජනතාව සඳහාය. අනාගතය සඳහා සැලසුම් කරමින් තරුණ වයසේ සිටම ඉතිරි කිරීමේ පුරුද්ද ක්‍රියාවේ යෙදවීම අනාගත ආරක්ෂාව සඳහා මඟ හෙලි කරනු ඇත. ඒ අනුව, RDB 14+ තරුණ ජනතාව ආකර්ෂණය කරගත හැකි අගය එකතුකිරීම් සමඟ ක්‍රියාත්මක කරයි. ගිණුම තුළ ශේෂය වර්ධනයට සාපේක්ෂව 30%ක ප්‍රසාද පොළියක් එකතු කිරීම සමඟ වඩා ඉහළ පොළි අනුපාතයක් පිරිනමනු ලබයි. ATM කාඩ්පතක් නිකුත් කරන බැවින්, අවුරුදු 14 ට ඉහළ ළමුන්ට ඔවුන්ගේ මුදල් අවශ්‍යතා සඳහා මුදල් ආපසු ගැනීම සඳහා අවස්ථාව ඇත. එමනිසා, ළමුන් විසින් ඔවුන් ලඟ විශාල මුදලක් තබා ගැනීම අවශ්‍ය නොවේ. පාසල් ළමුන්ට ඔවුන්ගේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා මෙම ගිණුම භාවිතා කළ හැකි අතර, ATM කාඩ්පතින් සිදුකරන සෑම ආපසු ගැනීමකදී, ආපසු ගැනීම් පිළිබඳ විස්තර භාරකරුගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් (SMS) මගින් යවනු ලැබේ. සංගණන සහ සංඛ්‍යාලේඛන දත්ත අනුව, ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රමබලකායෙන් ආසන්න වශයෙන් 10%ක් වයස අවුරුදු 15 - 25 අතර වේ. ශ්‍රමබලකාය තුළ එම වර්ගයට මෙම ගිණුමෙන් විශේෂ ප්‍රතිලාභ අත්කරගත හැකිය. තරුණ ප්‍රජාවට නිවසක්, වාහනයක්, ගෘහභාණ්ඩ, ව්‍යාපාරයක් සහ අධ්‍යාපනික අවශ්‍යතා සඳහා විද්‍යුත් උපකරණ සහ උපාංග අත්කර ගැනීමේ සහ විදේශ සංචාර සිහිනය සැබෑ කර ගැනීම සඳහා ණය පහසුකම් ලබාගත හැකි අතර, මෙම ගිණුම් තුළින් මෙය සූදානම්කර ගත හැකිය. සියලුම ගනුදෙනු කටයුතු ඔබට යාවත්කර තබා ගැනීම සඳහා ඔබගේ ජංගම දුරකථනයට කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ.

RDB ලිය සවිය - කාන්තා ඉතුරුම් ගිණුම

මෙම ගිණුම ශ්‍රී ලංකාවේ කාන්තාවන් දිරිමත් කිරීම අරමුණු කරමින් හඳුන්වා දෙන ලදී. මූල්‍ය පහසුකම්වලට අමතරව, ස්වයං රැකියාව තුළින් රටේ ආර්ථිකයට දායක වන කාන්තාවන් සඳහා බැංකුව විසින් උපදේශන සේවාවන්ද ලබා දේ. ගිණුම තුළ සුවිශේෂී ලක්ෂණය වන්නේ වඩා ඉහළ පොළිය, ප්‍රසාද පොළිය සහ තරඟකාරී පොළි අනුපාත මත දිමනා යනාදියයි. එමෙන්ම, විශේෂ සම්මන්ත්‍රණ, නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු වැඩසටහන් සහ ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ වැඩමුළු කිහිපයක් ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තා ව්‍යවසායකයින් සඳහා සෑම වසරකම පවත්වනු ලබයි. තවද, බැංකුව විසින් සමස්ත ලංකා විශිෂ්ඨතම කාන්තා ව්‍යවසායක තරඟය සංවිධානය කරනු ලබන අතර RDB ලිය සවිය ගිණුම් හිමියන් මෙම තරඟය සඳහා ඇතුළත්වීමට හිමිකම ලබයි.

RDB වික්ටරි

බැංකුව විසින් විශේෂ ඉතුරුම් ගිණුමක් ලෙස RDB වික්ටරි ගිණුම හඳුන්වා දෙන ලදී අතර මෙහිදී ආපසු ගැනීම් සිදුකරමින් වඩා ඉහළ පොළියක් ලබාගත හැකිය. විශේෂ ප්‍රතිලාභයක් ලෙස, මෙම ගිණුම තුළින් 70% දක්වා ප්‍රසාද පොළියක් පිරි නමයි. තවද, ගිණුම් හිමියන්ට විශේෂ ණය පහසුකම් ද ලබාගත හැකිය. පවත්වාගෙන යන ගිණුම් ශේෂය මෙන් දස ගුණයක ණය මුදලක් ලබා දේ. තැන්පතුව දින ගණනක් පැවතියද මෙම ගිණුම් තුළින් ප්‍රසාද පොළිය ගෙවනු ලැබේ. එමෙන්ම, සියලුම ගනුදෙනු SMS පණිවිඩ මගින් දැනුම් දෙනු ලැබේ.

පුරවැසියන්ගේ ඉතුරුම් ව්‍යවහාර රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන අතර RDB වික්ටරි තැන්පතුව ජනතාවගේ ඉතිරි කිරීමේ පුරුද්ද නගා සිටුවන ආකර්ෂණීය තැන්පතු යෝජනා ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැකිය. වට්ටම්කළ අනුපාත යටතේ මුදල් හුවමාරු සේවා ලබාදීම මෙම ගිණුම විසින් පිරිනමනු ලබන විශේෂ ප්‍රතිලාභයකි.

RDB ආයෝජන ගිණුම

මෙය ණය පහසුකම් ලැබෙන සේවාදායකයින් සඳහා හඳුන්වාදෙන ලද සාමාන්‍ය ආයෝජන ගිණුමකි. මෙම නිෂ්පාදනයේ විශේෂ ලක්ෂණවලට තැන්පතු සඳහා ආකර්ෂණීය පොළී අනුපාතයක් සහ ඉලක්කගත අංශ සඳහා සැලසුම්කර විශේෂ ණය යෝජනා ක්‍රමයක් ඇතුළත් වේ.

RDB ස්ථාවර තැන්පතු

RDB ස්ථාවර තැන්පතු එහි තනිපුද්ගල සහ ආයතනික ගනුදෙනුකරුවන් අතර ජනප්‍රිය ආයෝජන රටාවක් ලෙස හඳුනා ගනී. ස්ථාවර තැන්පතු මාස 1, 2, 3, සහ 6 ක කාලසීමා මෙන්ම වසර 1 - 5 දක්වා කාලසීමාවන් සඳහා ද අප බැංකුවෙන් ලබාගත හැකිය. ආරම්භයේ සිට, අනෙකුත් බැංකුවලට සාපේක්ෂව ඉතා ආකර්ෂණීය පොළී අනුපාත ලබාදීමට බැංකුවට හැකි වී ඇත. ස්ථාවර තැන්පතු සඳහා අවුරුදු 1 හෝ ඊට ඉහළ කාලසීමාවක් කල්පිරීම සමඟ විශේෂ පොළී අනුපාත පිරිනමනු ලබයි.

RDB දොරින් දොර - නිවස වෙතම සපයන බැංකුකරණ සේවය

මෙය ශ්‍රී ලංකාව තුළ නිවස වෙතම බැංකුකරණ සේවාව ලබාදීමේ පුරෝගාමියා ලෙස RDB හි තවත් එක් සේවාවකි. මෙම ක්‍රමය විශේෂ සේවා සපයන්නන් කණ්ඩායමක් තුළින් ක්‍රියාත්මක වන අතර ඔවුන් දෛනික පදනමක් මත ව්‍යාපාර පරිශ්‍ර සහ අදාළ ශාඛාවේ බලප්‍රදේශයන්හි නිවාස වෙත ගමන් කරයි. මෙම නිරන්තර සංචාර ඉලක්කගත කණ්ඩායමට වඩා පහසුවක් සහ සහනයක් සලසන අතර තම බැංකු ගනුදෙනු සඳහා වැඩි වාර ගණනක් ශාඛාව වෙත පැමිණීමේ ගැටළුවෙන් ගනුදෙනුකරුවන් ආරක්ෂා කරයි. දොරින් දොර සේවාව තැන්පතු රැස්කිරීමට පමණක් සීමා වී නොමැති අතර, සේවා දායකයින්ට සංවර්ධන අරමුණු සඳහා ණය ලබා ගැනීමට, ණය ගිණුම සඳහා සේවා සැපයීමට මෙන්ම තම පහසුව තුළ කඩිනමින් වාරික සහ පොළි ගෙවීමටද ඔවුන්ට සහය වී ඇත. ඊට අමතරව, උපයෝගිතා බිල්පත් ගෙවීම් මෙම සේවාව තුළින් නිරවුල් කිරීමට ද හැකිය. මෙම අසමසම සේවාව වැඩි වෙහෙසක් සහ කරදරයක් නොමැතිව කාලසීමාව තුළ යහපත් ගිණුම් ශේෂ ගොඩ නගාගැනීමට සුළු පරිමාණ ව්‍යවසායකයින්ට සහ පුද්ගලයින්ට සහය වී ඇත. ඊට අමතරව, මෙම ගනුදෙනු විද්‍යුත් අතින් ගෙනයාහැකි අතින් දරන උපාංග හරහා සිදුකරන අතර ගනුදෙනුව ස්වයංක්‍රීයව බැංකුවේ පද්ධතිය යාවත් කරනු ලබයි. මෙසේ, "ව්‍යවසායකයින් පෝෂණය කිරීම" යන බැංකුවේ දැක්ම ඉටු කිරීමට හැකි වී ඇත.

වෙස්ටර්න් යූනියන් (WU) සහ ලංකා මුදල් හුවමාරුව (LMT)

වෙස්ටර්න් යූනියන් (WU) සහ ලංකා මුදල් හුවමාරුව (LMT) තුළින් මුදල් හුවමාරු කිරීම ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවල පුළුල්ව පිහිටා ඇති RDB හි ශාඛා තුළින් විදේශ ගමනාන්තයක සිට අප රටට අරමුදල් මාරු කිරීම සඳහා පහසු සහ වේගවත් මාර්ගයකි.

ATMs සහ CDMs

ජංගම ගිණුම් හැර, බැංකුව විසින් ඉතුරුම් ගිණුම්, ළමා ඉතුරුම් ගිණුම්, කාන්තා ගිණුම් සහ ජෙෂ්ඨ පුරවැසි ගිණුම් උකස් පහසුකම් මෙන්ම දීර්ඝ කාලීන ණය පහසුකම් රාශියක් ඇතුළුව ගනුදෙනුකරුවන් වෙත නිෂ්පාදන සහ සේවා විශාල ප්‍රමාණයක් පිරිනමයි. සේවා රාශියක් හමුවේ වුවත් මෑතක් වනතුරු බැංකුව එහි ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් කාඩ් පහසුකම් පිරිනමා නොතිබුණි. කෙසේවෙතත්, ලංකා ක්ලියර් වෙතින් පිරිනමන ලද විප්ලවීය LankaPay පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) හඳුන්වාදීමත් සමඟ, වර්තමානයේ බැංකුව තම ගනුදෙනුකරුවන්ට ATM කාඩ්පත් පිරිනැමීමට සූදානම් වී සිටී. එමනිසා, 2015 සිට, LankaPay ලොගෝව සහිත ඕනෑම ATM යන්ත්‍රයක් තුළින් RDB ATM කාඩ්පත් භාවිතා කරමින් තම ගිණුම්වලින් මුදල් ආපසු ගැනීමට ගනුදෙනුකරුවන්ට හැකිවීම පිණිස බැංකුව ක්‍රමෝපායික පියවර රැගෙන ඇත. RDB හි ගනුදෙනුකරුවන්ගේ බහුතරය කෘෂිකර්මය, ධීවර සහ සත්ත්ව නිෂ්පාදනය වැනි වෘත්තීන්හී යෙදී සිටින ග්‍රාමීය සහ අර්ධ නාගරික ව්‍යවසායකයින්ගෙන් සෑදී ඇති බැවින්, මෙම ATM කාඩ්පත මඟින් වඩා යහපත් පහසුව සහ ආරක්ෂාව පිරිනැමීමට අපේක්ෂා කෙරේ. වර්තමානයේ, බැංකුව දිවයින පුරා යන්ත්‍ර 42ක් ස්ථාපිත කර ඇත.

ඊට අමතරව, 2018 දී බැංකුව විසින් මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) ජාලය හඳුන්වා දී ඇත. සේවාදායකයින්ගේ පහසුව සඳහා බොහෝ කාර්යබහුල නගරවල මේවා හඳුන්වා දෙනු ලැබේ. තවද, පදවි ශ්‍රීපුර සහ වැලිඔය ස්වයංක්‍රිය බැංකුකරණ මධ්‍යස්ථාන දෙකක් ඇති අතර, ඒවායේ වෙනත් බැංකු මඟින් විධිමත් බැංකුකරණ සේවා පවත්වා ගැනීමක් නොමැත.

RDB - ජය නිධාන

මෙය සියලුම ආර්ථික මට්ටම්වල ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගන්නා RDB හි නිෂ්පාදනයකි. මෙය සහතිකපතක් වන අතර ඉන් රු.5,000.00, රු.10,000.00, රු.25,000.00, රු.100,000.00, රු.500,000.00, රු.1,000,000.00ක් දක්වා මුහුණත් වටිනාකම් මත ලබා දේ. ප්‍රධාන වශයෙන් මෙම නිෂ්පාදනයෙන් අරමුණු කරන්නේ රටතුළ විශේෂයෙන් සුළු පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා අත දීම සඳහා බැංකුවේ ස්ථාවර තැන්පතු කළඹ වැඩිකර ගැනීමයි. මෙම නිෂ්පාදනයේ විශේෂ ලක්ෂණය වන්නේ ගනුදෙනුකරුවන්ට කල්පිරීමෙන් පසු මුහුණත් අගය (අනාගත වටිනාකම) අනුව වට්ටම්කළ වටිනාකමට තම මුදල් තැන්පත් කිරීමට හැකි වීමයි. පුද්ගලික තැන්පතු සඳහා පමණක් තනි පුද්ගල සහ හවුලේ RDB ජය නිධාන ගිණුම් විවෘත කළ හැකිය.

RDB නිව් ලයිෆ්

ශ්‍රී ලංකාව කලාපය තුළ ජෙෂ්ඨ පුරවැසියන්ගේ වේගවත් වර්ධනයක් ඇති රටක් ලෙස හඳුනා ගෙන ඇත. සමාජීය වගකීමක් ලෙස, RDB රටතුළ ජෙෂ්ඨ පුරවැසියන් ආකර්ෂණය කර ගැනීම සඳහා RDB නිව්ලයිෆ් තැන්පතු යෝජනා ක්‍රමය ආරම්භ කිරීම සඳහා කැපවී සිටී. මෙම නිෂ්පාදනය වයස අවුරුදු 16 සිට 55 දක්වා වැඩකරන පරම්පරාව වෙත සේවය කරයි. RDB නිව්ලයිෆ් තැන්පතු යෝජනා ක්‍රමය විශ්‍රාම වැටුපක් ආකාරයෙන් ස්ථාවර ආදායමක් තම විශ්‍රාම වයසේදී භුක්ති විඳීමට ජනතාවට සහය වේ.

ග්‍රාමීය ගනුදෙනුකරුවන්, අඩු ආදායම් උපයන ගනුදෙනුකරුවන් සහ ස්වයං රැකියාලාභීන් මෙන්ම ගොවීන් වැනි බැංකුවට සුදුසු වෙළෙඳපොල අපි ඉලක්ක කරමු. තවත් එක් ප්‍රධාන අවධානයක් වන්නේ සමස්ථයක් ලෙස රටේ ආදායමට දායක වන විදේශීය සේවකයින්ය.

ගනුදෙනුකරුවන්ට ගිණුම් විවෘත කර මාසිකව, මාස තුනකට වරක් හෝ අර්ධ වාර්ෂිකව තැන්පතු එවිය හැකිය. ඔහු හෝ ඇය වයස අවුරුදු 55 සම්පූර්ණ කිරීමෙන් පසු ප්‍රතිලාභ ලබාගත හැකිය. මෙය වයස අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීමට ද හැකිය.

RDB උත්තම - ජෙෂ්ඨ පුරවැසි ගිණුම

මෑතකාලීන වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 17.6%ක් ජෙෂ්ඨ පුරවැසියන් වෙති. ජෙෂ්ඨ පුරවැසියන් වෙත නිසි පිළිගැනීම ලබාදීම සඳහා, RDB විසින් එහි නව නිෂ්පාදනය වන "RDB උත්තම" ඉතුරුම් ගිණුම ආරම්භ කර ඇත. මෙම ගිණුම තනි පුද්ගල ගිණුමක් ලෙස පමණක් රු. 500.00කින් විවෘත කළ හැකිය.

උත්තම ගිණුම් හිමියන්ට ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ මෙම ගිණුම තුළින් RDB දෙටුසවි ණය ලබා ගැනීමේ හැකියාවයි. උපයෝගිතා බිල්පත් මෙම ගිණුම් තුලින් ගෙවන්නේනම් පමණක් සේවා ගාස්තු අය නොකෙරේ. අප වෙත පියවර තබන ගනුදෙනුකරුවන් කෙරෙහි විශේෂ අවධානය RDB යොමු කරනු ලබන අතර, ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාව ලබා දේ. RDB විසින් ජෙෂ්ඨ පුරවැසි ගිණුම් හිමියන් සඳහා විශේෂ වට්ටම්කළ අනුපාතයකට විදේශීය වන්දනා ගමන් සංවිධානය කරයි. එමෙන්ම, ඔවුන්ගේ වෛද්‍ය පරීක්ෂණ සඳහා රු.100,000.00 ට වැඩි වන ශේෂයෙන් 2.5%ක් බැංකුව විසින් පිරිනමයි.

රජයේ සහ රාජ්‍ය නොවන විශ්‍රාමිකයින් සහ වයස අවුරුදු 55ට වැඩි අනෙකුත් සියලුම දෙනා මෙම ගිණුම විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබයි.

සමාජීය වගකීම – CSR

සමාජය විසින් මුහුණපාන ගැටළු පිළිබඳ කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර දැනුවත්කම සහ අදහස් සංවර්ධනය කිරීම, බැංකුවේ පාර්ශ්වකරුවන් සහ කොටස්හිමියන් වෙත ඔවුන්ගේ වගකීම සවිබලගැන්වීම සහ ජනතාව සහ පරිසරයේ යහපැවැත්ම සඳහා බැංකුවේ වගකීම සවිබලගැන්වීම සමාජය වෙත සිදුකරන සේවාවන් ලෙස හඳුනාගත හැකිය.

RDB බැංකුව සම්පූර්ණයෙන්ම රජයට අයත් ආයතනයක් වීමේ ප්‍රතිලාභ ලබන අතර එහි සමාජීය බැඳීම් දරාගැනීමට බැඳී සිටී. ඒ අනුව, එහි කෙටිකාලීන කාලපරිච්ඡේදය තුළ ලාභ ඉපයීමේ අභිප්‍රායන් මත පමණක් කටයුතු කර නොමැත. ඒ වෙනුවට, බැංකුව එහි හැකියාව තුළ, සමාජීය සුභසාධනය නගා සිටුවීම සඳහා හැකි සෑම ආකාරයකින් තම කොටස ඉටුකර ඇත.

බැංකුවේ මෙහෙවර අනුව යමින්, RDB විසින් සුවිශේෂ ව්‍යාත්තීමය කණ්ඩායමක් තුළින් මූල්‍ය සහ උපදේශන සේවා ලබාදෙන අතර කලාපයන් හී සමාජ-ආර්ථික සෞභාග්‍ය ඵලදායිව නගාසිටුවීම අරමුණු කරයි. බැංකුවේ දැක්ම වන්නේ ව්‍යවසායකයින් පෝෂණය කිරීම වන අතර ඔවුන් අප රටේ සමාජ-ආර්ථික සෞභාග්‍ය වේගයෙන් ඉදිරියට ගෙන යනු ඇත.

බැංකුවේ සමාජ සුභසාධන වැඩසටහනේ සැලකියයුතු අංගයක් වන්නේ සීමාරහිත බැංකුකරණ සංකල්පය වන අතර එහිදී බැංකුකරණ සේවා අනුග්‍රාහක පොළි අනුපාත සහිතව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කාන්තා ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා ලබා දේ.

සමස්ථයක් වශයෙන්, RDB එහි සමස්ත කාර්ය මණ්ඩලයේ සහයෝගය සහ කැපවීම සමඟ රටතුළ ප්‍රධාන සමාජ සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ සැලකියයුතු දායකත්වයක් ලබාදීමට සමත් වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවට රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශය වෙත ශක්තිමත් නිදසුනක් ලෙස පෙනී සිටිය හැකිය.

රජයේ පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම්

දුෂ්කර ප්‍රදේශවල පාසල් තුළ සනිපාරක්ෂක පහසුකම් නගාසිටුවීමේ අරමුණ සඳහා, බැංකුව විසින් මොනරාගල ප්‍රාථමික පාසල, දොඩම්ගස්ලන්ද මහ විද්‍යාලය, ලුල්කඳුර දෙමළ විද්‍යාලය, දෙහිඕවිට ජාතික පාසල, මඩකුඹුර විද්‍යාලය සහ නවගත්තේගම ප්‍රාථමික පාසල සඳහා සනිපාරක්ෂක පහසුකම් පරිත්‍යාග කරන ලදී. මෙම ආයතනික සමාජීය වගකීම් (CSR) වැඩසටහන් සඳහා අයවැය වෙන් කිරීම රු.මි. 3ක් විය.



උතුරු සහ නැගෙනහිර ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව සඳහා වියලි සලාක පරිත්‍යාග කිරීම

බැංකුවේ සුභසාධන සංගමය සමඟ සහයෝගිත්වයෙන් කිළිනොච්චි, වවුනියාව සහ මුලතිව් වැනි උතුරු නැගෙනහිර ප්‍රදේශවල ගංවතුරෙන් පීඩාවට පත් ජනතාව වෙත වියලි සලාක පරිත්‍යාග කරන ලදී. එක් ජාතියක් ලෙස අප රටේ සහෝදර සහෝදරියන් වෙත තම සහය ලබාදෙමින් බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්වේච්ඡාවෙන් මෙම වැඩසටහනට සහභාගි විය.



5 වසර ශිෂ්‍යත්ව විභාග සම්මන්ත්‍රණ

රටතුළ පළාත් කිහිපයක් ආවරණය කරමින් 5 ශ්‍රේණියේ සිසුන් සඳහා විභාගයට සූදානම්වීමේ සම්මන්ත්‍රණ සංවිධානය කර ඇත. 2018 ජූලි 16 දින කුරුණෑගලදී මෙය පවත්වන ලදී. මෙයට සමගාමීව එක් එක් සම්මන්ත්‍රණය සඳහා 500කට වැඩි සිසුන්ගේ සහභාගිත්වයක් සහිතව රත්නපුර සහ මහනුවර සම්මන්ත්‍රණ පවත්වන ලදී.



RDB විශාලතම ධාන්‍ය ගුදම විවෘත කිරීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වසර ගණනාවක් තුළ එහි බිම් මට්ටමේ ගනුදෙනුකරුවන් නගා සිටුවීම සහ ඔවුන්ගේ ජීවිත සවිබලගැන්වීම සඳහා සෑමවිටම උත්සාහ දරා ඇත. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා බැංකුව ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇත. 2018 දී පොලොන්නරුව, ඇඹිලිපිටිය සහ කිළිනොච්චිවල මෑතදී ගුදම් විවෘත කරන ලද අතර, එහිදි ගොවීන්ට ඔවුන්ගේ අස්වැන්න ආරක්ෂිතව ගබඩා කළ හැකිය. ගුදමේ ධාරිතාවය මෙට්රික් ටොන් 5,000කි.

ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම ගණනය කළ නොහැකි සෘණාත්මක ආකාරයෙන් ගොවීන්ට බලපෑ හැකිය. අවිධිමත් ගබඩාකරණ භාවිතාවන් ද ඔවුන්ගේ අස්වැන්නේ වටිනාකම අඩුකළ හැකිය. ගුදම් ව්‍යාපෘතිය ගොවීන් මුහුණපාන මෙම ගැටළුවට විසඳුමක් වන අතර, ආරක්ෂිත තත්ත්වයේ ගුදම් පහසුකම ඔවුන්ට පිරිනමයි. මේ තුළ, ඔවුන්ට කෘමීන්, පරපෝෂිතයින්ගෙන්, ජල හානි යනාදි බියක් නොමැතිව ඔවුන්ගේ අස්වැන්න තබාගත හැකිය.

මෙම ව්‍යාපෘතිය මුදල් අමාත්‍යාංශය සහ RDB සමඟ සහයෝගිත්වයෙන් පවත්වා ගෙන යනු ලැබේ. එහිදී, එම ගම සහ ආසන්න ප්‍රදේශවල ගොවීන් වෙත අස්වැන්න ගබඩාකර ගැනීම සඳහා ස්ථානයක් ලබා දේ. මෙම ගුදම ශෝෂක, බොයිලේරු, පොතු ඉවත්කරණ වැනි නවීන තාක්ෂණයෙන් සමන්විත වන අතරම අස්වැන්නේ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ද ඇත.

ධාන්‍ය ගබඩා කිරීම සඳහා ආරක්ෂිත ස්ථානයක් ලබාදීමට අමතරව, බැංකුව විසින් ගොවීන්ට තරඟකාරී මිලකට ඔවුන්ගේ අස්වැන්න අලෙවිකර ගැනීමට ද සහය වන අතර ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගයද ලබා දේ. ගුදම් ලැබීම් මූල්‍යකරණ පහසුකම යටතේ මූල්‍ය පහසුකම් ලබාගැනීමට ගොවීන්ට අවස්ථාව ලබා දෙන අතර, මෙහිදී බැංකුව ඇපයක් ලෙස ධාන්‍ය තොගය ලබාගනී.







ගුදම් ව්‍යාපෘතියේ ප්‍රගතිය

ගුදම	වගාව	බර කි. ග්‍රෑ.	වටිනාකම රු.
උපුල්දෙනිය	වී	182,624	7,305,000
	බඩඉරිගු	115,025	6,096,325
බුත්තල	වී	54,579	2,183,160
	ගම්මිරිස්	7,295	3,364,950
	බඩඉරිගු	4,518	234,936
	කජු මඳ	916	164,880
මුරුන්කන්	වී	695,950	27,986,000
කිළිනොච්චිය	වී	143,162	4,024,296
ඇඹිලිපිටිය	වී	9,683	395,780
මැදිරිගිරිය	වී	875	87,500
මුළු එකතුව (වී)		1,086,873	41,981,736
මුළු එකතුව (බඩ ඉරිගු)		119,543	6,331,261
මුළු එකතුව (ගම්මිරිස්)		7,295	3,364,950
මුළු එකතුව (කජු මඳ)		916	164,880

ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නිරන්තරයෙන් පවත්වනු ලබන විශේෂ සාකච්ඡා සහ පුහුණු වැඩසටහන් තුළින් ග්‍රාමීය සහ අර්ධ නාගරික ජනතාව වගකීම්සහගත පුරවැසියන් බවට පත් කිරීම සඳහා එහි සම්පත් ආයෝජනය කර ඇත. එවැනි උත්සාහයන් වඩා යහපත් ආකාරයෙන් ඔවුන්ගේ එදිනෙදා ජීවිත සැලසුම් කිරීමට, සංවිධානය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහ රුපියල් සහ ශත ඉතිරි කිරීමේ ප්‍රවේශය කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම වෙනුවට අමුද්‍රව්‍ය සහ කාලය ඉතිරි කිරීමේ ක්‍රම තුළින් ඔවුන්ගේ ජීවන රටාවන් උසස් කරලීමේ ක්‍රම සහ විධි ගවේශනය කිරීමට ඔවුන්ට ඉඩදී ඇත. එමෙන්ම RDB විසින් දුර්වල ව්‍යවහාර මඟහැරීමට ව්‍යවසායකයින් සඳහා උපදෙස් සහ මඟපෙන්වීම් ලබාදෙන අතර ඵලදායී සහ අතරමැදි සැසි තුළින් සමාජය වඩා යහපත් කිරීම පිණිස ඔවුන්ගේ ජීවිතවලට මනා වටිනාකම් ගෙන දේ. ඊට අමතරව, තම ව්‍යාපෘති සාර්ථක කර ගැනීමට දක්ෂතාව, ක්‍රියාත්මකබව සහ දැක්ම පිළිබිඹු කරන පුද්ගලයින් විසින් ආරම්භකරන ලද මතු බලාපොරොත්තු සහිත ස්ථාවර ව්‍යාපෘති සඳහා සහයෝගයද බැංකුව ලබා දී ඇත.

දළ විශ්ලේෂණය

අදාළ මෙවලම්, විධිමත් ප්‍රතිපත්ති, ව්‍යවහාර සහ ක්‍රියාවලි භාවිතා කරමින් මානව ප්‍රාග්ධනය අත්කරගැනීම, සංවර්ධනය සහ සහභාගිත්වය තුළ ක්‍රමෝපායික සහ ඒකාබද්ධ ප්‍රවේශයක් යොදා ගනිමින් ස්ථිර ආකාරයකින් ව්‍යාපාර අරමුණු අත්කරගැනීම තුළ බැංකුව මැදිහත් වේ. මෙම සාකල්‍ය ප්‍රවේශය බැංකුවේ ව්‍යාපාර පරමාර්ථ මෙන්ම සේවක සුභසාධනය අත්කරගැනීම කරා උපකාරී පරිසරයක් නිර්මාණය කර ඇති අතර, එය සේවක ඵලදායිතා බලපෑම වැඩිකර ඇත.

ආයතනික සැලැස්ම තුළ හඳුනාගත් ශාඛා මෙහෙයුම් සහ අනෙකුත් ව්‍යාපාර අවශ්‍යතා පරිමාණය කිරීම මත පදනම් වී මිනිස්බල අවශ්‍යතාව තක්සේරු කර ඇති අතර කාර්යාත්මන ඒකාබද්ධවීම සහ ක්‍රමෝපායික පෙළගැස්ම ඇති කිරීම පිණිස සේවක ව්‍යූහ, ක්‍රියාකාරිත්වය සහ සේවක සංයුතීන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලබයි.

ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක සහ මානව සම්පත

ප්‍රධාන මූල්‍ය කාර්යසාධක දර්ශක (රු.මි.) පවත්වා ගනිමින් බැංකුවේ සේවකයින් පසුගිය වසරට සාපේක්ෂව සංවර්ධන ණය කළඹ සැලකියයුතු ලෙස වැඩිකර ගැනීමට දායක වී ඇති බැවින් ශ්‍රමබලකායේ ඵලදායිතාව සම්බන්ධ ප්‍රධාන මූල්‍ය කාර්යසාධක දර්ශක 2018 දී අඛණ්ඩව වර්ධනය වී ඇත.

2016-2018 සඳහා ශ්‍රමබලකායේ ඵලදායිතා බලපෑම සම්බන්ධ ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක

	2016 රු.	2017 රු.	2018 රු.
මුළු මෙහෙයුම් ලාභය	2,130	3,307	**3,606**
මුළු ආදායම	15,744	22,016	**26,071**
ණය කළඹ	106,806	130,325	**137,770**
තැන්පතු කළඹ	107,032	139,827	**141,560**
මුළු පුද්ගලයින් ගණන (FTE)	2,342	2,395	**2,345**
ශ්‍රම බලකායේ මුළු පිරිවැය	4,699	5,346	**6,225**
FTE කට ආදායම	6.72	9.19	**11.12**
FTE කට ලාභය	0.91	1.38	**1.54**
FTE කට තැන්පතු කළඹ	45.70	58.38	**60.37**
FTE කට ණය කළඹ	45.60	54.42	**58.75**

මිනිස්බල ශක්තිය

බැංකුවේ මිනිස්බලය ස්ථිර සහ කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යා තනතුරු සඳහා සේවයේ යොදවා ඇති සේවකයින්ගෙන් සමන්විත වේ. එයට අමතරව, දොරින් දොර ක්ෂේත්‍ර සහයකයින් (ස්ථිර කාල ගිවිසුමකට පරිවර්තනය කරන ලද) සහ ග්‍රාමීය නායකයින් (ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය හා සම්බන්ධ) බැංකුව වෙත මිනිස්බල සේවා ලබා දේ. එමෙන්ම, විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල, පිළිගත් වෘත්තීය ආයතන සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබන පාසල් හැරයන්නන්ගේ ඉල්ලීම පරිදි පුහුණුව (මාස 6 -12) අවශ්‍ය කරන අභ්‍යාසලාභීන් සඳහා බැංකුව අවස්ථාවන් ලබා දේ. මෙවැනි වර්ගීකරණ බැංකුවේ කාර්යසාධනයට වටිනා යෙදවුම් ලබා දේ. මිනිස්බල ශක්තිය පිළිබඳ සාරාංශය පහත පරිදි වේ:

මිනිස්බල වර්ගය	පුද්ගලයින් ගණන
ස්ථිර/කොන්ත්‍රාත් සේවකයින්	2,345
දොරින් දොර ක්ෂේත්‍ර සහයකයින්	399
ග්‍රාමීය නායකයින්	340
මුළු පුද්ගලයින් ගණන	3,084

2018 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා තනතුරු ගණන 2,345ක් විය. පළාත් අනුව සේවක සංඛ්‍යාවේ බෙදියාම පහතින් දැක්වේ:

පළාත	ශාඛා ගණන	පුද්ගලයින් ගණන	%
බස්නාහිර	34	285	12.15
මධ්‍යම	33	287	12.24
උතුරු මැද	32	248	10.58
දකුණු	54	387	16.50
ඌව	26	195	8.32
සබරගමුව	34	257	10.96
වයඹ	35	321	13.69
නැගෙනහිර	20	159	6.78
ප්‍රධාන කාර්යාලය	–	206	8.78
	268	2,345	100.00

රැකියා වර්ගය මෙන්ම කළමනාකරණ මට්ටම් අනුව පුද්ගලයින් බෙදියාම පහතින් දැක්වේ:

රැකියා වර්ගය	පුද්ගලයින් ගණන	කළමනාකරණ මට්ටම	%
සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි	1	ආයතනික කළමනාකරණය	0.34
නි.සාමාන්‍යාධිකාරී/ අංශ ප්‍රධානි	7		
ප්‍රා.නි.සා/ජ්‍යෙ.ස.සා	11	ජ්‍යෙෂ්ඨ කළමනාකරණය	1.24
සහකාර.සාමා	18		
ප්‍රධාන කළමනාකරු	51	විධායක කළමනාකරණය	6.52
ජ්‍යෙෂ්ඨ කළමනාකරු	102		
සහකාර කළමනාකරු	926	විධායකයින්	43.93
නිලධාරී ශ්‍රේණිය IV	104		
බැංකු සහකාර සහ ආශ්‍රිත	981	ලිපිකාර සහ	41.83
රියදුරු	60	වෙනත් ශ්‍රේණි	6.14
කාර්යාල සහයක/කම්කරු	84		
මුළු පුද්ගලයින් ගණන	2,345		100.00

බැංකුව පිරිමි සහ කාන්තා යන දෙවර්ගයටම සමාන අවස්ථා ලබාදෙන අතර එහි විස්තර පහතින් දැක්වේ:

ස්ත්‍රී පුරුෂභාවය	පුද්ගලයින් ගණන	%
කාන්තා	1,031	43.97
පිරිමි	1,314	56.03
එකතුව	2,345	100.00

වෘත්තීමය අභිවර්ධනය

බැංකුකරණ මෙහෙයුම් සහ වඩා යහපත් ගනුදෙනුකාර සේවාව සඳහා සේවක ආකල්පය වෙනස් කිරීමට සහ දැනුම වර්ධනයට මෙන්ම ඉගෙනුම් අත්දැකීම ලබාගැනීමට බැංකුව අඛණ්ඩව ඉදිරියට යන පුහුණු ලබා දී ඇත. වසර තුළ, සහභාගිවූවන් 2,493ක් සමඟ වැඩසටහන් 81ක් පවත්වන ලදී. පිරිස් කළමනාකරණය පිළිබඳ වරලත් ආයතනයේ (CIPM) සහයෝගිත්වයෙන් ප්‍රධාන කළමනාකරුවන් 40ක් වෙත විධායක සංවර්ධන වැඩසටහන් විෂයපථය යටතේ සය මාසික වෘත්තීය අභිවර්ධන පුහුණුව ලබාදෙන ලදී.

බැංකුව විසින් සහය ලබාදෙන විවිධ ව්‍යාපෘති පිළිබඳ මනා ව්‍යවහාර සහ ඉගෙනුම් අත්දැකීම ලබාදීම සඳහා අවස්ථාව ලබාදිමේ අරමුණ සමඟ ශාඛාවල කාර්ය මණ්ඩලයෙන් බහුතරය නියෝජනය කළ 240ක සහභාගිවූවන් සහිතව කණ්ඩායම් හයක් පිලිපීනය සහ ඉන්දුනිසියාව තුළ විදේශීය නිරාවරණය සූදානම් කරන ලද අතර මෙහිදී ගොවීන්, ධීවරයින් සහ ව්‍යවසායකයින් සඳහා නව්‍යකරණ කෘෂිකර්මය සහ වටිනාකම් දාම මූල්‍යකරණ යෝජනා ක්‍රම සහ කෘෂිකාර්මික වටිනාකම් දාම මූල්‍යකරණයට සහයවන මූල්‍ය උපකරණ පිළිබඳ ඔවුන් පුහුණු කර ඇත. ඊට අමතරව, නිලධාරීන් 9ක් සඳහා ඔවුන්ගේ ක්‍රියාත්මක ක්ෂේත්‍ර පිළිබඳ දැනුම ඇති කරන විදේශීය පුහුණු සඳහා අවස්ථාවන් ලබාදෙන ලදී. 2015 සහ 2016 විශිෂ්ඨතම ශාඛාව දිනාගත් ශාඛා කාර්ය මණ්ඩලය සඳහා විදේශ සංචාර ලබා දී ඇත. වසර තුළ දේශීය සහ විදේශීය පුහුණු සඳහා මුළු ආයෝජනය රු.මි. 60.88ක් විය.

සේවකයින් පිළිගැනීම

2017 වසර තුළ බැංකුවේ කාර්යසාධනයට දායක වූ කාර්ය මණ්ඩලය පිළිගැනීම සඳහා විශිෂ්ඨතම කාර්යසාධන ප්‍රදානය පවත්වන ලදී. මෙම ක්‍රමය එක් එක් ප්‍රදාන වර්ගීකරණය යටතේ පැහැදිලි නිශ්චිත නිර්ණායක සමඟ හඳුන්වා දී ඇති අතර කණ්ඩායම් කාර්යසාධන වර්ගීකරණය යටතේ විශිෂ්ඨතම කාර්යසාධකයින් තෝරා ගන්නා ලදී. සම්මාන ප්‍රදානෝත්සවය ජාතික මට්ටමේ උත්සවයක් ලෙස පවත්වන ලද අතර, ප්‍රධාන ආරාධිතයා ලෙස රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා සහ අමාත්‍යංශයේ නිලධාරීන් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයද සහභාගි විය. බලන්ගොඩ ශාඛාව සමස්ථ කාර්යසාධනය සඳහා ප්‍රථම ස්ථානය දිනාගත් අතර තවත් සම්මාන 40ක් කාර්යසාධනයේ විවිධ වර්ගීකරණ වෙත ලබා දෙන ලදී. බැංකුව තුළ වසර 25ක සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර ඇති සේවකයින් 206 ක් රන් සම්මානයෙන් පිළිගනු ලැබිය.

මැසිවිලි නිරාකරණය

සන්නිවේදනය වර්ධනය කිරීම මගින් වියහැකි ගැටුම් විසඳීම අපේක්ෂා කරමින් කාර්ය මණ්ඩලය ආශ්‍රිත ගැටළු සහ මැසිවිලි සාකච්ඡා කිරීම සඳහා යාන්ත්‍රණයක් බැංකුව හඳුන්වාදෙන ලදී. මානව සම්පත ආශ්‍රිත ගැටළු සාකච්ඡා කිරීම සඳහා කාර්තුමය පදනමක් මත දින නියම කරමින් සහ කාර්ය මණ්ඩලය ඒ පිළිබඳව දැනුවත් කරමින් ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් මට්ටමින් සේවක දිනයක් ප්‍රකාශයට පත් කරන ලදී.

සේවක ප්‍රතිලාභ

RDB හි සේවකයින්ගේ වැටුප් 2018 සිට වසර තුනක කාලසීමාවක් සඳහා 14.5% සිට 50% දක්වා වැඩි කරන ලදී. 2019 ජනවාරි සිට රාජ්‍ය බැංකුවලට සමානව සියලුම ශ්‍රේණිවලට අදාළ වැටුප් ගැලපීමට තීරණය කරන ලද අතර වැටුප් නොවන ප්‍රතිලාභ වැඩි කිරීම අනෙකුත් රාජ්‍ය බැංකු ප්‍රතිශෝධනය අවසන්කරන තුරු නොගෙවා ඇත.

මූල්‍යමය වශයෙන් සාධාරණ විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ඇති කිරීමට තක්සේරු කරන ලද ආයුගණක ඇගයීම් කිහිපයක් තුළ සහභාගිවීම සඳහා RDB හි සක්‍රීය සේවකයින්ට හැකිවීම පිණිස විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් යෝජනා කිරීමට වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කිරීම සඳහා පියවර නැවත ආරම්භ කරන ලදි.

අත්කර ගැනීමෙන් පසු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ (LDB) කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය සමඟ, CIPM ශ්‍රී ලංකා විසින් පවත්වන ලද මානව සම්පත් නිසි පරිදි යෙදීමේ වාර්තාව තුළින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සක්‍රිය සේවකයින් 165ක් අන්තර්ග්‍රහනය කර ගැනීමට පියවර අරම්භ කරන ලදී. ඒකාබද්ධ කිරීමේ බලපෑම තුළ, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ග්‍රාමීය ව්‍යවසායකයින්, ව්‍යාපෘති මූල්‍යකරණය, සංවර්ධන මූල්‍යකරණය සහ ක්ෂුද්‍ර ව්‍යවසාය සංවර්ධනයට සේවය සලසන ඒකාබද්ධ ආයතනයක අරමුදල් අවශ්‍යතාවන් පිළිබඳ වඩා පුළුල් කළඹක් සපයාදීම සඳහා RDB විසින් එහි ව්‍යාපාර කටයුතු නැවත මෙහෙයවීම සහ විවිධාංගීකරණය කිරීම කරනු ඇතැයි බලාපොරොත්තු විය හැක. මානව සම්පත් නිසි පරිදි යෙදීමේ වාර්තාව තුළ යෝජනා කරන පරිදි RDB හි වර්තමාන සේවක සංඛ්‍යාවට ඒකාබද්ධ කිරීම සඳහා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ පළපුරුදු සහ දක්ෂ සේවකයින් අන්තර්ග්‍රහනය කිරීමට නැවත ස්ථානගතකිරීමේ සැලැස්මක් පිළියෙල කරන ලද අතර, RDB සමඟ එක්වීමට අකැමැති අය සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම (VRS) සඳහා අවස්ථාව පිරිනැමීමේ යෝජනාවද අවසන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් අනුකමිටුව

ආයතනික පාලන ව්‍යවහාර සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස්වලට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ නාමයෝජනා කමිටුව ලෙස වෙනස් අනු කමිටු දෙකක් සකස් කරන ලදී. මෙම අනුකමිටු දෙක බැංකුවේ සභාපති විසින් මෙහෙයවනු ලැබේ. 2018 වසර තුළ නාමයෝජනා කමිටු රැස්වීම් තුනක් සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු රැස්වීම් හතරක් පවත්වන ලදී.



"RDB පා ගමන"

ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් සන්නාම ගොඩනැගීමක් සහ සන්නාම දැනුවත් කිරීමේ වැඩසටහනක් ලෙස 2018 නොවැම්බර් 3 දින දිවයින පුරා ප්‍රධාන නගර අටක "RDB පා ගමන" පවත්වන ලදී. සියලුම කාර්ය මණ්ඩලය සහ විශ්වාසවන්ත ගනුදෙනුකරුවන් දහස් ගණනක් මෙම අවස්ථාවට සහභාගි විය. මෙම අවස්ථාව තුළ, මෙම වැඩසටහනට සමගාමීව එම දිනය තුළ පාරිසරික ආරක්ෂාව සහ පැල සිටුවීමේ වැඩසටහන් අටක් ද සංවිධානය කරන ලදී.



පාසල් ඉතුරුම් ඒකක

RDB හි නැගෙනහිර පළාත් කාර්යාලයේ අධීක්ෂණය යටතේ, පාසල් ළමුන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ව්‍යාපාර සහය සේවා, ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා විසින් 2018 නොවැම්බර් 3 දින මඩකලපුවේ පාසල් කිහිපයක පාසල් ඉතුරුම් ඒකක විවෘත කරන ලදී.



"කැකුළු" ළමා ගිණුම් ප්‍රවර්ධනය

"කැකුළු" ළමා ගිණුම් ප්‍රවර්ධනය කිරීමට සහ ළමුන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමට. RDB හි වයඹ ශාඛා විසින් ලෝක ළමා දිනය සනිටුහන් කිරීම සඳහා 2018 සැප්තැම්බර් ප්‍රවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහනේ කොටස් ලෙස, තෝරාගත් ළමුන්ට බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලද දෙමව්පියන් සමඟ හෝමාගම ලෙජර් වර්ල්ඩ් නැරඹීම සඳහා අවස්ථාවක් ලැබුණි.



ලෝක ළමා දින වැඩසටහන සැමරීම

RDB හි සියලුම ශාඛා 2018 සැප්තැම්බර් 30 දින ළමා දින වැඩසටහන් සංවිධානය කරන ලදී. පෙර පාසල් සහ ප්‍රාථමික පාසල්වල ළමුන් දහසක් පමණ මෙම වැඩසටහන් තුළ තරඟ කිහිපයකට සහභාගි වූ අතර ජයග්‍රහකයින්ට සහතිකපත් සහ තෑග්ග ප්‍රදානය කරන ලදී.



උතුරු මැද පළාත් දානය පිරිනැමීම

උතුරු මැද පළාත් කාර්යාලය විසින් සංවිධානය කරන ලද වාර්ෂික දන්දීම් කළමනාකරණය සහ කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් 2018 ජූනි අනුරාධපුර මහ විහාරයේදී පවත්වන ලදී.



රන් සම්මාන උත්සවය

RDB හි සේවාව අගය කිරීම තුළ, පවුලේ සාමාජික සේවා විශිෂ්ඨත්ව සම්මානෝත්සවය BMICH හිදී පවත්වන ලදී. RDB හි වසර 25ක ගමන් වාර්තාව සම්පූර්ණ කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් 205ක් වෙත මෙම විශේෂ උත්සවයේදී සම්මාන පිරිනමන ලදී.



ජාතික යොවුන් දිනය සැමරීම

"ජාතික යොවුන් දිනය" සැමරීම වෙනුවෙන්, ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු අග්‍රාමාත්‍යවරයාගේ සහභාගිත්වයෙන් තරුණයින් අතර එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් නෙලුම් පොකුණේදී සංවිධානය කරන ලදී.



මොනරාගල එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය තුළ සහභාගිවීම

ජාතික වගකීමක් ලෙස, බැංකුව මොනරාගල අගෝස්තු 29, 30 සහ 31 පැවති "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ප්‍රදර්ශනයට සහභාගිවීම. ඌව පළාතේ තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ණය බෙදාහරින ලදී.



දොරින් දොර නියෝජිතයින්ගේ වාර්ෂික හමුව

RDB විසින් ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට හඳුන්වාදෙන ලද අපගේ අසමසම දොරින් දොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා නියෝජිතයින් 268ක් සිටී. බැංකුව වෙනුවෙන් ඔවුන්ගේ වටිනා සේවාව අගය කිරීම තුළ මෙම නියෝජිතයින් සඳහා වාර්ෂික හමුව සංවිධානය කරන ලදී.



CDM යන්ත්‍ර ස්ථාපනය

නව තාක්ෂණය සමඟ පෙළ ගැසෙමින්, RDB හි පළමු CDM යන්ත්‍රය කැලණිය වෙදමුල්ල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී ස්ථාපිත කරන ලදී.



නව සභාපතිතුමාගේ පත්වීම

නීතිඥ සුජිත් කාරියවසම් මහතා RDB හි 5ස්වැනි සභාපති ලෙස රාජකාරි භාර ගැනීම.



සාමූහික ගිවිසුම අත්සන් කිරීම

බැංකුවේ සේවකයින් ජාතික ආර්ථිකයේ ජීවනාලිය ලෙස සලකනු ලබයි. ශ්‍රී ලංකාව තුළ පුරෝගාමී සංවර්ධන බැංකුව ලෙස, ශ්‍රී ලංකාව තුළ අනෙකුත් රාජ්‍ය බැංකු සමඟ වැටුප සහ අනෙකුත් දීමනා ගලපමින් 2018 සිට 2022 දක්වා සාමූහික ගිවිසුමක් අත්සන් කරන ලදී.

ශාඛා නැවත ස්ථානගතකිරීම්



කලුතර

කලුතර ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 මාර්තු 21 දින සභාපති කස්තුරි අනුරාධනායක මහතා විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



තිස්සමහරාමය

තිස්සමහරාමය ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 අප්‍රේල් 10 දින සභාපති කස්තුරි අනුරාධනායක මහතා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ප්‍රියන්ත අබේසිංහ මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



පිටිගල

පිටිගල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 මැයි 15 දින සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කිරීම.



හතරලියද්ද

හතරලියද්ද ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 ජූනි 28 දින සභාපති කස්තුරි අනුරාධනායක මහතා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ප්‍රියන්ත අබේසිංහ මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.





පූජාපිටිය

පූජාපිටිය ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 ජූනි 28 දින සභාපති කස්තුරි අනුරාධනායක මහතා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ප්‍රියන්ත අබේසිංහ මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



නාත්තණ්ඩිය

නාත්තණ්ඩිය ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 ජූලි 2 දින සභාපති කස්තුරි අනුරාධනායක මහතා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂ, ප්‍රියන්ත අබේසිංහ මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



කලවාන

කලවාන ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 සැප්තැම්බර් 3 දින ක්‍රියාකාරී අධ්‍යක්ෂ, කේ. අමරසිංහ මහතා විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



කටුගස්තොට

කටුගස්තොට ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 ඔක්තෝබර් 22 දින සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



ලග්ගල

ලග්ගල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 නොවැම්බර් 21 දින සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



දමන

දමන ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 දෙසැම්බර් 10 දින සභාපති සුජිත් ප්‍රසන්න කාරියවසම් මහතා විසින් සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා සමඟ උත්සවාකාරයෙන් විවෘත කිරීම.



රිදීමාලියද්ද

රිදී මාලියද්ද ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන ගිය අතර 2018 දෙසැම්බර් 17 දින සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. ටී.ඒ. ආරියපාල මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කිරීම.

6.

කළමනාකාරිත්වය

ආචාරශීලි පැවැත්ම සහ අවංකකම ප්‍රධානම අංග වන අතර, ඉන් අපගේ පාර්ශවකරුවන්ගේ විශ්වාසය ලබාදේ. අපගේ හොඳින් අර්ථ දක්වා ඇති නිශ්චිත සහ ඵලදායී පාලන ව්‍යූහය සහ අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය අප ආයතනය සහ එහි තිරසාරත්වයේ ශක්තීන් ප්‍රවර්ධනය කරයි.


1


2


3


4


5


6


7


8

1. ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා
සභාපති

ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා 2018 ඔක්තෝබර් 01 දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති ලෙස රාජකාරි භාර ගන්නා ලදී.

ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා කොළඹ කේරි විද්‍යාලය සහ ඩී.එස්. සේනානායක විද්‍යාලවල දීප්තිමත් ආදි සිසුවෙක් වූ අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (ගෞරව) උපාධිධරයෙක්. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ ජ්‍යේෂ්ඨ සාමාජිකයෙක් වන අතර, වෘත්තීයෙන් නීතිඥයෙක්ද වේ.

කාරියවසම් මහතා රාජ්‍ය ආයතන ගණනාවක ඉහළ තනතුරු දරා ඇති අතර, ඔහු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව, කුඩා තේවතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල, සහ ශ්‍රී ලංකා පොල් සංවර්ධන අධිකාරිය (CDA) යන ආයතනවල හිටපු සභාපතිවරයාද වේ.

මෙහි (CDA) සේවා කාලය තුළ ආසියා සහ පැසිපික් පොල් ප්‍රජාවගේ ශ්‍රී ලංකාවේ ජාතික සම්බන්ධීකරණ නිලධාරියා ලෙස ඔහු සම්මානයට පාත්‍ර විය. ඔහු මග නැගුම ඉමල්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස සහ දීර්ඝ කාලසීමාවක් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කර ඇත.

එමෙන්ම, ඔහු පොල් වගාකිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය, මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ මගනැගුම ඉමල්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙසද සේවය කර ඇත.

2. කේ.බී. රාජපක්ෂ මහතා
අධ්‍යක්ෂ

කේ.බී. රාජපක්ෂ මහතා මහජන බැංකුවේ ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාරිභෝගික බැංකුකරණය) වන අතර, වාණිජ සහ සංවර්ධන බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 31 කට වැඩි පළපරැදිද ඇත. ඔහු නීතිඥයෙක් වන අතර, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෙවන පෙළ ගෞරව උපාධිධාරියෙක්ද වේ.

ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාව, කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව ඔහු සතු වන අතර ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක්ද වේ.

වර්තමානයේ, රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ කෘෂිකර්ම සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරමින් සිටින අතර, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ විකල්ප අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරයි.

3. එම්.ජේ.පී. සල්ගාදු මහතා
අධ්‍යක්ෂ

සල්ගාදු මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක් දරන ලංකා බැංකුවේ ස්ථිර සේවකයෙකි. ඔහුගේ වර්තමාන ව්‍යාපාර කළඹට නිෂ්පාදන සංවර්ධනය සහ ව්‍යාපාර ක්‍රියාවලි නැවත සැකසීමේ ව්‍යාපෘතිය, විද්‍යුත් බැංකුකරණය සහ හර/ණය කාඩ් මෙහෙයුම්, මධ්‍යම පසු කාර්යාලය, DMS ව්‍යාපෘතිය සහ සංවිධානය සහ ක්‍රම ඇතුළත්ය.

පළාත් අලෙවි කළමනාකරණය, ප්‍රමුඛ බැංකුකරණය, ISSP ක්‍රියාත්මක කිරීම, විශේෂ ව්‍යාපෘති, ඇමතුම් මධ්‍යස්ථානය සහ ලංකා බැංකු ආරක්ෂණය යන ක්ෂේත්‍රවල විවිධ පළපුරුද්ද ලබා ගනිමින් වසර 29ක පළපුරුද්ද ඔහු සතුය. ලංකා බැංකුවේ “වෙනස පරිවර්තන ව්‍යාපෘතිය” තුළ සක්‍රීය සාමාජිකයෙක් ද විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් දෙවන පෙළ ඉහළ වාණිජවේදී උපාධිය ඔහු සතු වේ. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකයෙක්ද වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික සහතිකපත්ධාරියෙකු මෙන්ම, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ ආයතනයේ සාමාජිකයෙක්ද වේ. බැංකුව භාර එක්වීමට පෙර, සල්ගාදු මහතා ගණකාධිකාරීවරයෙක් ලෙස මහවැලි ඉංජිනේරු සහ ඉදිකිරීම් ආයතනයේ සේවය කර ඇත.

4. ඒ.කේ. සෙනෙවිරත්න මහතා
අධ්‍යක්ෂ (2019 පෙබරවාරි 21 දින පත්කළ)

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

සෙනෙවිරත්න මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධිධාරියෙකි. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත.

ඔහු 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳී ඇත. ඔහුගේ සේවාස්ථ පුහුණු වසර අවසන් කිරීමෙන් පසු, 1996 දී මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙක් ලෙස ඔහු පත්කරන ලදී. 2006 දී, එම අමාත්‍යාංශයේම ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කරන ලද ඔහු 2015 දී, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත්කරන ලදී. 2018 පෙබරවාරි මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙක් ලෙස ඔහු පත්කරන තුරු ජනවාරි සිට, සෙනෙවිරත්න මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කර ඇත.

සෙනෙවිරත්න මහතා රජයට අයත් ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙස සේවය කර ඇත.

5. කේ.බී. විජයරත්න මහතා
අධ්‍යක්ෂ

කිත්සිරි බී විජයරත්න මහතා ජාතික ඉතුරු කිරීමේ බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ සැලසුම් වන අතර රක්ෂණය සහ බැංකුකරණය ක්ෂේත්‍රය තුළ විස්තීර්ණ පළපුරුද්ද සහිතව ප්‍රමුඛ මූල්‍ය ආයතනවල ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරුවල සේවය කරමින් දේශීය සහ විදේශීය වශයෙන් විගණන සහ මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ වසර 35ක පළපුරුද්දක් ඔහුට ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (FCA) සහය සාමාජිකයෙක් මෙන්ම ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ (FCMA) සහය සාමාජිකයෙක්ද වන අතර ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (FMMAT) ජ්‍යේෂ්ඨ සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) සහය සාමාජිකයෙක් මෙන්ම වෘත්තිකවේදීන්ගේ සංවිධාන ආයතනයේ (OPA) සාමාජිකයෙක්ද වේ.

විජයරත්න මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දෙවන පෙළ ගෞරව උපාධිධාරියෙක් වන අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) රාජ්‍ය මූල්‍ය සහ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකි (DPFM).

6. ඒ.ආර්. දේශප්‍රිය
අධ්‍යක්ෂ (2019 ජනවාරි ඉල්ලා අස්විය)

ඒ.ආර්. දේශප්‍රිය මහතාට රාජ්‍ය සේවය තුළ වසර 32ක සේවා පළපුරුද්ද ඇත. දැනට ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

මෙම කාලසීමාව තුළ, රාජ්‍ය සේවා කටයුතුවල විවිධ ක්ෂේත්‍රවල ඔහු සේවය ඇති අතර මහා භාණ්ඩාගරයේ අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ ජනරාල් යන විවිධ තනතුරු ඔහු දරා ඇත. වර්තමානයේ ඔහු මහා භාණ්ඩාගරයේ නියෝජ්‍ය ලේකම් තනතුරක් දරයි.

එමෙන්ම ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයෙක් ලෙස සේවය කර ඇති අතර ශුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ සාමාජිකයෙක්ද වේ.

ඒ.ආර්. දේශප්‍රිය මහතා ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය මෙන්ම ස්ලෝවේනියාවේ ලුබ්ලිජනා විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියද උසුලයි.

7. කේ. අමරසිංහ මහතා
අධ්‍යක්ෂ - විධායක අධ්‍යක්ෂ (2019 අප්‍රේල් 4 දක්වා)

කේ. අමරසිංහ මහතා 2018 ජූලි 31 දින බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස රාජකාරී භාරගෙන ඇත.

වතු පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ භාෂා පිළිබඳ ඩිප්ලෝමාවක් (ජපන් භාෂාව) ඔහු සතුය.

ඔහු ශ්‍රී ලංකා ඉතුරුම් බැංකුවේ වැඩබලන සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත. ඔහු වෙළෙඳ සහ පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ - විමර්ෂණ විය. එමෙන්ම, ඔහු අවකාශ මීඩියා හි සභාපති ලෙස සහ ජපන් ලංකා ඔටෝ ලැන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සාමාන්‍යාධිකාරී ලෙස ද සේවය කර ඇත. තවද, ඔහු ටයිනි වුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් හි කළමනාකරු - පරිපාලන මෙන්ම කේ. අමරසිංහ ඇන්ඩ් කම්පැනි (දන්ත උපකරණ ආනයනය කරන) හි කළමනාකාර අධ්‍යක්ෂ ලෙස සේවය කර ඇත. එයට පෙර, තිනියාවල තේ වත්තේ වතු පරිපාලකයෙක් ලෙස ද සේවය කර ඇත.

ඔහු 2002 සිට සාම විනිසුරුවරයෙක් (මුළු දිවයිනටම) ලෙස සේවය කරන අතර, දැනට විදුලි, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය ගරු රවි කරුණානායකගේ සම්බන්ධීකරණ නිලධාරියාද වේ.

8. නීල් ද අල්විස් මහතා
අධ්‍යක්ෂ (2019 අප්‍රේල් 4 දක්වා)

නීල් ද අල්විස් මහතා කැනඩාවේ කාර්ල්ටන් විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය (සංවර්ධන පරිපාලනය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙක් වන අතර පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී ගෞරව (ආර්ථික විද්‍යා - විශේෂ) උපාධිය, ගොවි කෘෂිකර්ම සහ ග්‍රාමීය සංවර්ධනය (දෙවන පෙළ ඉහළ) උපාධියද සතුය. එමෙන්ම කොලඹ විශ්ව විද්‍යාලයෙන් විමධ්‍යගත පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමාවක්ද ඔහු සතුය.

අල්විස් මහතා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකි. ඔහු මාතලේ සහ අම්පාර දිස්ත්‍රික් ලේකම්/උපදිසාපති ලෙස සේවය කර ඇත. එමෙන්ම, උතුරු මැද පළාතේ කෘෂිකර්මය, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය, කෘෂි-නිෂ්පාදන අලෙවිකරණ, කාන්තා කටයුතු සහ පළාත් සභා කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශයේ ලේකම් ලෙස ඔහු සේවය කර ඇත. ඒ හැරුණු විට, අල්විස් මහතා ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහකාර ලේකම් - පුහුණු, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් (වැඩබලන), උතුරු මැද පළාතේ තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් ලෙස මෙන්ම කොලඹ නිවාස දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (සංවර්ධන) සහ කොළඹ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ලෙසද සේවය කර ඇත.


1


2


3


4


5


6


7

1. ටී. කුහාන් මහතා
වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි.

ව්‍යක්තීමය බැංකුකරුවෙක් වන ටී. කුහාන් මහතා පිළිගත් පුද්ගලික බැංකු දෙකක එනම් HNB සහ යූනියන් බැංකුවේ සේවය කිරීමෙන් පසු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එක්විය. සංවර්ධන බැංකුකරණය, ආයතනික ණය, ශාඛා බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ වෙළෙඳ මූල්‍යකරණය සඳහා නිරාවරණය සහිතව බැංකුකරණ ක්ෂේත්‍රයෙහි විවිධ කළමනාකාරිත්ව තනතුරුවල අඛණ්ඩව වසර 27ක් සේවය කර ඇත. ඔහු කොලඹ විශ්ව විද්‍යාලයෙන් මූල්‍යකරණ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය මෙන්ම ආර්ථික සංවර්ධනය පිළිබඳ උපාධියද ලබාගෙන ඇත. ඔහුගේ අනෙකුත් සුදුසුකම් වන්නේ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ බැංකු සහ මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ මොරටුව විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ලද යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ තාක්ෂණය තුළ ජාතික ඩිප්ලෝමාව (NDT) ලබාගෙන තිබීමයි. ඔහු IBSL හි ජෙෂ්ඨ සහය සාමාජිකයෙක්ද වේ. එමෙන්ම, ඔහු IBSL හි පරීක්ෂකයෙක් මෙන්ම ආරාධිත කථිකාචාර්යවරයෙක්ද වේ.

2. වී. ජයසිංහ මහතා
ප්‍රධාන තොරතුරු නිලධාරී

වසර විස්සකට වැඩි පළපුරුද්ද සහිත තොරතුරු තාක්ෂණ ව්‍යක්තිකයෙක් වන ජයසිංහ මහතා 2011 ජූනි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එකතු විය. ඔහු මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිධාරියෙකි. එමෙන්ම ඔහුට තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයේ ඉංජිනේරු විද්‍යාපති උපාධිය මෙන්ම එක්සත් ජනපදයේ හවායි විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ඇත. උපාධිය ලබා ගැනීමෙන් පසු, IBM ලෝක වෙළෙඳ සංස්ථාවේ පද්ධති ඉංජිනේරුවරයෙක් ලෙස ඔහුගේ ව්‍යක්තිය ඔහු ආරම්භ කරන ලදී. මූල්‍ය සේවා සහ බැංකුකරණ ක්ෂේත්‍රයේ කළමනාකාරිත්ව තනතුරුවල වසර දහසයකට වැඩි සේවා පළපුරුද්ද ඔහු සතුය. බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සහතිකලත් තොරතුරු තාක්ෂණ ව්‍යක්තිකයෙක් (CITP) මෙන්ම එක්සත් ජනපදයේ ව්‍යාපෘති කළමනාකරණ ආයතනයේ සහතිකලත් ව්‍යාපෘති කළමනාකරණ ව්‍යක්තිකයෙක් (PMP) වන, ජයසිංහ මහතා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය තුළ වරලත් ඉංජිනේරුවරයෙක් ද වේ.

3. කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මහතා
මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන ප්‍රධානී

වසර 32කට වැඩි පළපුරුද්ද සහිත මානව සම්පත් විශේෂඥයෙක් වන, කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මහතා 2014 ජූලි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එකතු විය. ඔහු රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ (SMIB) සහකාර සාමාන්‍යාධිකාරී/ප්‍රධානී (මානව සම්පත් සහ මනා සංවිධාන) ලෙස සේවය කර ඇත. ඔහු ගැම්දිරිය (ලෝක බැංකු ආධාර ලබන ව්‍යාපෘතිය) තුළ අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙක් (මානව සම්පත් හා පරිපාලන) ලෙස සේවය කරන ලදී. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාවේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) ලෙස සහ සමූපාකාර කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ජ්‍යේෂ්ඨ කළමනාකරණ උපදේශක සහ කළමනාකරු (පරිපාලන හා මූල්‍ය) ලෙසද සේවය කරන ලදී.

කරුණාතිලක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් (1986) ව්‍යාපාර පරිපාලන (විශේෂ) විද්‍යාවේදී උපාධිය ලබාගෙන ඇති අතර මානව සම්පත් කළමනාකරණය පිළිබඳ (1996) පශ්චාත් උපාධි සහතිකය මෙන්ම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) MBA ලබාගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා පිරිස් කළමනාකරණ ආයතනයේ (IPM) සහය සාමාජිකයෙක් ද වේ. ඔහු IPM වෙතින් ජාතික මානව සම්පත් විශිෂ්ඨත්ව සම්මාන 2010 ප්‍රතිලාභියෙක් ද වේ. කරුණාතිලක මහතා "සහතිකලත් මානව සම්පත් විගණක" ලෙස IPM වෙතින් මානව සම්පත් සංවර්ධන විගණනය පැවැත්වීම සඳහා සහතික කිරීම ලබාගෙන ඇත.

4. පී.එස්. එදිරිසූරිය මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

එදිරිසූරිය මහතා 1992 දී ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර, කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇත. එදිරිසූරිය මහතාට අර්නස්ට් ඇන්ඩ් යන්ග් - කොළඹ, ජාතික සංවර්ධන බැංකුව සහ සෙලාන් බැංකුව ඇතුළු ප්‍රමුඛ ආයතනවල විගණනය, ගිණුම්කරණය, බදුකරණය, කළමනාකරණ උපදේශනය සහ බැංකුකරණ සහ මූල්‍යකරණය යන ක්ෂේත්‍රවල වසර 28කට වැඩි පළපුරුද්ද ඇත. ඔහු 2017 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එකතුවිය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස ඔහුගේ පත් කිරීමට පෙර, ඔහු ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, අනුකූලතා නිලධාරී සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු දරා ඇත.

5. ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ අයකිරීම්

ජයසිංහ මහතා 1986 දී ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබාගෙන ඇත.

ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව මෙන්ම වයඹ විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ NIBM ශ්‍රී ලංකා වෙතින් ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ වයඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියද ලබාගෙන ඇත.

උපාධිය ලබාගැනිමෙන් පසු, ඔහු 1987 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එකතු වී ඇති අතර, ශාඛා කළමනාකරු, කලාප කළමනාකරු, දිස්ත්‍රික් කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන මට්ටම්වල සේවය කර ඇත. ජයසිංහ මහතාට බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 31 කට වැඩි පළපුරුද්ද ඇත.

6. සී.එල්. පිහිල්ලන්ද මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ ව්‍යාපාර සහය

පිහිල්ලන්ද මහතා කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය සාර්ථකව නිමකර ඇත. ඔහු පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබාගෙන ඇත. එමෙන්ම, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් අතරමැදි විභාගය සමත්විය. ඔහු කළමනාකරුවෙක් ලෙස බැංකුව සමඟ එක්විය. (මෙයට පෙර මහනුවර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව/RRDB) බැංකුකරණය පිළිබඳ ඔහුගේ වෘත්තිය තුළ, සබරගමුව සහ දකුණු පළාත්වල ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී ලෙස මෙන්ම ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන කළමනාකරණ මට්ටම්වල විශාල පරාසයක පළපුරුද්ද ඔහු අත්කර ගෙන ඇත. ඔහුට බැංකුකරණ ක්ෂේත්‍රය තුළ වසර 31 කට වැඩි පළපුරුද්ද ඇත.

7. එන්.එස්. තිලකරත්න මහත්මිය
විගණන ප්‍රධානී

තිලකරත්න මහත්මිය 2017 අප්‍රේල් සිට බැංකුවේ විගණන ප්‍රධානී ලෙස පත්කර ඇත. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවකි. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දෙවන පෙළ ඉහළ සමාර්ථයක් සහිතව විද්‍යාවේදී විශේෂ උපාධිය ලබාගෙන ඇත. එමෙන්ම ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජිකාවක්ද වේ. ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉන්දියාවේ වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ තාක්ෂණික සහයෝගිත්වය ඇතිව පවත්වනු ලබන තොරතුරු පද්ධති ආරක්ෂක පාලනයන් සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාව ලබාගෙන ඇත. බැංකුව සමඟ එකතුවීමට පෙර, ඇය මහජන බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරිය වූ අතර ව්‍යාපෘති ණය දීම සහ විගණනය පිළිබඳ වසර 28ක පළපුරුද්ද ඇය සතුය.

ප්‍රාදේශිය සාමාන්‍යාධිකාරිවරු/ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරිවරු





















1. ඩී.එම්.එස් බණ්ඩාර මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

වාණිජවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

2. ඩී.එම්.ටී.එස්. කුමාර මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශාස්ත්‍රපති -
කැලණිය විශ්ව විද්‍යාලය

3. ඩබ්ලිව් එම්.එන් ද සිල්වා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - දකුණු පළාත

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

4. ඒ.එච්.එම්.පී. අබේරත්න මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - උතුරු මැද පළාත

වාණිජවේදී (විශේෂ) උපාධිය - කැලණිය විශ්ව විද්‍යාලය
ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව - විවෘත විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව

5. ජී.එස්. ද සිල්වා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - බස්නාහිර පළාත

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යලය, ශ්‍රී ලංකාව

6. බී.එච්.එම්. එස්. බස්නායක මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - ඌව පළාත

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව -
ඌව විශ්ව විද්‍යාලය

7. සී.එස්. වේරගොඩ මහත්මිය
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - සබරගමුව පළාත

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

8. ආර්.එම්.ආර්. රන්දෙනිය මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - නැගෙනහිර පළාත

ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙනිය විශ්ව විද්‍යාලය
බැංකුකරණය සහ මූල්‍යකරණය පිළිබඳ සහතිකය -
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

9. කේ.පී. දහනායක මහතා
ජ්‍යේෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සංවර්ධනය සහ පරිපාලනය

වාණිජවේදී (විශේෂ) උපාධිය - රුහුණ විශ්ව විද්‍යාලය
කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව -
රජරට විශ්ව විද්‍යාලය

10. ඩබ්ලිව්. එම්.ඩී.එස්. වික්‍රමසිංහ මහතා
ජ්‍යේෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා

වාණිජවේදී (විශේෂ) උපාධිය - රුහුණ විශ්ව විද්‍යාලය
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි
ඩිප්ලෝමාව - කොළඹ විශ්ව විද්‍යලය
බැංකුකරණය තුළ අවදානම් කළමනාකරණය පිළිබඳ
සහතිකය - ස්ටීඩන්


1


2


3


4


5


6


7


8


9


10


11


12


13


14


15


16


17


18



19

1. කේ. ආරියතිලක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ක්ෂුද්‍ර මූල්‍ය

මානව සම්පත් සංවර්ධනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව -
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනය

2. බී.එම්.යූ.එස්. බස්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම්

කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාව -
පැල්වෙහෙර කෘෂිකාර්මික විද්‍යාලය

3. ඩී.එස්.පී.සී. හඳුන්හේවා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, පර්යේෂණ සහ නිෂ්පාදන සංවර්ධනය

ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

4. ඩබ්ලිව්.වී.ඊ.පී. වරකාගොඩ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - භාණ්ඩාගාරය

ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍යම විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

5. එල්.බී. උපාලි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ණය

වාණිජවේදී (විශේෂ) උපාධිය - කැලණිය විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍යම විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

6. බී.ආර්.ඩී. පුෂ්පකුමාරි මහත්මිය
සහකාර සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

වාණිජවේදී (විශේෂ) උපාධිය - කැලණිය විශ්ව විද්‍යාලය

7. ඩී.පී. ධර්මදාස මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙනිය විශ්ව විද්‍යාලය

8. පී.එස්.ටී. රණතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ඌව පළාත

ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය

9. කේ.සී.ඩී. ධර්මප්‍රිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණය

ශාස්ත්‍රවේදී උපාධිය - පේරාදෙනිය විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යේෂ්ඨ සහය සාමාජික

10. පී.එම්.එස්. වික්‍රමරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම්

වාණිජවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය අතරමැදි විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
MAAT

11. එම්.එම්.එම්.එස්. ආනන්ද මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජික

12. බී.පී. ඩබ්ලිව්.ඒ. කුමාර
සහකාර සාමාන්‍යාධිකාරී - නැගෙනහිර පළාත

රාජ්‍ය පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

13. එම්.ඒ. ඥානරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - සබරගමුව පළාත

රාජ්‍ය පරිපාලන විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

14. කේ.බී. විජේරත්න මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී (විශේෂ) උපාධිය -
රජරට විශ්ව විද්‍යාලය
අන්තර්මධ්‍යම විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

15. ජී.එම්.බී.සී. ද සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - උතුරු මැද පළාත

වාණිජවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහය සාමාජික
MBA - වයඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

16. ඩබ්ලිව්.එම්.එස්. විජේතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණය

ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය -
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය -
කොළඹ විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණය පිළිබඳ MBA –
සික්කිනි, මනිපාල් විශ්ව විද්‍යාලය
බැංකු කළමනාකරණය පිළිබඳ PGEXDip -
ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

17. ඩබ්ලිව්.පී.එම්.කේ. දසන්ත මහතා
සහකාර සාමාන්‍යාධිකාරී - ගොඩනැගිලි සහ නඩත්තුව

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය -
මොරටුව විශ්ව විද්‍යාලය
තාක්ෂණය පිළිබඳ PGDip. - ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

18. මේජර් ජෙනරාල් ජගත් පක්ෂවීර
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

RSP, VSV, USP (විශ්‍රාම)

19. ආර්.එම්.ටී. රාජපක්ෂ මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීතිඥ
LLB – කොළඹ විශ්ව විද්‍යාලය

RDB හි ආවදානම් පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ආරම්භවන අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, කමිටු සහ බලය පවරන ලද අධිකාරි මට්ටම් තුළින් ශාඛා මට්ටම දක්වා ගමන් කරයි.

පොදුවේ, බැංකුකරණ ව්‍යාපාරය අවදානම් ව්‍යාපාරයක් ලෙස සලකනු ලබන අතර ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළෙඳපොල අවදානම වැනි අවදානම් වර්ග කිහිපයකට මුහුණ දේ. මෙම ප්‍රධාන අවදානම් වර්ග තුනට අමතරව, ක්‍රමෝපායික අවදානම, ෆොරෙක්ස් (Forex) අවදානම, අනුකූලතා අවදානම, නෛතික අවදානම සහ කීර්තිනාම අවදානම වැනි විවිධ වර්ගයේ වෙනත් අවදානම්වලට ද බැංකු මුහුණ දේ. මෙවැනි වර්ගයේ අවදානම් බැංකුකරණය තුළ අවදානම් කළමනාකරණ ව්‍යවහාර බැංකුවක් සතුවීමේ වැදගත්කම ඉස්මතු කරයි. බැංකුව අවදානම් ආමන්ත්‍රණය නොකරයිනම්, ආයතනය සඳහා මෙය සැලකියයුතු අවදානමකට මෙහෙයවිය හැකිය. එබැවින්, යහපත් සහ හිතකර ආයතනයක් ඇති කිරීම පිණිස, මෙවැනි අලාභ/අවදානම් කළමනාකරණය කර ගැනීමට නවින බැංකුකරණ ක්ෂේත්‍රය තුළ නව ශිල්ප හඳුන්වා දී/සංවර්ධනය කර ඇත. මෙයට සමාගාමීව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් එහි අවදානම් කළමනාකරණය කර ගැනීම පිණිස යහපත් ව්‍යවහාර සහ නව අවදානම් කළමනාකරණ ශිල්ප යොදා ගැනීමේ ක්‍රියාවලිය තුළ නිරතව සිටී.

මෙම කොටස තුළ, පසුගිය මෙහෙයුම් වසර තුළ බැංකුව මුහුණ දුන් එක් එක් අවදානම් වර්ගයට අදාළ තොරතුරු අපි අනාවරණය කර ඇත. මෙවැනි අනාවරණ මගින් බැංකුව විසින් මුහුණ දුන් අවදානම් රුචිය/නිරාවරණ සහ අවදානම් පාලනය සහ එහි අවදානම් නියාමනය කිරීමට ක්‍රියාත්මකව පවතින තක්සේරුකරණ ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු ලබා දේ.

ඒකාබද්ධ අවදානම් පාලනය

ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ අවදානම් පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ආරම්භවන අතර අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, කමිටු සහ බලය පවරන ලද අධිකාරි මට්ටම් තුළින් ශාඛා මට්ටම දක්වා ගමන් කරයි. RDB හි අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුවේ සමස්ථ අවදානම පාලනය කිරීමේ වගකීම ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (BCC), අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් බැංකුවේ සමස්ථ අවදානම් කළමනාකරණය පාලනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහය ලබා දෙන අතර, කළමනාකරණ කමිටු (MC) සහ බැංකුවේ ව්‍යාපාර මාර්ගයෙන් ස්වාධීන පුද්ගලයෙක් (CRO) වන, ප්‍රධාන අවදානම් නිලධාරී සියලුම ව්‍යාපාර මට්ටම්වල දෛනික මෙහෙයුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිරන්තරව වාර්තා ලබා දේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව යනු විධායක අධ්‍යක්ෂ විසින් මෙහෙයවන කමිටුවක් වන අතර ඉන් බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ තීරණ ගැනීමට සහය වී ඇත. මෙම කමිටු බැංකුවේ සමස්ථ අවදානම් පැතිකඩ පිළිබඳ නිර්දේශ ලබාදෙන අතර බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) නිර්දේශ කරනු ලබයි. ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි

සහ ICAAP ප්‍රධාන අවදානම් නිලධාරී සහ ඔහුගේ අංශය කාලීන ආකාරයකින් සකස්කර, සමාලෝචනය කර IRMC වෙත ඉදිරිපත් කරයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ නියාමන අනුකූලතාවය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් පරීක්ෂා කරයි. එමෙන්ම මෙම කමිටුව බැංකුවේ අභ්‍යන්තර විගණනයේ කාර්යසාධනය, නිරවද්‍යතාව සහ ස්වාධීනත්වය තක්සේරු කරයි.

කළමනාකරණ කමිටු යනු බැංකුවේ සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබන කමිටු වන අතර, බැංකුවේ විධායක මට්ටමේ සියලුම පුද්ගලයින් මේවා නියෝජනය කරයි. මෙම කමිටුව කලින් කල සහ අවශ්‍ය අවස්ථාවලදී කැඳවනු ලබයි.

මෙම කමිටුව කලින් කල අවදානම සහ අවිනිශ්චිතතාව අවම කිරීම සඳහා බැංකුවේ සියලුම මෙහෙයුම් මට්ටම්වල වාර්තා සමාලෝචනය කරනු ලබයි.

ප්‍රධාන අවදානම් නිලධාරී යනු ස්වාධීන පුද්ගලයෙක් වන අතර ඔහුට බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ ශිල්ප පිළිබඳව සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ IRMC වෙත සහයවීමේ වගකීම ඇත.

ප්‍රධාන අවදානම් නිලධාරී විසින් මෙහෙයවනු ලබන RMD (අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව) වෙත ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළෙඳපොල අවදානම සහ පොළී අනුපාත අවදානම පිළිබඳ අවදානම කළමනාකරණය සම්බන්ධ එකිනෙකට වෙනස් කාර්යයන් තුනක් ඇත.

අවදානම් පාලන ව්‍යූහය



බැංකුකරණය යනු එයටම ආවේණික විවිධ අවදානම් වර්ගවලට නිරාවරණය වන ව්‍යාපාරයකි. බැංකු විසින් පොදුවේ මුහුණ දෙන ප්‍රධාන සහ වඩාත් ප්‍රත්‍යක්ෂ අවදානම් වන්නේ ණය, වෙළෙඳපොල සහ මෙහෙයුම් අවදානමයි. කෙසේවෙතත්, තාක්ෂණය තුල සංවර්ධනයන්, නියාමනය සහ මෑත කාලීනව පැවති මූල්‍ය අර්බූද මගින් ක්‍රමෝපායික අවදානම, අනුකූලතා අවදානම, නෛතික අවදානම සහ කීර්තිනාම අවදානම වැනි අනෙකුත් අවදානම් වර්ග රාශියකට බැංකුවලට මුහුණ දීමට සිදු වී ඇත. මෙම වාතාවරණය තුළ, වර්තමානයේ සෑම බැංකුකරණ ආයතනයක්ම ඔවුන්ගේ අවදානම් සංස්කෘතිය සහ අවදානම් කළමනාකරණ ව්‍යුහය සම්බන්ධයෙන් වඩා ඉහලින් සලකා බැලීමේ ප්‍රවනතාවයක් පවතී. මෙම කොටස තුළ, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව නිරාවරණය වන ප්‍රධාන මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් අපි විශ්ලේෂණය කර ඇත.

ණය අවදානම් පැතිකඩ

ණය අවදානම යනු ණයකරුවෙක් ණය මුදලක් ආපසු ගෙවීමට හෝ ගිවිසුම්ගත බැඳීමක් සපුරාලීමට අසමත්වීම තුළින් ඇතිවන මුල් මුදල අහිමිවීම හෝ මූල්‍ය ප්‍රතිලාභයක් අහිමිවීම හා බැඳුණු අවදානමයි.

ණයදීමේ කටයුතුවලින් ණය අවදානම් නිරාවරණය

සංවර්ධන බැංකුවක් ලෙස, ණය සහ අත්තිකාරම් ලබාදීම ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ ප්‍රධානතම ව්‍යාපාරය වන අතර එම නිසාම ණය අවදානම් වඩාත් වැදගත් අවදානම වේ. ප්‍රධාන වශයෙන් ණය අවදානම ඇති වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහ පාරිභෝගික ණය සහ අත්තිකාරම්වලින්ය. බැංකුවේ ණය කළඹ තුළ ප්‍රමාණාත්මකබව හේතු කොට ගෙන, කෘෂිකාර්මික ණය, සත්ත්ව නිෂ්පාදන ණය, කර්මාන්ත ණය (SME), වෙළෙඳ සහ සේවා ණය, නිවාස ණය, උකස් ණය, පරිභෝජන ණය සහ තැන්පතු අනුව ණය සහිත මනාව විවිධාංගීකරණය කළ ණය කළඹක් බැංකුව පවත්වාගෙන ඇත.

2018 දී, බැංකුව ණය කළඹ තුළ ඉහළයන ප්‍රවනතාවක් පවත්වා ගනු ලැබීය. එය රු.මි. 137,77 ක් වූ අතර 2017 සිට 2018 දක්වා 6%ක වැඩි වීමකි. බැංකුවේ ණය කළඹ රු.මි. 5 ට වැඩි වර්ගයේ ණය පහසුකම් 729 කින් සමන්විත වූ අතර, ඉහළම ණය ගැණුම්කරුවන් 10 මුළු අත්තිකාරම් කළඹට 0.49%කින් දායක වේ. සංවර්ධන බැංකුවක් ලෙස, ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරය ණය වේ.

අංශය අනුව ශුද්ධ ණය නිරාවරණය බෙදියාම



පාලන ව්‍යූහය

ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ණය අවදානම් කළමනාකරණ සඳහා ප්‍රධාන මාර්ගෝපදේශය වේ. මෙම ප්‍රතිපත්තියට ණය අවදානම හඳුනාගැනීම, කළමනාකරණ කිරීම, අවම කිරීම සඳහා සියලුම ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි සහ ක්‍රම ඇතුළත් කර ඇත. මෙම ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තව සමාලෝචනය කරන අතර, බැංකුවේ ණය ප්‍රතිපත්තිය සහ ආයතනික සහ ව්‍යාපාර ක්‍රමෝපාය සහ අනුරූපතාව සහතික කිරීම සඳහා වසර තුළ යාවත් කිරීම සිදුකරයි.

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු සහ කළමනාකරණ මට්ටමේ කමිටු ද ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ ණය අවදානම් පාලනය තුල නිරත වේ. අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් මෙහෙයවන අතර, කළමනාකරණ ණය කමිටුව ප්‍රධාන විධායක නිලධාරී විසින් මෙහෙයවනු ලබයි.

ණය ක්‍රමය

බැංකුවේ ණය ක්‍රමය කාර්යක්ෂම සහ ඵලදායී ණය අනුමත කිරීමේ ක්‍රියාවලියක් සඳහා පදනම සපයයි. තනිපුද්ගල, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක, ආයතනික ගනුදෙනුකරුවන් ශාඛා කළමනාකරුවන් සහ ණය නිලධාරීන් විසින් බිම් මට්ටමේදී ප්‍රවර්ධනය කරනු ලබයි. අංශමය සීමා සහ පවරන ලද බලතල සීමාවලට අනුව, ණය පහසුකම් අදාළ නිලධාරීන් විසින් අනුමත කෙරේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වර්තමානයේ අතින් ක්‍රියාකරන ණය ඇගයීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය භාවිතා කරයි. තවද, බැංකුව අනාගතයේදී ස්වයංක්‍රිය ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. පවරන ලද ණය අනුමත කිරීමේ ව්‍යුහය සහ ණය කළමනාකරණ ක්‍රමය කාර්යක්ෂම පරිපාලනය සහතික කරයි.

ණය කළමනාකරණ ක්‍රියාවලිය

ඵලදායී ණය අවදානම් කළමනාකරණ සහ නියාමනය සඳහා ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් පහත සඳහන් පියවර අනුගමනය කරයි:

- ණය උත්පාදනය සහ අවදානම් ඇගයීම
- ණය අනුමැතිය සහ අවසරය
- ණය පරිපාලනය සහ බෙදාහැරීම
- ණය ඇගයීම, නියාමනය සහ වාර්තාකරණය
- අයකරගැනීම්

ණය උත්පාදනය සහ ඇගයීම

මූලික/ශාඛා මට්ටමේ කළමනාකරුවන් සහ ණය නිලධාරීන් ලබාදී ඇති චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මත පදනම් වී පුද්ගලයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ආයතනික සේවාදායකයින් වෙත ණය පහසුකම් ලබා දේ. සියලුම උපදෙස් බැංකුවේ ණය ප්‍රතිපත්තිය, ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූල වේ.

ණය අනුමැතිය සහ අවසරය

බැංකුවට ණය පහසුකම් අනුමත කිරීමට විශේෂිත බලය පවරන ලද මට්ටම් ඇත. සාමාන්‍යයෙන්, ණය යෝජනා පළපුරුදු ණය නිලධාරීන් විසින් විශ්ලේෂණය කර අදාළ අනුමත බලාධිකාරී මට්ටම වෙත බාර දෙනු ලබයි. කෙසේවෙතත්, ඉහළ වටිනාකමක් සහිත ණය යෝජනා ණය කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරයි.

වර්තමානයේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ අයකිරීම් ගේ බලාධිකාරී මට්ටම ඉක්මවන ණය යෝජනා ප්‍රධාන අවදානම් නිලධාරීගේ ස්වාධීන ඇගයීමකට යටත් වේ. බැංකුව 2014 දී හඳුන්වාදෙන ලද ව්‍යූහගත ඇගයීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය සමඟ ඉදිරියට යන අතර, එය බැංකුවේ ණය කළඹ තුළ අවදානම් කළමනාකරණයට විශාල දායකත්වයක් ලබා දී ඇත.

ණය පරිපාලනය සහ බෙදාහැරීම

ණය කළඹ තුළ වැඩිවන පරිපාලන ක්‍රියාවලිය තුළ, 2016 මාර්තු බැංකුව විසින් ණය පරිපාලන ඒකකයක් ස්ථාපිත කරන ලද අතර, එම ඒකකය ස්වාධීන ඒකකයක් ලෙස අවදානම් කළමනාකරණ අංශය යටතේ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබයි. මෙම ඒකකය ණය ඇප ලේඛන නියාමනය සඳහා වගකීමට බැඳි සිටින අතර පූර්ව සහ පශ්චාත් උපලබ්ධි ඇගයීමේ ක්‍රියාවලියක් ලෙස රු.මි. 2.5 හෝ ඊට ඉහළ සියලුම ණය සමාලෝචනය කරයි.

ණය ඇගයීම, නියාමනය සහ වාර්තාකරණය

ශාඛා කළමනාකරු/ණය නිලධාරීන් විසින් දෛනික ගනුදෙනුකාර විශ්ලේෂණ සහ අයකරගැනීමේ ක්‍රියාවලි තුළින් ණය කළඹ සහ පුද්ගල ණය පහසුකම් මූලික මට්ටමේදී (ශාඛා මට්ටම) සමීපව නියාමනය කරයි. කෙසේවෙතත්, ප්‍රධාන කාර්යාල මට්ටමේදී, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැංකුවේ ණය කළඹ විශ්ලේෂණය කර මාසික පදනමක් මත ස්වාධීන නිරීක්ෂණ සහිත මූලික කාර්යසාධන දර්ශක (KRI) වාර්තාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. මූලික කාර්යසාධන දර්ශක වාර්තාවට මුළු ණය කළඹ විශ්ලේෂණය, අක්‍රිය විශ්ලේෂණය සහ ණය වෙන්කිරීමේ විශ්ලේෂණය යනාදිය ඇතුළත්ය. අවදානම් කළමනාකරණ අංශය මාසික පදනමක් මත බැංකුවේ ඉහළම ණයගැණුම්කරුවන් 20 සහ ඉහළම අක්‍රිය ණය ගනුදෙනුකරුවන් 10 සමීපව නියාමනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. ගුණාත්මක ණය කළඹක් කළමනාකරණය කර ගැනීමට ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් පහත සඳහන් අවම කිරීමේ ශිල්ප සහ ප්‍රවේශ භාවිතා කරනු ලබයි.

පවරන ලද අනුමත කිරීමේ බලාධිකාරිය

බැංකුවට ණය පහසුකම් අනුමත කිරීම සඳහා විශේෂිත පවරන ලද අධිකාරී මට්ටම් ඇත. සාමාන්‍යයෙන්, ණය යෝජනා පළපුරුදු ණය නිලධාරීන් විසින් විශ්ලේෂණය කර අදාළ අනුමත බලධාරී මට්ටම වෙත භාර දෙනු ලබයි. කෙසේ වෙතත්, ඉහළ වටිනාකමක් ඇති ණය යෝජනා ණය යෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරයි. වර්තමානයේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ අයකිරීම්ගේ බලාධිකාරී මට්ටම ඉක්මවන ණය යෝජනා ප්‍රධාන අවදානම් නිලධාරීගේ ස්වාධීන ඇගයීමකට යටත් වේ. බැංකුව 2014 දී හඳුන්වාදෙන ලද ව්‍යූහගත ඇගයීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය සමඟ ඉදිරියට යන අතර, එය බැංකුවේ ණය කළඹ තුළ අවදානම් කළමනාකරණයට විශාල දායකත්වයක් ලබා දී ඇත.

ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)

2017 සිට, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් ගුණාත්මක ණය කළඹක් පවත්වා ගැනීමට විස්තීර්ණ ණය සමාලෝචන යාන්ත්‍රණය ස්ථාපිත කර ඇත. ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ ණය සමාලෝචන ප්‍රතිපත්තිය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ණය පරිපාලනය වර්ධනය කිරීම සඳහා ණය සමාලෝචන යාන්ත්‍රණය සඳහා පොදු රාමුවක් ස්ථාපිත කරයි. මෙම සමාලෝචනය තුළින් නියමිත සීමාවට වඩා ඉහළ සක්‍රිය ණය ආවරණය කළ යුතු අතර මෙය බැංකුවේ ණය කළඹින් 40%ට වැඩි විය යුතුය. මෙම නියමිත සිමාව ණය කමිටුවේ නිර්දේශය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කළ/අනුමත කළ යුතුය.

ණය ශ්‍රේණිගතකරණ ආදර්ශය

බැංකුව 2016 අගෝස්තු සිට ණය ශ්‍රේණිගතකරණය හඳුන්වා දී ඇත. බැංකුවේ විශේෂිත ආකෘතිය මත පදනම් වී බැංකුව AAA සිට C දක්වා ශ්‍රේණිගතකරණ ශ්‍රේණි නවයක් (9) නියම කර ඇත. “AAA” ශ්‍රේණිගතකරණයෙන් අදහස් වන්නේ ඉතා ඉහළ ණය වටිනාකමක සහ ණය අවදානම පිළිබඳ ඉතා පහළ අපේක්ෂාව වන අතර “C” යන්නෙන් අදහස් වන්නේ එයට ප්‍රතිවිරුද්ධ අදහසයි. චක්‍රලේඛය තුළ ලබාදී ඇති උපදෙස්වලට අනුව, BBB ශ්‍රේණිගතකරණයට පහළ සිටින ගනුදෙනුකරුවන් බැංකුවෙන් ණය පහසුකමක් සඳහා සුදුසුකම් නොලබයි.

අවදානම පදනම් මිලකරණය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් 2016 සිට බැංකුවේ ණය පහසුකම් සඳහා අවදානම පදනම් මිලකරණයක් හඳුන්වාදී ඇත. බැංකුව ගනුදෙනුකරුගේ අවදානම් ශ්‍රේණිගතකරණය මත පදනම් වී පහසුකමේ මිල ගලපා ඇත. මෙම මිලකරණ ක්‍රමය බැංකුවේ අරමුදල් යටතේ පමණක් සලකා බලන පහසුකම්වලට යොදා ගන්නා අතර නැවත මිලකරණය යටතේ සලකා බලන අනෙකුත් පහසුකම් අවදානම පදනම් මිලකරණයෙන් ඉවත් කෙරේ.

ණය අලාභ වෙන්කිරීම (හානිකරණ වෙන් කිරීම් සහ CBSL වෙන්කිරීම)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම සඳහා, වර්තමානයේ බැංකුව පහත ක්‍රම දෙක මත පදනම් වී ණය අලාභ සඳහා හානිකරණය ගණනය කර ඇත:

- කේවල හානිකරණය
- සාමූහික හානිකරණය

2018 වසරේ සිට, ණය හානිකරණය සඳහා බැංකුව SLFRS 9 යොදා ගෙන ඇති අතර දැනට බැංකුව SLFRS 9 සඳහා ක්‍රමය/ආදර්ශය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක නිරත වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මාර්ගෝපදේශවලට අනුව, බැංකුව වෙන් කිරීමේ ක්‍රම දෙකක් අනුගමනය කරයි. වෙන් කිරීමේ වර්ග දෙක වන්නේ:

- පොදු වෙන්කිරීම
  (මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුව)
- විශේෂ වෙන්කිරීම
  (මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුව)

බැංකුවේ වෙන්කිරීමේ ආවරණ අනුපාතය සහ විවෘත ණය නිරාවරණ අනුපාතය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් ගණනය කර විශ්ලේෂණය කරනු ලබයි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව එහි නිර්දේශ සමඟ මාසික පදනමක් මත මෙම අනුපාත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

2018 දෙසැම්බර් අවසානයට, බැංකුවේ විවෘත ණය නිරාවරණ සහ වෙන් කිරීමේ ආවරණ අනුපාත පහත පරිදි වේ:

විවෘත ණය නිරාවරණය (%)



වෙන්කිරීමේ ආවරණ අනුපාතය (%)



සංකේන්ද්‍රණ අවදානම

ණය සංකේන්ද්‍රණය නියාමනය කිරීම ණය අවදානම් නියාමන ක්‍රියාවලියේ ඉතා වැදගත් කොටසකි. බැංකුව ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළින් ණය සඳහා අනුමත අංශමය සීමා නියමකර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ආර්ථික සහ කර්මාන්ත ප්‍රමිතිවලට අනුකූලව මෙවැනි සීමා කලින් කල අනුමත කර ඇත.

ව්‍යාපාර ඒකක විසින් මෙම අංශමය සීමාවන්ට අනුව තම තනිපුද්ගල ණය කළඹ කළමනාකරණය කරයි. බැංකුව නිරතුරුව සමාලෝචනය කළ අංශමය සීමා මත පදනම් වී එක් එක් අංශය, නිෂ්පාදනය සහ භූගෝලීය වශයෙන් සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කර ඇත.

හර්ෆින්ඩාල්- හිර්ච්මන් (Herfindahl-Hirschman) දර්ශකය, අංශමය සීමා විශ්ලේෂණය අභ්‍යන්තරව සංවර්ධනය කළ සීමා ආදර්ශ සහ පීඩන පරීක්ෂණ වැනි දර්ශක ශිල්පය මත පදනම් ක්‍රමවේදය බැංකුවේ ණය කළඹ තුළ ණය සංකේන්ද්‍රණය මැනීමට සහ නියාමනය කිරීමට යොදා ගනී.

භූගෝලීය සංකේන්ද්‍රණය



අංශ අනුව සංකේන්ද්‍රණය



ද්‍රවශීලතා අවදානම් පැතිකඩ

මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් ලබාදීම මගින් නිරවුල් කරනු ලබන බැංකුවේ මූල්‍යමය බැඳීම් සපුරාලීමේදී බැංකුව මුහුණ දෙන දුෂ්කරතාව පිළිබඳ අවධානම මෙයයි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නියාමන මාර්ගෝපදේශ, ජාත්‍යන්තර මනා පරිචයන්, ක්ෂේත්‍රයේ මනා පරිචයන් සහ අභ්‍යන්තර පාලන සීමාවලට අනුකූලව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. දෛනික සහ දිගුකාලීන පදනමක් මත ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ද්‍රවශීලතා ප්‍රතිපත්තියක් බැංකුවට ඇත. එය නියාමනය අවශ්‍යතාවන්ට අනුකූලව ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - (SLAR) මත 20% සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතයේ (LCR) 90%ට මට්ටමට ඉහළින් ද්‍රවශීලතා තත්ත්වය පවත්වා ගැනීම සඳහාවන බැංකුවේ ප්‍රතිපත්තිය වේ. මෙම පරමාර්ථය අත්කර ගැනීම පිණිස, බැංකුව අඛණ්ඩ පදනමක් මත ද්‍රවශීලතා වත්කම් සහ වගකීම් අගය කර නියාමනය කරයි.

පාලන ව්‍යුහය

බැංකුවේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වෙත පැවරේ. ALCO යනු විධායක මට්ටමේ කමිටුවක් වන අතර එය බැංකුවේ ආයතනික සහ විධායක මට්ටමේ සේවකයින්ගෙන් සමන්විත වේ. මෙම කමිටුව අවම වශයෙන් මාසයකට වරක් හෝ අවශ්‍යතා පදනමක් මත නිරතුරුව රැස්වේ.

ALCO කමිටුවේ තීරණවලට අමතරව, බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දෛනික කළමනාකරණය සඳහා ප්‍රවාහ සහ තොග ප්‍රවේශය යටතේ වත්කම් සහ වගකීම්වල කල්පිරීමේ පරතරය, ද්‍රවශීලතා අනුපාත මාසිකව විශ්ලේෂණය කරයි. එමෙන්ම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවේද තුන යටතේ අවසාන සිදුවීම්වල බලපෑම තක්සේරු කිරීමට ද්‍රවශීලතා පීඩන පරීක්ෂණ සිදුකර ඇත. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ද්‍රවශීලතා තත්ත්වයන් සහ ඒවාට යෝජිත පිළියම් BIRMC තුළින් කාර්තුමය පදනම මත සහ ප්‍රධාන අවදානම් දර්ශණ තුළින් මාසික පදනම මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දී ඇත.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රියාවලියි

RDB විසින් තොග ප්‍රවේශය සහ ප්‍රවාහ ප්‍රවේශය යටතේ එහි ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත සහ අනෙකුත් ද්‍රවශීලතා අනුපාත කලින් කල විශ්ලේෂණය කිරීම මගින් යහපත් ද්‍රවශීලතා මට්ටමක් කලමනාකරණය කර ගනී.

නියාමන අනුපාත

නියාමනය අවශ්‍යතාවන්ට අනුකූලව, බැංකුවේ ද්‍රවශීලතා අවදානම අගය කිරීමට ප්‍රධාන වශයෙන් අනුපාත දෙකක් බැංකුව භාවිතා කර ඇත.

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය – (SLAR)

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් 20%ක නියාමන අවශ්‍යතාවයට ඉහළින් එහි ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන ඇත.

2018 දෙසැම්බර් අවසානයට බැංකුවේ සැබෑ ද්‍රවශීල වත්කම් අනුපාතයට අනුව අවශ්‍ය අනුපාත (%)



ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR)

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2018 වසර තුළ ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස්වලට අනුකූල වී ඇත. බැංකුව 2018 දෙසැම්බර් අවසානයට 113%ක ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වාගෙන ඇති අතර එය අවම නියාමන අවශ්‍යතාවය (90%)ට වඩා ඉහළ අගයකි.

2018 දෙසැම්බර් අවසානයට බැංකුවේ සැබෑ ද්‍රවශීලතා ආවරණ අනුපාතයට අනුව අවශ්‍ය අනුපාත (%)



තොග ප්‍රවේශය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ඉහත තොග ප්‍රවේශය යටතේ ද්‍රවශීලතාව මැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන දර්ශක ගණනය කර විශ්ලේෂණය කර ඇත:

- මුළු වත්කම්වලට ශුද්ධ ණය
- ගනුදෙනුකාර තැන්පතුවලට ණය
- කෙටි කාලීන වගකීම්වලට ද්‍රවශීල වත්කම්
- මුළු වත්කම්වලට ප්‍රධාන තැන්පතු
- මුළු වත්කම්වලට මුළු ස්කන්ධය
- ශුද්ධ ණයට ණය අලාභ
- ශුද්ධ ණයට ණය අලාභ සඳහා සංචිතය



අනුපාත විශ්ලේෂණයට අනුකූලව, 2018 වසර තුළ යහපත් ද්‍රවශීල තත්ත්වයක් බැංකුව පවත්වාගෙන ඇත.

ද්‍රවශීලතාවය පිළිබඳ පීඩන පරීක්ෂණ

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විවිධ දැඩි කොන්දේසිවලට අදාළ ක්‍රමවේද තුනක් යටතේ බැංකුවේ ද්‍රවශීලතාව පිළිබඳ පීඩන පරීක්ෂණයක් කලින් කල පවත්වනු ලබයි. සෑම මාසයකදීම, මෙම දෙපාර්තමේන්තුව පීඩන පරීක්ෂණයේ ප්‍රතිඵල ඇගයීමට ලක් කරන අතර බැංකුවේ ද්‍රවශීලතාව පිළිබඳ අනපේක්ෂිත අවස්ථාවලින් වියහැකි බලපෑම් අගය කරනු ලබයි. පීඩන පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුකූලව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ALCO තුළින් එවැනි අවස්ථා සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ අරමුදල් වැඩපිළිවෙල පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දෙනු ලබයි.

විස්තර	2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	සියලුම සංඛ්‍යා රු'000 වලින් කම්පන		
		සුළු	මධ්‍යස්ථ	ප්‍රධාන
කම්පනයේ විශාලත්වය %		2	4	6
ද්‍රවශීල වත්කම්	34,264,681	34,264,681	34,264,681	34,264,681
මුළු වගකීම්	141,152,826	141,152,826	141,152,826	141,152,826
මුළු වගකීම් මත අගය වැටීම		2,823,057	5,646,113	8,469,170
කම්පනයෙන් පසු සංශෝධිත මුළු වගකීම්		138,329,769	135,506,713	132,683,656
කම්පනයෙන් පසු සංශෝධිත මුළු වත්කම්		31,411,624	28,618,568	25,795,511
ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය %	24.27	22.73	21.12	19.44

මෙහෙයුම් අවදානම් පැතිකඩ

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවන හෝ අසමත් අභ්‍යන්තර ක්‍රියාවලි, සේවකයින් සහ පද්ධති සහ ණය හෝ වෙළෙඳපොල විසින් ඇති කරන බාහිර සිදුවීම්වලින් ඇතිවන අනපේක්ෂිත ඍජු හෝ වක්‍ර අලාභවලින් ඇතිවන හානිය පිළිබඳ ප්‍රකාශයකි.

වර්තමානයේ බැංකුවේ මුළු සේවාදායක පදනම පුද්ගලයින් මිලියන 6 ඉක්මවන අතර එය දිවයිනේ ජනගහනයෙන් ආසන්න වශයෙන් 20%ක් නියෝජනය කරයි. දැනට උතුර සහ නැගෙනහිර ශාඛා ඇතුළුව සමස්ත රට ආවරණය කරන ශාඛා 273ක් බැංකුව සතු වේ. ශාඛා ගණන අනුව ප්‍රාදේශිය සංවර්ධන බැංකුව රටතුළ තෙවැනි විශාලතම බැංකුව වන අතර වර්තමානයේ 3,000කට වැඩි කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ මෙය ක්‍රියාත්මක වේ. එබැවින්, වර්තමානයේ ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විවිධ මෙහෙයුම් ප්‍රමාදයන්ට නිරාවරණය වී ඇත.

සමාලෝචිත වසර තුළ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව නව බඳවාගැනීම් තුළින් එහි සේවක පදනම වැඩිකරගෙන ඇත. මෙහෙයුම් කටයුතු සඳහා CDM, ATM යනාදිය වැනි නව තොරතුරු තාක්ෂණ විසඳුම් වේගයෙන් හඳුන්වා දෙමින් සිටින අතර මානව ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමයක් (HCM) ද ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම, බාසල් එකඟතාවයට අනුකූලවීම සඳහා බැංකුවේ ප්‍රාග්ධනය වැඩිකිරීමේ අරමුණ ඇතිව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධවීමේ ක්‍රියාවලිය තුල නිරත වී සිටී.

පාලන ව්‍යූහය

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්තියක් බැංකුවට ඇති අතර එය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති මෙහෙයුම් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලබයි. මෙය බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා ප්‍රධාන මාර්ගෝපදේශයයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ඒකකයට එදිනෙදා මෙහෙයුම් අවදානම් ගැටළු විශ්ලේෂණය කර හඳුනා ගැනීම සහ මාසික ප්‍රධාන අවදානම් දර්ශක (KRI) මත මෙහෙයුම් අලාභ පිළිබඳ කාලීන වාර්තා ඉදිරිපත් කිරීමට සහ මෙහෙයුම් ප්‍රමාද පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම සඳහා වගකීමට බැඳී සිටී.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ අනුකමිටුව යනු බැංකුවේ මෙහෙයුම් ප්‍රමාද තක්සේරු කිරීමේ කළමනාකරණ අනුකමිටුවකි. 2012 සිට, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිගේ අධීක්ෂණය යටතේ මෙහෙයුම් අවදානම් අනුකමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම කමිටුව අවම වශයෙන් මාසයකට වරක් රැස්වන අතර, තක්සේරු කිරීම සඳහා IRMC වෙත කාර්තුමය ලෙස වාර්තාවක් ඉදිරිපත් කරයි. මේ තුළින් ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ සියලුම මෙහෙයුම් ගැටළු අංශ ආවරණය කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අහිමි වූ දත්ත වාර්තාකරණය

2012 සිට, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) අහිමි වූ දත්ත අත්කර ගැනීම සහ වාර්තාකරණ ක්‍රියාවලි හා සම්බන්ධ වී ඇත. විමර්ෂණ ඒකකයට වාර්තා කරන ලද සියලුම අලාභ RMD විසින් වාර්තා කරන අතර සෑම කාර්තුවකදීම, රු. 500,000.00 නියමිත සීමාව ඉක්මවන අහිමි වූ දත්ත මහා බැංකුව වෙත වාර්තා කරනු ලබයි. විවිධ වර්ගයේ දත්ත අහිමිවීම සම්බන්ධයෙන් දත්ත පදනමක් බැංකුව පවත්වා ගෙන ඇත.

අභ්‍යන්තර වංචාවල ප්‍රවනතාව



බාහිර වංචාවල ප්‍රවනතාව



ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP)

බැංකුව 2015 වසර තුළ එහි ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) අවසන් කරන ලදී. 2016 සිට, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛා සහ ප්‍රධාන කාර්යාලය ආවරණය කිරීම සඳහා එය සිදුකර ඇත, ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම මෙහෙයුම් දෙපාර්තමේනතුව යටතේ පවතී. වරින් වර බැංකුව විසින් ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ පරීක්ෂණ සිදුකර ඇත

තොරතුරු ආරක්ෂක කළමනාකරණ ක්‍රමය (ISMS)

2015 වසර සිට, තොරතුරු ආරක්ෂක කළමනාකරණ ක්‍රමයේ (ISMS) ක්‍රියාත්මකවීම බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරීගේ අධික්ෂණය යටතේ පවතී. අනුමත තොරතුරු ආරක්ෂාව සහ පිළිගතහැකි භාවිත ප්‍රතිපත්ති ක්‍රියාත්මකව පවතින අතර කලින් කල සමාලෝචනය කෙරේ.

පොළී අනුපාත අවදානම් පැතිකඩ

පොළී අනුපාතවල අහිතකර වෙනස්වීම්වලට බැංකුවේ මූල්‍ය තත්ත්වයේ නිරාවරණය පොළී අනුපාත අවදානම ලෙස හඳුන්වනු ලබයි. පොළී අනුපාතවල වෙනස්වීම්වලින් බැංකුවේ ඉපයීම් මෙන්ම බැංකුවේ වත්කම්, වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බාහිර අයිතමවල පාදක වූ ආර්ථික වටිනාකම කෙරෙහි සැලකියයුතු බලපෑම් ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොළී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව, බැංකුවේ පරතර සහ කාලසීමාව විශ්ලේෂණය මත පදනම් වී පොළී අනුපාත තීරණය කිරීමට ALCO වගකීමට බැඳී සිටී. මෙම විශ්ලේෂණය මත පදනම් වී, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පොළී අනුපාත උච්චාවචන පිළිබඳ අවදානම් තක්සේරු කරයි. කෙසේවෙතත්, වර්තමානයේ පද්ධති සීමා හේතු කොට ගෙන වෙළෙඳපොල කොන්දේසි සහ ණය තැන්පතු මත පදනම් වී ණයදීම සහ තැන්පතු සඳහා පොළී අනුපාත ALCO විසින් තීරණය කරයි.

අනුකූලතා අවදානම් කළමනාකරණය

බැංකුවේ කළමනාකරණය විසින් එහි නීතිකරණ සහ මූල්‍ය අධිකාරිය සහ අනෙකුත් නෛතික/රාජ්‍ය ආයතන විසින් පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීමට සහ ඒවා කඩකිරීම සහ ඒවා පිළිපැදීමට අසමත්වීම වැලැක්වීම සඳහා ඉහළ අවධානය යොමු කර ඇත.

අනුකූලතා නිලධාරියාගේ ප්‍රධාන පරමාර්ථ වන්නේ අභ්‍යන්තර පාලනයන්/නියාමන අවශ්‍යතා සම්මත මට්ටම්වලට අනුකූල බව සහතික කිරීමයි. බැංකුවේ අනුකූලතා කාර්යය සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා විසින් මෙහෙයවන IRMC හි අධික්ෂණය යටතේ පවතී. මෙම පරමාර්ථය අත්කර ගැනීම පිණිස, ඔහු අනුකූලතා අවශ්‍යතා නියාමනය කර තක්සේරු කරන අතර, සමාලෝචනය සඳහා බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳව කාර්තුමය වාර්තා IRMC වෙත ඉදිරිපත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත විස්තරාත්මක අනුකූලතා ප්‍රතිපත්තියක් ඇති අතර එය වාර්ෂිකව සමාලෝචනය කෙරේ. අනුකූලතා නිලධාරියා විසින් නියාමකයා වෙත බැංකුවේ අවශ්‍ය ව්‍යවස්ථාපිත වාර්තා කාලිනව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ද සොයා බැලීම සිදුකරයි.

2018 වසර තුළ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අනුකූලතා අංශය යහපත් අනුකූලතා කළමනාකරණය සහතික කිරීමට ක්‍රියාමාර්ග ගණනාවක් අනුගමනය කර ඇත:

- කලින් කල ආදර්ශ ශාඛා සහ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය මට්ටමේ අංශවල අනුකූලතා තක්සේරු කිරීම සිදුකිරීම.
- බැංකුකරණ මෙහෙයුම්වල නියාමන පරිසරය පිළිබඳ ප්‍රාදේශීය සහ ප්‍රධාන කාර්යාලයේදී අනුකූලතා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

නෛතික අවදානම් කළමනාකරණය

නෛතික අවදානම් යනු ව්‍යාපාරය, එහි සම්බන්ධතා, ක්‍රියාවලි, නිෂ්පාදන හා සේවාවන්ට අදාළව දැනුවත්කම නැතිවීම හෝ වැරදි අවබෝධය, බහුඅර්ථතාව හෝ සහසික නොසැලකිල්ල, නීති සහ රෙගුලාසි යොදාගන්නා අකාරය තුළින් ඇතිවියහැකි මූල්‍යමය හෝ කීර්තිනාමය අහිමිවීමේ අවදානමයි. 2003 දී බාසල් එකඟතාවන් විසින් නෛතික අවදානම මෙහෙයුම් අවදානමේ කොටසක් ලෙස වර්ගීකරණය කර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නෛතික අවදානම කළමනාකරණය කිරීමේ වගකීම ප්‍රධාන නීති නිලධාරී යටතේ පවතී. නීති අංශයක් පවතින අතර නීති අංශයට අනුයුක්ත නීතිඥ කණ්ඩායම ප්‍රධාන නීති නිලධාරී විසින් මෙහෙයවනු ලබයි.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නීති අංශය නෛතික අවදානම යහපත් අයුරින් කලමනාකරණය කිරීම සඳහා පහත සඳහන් රාජකාරී ඉටුකර ඇත:

- තෙවැනි පාර්ශ්වයකට ණය ලබාදීමේදී සියලුම ඇප ලියවිලිවල සහ අනෙකුත් ගිවිසුම්ගත බැඳීම්වල නෛතිකභාවය සහතික කිරීම.
- තෙවැනි පාර්ශ්ව සමඟ ගනුදෙනුවල ගිවිසුම්ගත සම්බන්ධතාවල නෛතිකභාවය සහතික කිරීම. උදා- ප්‍රසම්පාදනය
- මෙහෙයුම් ක්‍රියාවලිය තුළ බැංකු පනත සහ අනෙකුත් අදාළ නීතිවල අදාළත්වය සහතික කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ශ්‍රමබලකාය හැසිරවීමේදී කම්කරු නීතියේ අදාළත්වය සහතික කිරීම

ප්‍රාග්ධන කළමනාකණය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මහ බැංකුවේ උපදෙස් සහ ජාත්‍යන්තර බාසල් III එකඟතාවයට අනුකූලව පදනම් වී එහි ප්‍රාග්ධනය කළමනාකරණය කර ඇත.

2016 අංක 1 දරන මහ බැංකුවේ නියෝගයට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව 2017 ජූලි 1 දිනෙන් ආරම්භවන බාසල් III යටතේ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු අතර, 2019 ජනවාරි 1 දිනට අවශ්‍ය මට්ටමට පැමිණිය යුතුය. එම නියෝගයට අනුව, අපි පහත සඳහන් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් අත්කර ගත යුතුව ඇත:

ප්‍රාග්ධනයේ සංරචක	2017 ජූලි 1 %	2018 ජනවාරි 1 %	2019 ජනවාරි 1 %
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව පොදු ස්කන්ධ පළමු පෙළ ප්‍රාග්ධනය	5.75	6.375	7.00
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය මුළු ප්‍රාග්ධනය	7.25	7.875	8.50
ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය මුළු ප්‍රාග්ධන අනුපාතය	11.25	11.875	12.50

ප්‍රාග්ධන කළමනාකරණය



බැංකුව 2019 ජනවාරි 1 දිනට බාසල් III අනුකූලව නියාමන අවශ්‍යතාවයට පැමිණිය යුතුය. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය 2017 වසරේ සිට ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුමත කර ඇත:

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත පරිදි දැනට සිටින කොටස්හිමියන්ගෙන් අමතර ප්‍රාග්ධනය යෙදවීම සඳහා ඉල්ලා සිටීම. මෙහිදී කොටස්හිමියෙක් ලෙස නව ආයෝජකයෙකුට පැමිණීම සඳහා අවසර නොමැත.
2. ණයකර නිතුත් කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලය 2017 දී රු.බි. 2ක් දක්වා ණයකර නිකුතුවක් තුළින් ප්‍රාග්ධනය ඉහළ දැමීමට අනුමත කරන ලදී.
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ඒකාබද්ධ කිරීම.

බැංකුව 2017 දෙසැම්බර් හි මහා භාණ්ඩාගාරයෙන් රු.බි. 2.5ක ප්‍රාග්ධනය ඇතුළත් කිරීමක් ලැබී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණය බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවයට බලපාන ණය කළඹ තුළ අක්‍රිය ණය වෙනස්වීම් පිළිබඳව දැනුවත්ව ඇත. එබැවින්, බැංකුවේ අනුමත පිඩන පරීක්ෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ පරිදි අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කලින් කල පීඩන පරීක්ෂණ පවත්වනු ලබන අතර ප්‍රතිඵල කාර්තුමය පදනමක් මත IRMC තුළින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දෙනු ලැබේ.

2018 වසර සඳහා පීඩන පරීක්ෂණවල ප්‍රතිඵල 2018 පහත පරිදි වේ:

අක්‍රිය ණය කළඹ	මූල් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය %	ක්‍රියාදාමය 1 %	ක්‍රියාදාමය 2 %	ක්‍රියාදාමය 3 %
කම්පනයේ විශාලත්වය		2	3	4
සෘජුවම අලාභ වර්ගීකරණයට	13.61	13.58	13.56	13.54
සියලුම වර්ගීකරණ තුළ කම්පනයේ විතැන්වීම	13.61	13.59	13.58	13.56

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. BAF/F/RDB/CG/2018

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 25 June 2019

සභාපති,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා කෙරෙහි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සිද්ධිවාචක සොයාගැනීම් පිළිබඳ විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට පිළියෙල කොට ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් මෙම වාර්තාවේ ඇමුණුම තුළ ගණනය කල ක්‍රියාපටිපාටි මා විසින් ඉටුකර ඇත. මෙම සහභාගිත්වය ඉටු කරනු ලැබුවේ එකඟ වූ ක්‍රියාපටිපාටි සහභාගිත්වයට අදාළ සම්බන්ධිත සේවා 4400 (SLSRS 4400) පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතියේ දක්වා ඇති මූලධර්මවලට අනුකූලවය. ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා සපුරාලීමට ඔබට සහයවීම සඳහා පමණක් ක්‍රියාපටිපාටි ඉටු කරන ලදී.

මෙම වාර්තාවට අමුණා ඇති ඇමුණුම තුළ මාගේ සොයාගැනීම් පිළිබඳව මා විසින් වාර්තා කරමි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සිදුකළ විගණනයක් හෝ සමාලෝචනයක් ඉහත ක්‍රියාපටිපාටිවලින් අදහස් නොකරන බැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝග සමඟ අනුකූලතාව පිළිබඳ සහතිකයක් මම ප්‍රකාශ නොකරමි.

අතිරේක ක්‍රියාපටිපාටි මවිසින් ඉටුකරන ලද බැවින් සහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් මම ඉටුකර ඇති බැවින්, අනෙකුත් කරුණු මාගේ අවධානයට ලක්වියහැකි අතර ඒවා ඔබ වෙත වාර්තා කර ඇත.

මගේ වාර්තාව හුදෙක් මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදයේ දක්වා ඇති අරමුණ සහ ඔබගේ දැනගැනීම සඳහා පමණක්ම වන අතර, වෙනත් යම් අරමුණක් සඳහා හෝ යම් වෙනත් පාර්ශ්වයන්ට බෙදාහැරීමට භාවිතා නොකළ යුතුය.

මෙම වාර්තාව ඉහත විශේෂයෙන් දක්වා ඇති අයිතමවලට පමණක් අදාළවන අතර, සමස්තයක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වෙනත් මූල්‍ය ප්‍රකාශන සඳහා පුළුල් කළ නොහැක.

ඩබ්ලිව් පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

සිද්ධි වාචක සොයාගැනීම් පිළිබඳ වාර්තාවට ඇමුණුම

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (1)		
3 (1) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ආරක්ෂාව සහ අඛණ්ඩතාව ශක්තිමත් කර ඇති බව සහතික කිරීමට එකඟවූ ක්‍රියාපටිපාටි සිදුකරන ලදී.	
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය, බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම්.	**මදක් අනුකූල විය;** බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. 2017 වසර අවසානයට, බැංකුවේ සැබෑ කාර්යසාධනය ආයතනික සැලැස්මේ පුරෝකථනය කළ ව්‍යාපාර පරමාර්ථ ඉක්මවා ඇත. එමනිසා, ආයතනික සැලැස්ම 2018 වසර තුළ සමාලෝචනය කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. කෙසේවෙතත්, ඉහත ආයතනික සැලැස්ම 2020 දක්වා පමණක් පුරෝකථනය කරයි.
	බැංකුවේ ක්‍රමෝපායික පරමාර්ථ සහ ආයතනික වටිනාකම් බැංකුව තුළ සන්නිවේදනය කර තිබීම	දැනුවත් කිරීමේ රැස්වීම් සහ චක්‍රලේඛ උපදෙස් මගින් ඒ පිළිබඳ සේවකයින්ට දැනුම් දී ඇත.
	(ආ) බැංකුවේ සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ආයතනික සැලැස්මට 2016 - 20 කාලසීමාව සඳහා බැංකුවේ සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය ඇතුළත්ය.
	සමස්ත ව්‍යාපාර ක්‍රමෝපායට සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ඇතුළත් බව සහ ඒවා ලේඛණගතකර තිබීම.	බැංකුවේ සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ලේඛනගත කර සමාලෝචනය කර ඇත.
	සමස්ත ව්‍යාපාර ක්‍රමෝපායට අවම වශයෙන් ඉදිරි වසර තුළ තුළ මැනියහැකි ඉලක්ක ඇතුළත්වීම.	කෙසේවෙතත්, ආයතනික සැලැස්ම තුළ මැනියහැකි ඉලක්ක 2020 දක්වා පමණක් පුරෝකථනය කරයි.
	(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගන්නා අවදානම් කළමනාකරණයට සුදුසු ක්‍රම විචක්ෂණව සහ සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීම	**අනුකූල විය;** අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණයට අඛණ්ඩ සහ විචක්ෂණ තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මකව පවතී. ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ව්‍යූහගත කර ඇති අතර ඒවා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අනුමත කර සමාලෝචනය කරයි. එමෙන්ම, අවදානම් රුචි ප්‍රකාශය ඉවසුම් සීමා තීරණය කිරීමට පිළියෙල කර ඇත.
	(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තැන්පතුකරුවන්, ණයකරුවන්, කොටස්හිමියන් සහ ණය හිමියන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත;	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සන්නිවේදන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවත්නා අතර එය වරින් වර සමාලෝචනය කර ඇත. කළමනාකරණයේ සෑම මට්ටමකම පුද්ගලයින් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සමීපව නියාමනය කිරීම සඳහා වගකීමට බැඳී සිටී.
	(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධති ප්‍රමාණාත්මකව සහ අවංකව සමාලෝචනය කර තිබීම;	**අනුකූල විය;** සියලුම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම නියාමනය සඳහා වගකිව යුතුය. එමෙන්ම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධති ප්‍රමාණාත්මකව සහ අවංකව තක්සේරු කර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරයි. එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
(ඊ)	(i) ප්‍රතිපත්තිය කෙරෙහි සැලකියයුතු බලපෑම්කරන; (ii) කටයුතු මෙහෙයවන; සහ (iii) ව්‍යාපාර කටයුතු, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ පාලනය ක්‍රියාත්මක කරන තනතුරක් දරන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලය හඳුනාගෙන නම් කර තිබීම;	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හඳුනාගෙන ඇත.
(උ)	අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තමන්ගේ බලාධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් හඳුනාගෙන තිබීම;	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තමන්ගේ බලාධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් විස්තර කරයි. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තමන්ගේ බලාධිකාරී ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් අදාළ රැකියා විස්තරවල ලේඛනගත කර ඇත.
(ඌ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තියට අනුරූපව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් බැංකුවේ කටයුතු සුදුසු පරිදි පාලනය ක්‍රියාත්මක කර තිබීම;	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු මගින් බැංකුවේ කටයුතු සුදුසු පාලනය ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් කැඳවනු ලබයි.
(එ)	අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයේ පාලන ව්‍යවහාරයන්හී ඵලදායිත්වය පිළිබඳ කලින් කල ඇගයීම සිදුකර තිබීම; (i) අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරාගැනීම, නම්කිරීම සහ පත්කිරීම; (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය; සහ (iii) අවශ්‍ය අවස්ථාවලදී දුර්වලතා තීරණය කිරීම සහ වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං තක්සේරු කිරීමේ ආකෘති ලබාගතහැක.
(ඒ)	අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්ත සැලැස්මක් තිබීම.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අනුප්‍රාප්ත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවති. යාවත්කළ අනුප්‍රාප්ත සැලැස්මක් නොතිබුණි.
(ඔ)	ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික පරමාර්ථ කරා ප්‍රගතිය නියාමනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ උපලේඛණගත නිරන්තර රැස්වීම් තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පරමාර්ථවල ප්‍රගතිය සාකච්ඡා කර සමාලෝචනය කිරීමට නිරන්තර රැස්වීම් පවත්වන අතර අවශ්‍ය අවස්ථාවලදී ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට (KMP) ආරාධනය කරයි. එමෙන්ම, ආරම්භකරන වසර සඳහා කාර්යය සැලැස්ම KMP සමඟ සාකච්ඡා කර ඇත.
(ඕ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන පරිසරය අවබෝධකර ගැනීමට සහ නියාමකයින් සමඟ බැංකුව සම්බන්ධතා පවත්නාගන්නා බව සහතික කිරීමට පියවර ගෙන තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය නියාමන පරිසරය පිළිබඳ ඉහළින් අවධානය යොමුකර ඇති අතර වෙනස්වීම් යාවත්කර නියාමකයින් සමඟ බැංකුව සම්බන්ධතා පවත්වා ගනී.
(ක)	අධ්‍යක්ෂ මණ්ඩලයට බාහිර විගණකයින් ලබාගැනීම සහ පාලනය සඳහා ක්‍රියාවලියක් තිබීම.	**අදාළ නැත;** ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වගන්තිය යටතේ, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (I) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO) පත්කර තිබීම.	**අනුකූල විය;** මහ භාණ්ඩාගාරයේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යවරයා විසින් සභාපති පත්කර ඇත. භාණ්ඩාගාරයේ ලේකම් සමඟ එකඟත්වයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරී පත්කරයි.
	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ කාර්යයන් සහ වගකීම් මෙම නියෝගවල 3 (5) ට අනුකූලවීම.	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ප්‍රධාන විධායක නිලධාරී බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල දෛනික කළමනාකරණයේ ප්‍රධාන විධායක ලෙස කටයුතු කරයි. කෙසේවෙතත්, 2018 නොවැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ තීරණය පරිදි බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ අනෙකුත් උපකරණ අත්සන් කිරීම තුළ සභාපති සම්බන්ධ වේ.
3 (I) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරව හමුවන අතර ආසන්න වශයෙන් මාසයක කාලාන්තරයක් ලෙස එක් වසරකට අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා තිබීම.	**මදක් අනුකූල විය;** පොදුවේ, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව සහ අවශ්‍යතාව අනුව අමතර රැස්වීම් පවත්වනු ලබයි. කෙසේවෙතත්, 2018 වසර තුළ රැස්වීම් 10ක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් සිදුකර නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2018 අප්‍රේල් 28 සිට 2018 සැප්තැම්බර් 16 දක්වා කාලසීමාව තුළ පවත්වා නැත.
3 (I) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය තුළ කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකිවන ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මකව පවතී. ඒ තුළ එකී කරුණු සහ යෝජනා බැංකුවේ ව්‍යාපාරය ප්‍රවර්ධනයට සහ අවදානම් කළමනාකරණයට සම්බන්ධ වේ.	**අනුකූල විය;** විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වීමට නියමිත අතර කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට හැකිවීම සඳහා අධ්‍යක්ෂවරුන්ට කලින්ම ඉදිරි රැස්වීම පැවැත්වීමට නියමිත දිනය දැනුම් දෙනු ලැබේ.
3 (I) (v)	සියලුම අධ්‍යක්ෂවරුන්ට රැස්වීම්වලට සහභාගිවීමට හැකිවන පරිදි විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ නිවේදනය එම රැස්වීම පැවැත්වීමට නියමිත දින හතකට පෙර ලබාදී තිබීම.	**අනුකූල විය;** ව්‍යවහාරයක් ලෙස, මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ නිවේදනය එම රැස්වීමට දින 7 කට පෙර ලබාදී ඇත.
3 (I) (vi)	පූර්වාසන්න මාස 12ක කාලසීමාව තුළ අවම වශයෙන් රැස්වීම්වලින් තුනෙන් දෙකකට පැමිණීමට නොහැකි වූ හෝ පූර්වාසන්නයෙන් එක දිගට පවත්වනු ලබන රැස්වීම් තුනකට සහභාගි වී නොමැති අධ්‍යක්ෂවරු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගෙන තිබීම. කෙසේවෙතත් විකල්ප අධ්‍යක්ෂවරයෙක් මගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගිවීම පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	**අනුකූල විය;** අවම වශයෙන් රැස්වීම්වලින් තුනෙන් දෙකකට පැමිණීමට නොහැකි වූ හෝ පූර්වාසන්නයෙන් එක දිගට පවත්වනු ලබන රැස්වීම් තුනකට සහභාගි වී නොමැති අවස්ථා නොමැත.
3 (I) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම් ලේකම්වරයෙක් පත්කර ඇත. ඔහු 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන සපුරා ඇති අතර ඔහුගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කොටස්හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කටයුතු මෙහෙයවීම සහ ව්‍යවස්ථා සහ අනෙකුත් රෙගුලාසිවල දක්වා ඇති පරිදි අනෙකුත් කාර්යයන් ඉටු කිරීමයි.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කර ඇත.
3 (I) (viii)	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් සහ සේවය සඳහා පිවිසීමට සියලුම අධ්‍යක්ෂවරුන්ට හැකියාව තිබීම.	**අනුකූල විය;** සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් සහ සේවය සඳහා පිවිසීම ඇත.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (I) (ix)	සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වා ගන්නා අතර අධ්‍යක්ෂවරුන්ට එම වාර්තා පරීක්ෂා කිරීමට ක්‍රියාවලියක් තිබීම.	**අනුකූල විය;** සමාගම් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වා ගන්නා අතර ඕනෑම අධ්‍යක්ෂවරයෙක්ට පරීක්ෂාව සඳහා එවා ලබාගත හැකිය.
3 (I) (x)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක වාර්තා පහත සඳහන් කරුණුවලින් සමන්විත වීම: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම කරුණු දැක්වීමේදී භාවිතා කළ දත්ත සහ තොරතුරු පිළිබඳ සාරාංශයක්; (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු; (ඇ) කරුණු සොයන ලද සකාච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි ආරක්ෂාව සහ මූල්‍ය ප්‍රඥාව සහිතව එහි රාජකාරී ඉටුකර තිබේද යන්න පැහැදිලි කරන තර්ක හෝ එකඟ නොවූ ගැටළු; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්තිවලට අනුකූලතාවය සහ අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදීම පෙන්නුම් කරන කරුණු; (ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් අවබෝධකරගැනීමට යොදාගත් අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳව දළ විශ්ලේෂණයක්; සහ (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල විසඳුම්.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලින් පහත සඳහන් අවශ්‍යතා ආවරණය කරයි. (I) මූල්‍ය ප්‍රගතිය සහ ජයග්‍රහන පිළිබඳ සාකච්ඡා. (II) විශේෂ මාතෘකා මත ගනු ලැබූ ව්‍යාපාර තීරණ. (III) විශේෂ මාතෘකා මත සම්මත කරන ලද යෝජනා. (IV) කළමනාකරණයට උපදෙස් දෙනලද ප්‍රගති උපදෙස් සහ කරුණු. (V) කරුණු සම්බන්ධ ප්‍රතිපත්ති තීරණ සහ කාර්යසාධන සමාලෝචන. (VI) අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිළිබඳ ඉස්මතු කිරීම සහ නිර්දේශ. (VII) සාකච්ඡා කළ අනෙකුත් සමකාලික කරුණු (VIII) අනුකූලතාව, අවදානම සහ විගණනයේ සොයාගැනීම් සහ තක්සේරු කිරීම්.
3 (I) (xi)	අධ්‍යක්ෂවරුන්ට සාධාරණ ඉල්ලීමක් මත බැංකුවේ වියදමින් සුදුසු අවස්ථාවලදී ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රියාපටිපාටි තිබීම.	**අනුකූල විය;** ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ක්‍රියාපටිපාටි ඇත.
3 (I) (xii)	අධ්‍යක්ෂවරු බැඳියා පිළිගැටුම්වලින් හෝ පෙනීයන බැඳියා පිළිගැටුම්වලින් වැලැක්වීම සම්බන්ධයෙන් තීරණය කිරීමට, වාර්තා කිරීමට, විසඳීමට සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියාපටිපාටි තිබීම. යම් අධ්‍යක්ෂවරයෙක්ට ඔහුට හෝ ඇයට හෝ ඔහුගේ හෝ ඇයගේ සමීප ඥාතියෙකුට සැලකියයුතු බැඳියාවක් සහිත යම් කාරණයක් සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකදී එම අධ්‍යක්ෂවරයා ඒ සම්බන්ධ ඡන්දයකදී ඡන්දය දීමෙන් වැලකී සිටීම. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා සණසූරණය තුළ ඔහු/ඇය ගණනය කර තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරු පුද්ගලිකවම බැඳියාවක් ඇති විශේෂිත කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී යෝජනාවක් සම්මත කිරීමේදී, ඔහු/ඇය යෝජනාව සඳහා ඡන්දය දීමෙන් වැලකී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා සණසූරණය තුළ බැඳියාවක් සහිත අධ්‍යක්ෂ ඡන්දය දීමෙන් වැලකී ඇත.
3 (I) (xiii)	අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකුව මෙහෙයවීම සහ පාලනය එහි අධිකාරිය යටතේ දැඩිව ඇති බව තීරණය කිරීමට විශේෂයෙන් වෙන් වූ කරුණු පිළිබඳ විධිමත් උපලේඛණයක් තිබීම.	**අනුකූල විය;** අවසාන තීරණය ගැනීමට තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ සඳහා වෙන් වූ කරුණු පිළිබඳ උපලේඛණයක් න්‍යාය පත්‍රයට ඇතුළත් කෙරේ.
3 (I) (xiv)	බැංකුවට එහි බැඳීම් සපුරාලීමට අසමත්වන හෝ නොහැකිවන, හෝ බුන්වත්භාවයට පත්වෙන හෝ තැන්පතුකරුවන් සහ අනෙක් ණයහිමියන් නිසා ගෙවීම් තාවකාලිකව අත්හිටුවන අවස්ථාව හඳුනා ගැනීමේ ක්‍රියාපටිපාටි සලකා බලන්නේනම් එවැනි තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වහාම වාර්තා කර තිබීම.	**අදාළ නැත;** එවැනි අවස්ථාවක් ඇති නොවුනත්, බැංකුව බුන්වත්වීමට නියමිතනම්, හෝ තැන්පතුකරුවන් සහ අනෙක් ණයහිමියන් නිසා ගෙවීම් තාවකාලිකව අත්හිටුවන්නේනම් එවැනි තීරණයක් ගැනීමට පෙර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත දැනුම්දීමේ අවශ්‍යතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ය.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (l) (xv)	අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් මණ්ඩලය විසින් අවශ්‍යකරන මට්ටම්මල බැංකුව ප්‍රාග්ධනීයකරණය කර තිබීම.	**මදක් අනුකූල විය;** මුදල් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි 2018 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම බැංකුව පවත්වා ගෙන ඇත. කෙසේවෙතත්, සමහර අවස්ථාවල අවශ්‍ය වට්ටමට පහළින් වාර්තා වී ඇත.
3 (l) (xvi)	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ වාර්ෂික වාර්තාව තුළ මෙම නියෝගයේ 3 නියෝගයට අනුකූලව දක්වා ඇති වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් ප්‍රකාශයට පත් කරයි.	**අනුකූල විය;** වාර්ෂික වාර්තාවට ආයතනික පාලන වාර්තාව ඇතුළත්වන අතර ඉන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන නියෝගයේ අනුකූලතා අවශ්‍යතා අනාවරණය කරයි.
3 (l) (xvii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව සිදුකළයුතු ස්වයං ඇගයීම් යෝජනා ක්‍රමයක් යොදා ගන්නා අතර එවැනි ඇගයීම් පිළිබඳ වාර්තා පවත්වාගැනීම.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ලබාගත හැකිය.

3 (2) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු 7කට නොඅඩු සහ 11කට නොවැඩි ගණනකින් සමන්විතවීම.		**අනුකූල විය;** 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂවරු 7කින් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය.
3 (2) (ii)	(අ)	ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂවරයා හැර අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලසීමාව වසර නවය නොඉක්මවිය යුතුය.	**අනුකූල විය;** කිසිදු අධ්‍යක්ෂවරයෙක් නියෝගය තුළ විස්තර කරන පරිදි වයස අවුරුදු නවය සම්පූර්ණ කර නොමැත.
	(ආ)	යම් අධ්‍යක්ෂවරයෙක් අවුරුදු නවයකට වඩා සේවය කරන අවස්ථාවක, සංක්‍රාන්තිමය විධිවිධාන යොදාගෙන තිබේද යන්න පරීක්ෂා කිරීම.	**අදාළ නැත.**
3 (2) (iii)	ප්‍රධාන විධායක නිලධාරී ඇතුළුව විධායක අධ්‍යක්ෂවරුන්ගේ ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරු ගණනින් තුනෙන් එක නොඉක්මවිය යුතුය.		**අනුකූල විය;** විධායක අධ්‍යක්ෂ සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ හැර සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරු වෙති.
3 (2) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරු ගණනින් තුනෙන් එකක් යන දෙකෙන් ඉහළ අගයට සිටිය යුතුය. විධායක නොවන අධ්‍යක්ෂවරු ස්වාධීනද යන්න සලකා බැලීමට හැකි වන්නේ ඔහු/ඇය:		**මදක් අනුකූල විය;** 2018 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙක් විය. 2008 අංක 41 දරන PSB පනතට අනුව, අධ්‍යක්ෂවරු හතර දෙනෙක් බැංකුවේ කොටස්හිමියන්, සහ මහ භාණ්ඩාගාරය විසින් පත්කර ඇත.
	(අ)	බැංකුවේ සියයට 1 ට වැඩිපුර සෘජු හා වක්‍ර කොටස්හිමිකාරත්ව දැරීම;	**අදාළ නැත.**
	(ආ)	බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන මෙහි 3 (7) නියෝගය තුළ විස්තර කර ඇති පරිදි බැංකුව සමඟ යම් ව්‍යාපාර ගනුදෙනු දැනට තිබීම හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස ඔහුගේ හෝ ඇයගේ පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක කාලසීමාව තුළ තිබීම.	**අදාළ නැත.**
	(ඇ)	අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පූර්වාසන්නයෙන් වසර දෙකක කාලසීමාව තුළ බැංකුව විසින් සේවයේ යොදවා තිබීම.	**අදාළ නැත.**
	(ඈ)	අධ්‍යක්ෂවරයෙක්, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්, බැංකුවේ හෝ වෙනත් බැංකුවක සැලකියයුතු කොටස්හිමියෙක් සමඟ සමීප සම්බන්ධයක තිබීම (මෙම අරමුණ සඳහා, "සමීප ඥාතියා" යන්නෙන් කලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන ළමයා අදහස් වේ);	**අදාළ නැත.**

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(ඉ) බැංකුවේ සැලකියයුතු කොටස්හිමියෙක් නියෝජනය කිරීම.	**අදාළ නැත.**
	(ඊ) පහත සමාගමක හෝ ව්‍යාපාර ආයතනයක සේවකයෙක් හෝ අධ්‍යක්ෂවරයෙක් හෝ සැලකියයුතු කොටස්හිමියෙක් වීම: (I) බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන මෙහි 3 (7) නියෝගය තුළ විස්තර කර ඇති පරිදි බැංකුව සමඟ වර්තමානයේ යම් ව්‍යාපාර ගනුදෙනු තිබීම, හෝ (II) බැංකුවේ යම් වෙනත් අධ්‍යක්ෂවරු සේවයේ යොදවා ඇති හෝ අධ්‍යක්ෂවරුන් වන හෝ සැලකියයුතු කොටස්හිමියෙක් වීම, හෝ (III) බැංකුවේ යම් වෙනත් අධ්‍යක්ෂවරුන්ට බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන මෙහි 3 (7) නියෝගය තුළ විස්තර කර ඇති ගනුදෙනුවක් තිබීම.	**අදාළ නැත.**
3 (2) (v)	විකල්ප අධ්‍යක්ෂවරයෙක් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් නියෝජනය කිරීමට පත්කළ අවස්ථාවක, එසේ පත්කරන පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළවන නිර්ණායක සපුරාලන්නේද යන්න පරීක්ෂා කිරීම.	**අදාළ නැත;** 2008 අංක 41 දරන පනත අනුව විකල්ප අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා විධිවිධාන නොමැත.
3 (2) (vi)	ස්වාධීන අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා ක්‍රියාවලියක් බැංකුවට ඇත.	**අදාළ නැත;** සියලුම අධ්‍යක්ෂවරු අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබයි.
3 (2) (vii)	බැංකුවේ නියමිත සංඛ්‍යාවට අධ්‍යක්ෂවරුන්ගෙන් 50%ට වඩා ඇතුළත් වන අතර මෙම සංඛ්‍යාවෙන් 50%ට වැඩිපුර විධායක නොවන අධ්‍යක්ෂවරු ඇතුළත් කළ යුතුය.	**අනුකූල විය;** සංඛ්‍යාවට (පනතේ 16 වගන්තිය අනුව තීරණය කළ පරිදි) අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු 7කින් සමන්විතවේ නම් 5 ක් ඇතුළත් වියයුතු අතර, අධ්‍යක්ෂවරු ගණන 8ට වැඩිනම් 6ක් ඇතුළත් විය යුතුය. සංඛ්‍යාවෙන් 50%ට වැඩිපුර විධායක නොවන අධ්‍යක්ෂවරු නියෝජනය කළ යුතුය.
3 (2) (viii)	වාර්ෂික ආයතනික පාලන වාර්තාව තුළ සභාපති, විධායක අධ්‍යක්ෂවරු, විධායක නොවන අධ්‍යක්ෂවරු සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ වර්ගය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය බැංකුව අනාවරණය කරයි.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරුන්ගේ වර්ගය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කෙරේ.
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරු පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටිය.	**අදාළ නැත;** සියලුම අධ්‍යක්ෂවරු අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබයි.
3 (2) (x)	තාවකාලික ඇබෑර්තුවක් පිරවීමට පත්කරන ලද සියලුම අධ්‍යක්ෂවරු ඔවුන්ගේ පත්කිරීමෙන් පසු පළමු මහ සභා රැස්වීමේදී කොටස්හිමියන් විසින් තෝරා ගැනීමට යටත් වීම.	**අදාළ නැත;** සියලුම පත්කිරීම් සහ ඉවත් කිරීම භාණ්ඩාගාරයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් සිදු කරනු ලබයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (2) (xi)	යම් අධ්‍යක්ෂවරයෙක් තනතුරින් ඉල්ලා අස්වන්නේනම් හෝ ඉවත් කරනු ලබන්නේනම්, අධ්‍යක්ෂ මණ්ඩලය: (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ එකී ඉල්ලා අස්වීම හෝ ඉවත්කිරීම සඳහා හේතු සමඟ මෙයටම සීමා නොවූවද බැංකුව සමඟ අදාළ අධ්‍යක්ෂවරයාගේ එකඟ නොවීම් (ඇත්නම්) වලට අදාළ තොරතුරු නිවේදනය කරන අතර, (ආ) කොටස්හිමියන්ගේ අවධානයට යොමුකළ යුතු කරුණු තිබේද යන්න පිළිබඳව තහවුරු කරමින් ප්‍රකාශයක් නිකුත් කරයි.	**අනුකූල විය;** සියලුම පත්කිරීම් සහ ඉවත් කිරීම භාණ්ඩාගාරයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් සිදු කරනු ලබයි. ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයා බැංකුව වෙත ලිපියක් ලබාදීමෙන් ඔහුගේ/ඇයගේ ඉල්ලා අස්වීම පිළිගන්නා අතර එම ලිපිය පදනම් කරගෙන බැංකුව අදාළ අධ්‍යක්ෂගේ ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයට වාර්තා කරයි.
3 (2) (xii)	යම් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් හෝ සේවකයෙක් වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම හඳුනා ගැනීමට ක්‍රියාවලියක් ඇති බවට පරීක්ෂා කිරීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරු පත්කිරීම භාණ්ඩාගාරයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් සිදු කරනු ලබන බැවින් එවැනි අවස්ථා ඇති නොවේ. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් ලබාගන්නා ප්‍රකාශන මත පදනම් වී යෝග්‍යතාව සහ උචිතබව තක්සේරු කරයි.

3 (3) අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාව සහ උචිතබව තක්සේරු කිරීමේ නිර්ණායකි.

3 (3) (i)	අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරන යම් පුද්ගලයෙක් වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය.	**අනුකූල විය;** අවුරුදු 70 ට වැඩි කිසිදු අධ්‍යක්ෂවරයෙක් අධ්‍යක්ෂ මණ්ඩලයේ නොමැත.
	(අ) සංක්‍රාන්තිමය විධිවිධානවලට අනුකූල වී ඇත	**අදාළ නැත.**
3 (3) (ii)	යම් පුද්ගලයෙක් බැංකුවේ පරිපාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළුව සමාගම්/ආයතන 20කට වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙක් ලෙස තනතුරු දරන්නේද යනබව.	**අනුකූල විය;** කිසිදු අධ්‍යක්ෂවරයෙක් ඔවුන්ගේ ප්‍රකාශන පරිදි සමාගම 20ක අධ්‍යක්ෂ ධූරය නොදරයි.

3 (4) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද කළමනාකරණ කාර්යයන්

3 (4) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පැවරීමේ වැඩපිළිවෙල අනුමත කර ඇත.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත බැංකුවේ කටයුතුවලට අදාළව බලය බෙදා ඇත.
3 (4) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි කාර්යයන් හි බලය පවරා තිබුනද 3 (1) (i) හි කරුණු සඳහා වගකීම භාරගෙන තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි කාර්යයන් හි බලය පවරා තිබුනද 3 (1) (i) හි කරුණු සඳහා වගකීම භාරගනී.
3 (4) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවශ්‍යතාවන්ට අදාළව බලය පැවරීම පවතින්නේද යන්න සහතික කිරීම සඳහා නිරන්තර පදනමක් මත ක්‍රියාත්මකව පවත්නා බලතල පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තර පදනමක් මත බලතල පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කරයි. ඒ අනුව බලධාරී මට්ටම වෙත අනුමත සීමා තීරණය කර ඇත.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (5) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO)		
3 (5) (i)	සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරිගේ කාර්යභාරය වෙන් කර ඇති අතර එකම පුද්ගලයෙක් විසින් ඉටු නොකරයි.	**අනුකූල විය;** සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරිගේ තනතුරු වෙන්කර ඇති අතර පුද්ගලයින් දෙදෙනෙක් විසින් දරනු ලබයි. සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ප්‍රධාන විධායක නිළධාරි බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරයේ දෛනික කළමනාකරණයේ විධායකයා ලෙස කටයුතු කරයි. කෙසේ වෙතත්. 2018 නොවැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ තීරණය පරිදි බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ අනෙකුත් උපකරණ අත්සන් කිරීම තුළ සභාපති සම්බන්ධ වේ.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් නොවන අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය සුදුසු පරිදි ලේඛණගතකළ යොමු නිර්දේශ සමඟ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙක් ලෙස ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් නම් කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ නම්කිරීම බැංකුවේ වාර්ෂික වාර්තාවේ අනාවරණය කෙරේ.	**අනුකූල විය;** සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි. කිසිදු අධ්‍යක්ෂවරයෙක් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කර නැත.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලට සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර යම් සම්බන්ධතා (මූල්‍යමය, ව්‍යාපාර, පවුලේ හෝ අනෙකුත් වැදගත්/අදාළ සම්බන්ධතා) සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් අතර ඇතුළුව යම් සම්බන්ධතා (ඇත්නම්) ආයතනික පාලන වාර්තාව තුළ එය හඳුනාගැනීමට සහ අනාවරණය කිරීමට ක්‍රියාවලියක් ඇති අතර මෙය වාර්ෂික වාර්තාවේ කොටස් වේ.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන වාර්ෂික ප්‍රකාශන එවැනි සම්බන්ධතා හඳුනා ගැනීමට සහය වේ.
3 (5) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ඇති අතර එහිදී සභාපති: (අ) අධ්‍යක්ෂ මණ්ඩලට නායකත්වය ලබා දේ (ආ) අධ්‍යක්ෂ මණ්ඩල ඵලදායීව කටයුතු කරන බව සහ එහි වගකීම් මුදාහරින බව සහතික කරයි (ඇ) සියලුම ප්‍රධාන සහ සුදුසු ගැටළු කාලීන ආකාරයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡා කරන බව සහතික කරයි.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ආකෘතිපත් ලබාගත හැක.
3 (5) (v)	සභාපති විසින් අනුමත කළ විධිමත් න්‍යාය පත්‍රය සමාගම් ලේකම් විසින් බෙදාහරිනු ලබයි.	**අනුකූල විය;** එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල න්‍යාය පත්‍රය සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරිගේ උපදේශකත්වයෙන් සමාගම් ලේකම් විසින් බෙදාහරිනු ලබයි.
3 (5) (vi)	කාලීන ඉදිරිපත් කිරීම් තුළින් සියලුම අධ්‍යක්ෂවරු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී මතුවන ගැටළු පිළිබඳ ප්‍රමාණවත්ව සාකච්ඡා කරන බව සභාපති සහතික කරයි.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සාකච්ඡාව සඳහා ගනු ලබන කරුණු හදිසි කරුණකදී හැර රැස්වීමට අවම වශයෙන් දින 7කට පෙර නිවේදනය සමඟ බෙදා හරිනු ලබයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (5) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ඇත. ඉන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතුවලදී සම්පූර්ණ සහ සක්‍රිය දායකත්වය ලබාදීමට සියලුම අධ්‍යක්ෂවරු දිරිගන්වන අතර සභාපති බැංකුවේ පොදු යහපත සඳහා කටයුතු කිරීමට පෙරමුණ ගනී.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ආකෘතිපත් ලබාගත හැක.
3 (5) (viii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ඇති අතර ඉන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය අගය කරයි.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං ඇගයීම් ආකෘතිපත් ලබාගත හැක.
3 (5) (ix)	සභාපති ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හෝ වෙනත් යම් විධායක රාජකාරි පිළිබඳ සෘජු අධීක්ෂණය සම්බන්ධ කටයුතුවල නිරතවීම.	**අනුකූල විය;** සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ අධීක්ෂණයට සෘජුව සම්බන්ධ නොවේ. කෙසේ වෙතත්, සභාපති 2018 නොවැම්බර් 30 දින අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුවේ තීරණය පරිදි බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ අනෙකුත් උපකරණ අත්සන් කිරීම තුළ සභාපති සම්බන්ධ වේ.
3 (5) (x)	කොටස්හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනය පවත්වාගැනීමට ක්‍රියාවලියක් ඇති අතර කොටස්හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කෙරේ.	**අනුකූල විය;** 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව, බැංකුවේ කොටස් හිමිකම සහ භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජිකයින් හතර දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයට නිලබලයෙන් පත්කරන ලදී. ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස්හිමියන් අතර මාර්ගයක් ලෙස කටයුතු කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරි බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල දෛනික කළමනාකරණයේ ඉහළම විධායක නිලධාරියා ලෙස කටයුතු කරයි.	**අනුකූල විය;** ප්‍රධාන විධායක නිලධාරි බැංකුවේ දෛනික කළමනාකරණයේ ඉහළම විධායක නිලධාරියා වේ. මෙහෙයුම් සහ ව්‍යාපාර කටයුතුවලදී ඔහුට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහයවන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

3 (6) අධ්‍යක්ෂ මණ්ඩලය පත්කළ කමිටු

3 (6) (i)	මෙම නියෝගවල 3 (6) (ii), 3 (6) (iii), 3 (6) (iv) සහ 3 (6) (v) නියෝගවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් ස්ථාපිත කර ඇත. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය ආමන්ත්‍රණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල රාජකාරි, කාර්යභාරයන් සහ කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කරයි.	**අනුකූල විය;** මෙම නියෝගවල 3 (6 (ii), 3 (6) (iii), 3 (6) (iv) සහ 3 (6) (v) නියෝගවල දක්වා ඇති පරිදි බැංකුව පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු ස්ථාපිත කර ඇති අතර ඒවා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල රාජකාරි, කාර්යභාරයන් සහ කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂික වාර්තාවට ඇතුළත් කරයි.
3 (6) (ii)	විගණන කමිටුව: (අ) විගණන කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර ඔහුට සුදුසුකම් සහ පළපුරුද්ද ඇත.	**අනුකූල නොවිය;** විගණන කමිටුවේ සභාපති මහා භාණ්ඩාගාරය විසින් පත්කරනු ලබන අධ්‍යක්ෂවරයෙකි. කොටස් ප්‍රාග්ධනයෙන් බහුතරය මහා භාණ්ඩාගාරයට අයත් වන බැවින් ඉහත අධ්‍යක්ෂ ස්වාධීන නොවේ.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(ආ) කමිටුවල සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.	**අනුකූල විය;** කමිටුවල සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති.
	(ඇ) කමිුව විසින් පහත කරුණු සම්බන්ධයෙන් නිර්දේශ සිදුකර ඇත: (i) අදාළ නීතිවලට අනුකූලතාවය ලබාදීම තුළ විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම; (ii) වරින් වර විගණකවරුන්ට නිකුත් කරන මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම; (iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම, සහ (iv) විගණකගේ සේවාකාලය, විගණක ගාස්තුව සහ ඉල්ලා අස්වීම හෝ අස්කිරීම. කෙසේවෙතත් විගණක හවුල්කරුගේ සහභාගිත්වය වසර පහ නොඉක්මවිය යුතු අතර එකී විශේෂිත විගණක හවුල්කරු පෙර කාලසීමාව සම්පූර්ණ කරන දිනයේ සිට වසර තුනක කාලයක් සම්පූර්ණවීමට පෙර නැවත සහභාගිකර නොගත යුතුය.	**අදාළ නැත;** 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වගන්තියට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. බාහිර විගණක ආරාධනය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සහභාගි වේ. වරින් වර විගණකවරුන්ට නිකුත් කරන මහ බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම රැස්වීම් තුළ සාකච්ඡා කරයි.
	(ඈ) කමිටුව ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ බාහිර විගණකගෙන් නියෝජන ලබාගෙන ඇති බව සහ විගණනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කරන බව.	**අදාළ නැත;** 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වගන්තියට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.
	(ඉ) කමිටුව විසින් අදාළ රෙගුලාසිවලට අනුකූලව විගණන නොවන සේවා ලබාදීමට බාහිර විගණකගේ සහභාගිත්වය පිළිබඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත.	**අදාළ නැත;** විගණකාධිපති බැංකුවේ විගණකවරයා වන බැවින් එවැනි අවස්ථා උදා වී නොමැත.
	(ඊ) කමිටුව විගණනය ආරම්භවීමට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව බාහිර විගණක සමඟ විගණනයේ ස්වභාවය සහ විෂයපථය පිළිබඳ සාකච්ඡාකර එකඟ වී ඇත.	**අදාළ නැත;** 1971 අංක 38 දරන මූල්‍ය පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති විගණනයේ ස්වභාවය සහ විෂයපථය තීරණය කිරීමට විගණකාධිපතිට අභිමතානුකූල බලය ලබා දේ.
	(උ) කමිටුවට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ අනාවරණය සඳහා පිළියෙල කරන කාර්තුමය වාර්තාවල අවංකකම සහ පහත දැ ප්‍රධාන මූල්‍ය නිලධාරිගෙන් ලබාගැනීම නියාමනය කිරීම පිණිස බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමට ක්‍රියාවලියක් ඇත: (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ව්‍යවහාරවල යම් වෙනස්වීම්; (iii) අඛණ්ඩතාව පිළිබඳ උපකල්පනය, සහ (iv) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූලතාවය, සහ (v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන්, විගණනයෙන් ඇතිවන වැදගත් ගැලපීම්.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කරයි. මෙම සමාලෝචනයට කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් ඇතුළත්ය.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
(උ)	කමිටුව විගණනය සම්බන්ධයෙන් විධායක කළමනාකරණය නොපැමිණීමේ ගැටළුවට අදාළව බාහිර විගණවරු හමුවී ඇත.	**අනුකූල විය;** කමිටුව විධායක කළමනාකරණය නොමැතිව බාහිර විගණවරු සමඟ රැස්වී ඇත.
(එ)	කමිටුව බාහිර විගණවරුන්ගේ කළමනාකරණ ලිපිය සහ එයට කළමනාකරණයේ ප්‍රතිචාරය සමාලෝචනය කර ඇත.	**අනුකූල නොවිය;** කමිටුව 2017 වසරේ කළමනාකරණ ලිපිය සහ එයට කළමනාකරණයේ ප්‍රතිචාරය සමාලෝචනය කර නොමැත.
(ඒ)	කමිටුව බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සම්බන්ධයෙන් පහත සඳහන් පියවර ගෙන ඇත:	
	I. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්වල ප්‍රමාණාත්මතාව සමාලෝචනය කර දෙපාර්තමේන්තුවට එහි කාර්යය කරගෙන යාමට අවශ්‍ය බලය ඇති බවට සෑහීමට පත්වීම;	**අනුකූල විය.**
	II. අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීම;	**අනුකූල විය.**
	III. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම;	**අනුකූල විය;** 2018 වසර සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකගෙ වාර්ෂික කාර්යසාධන ඇගයීම් වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කර ඇත.
	IV. අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම හෝ අවසන් කිරීම නිර්දේශ කිරීම;	**අනුකූල විය;** විගණන කමිටුවේ සාමාජිකයින් ඇතුළත් සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කිරීම අනුමත කරන ලදී.
	V. කමිටුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර සේවා සපයන්නන් ඇතුළුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් ඇගයීමට ලක් කරන අතර ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන්ට අවස්ථාවක ලබාදීම;	**අනුකූල විය;** අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන ප්‍රධානීගේ කාර්යසාධනය කමිටුව ඇගයීමට ලක්කරන ලදී.
	VI. අභ්‍යන්තර විගණන කාර්යය එහි විගණන කටයුතුවලදී ස්වාධීනවන බව.	**අනුකූල විය;** අභ්‍යන්තර විගණන කාර්යය එහි විගණන කටයුතුවලදී ස්වාධීන වන අතර සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කරයි. මෙහෙයුම් ඒකකයේ විගණන සොයාගැනීම් නිවැරදි කිරීම සඳහා යොමු කිරීමට සාමාන්‍යාධිකාරී/ප්‍රවිනි වෙත ඉදිරිපත් කරයි.
(ඔ)	අභ්‍යන්තර විමර්ෂණවල ප්‍රධාන සොයාගැනීම් සහ ඒවාට කළමනාකරණයේ ප්‍රතිචාර කමිටුව සලකා බලා ඇති බව තීරණය කරන වාර්තා.	**අනුකූල විය;** ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ කළමනාකරණ ප්‍රතිචාර විගණන කමිටුව සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය නිර්දේශ සිදුකර ඇත.
(ඕ)	විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය නොමැතිව බාහිර විගණකවරු සමඟ අවම වශයෙන් රැස්වීම් දෙකක් පවත්වා තිබීම.	**අනුකූල විය;**

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(ක) කම්ටුවේ යොමු නිර්දේශ මගින් පහත දෑ සහතික කරයි: (i) එහි යොමු නිර්දේශ තුළ යම් කරුණු විමර්ෂණය කිරීමට පැහැදිලි බලය; (ii) එසේ කිරීමට අවශ්‍ය සම්පත්ත; (iii) තොරතුරු කරා සම්පූර්ණ පිවිසීම, සහ (iv) බාහිර වෘත්තීය උපදෙස් ලබාගැනීමට සහ අවශ්‍යනම් අදාළ පළපුරුද්ද සහිත බාහිර පුද්ගලයින්ට සහභාගිවීමට ආරාධනා කිරීමේ බලය.	**අනුකූල විය;** විගණන කම්ටුවේ "යොමු නිර්දේශ" සියලුම විෂය ක්ෂේත්‍ර ආවරණය කරයි.
	(ග) කම්ටුව අවම වශයෙන් හතර වරක් මුණ ගැසී ඇති අතර වාර්තා පවත්වා ගෙන ඇත.	**මදක් අනුකූල විය;** කම්ටු රැස්වීම් තුනක් 2018 වසර තුළ පවත්වා ඇත. කෙසේවෙතත්, අධ්‍යක්ෂවරු පත් නොකිරීම මත විගණන කම්ටු රැස්වීම් 2018 අප්‍රේල් 28 දින සිට 2018 සැප්තැම්බර් 16 දක්වා පවත්වා නොමැත.
	(ඛ) අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කරයි, (i) විගණන කම්ටුවේ කටයුතු පිළිබඳ විස්තර; (ii) විගණන කම්ටුව විසින් වසර තුළ පවත්වනු ලබන රැස්වීම් ගණන, සහ (iii) එවැනි රැස්වීම්වලදී එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර	**අනුකූල විය.**
	(ජ) කම්ටුවේ ලේකම් සමාගමේ ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රධානියා වේ.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල ලෙකම් විගණන කම්ටුවේ ලේකම් වේ.
	(ට) "තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය" පහත සඳහන් ක්‍රියාවලි ආවරණය කරයි; (i) මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කරුණුවල අනිසිතාව; (ii) (i) සම්බන්ධයෙන් එවැනි කරුණ පිළිබඳ සාධාරණ සහ ස්වාධීන විමර්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවා ඇති බවට කම්ටුව සහතික වීම, සහ (iii) සුදුසු පසුවිපරම් කාර්යය.	**අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත "තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තියක්" ක්‍රියාවට නංවා ඇත.
3 (6) (iii)	මානව සම්පත් සහ පාරිශ්‍රමික කම්ටුව සම්බන්ධයෙන් පහත සඳහන් නිති අනුගමනය කරන බව;	
	(අ) "යොමු නිර්දේශ" සහ වාර්තා සමාලෝචනය මගින් කම්ටුව බැංකුවේ අධ්‍යක්ෂවරු, ප්‍රවිනි සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍ය ගෙවීම්) තීරණය කිරීමට ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය PED චක්‍රලේඛය මගින් පාලනය කරයි. කම්ටුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට පාරිශ්‍රමිකය, දීමනා සහ වෙනත් මූල්‍ය ගෙවීම් තීරණය කිරීමට ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත.
	(ආ) අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අරමුණු සහ ඉලක්ක ලේඛනගතකර ඇත.	**මදක් අනුකූල විය;** ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අරමුණු සහ ඉලක්ක එක් එක් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන වාර්ෂික කාර්ය සැලැස්ම තුළින් ලේඛනගතකර ඇත.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(ඇ) පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ කාර්යසාධනය පදනම් දිරිදීමනා මත අනෙකුත් ගෙවීම් සමාලෝචනය සඳහා පදනම තීරණය කිරීමට කලින් කල නියමිත අරමුණු සහ ඉලක්ක අනුව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධන ඇගයීම් කමිටුව විසින් සලකා බලා ඇත.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමට ලක්කර ඇත. කෙසේවෙතත්, අවදානම, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණනය වැනි ස්වාධීන කාර්යයන්ට අයත්වන කාර්යසාධනය ඇගයීම අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.
	(ඈ) "යොමු නිර්දේශ" මගින් ප්‍රධාන විධායක නිලධාරීට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන විට කමිටුවේ රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහභාගි නොවිය යුතු බව දන්වා ඇත.	**අනුකූල විය;** BHRRC හි "යොමු නිර්දේශ" මගින් ප්‍රධාන විධායක නිලධාරීට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන විට කමිටුවේ රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරී සහභාගි නොවියයුතු බව දන්වා ඇත.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධයෙන් පහත සඳහන් නිති අනුගමනය කරන බව;	
	(අ) නව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය තෝරා ගැනීම/පත්කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් කමිටුව ක්‍රියාත්මක කර තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරු පත්කිරීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා විසින් සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී පත්කරයි.
	(ආ) කමිටුව වර්තමාන අධ්‍යක්ෂවරු නැවත පත්කිරීම සලකා බලා නිර්දේශ කර ඇත (නිර්දේශ කර නොමැත).	**අදාළ නැත;** භාණ්ඩාගාරයේ ලේකම්ගේ උපදේශකත්වයෙන් ගරු අමාත්‍යතුමා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරයි.
	(ඇ) රැකියා විස්තර සමාලෝචනය මගින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තනතුරුවලට පත්කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලීමේ සුදුසුකම සඳහා අවශ්‍යවන සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික ආකල්ප වැනි නිර්ණායක කමිටුව නියම කර ඇත.	**අනුකූල විය;** ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරිවරු තනතුරු සඳහා තෝරා ගැනීම සඳහා යෝග්‍යවීම සඳහා අවශ්‍යවන සුදුසුකම්, පළපුරුද්ද 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත විසින් තීරණය කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුමත බඳවාගැනීමේ පටිපාටිය සහ අභ්‍යන්තර උසස්වීම දැක්වෙන යෝග්‍යතා නිර්ණායක ලබාගත හැකිය.
	(ඈ) කමිටුව අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් 3 (3) නියෝගය සහ ව්‍යවස්ථාවල දක්වා ඇති නිර්ණායක පරිදි තනතුරු දැරීමට ඔවුන් සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බවට අත්සන් කරමින් ඔවුන්ගෙන් ප්‍රකාශන ලබාගෙන ඇත.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සුදුසුකම සහ යෝග්‍යතාව පිළිබඳ ප්‍රකාශ ලබාගෙන ඇති අතර බැංකු පනත් නියෝග විසින් තීරණය කරන පරිදි වාර්ෂිකව සමාලෝචනය කෙරේ.
	(ඉ) කමිටුව අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විශ්‍රාම යාම වෙනුවෙන් විධිමත් අනුප්‍රාප්ත සැලැස්මක් සලකාබලා ඇත.	**මදක් අනුකූල විය;** අධ්‍යක්ෂවරු සඳහා අනුප්‍රාප්ත වැඩපිළිවෙල මුදල් අමාත්‍යාංශය තුළින් සිදුකරනු ලබයි. බැංකුවේ අනුප්‍රාප්ත වැඩපිළිවෙලේ යාන්ත්‍රණය තීරණය කිරීමට අනුප්‍රාප්ත ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවා ඇත. කෙසේවෙතත්, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්ත සැලැස්ම මේ දක්වා අවසන් කර නොමැත.
	(ඊ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ උපදේශකත්වයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් විසින් මෙහෙයවනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරීට ආරාධනය අනුව රැස්වීමට සහභාගි විය හැක.	**අනුකූල විය.**

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (6) (v)	මානව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) සම්බන්ධයෙන් පහත සඳහන් නීති අනුගමනය කරන බව;	
	(අ) බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් වැනි පුළුල් අවදානම් වර්ගීකරණ අධීක්ෂණය කරන සහ කමිටුවට පවරන ලද බලය සහ වගකීම් රාමුව තුළ කටයුතු කරන අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙක්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් මෙම කමිටුව සමන්විත වේ.	**අනුකූල විය;** විධායක නොවන අධ්‍යක්ෂවරු හතරක්, එක් විධායක අධ්‍යක්ෂවරයෙක්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරීගෙන් කමිටුව සමන්විත වේ. අනුකූලතා නිලධාරී ආරාධනයෙන් මෙම කමිටුවට සහභාගි වේ.
	(ආ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු තුළින් මාසික පදනමක් මත බැංකුවේ ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ ක්‍රමෝපායික අවදානම් වැනි සියලුම අවදානම් තක්සේරු කිරීම සඳහා ක්‍රියාවලියක් කමිටුවට ඇත. පරිපාලිත සමාගම සහ ආශ්‍රිත සමාගම සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණය බැංකු පදනමින් සහ සමූහ පදනමින් සිදුකරනු ලැබේ.	**අනුකූල විය;** බැංකුවේ අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව ප්‍රධාන අවදානම් නිලධාරී විසින් මාසික පදනමක් මත පිළියෙල කරන අතර සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.
	(ඇ) ණය කමිටුව සහ වත්කම් සහ වගකීම් කමිටු වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සඳහා විශේෂිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් මට්ටම් කමිටුව සමාලෝචනය කර ඇති අතර කලින් කල අවදානම් දර්ශක වාර්තා කරයි.	**අනුකූල විය;** කමිටු මෙහෙයුම්වල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සහතික කිරීම සඳහා කළමනාකරණ මට්ටමේ කමිටු රැස්වීම් වාර්තා BIRMC විසින් සමාලෝචනය කරයි. කෙසේවෙතත්, ඉහත කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වන බැවින් ණය කමිටු රැස්වීම් වාර්තා සමාලෝචනය කර නොමැත.
	(ඈ) විශේෂිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් මට්ටම්වලින් ඉදිරියට ගොස් ඇති සියළුම අවදානම් දර්ශන කමිටුව විසින් සමාලෝචනය කර සැලකිල්ලට ගෙන ඇත.	**අනුකූල විය;** ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරයි.
	(ඉ) කාර්තුවකට අවම වශයෙන් කමිටුව රැස්වූ වාර ගණන.	**මඳක් අනුකූල විය;** අධ්‍යක්ෂ මණ්ඩලය නොමැති කාලසීමාව හැර 2018 වසර තුළ කමිටුව තුන් වරක් මුණගැසී ඇත.
	(ඊ) විශේෂ අවදානම් හඳුනා ගැනීමට අසමත්වීම සඳහා වගකීමට බැඳෙන නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ලේඛනගත විනය ක්‍රියාමාර්ගයක් කමිටුව විසින් සමාලෝචනය කර සැලකිල්ලට ගෙන ඇත.	**අනුකූල විය;** විධිමත් විනය සංග්‍රහයක් ක්‍රියාත්මක වේ. කමිටු පත්‍රිකා තුළින් අවදානම් කරුණු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගය ක්‍රියාපටිපාටිය නිර්දේශ කිරීමට කමිටුව තීරණ ගෙන ඇත.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාව සහ/හෝ විශේෂ උපදෙස් අපේක්ෂා කරමින් එක් එක් රැස්වීමෙන් සතියක් තුළ අවදානම් කළමනාකරණ වාර්තාවක් කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.	**අනුකූල විය;** බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී විසින් මාසික පදනමක් මත පිළියෙල කරන අතර ඉදිරි මාසයේදී ආසන්න අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි.
	(ඌ) නීති, රෙගුලාසි, නියාමන මඟපෙන්වීම්, අභ්‍යන්තර පාලනයන් සියලුම ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රවල අනුමත ප්‍රතිපත්තිවලට බැංකුවේ අනුකූලතාව තක්සේරු කිරීමට සහ කමිටුව අනුකූලතා කාර්යයක් ස්ථාපිත කර ඇති අතර අනුකූලතා කාර්යය කරගෙන යාමට ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙන් තෝරාගත් විශේෂ අනුකූලතා නිලධාරීයෙක් සිටින අතර ඔහු කලින් කල කමිටුව වෙත වාර්තා කරයි.	**අනුකූල විය;** බැංකුවේ අනුකූලතා කාර්යය අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවන අතර අනුකූලතා අවදානම් තක්සේරු වාර්තාව කලින් කල වෙත ඉදිරිපත් කරයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (7) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු		
3 (7) (i)	යම් පුද්ගලයින් සමඟ විශේෂයෙන් මෙම නියෝගයේ අරමුණ සඳහා "සම්බන්ධිත පාර්ශව" ලෙස සලකනු ලබන පහත සඳහන් පුද්ගල වර්ගීකරණ සමඟ බැංකුවේ යම් ගනුදෙනුවලින් ඇතිවිය හැකි යම් බැඳියා පිළිගැටුම්වලින් අධ්‍යක්ෂ මණ්ඩලය වැලැක්වීමට ස්ථාපිත ලේඛනගත ක්‍රියාවලියක් ඇත: (අ) බැංකුවේ යම් පරිපාලිත සමාගමක (ආ) බැංකුවේ යම් ආශ්‍රිත සමාගමක (ඇ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක්, (ඈ) බැංකුවේ යම් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, (ඉ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප ඥාතියෙක් (ඊ) බැංකුවේ සැලකියයුතු හිමිකමක් සහිත කොටස්හිමියෙක් (උ) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක් හෝ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙක්ගේ සමීප ඥාතියෙක් බැංකුවේ සැලකියයුතු හිමිකමක් සහිත කොටස්හිමියෙක් අදහස්වන පුද්ගලයෙක්	**මදක් අනුකූල විය;** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තියක් ඇත. කෙසේවෙතත්, එය නිවැරදිව සමාලෝචනය කර නොමැත. සම්බන්ධිත පාර්ශ්වයන්ට අයත්වන ගනුදෙනු ප්‍රකාශිත මත පදනම් වී ජාතික හැඳුණුම්පත් අංකය භාවිතයෙන් ග්‍රහනය කර ගත හැකිය.
3 (7) (ii)	මෙම නියෝගයෙන් ආවරණය වන "සම්බන්ධිත පාර්ශව" සමඟ ගනුදෙනු ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමට ක්‍රියාවලියක් ඇත:	**මදක් අනුකූල විය;** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකය. කෙසේවෙතත්, ඉහත ප්‍රතිපත්තියෙන් ආවරණය කරන්නේ (අ) පමණි. බැංකුවට පද්ධතියක් තුළින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගැනීමේ ක්‍රියාවලියක් ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ඉදිරිපත්කළ ප්‍රකාශන මත පදනම් වී, ගනුදෙනු පද්ධතිය තුළින් තෝරාගත හැකිය.
	(අ) පහසුකමේ උපරිම ප්‍රමාණය මත මුදල් මණ්ඩලයේ නියෝගයෙහි දක්වා ඇති පහසුකම් වර්ගයක් ප්‍රදානය කිරීම.	
	(ආ) තැන්පතු, ණයගැනීම් සහ ආයෝජනවලින් බැංකුවේ යම් වගකීමක් නිර්මාණය කිරීම.	
	(ඇ) මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ යම් සේවාවක් බැංකුව වෙත ලබාදීම හෝ බැංකුවෙන් ලබාගැනීම.	
	(ඈ) සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලැබිය හැකි හිමිකාර, රහසිගත හෝ සංවේදී තොරතුරු නුවමාරුකර ගැනීමට හේතුවිය හැකි බැංකුව සහ යම් සම්බන්ධිත පාර්ශ්ව අතර වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ නිර්මාණය සහ නඩත්තුව.	
3 (7) (iii)	බැංකුව ඉහත 3 (7) (i) නියෝගය තුළ විස්තර කරන පරිදි සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ එම ව්‍යාපාරය කරගෙන යන බැංකුවේ අනෙක් පුද්ගලයින්ට සලකන ආකාරයට වඩා ඔවුන්ට වඩාත් හිතකර සැලකිමක් ලබා දෙන ආකාරයෙන් ගනුදෙනුවල යෙදී නැති බව අධ්‍යක්ෂ මණ්ඩලයට සහතික කිරීමට ක්‍රියාවලියක් තිබීම.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥාතීන්ට සහ හිතවතුන්ට ලබාදෙන ලද පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සකස්වී ඇති අධ්‍යක්ෂවරු ගණනින් තුනෙන් දෙකට නොඅඩු ගණනක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරනු ලැබේ. කෙසේවෙතත්, සලකාබලන කාලය තුළ එවැනි අවස්ථා උදාවී නොමැත.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතය ඉක්මවන පරිදි සම්බන්ධිත පාර්ශ්වයන් වෙත "මුළු ශුද්ධ පහසුකම" ප්‍රදානය කිරීම. මෙම උප නියෝගයේ අරමුණ සඳහා: I. "පහසුකම" යන්නෙන් උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ 2007 අංක 07 දරන බැංකු පනත් නියෝගයේ දක්වා ඇති පහසුකම අදහස් වේ. II. "මුළු ශුද්ධ පහසුකම" ගණනය කරනු ලබන්නේ මුළු පහසුකම, බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ එකී සම්බන්ධිත පාර්ශ්වය විසින් සිදුකරන මූල්‍ය ඇප සහ ආයෝජනවලින් සහ වසර පහ හෝ ඊට වැඩි කල්පිරීමක් සහිත ණය උපකරණ අඩුකිරීමෙනි;	
	(ආ) බැංකුවේ වඩා හොඳ ණයදීමේ අනුපාතයට වඩා අඩු පොළි අනුපාතයක් අයකිරීම හෝ අසම්බන්ධිත සැසැඳියහැකි ඇපයක් සහිත සැසැඳියහැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා ගෙවීම;	
	(ඇ) හිතකර කොන්දේසි වැනි වරණීය ප්‍රතිකාර ලබාදීමල අසම්බන්ධිත පාර්ශ්වයන් සමඟ සිදුකරන සාමාන්‍ය ව්‍යාපාර රටාව තුළ ලබාදෙන නියමයන්ට වඩා වෙළෙඳ අලාභ ආවරණය සහ/හෝ ගාස්තු/කොමිස් කපාදැමීම;	
	(ඈ) ඇගයීම් ක්‍රියාපටිපාටියක් නොමැතිව සම්බන්ධිත පාර්ශ්වයක් වෙත සේවා ලබාදීම හෝ සේවයක් ලබාගැනීම;	
	(ඉ) නීත්‍යනුකූල රාජකාරී සහ කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍යතාව හැර සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ හිමිකාර, රහසිගත සහ සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු විය හැකි වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	
3 (7) (iv)	බැංකුවට එහි අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත පහසුකම් ලබාදීම සඳහා ක්‍රියාවලියක් ඇති අතර එකී පහසුකම සඳහා පක්ෂව ඡන්දය දීම වලකමින් අදාළ අධ්‍යක්ෂවරයා හැර අධ්‍යක්ෂවරුන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කරනු ලබන බව සහ මෙම පහසුකම මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරනු ලැබිය හැකි ඇපයකින් ආරක්ෂා කරන බව.	**අනුකූල විය;** එවැනි කිසිදු අවස්ථාවක් වර්ෂය තුළ උදා වී නොමැත.
3 (7) (v)	(අ) බැංකුව විසින් යම් පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ යම් සැලකියයුතු හිමිකමක් ඇති පුද්ගලයෙකුට යම් පහසුකමක් ලබා දී ඇති අවස්ථාවක සහ එකී පුද්ගලයා පසුකලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයෙක් ලෙස එම පුද්ගලයාගේ පත්වීමේ දිනයේ සිට එක් වසරක් තුළ මුදල් මණ්ඩලය විසින් එම අරමුණ සඳහා අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය ඇප ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනීම සඳහා බැංකුවට ක්‍රියාවලියක් ඇත.	**අනුකූල විය;** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තිය මෙම අවශ්‍යතාව ආවරණය කරයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
	(ආ) ඉහත 3 (7)(v) (අ) නියෝගය තුළ දක්වා ඇති කාලසීමාව තුළ එකී ඇප ලබාදී නොමැති අවස්ථාවක, පහසුකම ලබාදෙන ලද අවස්ථාවේ නියමකළ කාලසීමාව හෝ එකී අධ්‍යක්ෂ පත්කිරීමේ දිනයේ සිට මාස දහ අටක කාලසීමාව යන දෙකෙන් කළින් එළඹෙන කාලසීමාව තුළ පොළිය සමඟ එම පහසුකම හේතුවෙන් ඇතිවූ හිඟමුදල අයකර ගැනීමට බැංකුව පියවර ගෙන ඇති බව.	**එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත.**
	(ඇ) ඉහත උපනියෝගවලට අනුකූලවීමට අසමත්වන අධ්‍යක්ෂවරු හඳුනා ගැනීමට සහ අධ්‍යක්ෂ තනතුරින් ඉවත්වී ඇති ලෙස සැලකීමට බැංකුවට ක්‍රියාවලියක් තිබීම සහ එවැනි කරුණු මහජනතාවට බැංකුව විසින් අනාවරණය කර තිබේද යන්න.	**එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත.**
	(ඈ) පහසුකම ලබා දෙන අවස්ථාවේදී බැංකුවේ සේවකයෙක් වූ යම් අධ්‍යක්ෂවරයෙක්ට 3 (7) (v) (ඇ) ඡේදය යොදා නොගන්නා බව සහතික කිරීමට ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අතර පහසුකම එම බැංකුවේ සියලුම සේවකයින්ට අදාළවන යෝජනා ක්‍රමයක් යටතේ ලබා දෙන ලදී.	**එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත.**
3 (7) (vi)	බැංකුව විසින් එම බැංකුවේ සේවකයින්ට අදාළ යෝජනා ක්‍රමයක පදනම මත නොවන සැලකියයුතු බැදියාවක් ඇති යම් සේවකයෙක්ට හෝ එම සේවකයාගේ සමීප ඥාතියෙකුට හෝ හිතවතෙකුට ගාස්තු සහ/හෝ කොමිස් පිළිබඳ අත්හැරීමකට අදාළව යම් පහසුකමක් හෝ "වඩා හිතකර සැලකීමක්" ලබාදෙන අවස්ථා හෝ ඉහත 3 (7) (v) නියෝගය පරිදි ලබාදෙන ලද පහසුකම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි ඇපයකින් සුරක්ෂිත කරන අවස්ථාව හඳුනා ගැනීමට ක්‍රියාවලියක් ක්‍රියාත්මකව ඇත.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරුන්ට, ඔහුගේ සමීප ඥාතීන්ට සහ හිතවතුන්ට ලබාදෙන ලද පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සකස්වී ඇති අධ්‍යක්ෂවරු ගණනින් තුනෙන් දෙකට නොඅඩු ගණනක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙදී අනුමත කරනු ලැබේ.
3 (7) (vii)	ඉහත 3 (7) (v)සහ 3 (7) (vi) නියෝග යටතේ බැංකුවක් විසින් ලබාදෙන ලද යම් පහසුකමක් සඳහා මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබාගැනීමට ක්‍රියාවලියක් ඇති අතර එවැනි පහසුකමක් යම් කොටසක් හෝ ඒ සම්බන්ධ යම් පොළියක් මුදල් මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය නොමැතිව ප්‍රේෂණය කළ නොහැක. එකී අනුමැතිය නොමැතිව යම් සමාවදීමක් අවලංගු සහ බලාත්මක නොවේ.	**අනුකූල විය;** සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ප්‍රතිපත්තිය මෙම ක්ෂේත්‍රය ආවරණය කරයි. කාලසීමාව තුළ එවැනි කිසිදු අවස්ථාවක් උදා වී නොමැත.

3 (8) අනාවරණය කිරීම්

3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ අනාවරණය කර ඇත; (අ) අධීක්ෂණ සහ නියාමන බලධාරීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිති මගින් නියමකළ ආකෘතිපත්‍රවලට අනුකූලව පිළියෙල කර ප්‍රකාශයට පත් කරන වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ එම ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසීවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල ප්‍රකාශයට පත් කරයි. (ආ) කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසීවලින් සංක්ෂිපත ආකාරයෙන් පුවත්පත්වල ප්‍රකාශයට පත් කරයි.	**අනුකූල විය;** වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණ සහ නියාමන බලධාරීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිති මගින් නියමකළ ආකෘතිපත්‍රවලට අනුකූලව පිළියෙල කර ප්‍රකාශයට පත් කරයි. එම ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසීවලින් සංක්ෂිපත ආකාරයෙන් පුවත්පත්වල ප්‍රකාශයට පත් කරයි.

	අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම	අනුකූලතා මට්ටම
3 (8) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික වාර්තාව තුළ පහත සඳහන් අවම අනාවරණ සිදුකර ඇති බව;	
	(අ) විශේෂ අනාවරණ සහිතව වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙල කර ඇති බවට ප්‍රකාශය.	**අනුකූල විය;** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව අනාවරණය කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්.
	(ආ) මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම් කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකර ඇති බව තහවුරු කරන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව.	**අනුකූල විය;** මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායිත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය යටතේ දක්වා ඇත.
	(ඇ) ඉහත 3 (8) (ii) (ආ) නියෝගයට අදාළව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායිත්වය පිළිබඳ බාහිර විගණකවරුන්ගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගෙන ඇත.	**අනුකූල විය;** බැංකුව මූල්‍ය වාර්තාකරණ පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායිත්වය සම්බන්ධයෙන් සහතිකයක් විගණකාධිපතිගෙන් ලබාගෙන ඇත.
	(ඈ) නම, සුදුසුකම්, වයස, මාර්ගෝපදේශවල යෝග්‍යතාවයේ අවශ්‍යතා සපුරාලන පළපුරුද්ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර සහ බැංකුවේ හිමිකම සහ ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවනු ලබන මුළු ගාස්තු/පාරිශ්‍රමිකය.	**අනුකූල විය;** අධ්‍යක්ෂවරුන්ගේ වයස හැර අධ්‍යක්ෂවරුන්ගේ විස්තර ලබාදී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවන ලද ගාස්තු/පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් යටතේ අනාවරණය කර ඇත.
	(ඉ) එක් එක් සම්බන්ධිත පාර්ශ්ව වර්ගයට දෙන ලද 3 7) (iii) හි දක්වා ඇති මුළු ශුද්ධ පහසුකම. එක් එක් සම්බන්ධිත පාර්ශ්ව වර්ගයට දෙන ලද ශුද්ධ පහසුකම බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස අනාවරණය කරනු ලැබේ.	**අනුකූල විය;**
	(ඊ) ගෙවන ලද පාරිශ්‍රමික, ලබාදෙන ලද පහසුකම් සහ බැංකුව තුළ සිදුකළ තැන්පතු හෝ ආයෝජන වැනි පැහැදිලි වර්ගීකරණ විස්තර කරන බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමික වටිනාකම්වල එකතුව සහ බැංකුව සමඟ එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ගනුදෙනුවල වටිනාකම්වල එකතුව.	**අනුකූල විය;** ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමික වටිනාකම්වල එකතුව සහ ලබාදෙන ලද පහසුකම්, බැංකුව සමඟ තැන්පතු සහ අදාළ පොළි ආදායම සහ වියදම් ඇතුළත් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ගනුදෙනුවල වටිනාකම්වල එකතුව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් යටතේ අනාවරණය කර ඇත.
	(උ) ආයතනික පාලන උපදෙස්වලට අනුකූලතාව පිළිබඳ බාහිර විගණකගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය ලබාගෙන ඇත.	**අනුකූල විය;** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ ආයතනික පාලන උපදෙස්වල අවශ්‍යතාවන්ට අනුකූලතාව පිළිබඳ බාහිර විගණකගේ වාර්තාව වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් වේ.
	(ඌ) විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූලතාවය සහ වැදගත් අනුකූල නොවීම නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක්.	**අනුකූල විය;** වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව පැහැදිලිව විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූලතාවය සම්බන්ධයෙන් විස්තර දක්වා ඇත.
	(ඍ) බැංකුවේ අවදානම් කළමනාකරණය තුළ අඩුපාඩු හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දෙන ලද මෙම උපදෙස්වලට අනුකූල නොවීම පිළිබඳ නියාමනය සහ අධීක්ෂණ අදහස් සහ එම ගැටළු ආමන්ත්‍රණය කිරීමට බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සමඟ ජනතාවට අනාවරණය කළ යුතු මුදල් මණ්ඩලය විසින් උපදෙස් දී ඇත්නම් ඒ පිළිබඳ ප්‍රකාශයක්.	**අදාළ නැත;** මුදල් මණ්ඩලය විසින් ජනතාවට අනාවරණය කරන මෙන් කිසිදු උපදේශයක් ලබා නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සංයුතිය සහ 2018 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය/අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු රැස්වීම්වලට අධ්‍යක්ෂවරු/කමිටු සාමාජිකයින්ගේ පැමිණීම

අධ්‍යක්ෂවරයාගේ නම සහ විධායක/විධායක නොවන/ස්වාධීන තත්ත්වය	අධ්‍යක්ෂ මණ්ඩලය		අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව			අධ්‍යක්ෂ මණ්ඩල IT මෙහෙයුම් කමිටුව		
	E*	A*	S*	E*	A*	S*	E*	A*	S*	E*	A*	S*	E*	A*	S*	E*	A*	S*	E*	A*
ප්‍රසන්න ප්‍රේමරත්න මහතා (සභාපති)*	05	05							C	02	02	C	02	02	C	01	01			
ජේ.ටී.එස්.සී.කාරියවසම් මහතා (සභාපති)**	04	03							C	02	02	C	02	02	C	02	02			
ටී.ඒ. ආරියපාල මහතා (සාමාන්‍යාධිකාරී)	10	10					03	03		04	04		04	04		03	03		02	02
ඒ.ආර්. දේශප්‍රිය මහතා (අධ්‍යක්ෂ)	10	08	C	03	03															
ජේ.කේ. ගමනායක මහතා (අධ්‍යක්ෂ)***	05	05	M	01	01							M	02	02						
කේ.බී. විජයරත්න මහතා (අධ්‍යක්ෂ)****	05	04	M	02	02	M	02	02				M	02	01						
කේ.බී. රජපක්ෂ මහතා (අධ්‍යක්ෂ)	10	07				C	03	03				M	04	04				C	02	02
එම්. ජේ.පී. සල්ගාදු මහතා (අධ්‍යක්ෂ)	10	09				M	03	03										M	02	02
ෂමරා හේරත් මිය (අධ්‍යක්ෂ)*****	05	03	M	01	01				M	02	02				M	01	01			
එම්.සී.එම්. මුනීර් මහතා (අධ්‍යක්ෂ)******	02	02							M	01	01	M	01	01	M	01	01			
නීල් ද අල්විස් මහතා (අධ්‍යක්ෂ)*******	05	04	M	03	02	M	02	01	M	02	02				M	02	02	M	01	01
කේ. අමරසිංහ මහතා (විධායක අධ්‍යක්ෂ)********	05	04				M	02	00	M	02	02	M	02	01						
ඩබ්ලිව් ඒ. ප්‍රියන්ත අබේසිංහ මහතා (ක්‍රියාකාරී අධ්‍යක්ෂ)*********	07	07				M	01	01	M	03	03	M	03	02	M	02	02			

*S – අදාළ කමිටුව තුළ අධ්‍යක්ෂගේ තත්ත්වය
C – කමිටුවේ සභාපති
*E – පැමිණීම පිළිබඳ යෝග්‍යතාව
M – කමිටුවේ සාමාජික
*A – පැමිණීම
BI – ආරාධනය අනුව

* 2018 මැයි 1 සිට ඉල්ලා අස්විය

** 2018 සැප්තැම්බර් 20 පත් කරන ලද අතර 2018 ඔක්තෝබර් 1 දින රාජකාරී භාරගෙන ඇත

*** 2018 මැයි 31 සිට ඉල්ලා අස්විය

**** 2018 අගෝස්තු 1 දින පත්විය

***** 2018 මැයි 1 සිට ඉල්ලා අස්විය

****** 2018 පෙබරවාරි 28 සිට ඉල්ලා අස්විය

******* 2018 ජූලි 12 දින පත්විය

******** 2018 ජූලි 12 දින පත්විය

********* 2018 නොවැම්බර් 27 කාලය අවසන් විය

පොදු කරුණු

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ බැංකුවේ හත්වැනි වසරේ, විගණනය කළ මුල්‍ය වාර්තා සමඟ බැංකුවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව ඉදිපත් කිරීමට ලැබීම පිළිබඳ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) අධ්‍යක්ෂවරු සතුටට පත්වේ. 1988 අංක 30 දරන බැංකු පනතේ සහ නො. 41, 2008 ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ ආයතනික පාලනය පිළිබඳ උපදෙස්වල අවශ්‍යතාව මෙම වාර්තාවෙන් තහවුරු කරයි. ග්‍රාමීය බැංකු දහහතක් බැංකු හයකට එනම් රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු නමින් ඒකාබද්ධ කිරීමේදී මෙම බැංකුව 1997 දී මුලින්ම ස්ථාපිත කර ඇත. මෙම ප්‍රාදේශීය සංවර්ධන බැංකු හය 2010 දී තවදුරටත් ජාතික මට්ටමේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවක් ලෙස ඒකාබද්ධ කළ අතර, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (Regional Development Bank or RDB) ලෙස නම්කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපිත කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා දායකවන, පිවිසිය හැකි සහ දුරියහැකි මූල්‍ය සේවාවන් ග්‍රාමීය ජනතාව වෙත ලබා දෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් සවිබලගැන්වීමේ පරමාර්ථය ඇති රජයට අයත් ජාතික මට්ටමේ බැංකුවකි.

මූලික කටයුතු

බැංකුවේ මූලික කටයුතු වන්නේ ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත මූල්‍ය සහය ලබාදෙමින් කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳාම, වාණිජ සහ පශුසම්පත්, ධීවර කටයුතු සංවර්ධනය සහ ශ්‍රී ලාංකිකයින් සවිබලගැන්වීම ප්‍රවර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනය ඇති කිරීමයි.

දැක්ම, මෙහෙවර

බැංකුවේ දැක්ම සහ මෙහෙවර වාර්ෂික වාර්තාවේ ඉදිරි ඇතුළත කවරයේ දැක්වේ. බැංකුව දැක්ම සහ මෙහෙවර යටතේ සඳහන් පරමාර්ථ හඹායමින් එහි කටයුතු තුළ ඉහළ සදාචාර ප්‍රමිති පවත්වා ගනී.

අඛණ්ඩ පැවැත්ම

දැකියහැකි අනාගතයක් තුළ එහි මෙහෙයුම් ඉදිරියට කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් බැංකුවට ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. එමනිසා, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම අපි අඛණ්ඩව යොදා ගනිමු.

මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දක්වා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs/ LKASs) අනුකූලව පිළියෙල කර ඇති අතර 1988 අංක 30 දරන බැංකු පනතට අනුකූල වේ. 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ බැංකුවේ හත්වැනි වසරේ මූල්‍ය වාර්තා ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන විධායක නිලධාරී සහ බැංකුවේ අධ්‍යක්ෂවරු දෙදෙනෙක් විසින් විධිමත්ව අත්සන් කරනු ලබයි. මෙම ප්‍රකාශන 100 පිටුවේ දැක්වෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වේ.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්

බැංකුවේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකීමට බැඳී සිටී. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල සහ 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ. මෙම වාර්ෂික වාර්තාවේ 88 පිටුවේ දැක්වෙන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය තුළින් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම විස්තරාත්මකව විස්තර කෙරේ.

විගණකගේ වාර්තාව

2018 දී බැංකුවේ විගණනය විගණකාධිපති විසින් සිදුකරන ලද අතර එම විගණනය වසර පුරාම පවත්වන ලදී. එම වාර්තාව තුළ හඳුනාගන්නා අඩුපාඩු කඩිනම් පියවර සඳහා කළමනාකරණයට ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාව තහවුරු කරමින්, මූල්‍ය වාර්තා අවශ්‍ය දත්ත සහ තොරතුරු සමඟ පරීක්ෂණය සඳහා විගණකාධිපතිවරයාට ලබාගැනීමට සලස්වන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ 94 පිටුවේ දැක්වේ. නියාමන අධීක්ෂණ ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් සමඟ අනුකූලතාවය සහතික කිරීමට බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ නිරන්තර පරීක්ෂණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර ඇත. එමෙන්ම, අවශ්‍ය ප්‍රාග්ධන දර්ශක අවශ්‍ය මට්ටමේදී පවත්වාගෙන තිබේද යන්න ඉන් තීරණය කරන අතර ඒ අනුව කොටස්හිමියන්ගේ විශේෂයෙන් තැන්පත්කරුවන්ගේ හිමිකම් ආරක්ෂා කෙරේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගනු ලබන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 106 සිට 121 දක්වා පිටුවල දැක්වේ.

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය

වසර තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 12 හි දක්වා ඇත.

අනාගත සංවර්ධනයන්

බැංකුවේ අනාගත සංවර්ධනයන් පිළිබඳ දළ විශ්ලේෂණයක් සභාපතිගේ ප්‍රකාශය (පිටු අංක 8 සිට 9), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (පිටු අංක 10 සිට 11) සහ කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ (පිටු අංක 12 සිට 15 දක්වා) විස්තර කෙරේ.

ව්‍යාපාර කාර්යසාධනය සමාලෝචනය කිරීම

2018 මූල්‍ය වසර තුළ බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සභාපතිගේ ප්‍රකාශය (පිටු අංක 8 සිට 9), සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (පිටු අංක 10 සිට 11) සහ කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණ (පිටු අංක 12 සිට 15 දක්වා) අඩංගු වේ. මෙම වාර්තා වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් සාදනු ලබයි.

මූල්‍ය ප්‍රතිඵල

බැංකුවේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (පිටු අංක 10 සිට 11) සහ කළමනාකරණ සාකච්ඡා සහ පිටු අංක 5 සිට 7 දක්වා මූල්‍යමය වැදගත් සිදුවීම්වල දක්වා ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2018 දෙසැම්බර් 31 දිනට මුළු කොටස්හිමියන්ගේ අරමුදල රු. බිලියන 14.8 කි. වසර අවසානයේදී කොටස්හිමියන් විසින් දායක වී ඇති ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. බිලියන 8.05ක් වන අතර ඒවායේ කොටස්හිමිකාරත්වයේ ප්‍රතිශතය පහත පරිදි වේ:

	රු.	%
මහ භාණ්ඩාගාරය	7,553,739,710	94
ලංකා බැංකුව	164,484,480	2
මහජන බැංකුව	164,484,480	2
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	164,521,260	2
එකතුව	8,047,229,930	100

ආදායම

2018 වසර සඳහා බැංකුවේ දළ ආදායම රු.බි. 26කි. ආදායම පිළිබඳ විස්තර 124 පිටුවේ දැක්වේ.

බදුකරණය

බැංකුව 2018 දී බදු සහ ගාස්තු ලෙස රජය වෙත රු.මි. 2,575ක් දායක වී ඇත. රු.මි. 1,072ක ආදායම් බදු, රු.මි. 1,159 ක මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බදු, රු.මි. 154ක ජාතිය ගොඩනැගීමේ බදු සහ රු.මි. 190ක ණය ආපසු ගෙවීමේ බදුවලින් මෙය සමන්විත වේ. බැංකුවේ මෙහෙයුම් මත අදාළවන ආදායම් බදු අනුපාතය 28%ක් වේ. වගකීම් ක්‍රමය යටතේ දැනුවත් සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භීත බදුකරණය වෙන්කිරීම බැංකුවේ ප්‍රතිපත්තියක් වේ.

දේපල, පිරියත හා උපකරණ

වසර තුළ දේපල, පිරියත හා උපකරණ, කල්බදු දේපල සහ අස්පෘශ්‍ය වත්කම් අත්කර ගැනීම මත දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු.මි. 414ක් විය. (2017 දී රු.මි. 325කි) ඒ සම්බන්ධ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 137 පිටුවේ සහ 142 පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 24 සහ 25 හි දැක්වේ.

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමට හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ වැදගත් සිදුවීම් නොමැත.

දැනට පවත්නා නඩු කටයුතු

බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ සහ නීතිඥයින්ගේ මතය වන්නේ, මූල්‍ය ප්‍රකාශනවල 38.2 සටහන තුළ අනාවරණය කර ඇති බැංකුවට විරුද්ධ නඩු කටයුතුවලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ එහි අනාගත මෙහෙයුම් සඳහා වැදගත් බලපෑමක් නොමැති බවයි.

ප්‍රාග්ධන හා සංචිත

රඳවාගැනීමේ ඉපයීම් ඇතුළුව බැංකුවේ ප්‍රාග්ධනය සහ සංචිත පහත පරිදි සමන්විත වේ:

	2018 රු.	2017 රු.
ප්‍රකාශිත ප්‍රාග්ධනය	8,047,229,930	3,870,936,931
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	717,331,468	663,652,150
විශේෂ සංචිත අරමුදල	571,721,796	518,042,478
පොදු සංචිත අරමුදල	3,057,925,624	2,843,208,353
රඳවාගත් ඉපයීම්	2,315,905,811	1,716,908,747
එකතුව	14,710,114,629	9,612,748,660

ලාභාංශ

අධ්‍යක්ෂ මණ්ඩලය 2018 වසර සඳහා ලාභයෙන් 2018 දෙසැම්බර් 31 දින ක්‍රියාත්මක කොටස් නිකුතුවේ වටිනාකම හැර 2018 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ කොටස් මත 5%ක අවසාන ලාභාංශ බෙදාහැරීමක් අනුමත කර ඇත. මේ සම්බන්ධයෙන් කොටස්හිමියන්ගේ යෝජනාවක් ඉදිරි මහ සභා රැස්වීමේදී සම්මත කර ගැනීමට නියමිතය.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති ඇතුළුව සාමාජිකයින් හතකින් සමන්විත වේ. මහ භාණ්ඩාගාරයේ ලේකම්, සභාපති සහ අනෙකුත් අධ්‍යක්ෂවරු පත්කරන අතර අධ්‍යක්ෂවරු හතර දෙනෙක් මහ භාණ්ඩාගාරය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව නියෝජනය කරන කොටස්හිමියන් විසින් නම් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් පහත දක්වෙන අතර ඔවුන් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 33 සිට 35 දක්වා විස්තර කෙරේ.

ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා - සභාපති

ඒ.ආර්. දේශප්‍රිය මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ
(2019 ජනවාරි ඉල්ලා අස්විය)

කේ.බී. විජයරත්න මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

එම්. ජේ.පී. සල්ගාදු - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

කේ.බී. රාජපක්ෂ මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ

නීල් ද අල්විස් මහතා - ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ (2019 අප්‍රේල් 4 දක්වා)

කේ. අමරසිංහ මහතා - විධායක අධ්‍යක්ෂ
(2019 අප්‍රේල් 4 දක්වා)

ඒ.කේ. සෙනෙවිරත්න මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ
(2019 පෙබරවාරි 21 දින පත්කරන ලදී)

ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරු

ප්‍රසන්න ප්‍රේමරත්න මහතා - සභාපති,
(2018 මැයි 1 දින ඉල්ලා අස්විය)

කස්තුරි අනුරාධනායක මහතා - සභාපති,
(2018 අගෝස්තු 31 දින ඉල්ලා අස්විය)

ජේ.කේ. ගමනායක මහතා - ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂ (2018 මැයි 31 දින ඉල්ලා අස්විය)

එම්.සී.එම්. මුනීර් මහතා - ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ (2018 පෙබරවාරි 28 දින ඉල්ලා අස්විය)

ෂමාරා හේරත් මහත්මිය - ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂ (2018 මැයි 1 දින ඉල්ලා අස්විය)

ඩබ්ලිව්.ඒ. ප්‍රියන්ත අබේසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ 2018 නොවැම්බර් 27 දින කල් ඉකුත් විය.

නව අධ්‍යක්ෂවරු පත්කිරීම

අධ්‍යක්ෂ	පත්කිරීමේ දිනය
කස්තුරි අනුරාධනායක මහතා	2018 මැයි 1
ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා	2018 සැප්තැම්බර් 20
කේ.බී. විජයරත්න මහතා	2018 අගෝස්තු 1
නීල් ද අල්විස් මහතා	2018 ජූලි 12
කේ. අමරසිංහ මහතා	2018 ජූලි 12

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත වගකීම සහ වගවීම භාරගනිමින්, මහ බැංකුවේ ආයතනික පාලන ප්‍රමිතිවලට අනුකූලතාව සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අනුකූලතාවයන් සහතික කිරීමට පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපිත කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සංයුතිය පහත පරිදි වේ:

විගණන කමිටුව

1. ඒ.ආර්. දේශප්‍රිය මහතා (කමිටු සභාපති)
2. කේ.බී. විජයරත්න මහතා
   (2018 අගෝස්තු 1 දින පත්කරන ලදී)
3. නීල් ද අල්විස් මහතා
   (2018 ජූලි 12 දින පත්කරන ලදී)
4. ජේ.කේ. ගමනායක මහතා
   (2018 මැයි 31 ඉල්ලා අස්විය)
5. ෂමාරා හේරත් මහත්මිය (2018 මැයි 1 ඉල්ලා අස්විය)

විගණන කමිටුවේ වාර්තාව 80 පිටුවේ දක්වෙන අතර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසකි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

1. කේ.බී. රාජපක්ෂ මහතා (කමිටුවේ සභාපති)
2. කේ.බී. විජයරත්න මහතා (2018 අගෝස්තු 1 දින පත්කරන ලදී)
3. එම්. ජේ.පී. සල්ගාදු
4. ඩබ්ලිව් ඒ.පී. අබේසිංහ මහතා (2018 නොවැම්බර් 27 දින ඉල්ලා අස්විය)
5. නීල් ද අල්විස් මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
6. කේ. අමරසිංහ මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
7. ටී.ඒ. ආරියපාල මහතා - GM/CEO
8. ටී. කුහාන් මහතා - ප්‍රධාන අවදානම් නිලධාරී
9. ඩබ්ලිව්.එම්.එස්. වික්‍රමසිංහ මහතා - අනුකූලතා නිලධාරී

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව 85 පිටුවේ දැක්වෙන අතර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසකි.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

1. ප්‍රසන්න ප්‍රේමරත්න මහතා (සභාපති - 2018 මැයි 1 ඉල්ලා අස්විය)
2. ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා (සභාපති - 2018 සැප්තැම්බර් 20 දින පත්කළ අතර 2018 ඔක්තෝබර් 1 දින රාජකාරි භාරගනු ලැබිය)
3. එම්.සී.එම්. මුනීර් මහතා (2018 පෙබරවාරි 28 දින ඉල්ලා අස්විය)
4. ෂමාරා හේරත් මහත්මිය (2018 මැයි 1 ඉල්ලා අස්විය)
5. ඩබ්ලිව් ඒ.පී. අබේසිංහ මහතා (2018 නොවැම්බර් 27 දින ඉල්ලා අස්විය)
6. නීල් ද අල්විස් මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
7. කේ. අමරසිංහ මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
8. ටී.ඒ. ආරියපාල මහතා - සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී
9. කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මහතා - මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී

අධ්‍යක්ෂ මණ්ඩල IT මෙහෙයුම් කමිටුව

1. කේ.බී. රාජපක්ෂ මහතා (කමිටුවේ සභාපති)
2. එම්. ජේ.පී. සල්ගාදු
3. නීල් ද අල්විස් මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
4. ටී.ඒ. ආරියපාල මහතා - සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී
5. වී. ජයසිංහ මහතා - ප්‍රධාන තොරතුරු නිලධාරී
6. ටී. කුහාන් මහතා - ප්‍රධාන අවදානම් නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව

1. ප්‍රසන්න ප්‍රේමරත්න මහතා (සභාපති - 2018 මැයි 1 ඉල්ලා අස්විය)
2. ජේ.ටී.එස්.පී.කාරියවසම් මහතා (සභාපති - 2018 සැප්තැම්බර් 20 දින පත්කළ අතර 2018 ඔක්තෝබර් 1 දින රාජකාරි භාරගනු ලැබිය)
3. කේ.බී. රාජපක්ෂ මහතා
4. ජේ.කේ. ගමනායක මහතා (2018 මැයි 31 ඉල්ලා අස්විය)
5. එම්.සී.එම් මුනීර් මහතා (2018 පෙබරවාරි 28 දින ඉල්ලා අස්විය)
6. කේ.බී. විජයරත්න මහතා (2018 අගෝස්තු 1 දින පත්කරන ලදී)
7. ඩබ්ලිව් ඒ.පී. අබේසිංහ මහතා (2018 නොවැම්බර් 27 දින ඉල්ලා අස්විය)
8. කේ. අමරසිංහ මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)

නාමයෝජනා කමිටුව

1. ප්‍රසන්න ප්‍රේමරත්න මහතා (කමිටුවේ සභාපති, 2018 මැයි 1 ඉල්ලා අස්විය)
2. ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා (සභාපති - 2018 සැප්තැම්බර් 20 දින පත්කළ අතර 2018 ඔක්තෝබර් 1 දින රාජකාරි භාරගනු ලැබිය)
3. එම්.සී.එම්. මුනීර් මහතා (2018 පෙබරවාරි 28 දින ඉල්ලා අස්විය)
4. ෂමාරා හේරත් මහත්මිය (2018 මැයි 1 ඉල්ලා අස්විය)
5. ඩබ්ලිව් ඒ.පී. අබේසිංහ මහතා (2018 නොවැම්බර් 27 දින ඉල්ලා අස්විය)
6. නීල් ද අල්විස් මහතා (2018 ජූලි 12 පත්කරන ලදී)
7. ටී.ඒ. ආරියපාල මහතා - සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන විධායක නිලධාරී
8. කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මහතා - මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී

අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීම් සහ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව, මෙහෙයුම් කමිටු රැස්වීම් සමන්විත අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් ගණන සහ අධ්‍යක්ෂවරු මෙම රැස්වීම්වලට පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ 73 පිටුවේ ආයතනික පාලන වාර්තාවේ දක්වා ඇත.

ගිවිසුම් තුළ අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව

බැංකුව සමඟ ගිවිසුම්වල සෘජුව හා වක්‍රව අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 39.2.3 හි විස්තර කෙරේ. අධ්‍යක්ෂවරුන්ට බැංකුව සමඟ ගිවිසුම්වල හෝ යෝජිත ගිවිසුම්වල සෘජු හෝ වක්‍ර බැඳීමක් නොමැත.

සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 24) - "සම්බන්ධිත පාර්ශව අනාවරණ" අනුව සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ලෙස වර්ගීකරණය කරනු ලබන ගනුදෙනු අධ්‍යක්ෂවරුන් විසින් අනාවරණය කර ඇත. අධ්‍යක්ෂවරුන් විසින් අනාවරණය කරන ලද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 39 හි දක්වේ.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (GM/CEO)

සාමාන්‍යාධිකාරී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබයි. සාමාන්‍යාධිකාරීට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙනී සිටීමට සහ සහභාගිවීමට අයිතිය ඇත.

මානව සම්පත

බැංකුව කැපවූ සහ ඉහළින් අභිප්‍රේරිත සේවකයින් සංවර්ධනය කර පවත්වා ගන්නා අතර ඔවුන් උසස් තත්ත්වයේ සේවාව තුළින් තිරසාර වටිනාකම නිර්මාණය කිරීමට කැපවී සිටී.

මෙහෙයුම් අනර්ඝත්වය

කාර්යක්ෂමතාව වැඩිකිරීමට සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ප්‍රමිතිගතකරණයට සහ දැනට පවත්නා තාක්ෂණික අවකාශ භාවිතය ප්‍රශස්ථ කිරීමට අඛණ්ඩව සිදුකරන වැඩසටහන් බැංකුව සතු වේ.

පාරිසරික ආරක්ෂාව

බැංකුවේ තිරසාර සංවර්ධනය සහ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය පරිසරය ආරක්ෂා කිරීමට සහ ශක්තිමත් කිරීමට බැංකුව පියවර ගෙන ඇත. බැංකුව පරිසරයට හානිකර හෝ උපද්‍රව සහිත කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂවරු ඔවුන්ගේ දැණුම සහ විශ්වාසය අනුව, රජය සහ සේවකයින් සම්බන්ධයෙන් ගෙවියයුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් කාලීනව සිදුකර ඇති බවට සෑහීමට පත්වේ.

අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනයන් සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම කළමනාකරණය සඳහා සම්පූර්ණ වගකීම් භාරගනී. මෙම අරමුණ සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුව තුළ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ ඵලදායි සහ සම්පූර්ණ පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධති ඇතුළත්කර ක්‍රියාත්මක කර ඇත. අභ්‍යන්තර පාලන පද්ධති බැංකුව නිරාවරණය වන අවදානම් අවම කිරීමට නැවත සැලසුම්කර ඇති අතර වැදගත් වැරදි ප්‍රකාශ සහ අලාභවලට අනුව සාධාරණ සහතිකයක් ලබා දේ. බැංකු විසින් මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් ඇත. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් ගනු ලැබූ විශේෂිත ක්‍රියාමාර්ග පිළිබඳ මෙම වාර්ෂික වාර්තාවේ 42 සිට 53 දක්වා පිටුවල විස්තර කෙරේ.

අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය සැලසුම්කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් සාදන ඉහත වාර්තාව 91 සිට 92 දක්වා පිටුවල දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් විගණකාධිපතිගෙන් සහතික කිරීමේ වාර්තාවක් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ 90 පිටුවේ දක්වා ඇත.

ආයතනික පාලනය

බැංකුවේ කළමනාකරණය සඳහා, අධ්‍යක්ෂවරු විශිෂ්ඨ ආයතනික පාලන ව්‍යවහාර සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලතාව කෙරෙහි අවධාරණය යොමු කොට ඇත. ඒ අනුව, අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග වැඩි කිරීමට සහ වගකීම සහ වගවීම වර්ධනය කිරීමට කලින් කල පද්ධති සහ ව්‍යූහ හඳුන්වාදී/වර්ධනය කර ඇත. ආයතනික පාලනය පිළිබඳ වෙනම වාර්තාවක් 55 සිට 73 දක්වා පිටුවල දක්වා ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විගණකාධිපතිගෙන් සිද්ධිවාචක සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් ලබාගෙන ඇත.

නීති, රෙගුලාසි සහ විචක්ෂණ අවශ්‍යතාවන්ට අනුකූලතාව

ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සහ අනෙකුත් අදාළ සියලුම නීති, රෙගුලාසි සහ විචක්ෂණ අවශ්‍යතාවන්ට සෑම අවස්ථාවකම බැංකුව අනුකූල වී ඇති බව බැංකුව තහවුරු කර ඇත.

විගණකවරුන්

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණනය විගණකාධිපති විසින් සිදුකරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2017 අංක 12 දරන බැංකු පනත් නියෝගයේ විධිවිධානවලට අනුකූලව ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු එම කමිටුවේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ප්‍රඥප්තිය මත පදනම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ බලය, විෂයපථය සහ වගකීම් බෙදාහැරීමේ අරමුණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රඥප්තිය නිරන්තරව සමාලෝචනය කර බලය ලබා දේ. එහි පවරන ලද බලතල සමඟ, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අභ්‍යන්ත විගණන ප්‍රඥප්තියට අනුකූලව අභ්‍යන්තර විගණන කාර්යයන්හී විෂයපථය සහ රාජකාරි තීරණය කරයි.

කමිටුවේ සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති ඒ.ආර්. දේශප්‍රිය මහතා සහ මහ භාණ්ඩාගාරයේ නියෝජිත, ෂමාරා හේරත් මහත්මිය 2015 සිට සේවය කරන ලදී. ඔවුන් 2018 මැයි 1 දින ඉල්ලා අස්වීමත් සමඟ, ජේ.කේ. ගමනායක මහතා 2015 සිට මෙම කමිටුවේ සේවය කරන ලදී. ඔහු 2018 මැයි 31 දින ඉල්ලා අස්වීමත් සමඟ, නීල් ද අල්විස් මහතා සහ කේ.බී. විජේරත්න මහතා පිළිවෙලින් 2018 ජූලි 12 දින සහ 2018 අගෝස්තු 1 දින සිට මෙම කමිටුවට පත් කරන ලදී. විගණන කමිටු රැස්වීම්වල සණපූරණය සාමාජිකයින් දෙදෙනෙකි (02).

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, විගණන ප්‍රධානී, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූළතා) සහ විගණකාධිපතිගේ නියෝජිතයින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ආරාධනයෙන් එම කමිටුවේ රැස්වීම්වලට සහභාගි වේ. ව්‍යාපාර ඒකකවල අදාළ නිලධාරීන් ද විගණන කමිටුවේ කාර්යභාරය ඉටු කිරීම තුළ කමිටුවට අදාල ප්‍රධාන ගැටළු සහ ව්‍යාපාර සංවර්ධනයන් පිළිබඳ විගණන කමිටුවේ දැනුවත්කම වැඩි කිරීම සඳහා සැලසුම්කළ කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීම් සඳහා සමහර රැස්වීම්වලට ආරාධනය අනුව සහභාගි වේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රාජකාරි සහ කාර්යභාරයන්

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු පහත කරුණු සඳහා වගකීමට බැඳී සිටී.

- අනාවරණය සඳහා පිළියෙල කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශ, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල අවංකකම නියාමනය කිරීම පිණිස මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ව්‍යවහාරවල තත්ත්වය සහ පිළිගතහැකිබව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.
- ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලි සහ නියාමන අනුකූලතාව සම්බන්ධයෙන් සමාලෝචනය.
- මූල්‍ය ප්‍රකාශ (කාර්තුමය වාර්තා ඇතුළුව) ප්‍රකාශයට පත් කිරීමට පෙර ඒවා ස්ථිර වශයෙන් යොදා ගනු ලබන ව්‍යවස්ථාපිත විධිවිධාන, ගිණුම්කරණ ප්‍රමිති සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය සහ කඩකිරීම්, වංචා සහ දෝෂ වැලැක්වීම සඳහා ආරක්ෂක ක්‍රියාපටිපාටි ගනිමින් ආයතන කළමනාකරණය සමඟ සම්බන්ධීකරණය කිරීම.
- විගණන ප්‍රධාන පත්කිරීම පාලනය කිරීම ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ කාර්යයන් නියාමනයේ ස්වාධීනත්වය ඇගයීම.
- අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ ඵලදායිත්වය සමාලෝචනය කිරීම.
- අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවල විශේෂිත කාර්යයන් පිළිබඳ ස්වාධීන උපදේශකයින් සහභාගි කරවීම.

රැස්වීම්

කමිටුවේ රැස්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සංවිධානමය ආයතනික පාලනය සඳහා රෙගුලාසි/මාර්ගෝපදේශවලට අනුකූලව කාර්තුමය වශයෙන් කැඳවනු ලැබේ. විගණන කමිටු රැස්වීම් තුනක් (03) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පවත්වා ඇත.

කමිටුවේ සාමාජිකයින්ගේ පැමිණීම පහත පරිදි වේ:

කමිටු සාමාජිකයාගේ නම	පැමිණීම
ඒ.ආර්. දේශප්‍රිය මහතා (සභාපති)	03/03
එස්. හේරත් මහත්මිය	01/03
ජේ.කේ. ගමනායක මහතා	01/03
නීල් ද අල්විස් මහතා	02/03
කේ.බී. විජයරත්න මහතා	02/03

සමාලෝචිත වසර යටතේ, අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සමස්ත ශාඛා ජාලය, තොරතුරු තාක්ෂණ අංශය, මානව සම්පත් අංශය, පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය සහ පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ අධීක්ෂණය සහ මඟපෙන්වීම් යටතේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇත. ඒ සමඟම, වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණ සහ නියාමන බලධාරීන් සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ප්‍රකාශයට පත්කරන බව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාව තුළ සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වාර්තාව තුළ විගණකාධිපති විසින් මතුකරන ලද කරුණු පිළිබඳ 2018 වසර තුළ කළමනාකරණය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව පසු විපරම් කරනු ලබයි.

එමෙන්ම, වංචා, දෝෂ සහ අනෙකුත් අලාභ සිදුවීම් අවම කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ක්‍රියාමාර්ග වර්ධනය කිරීම සඳහා පියවර දැනටමත් රැගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බැංකුවේ තිරසාරත්වය, ලාභදායිතාව සහ අනෙකුත් අදාළ කරුණු ඇගයීමට ලක් කරයි. විගණන කාර්ය මණ්ඩලයේ දැනුම සහ කුසලතාව වැඩි කිරීමට වැඩපිළිවෙල සකස් කර ඇත.

ඒ අනුව, මූල්‍ය වාර්තාකරණය සහ අවදානම් කළමනාකරණයට අනුකූලතාවය සඳහා ක්‍රියාපටිපාටි/ පද්ධතිවලට ප්‍රමාණවත් සහ සුදුසු පාලනයන් සහ පිළිපැදීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහතික කරයි.



ඒ.ආර්. දේශප්‍රිය මහතා

සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

හැඳින්වීම

බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නිකුත් කළ 3 (6) නියෝගය තුළ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ආයතනික යහපාලන ව්‍යවහාර සහ උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු පිහිටුවීම අවශ්‍යය. එහි 3 (6) (iii) සහ (iv) වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහිතව වෙනම කමිටු දෙකක් එනම් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) උපදෙස් පරිදි දක්වා ඇති විෂයපථය තුළ කමිටු දෙකට වගකීම් පවරන ලදී

2017 මාර්තු 27 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව යොමු නිර්දේශවල (TOR) දක්වා ඇති පරිදි වෙනස් කමිටු දෙකක් ලෙස ක්‍රියාත්මක වේ.

විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ විෂයපථයට පහත කරුණු ඇතුළත් වේ.

- බැංකුවේ අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී (CEO), ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළව පාරිශ්‍රමික තීරණය කිරීම.
- ඉලක්ක සහ අරමුණු නියම කර අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී (CEO), ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සහ නිරන්තරව නියමකළ ඉලක්ක සහ අරමුණු අනුව ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම.
- බැංකුවේ ව්‍යාපාරය සහ ක්‍රියාත්මක ක්‍රමෝපායන් හා බැඳුණු මානව සම්පත් ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති උපාය ක්‍රියාත්මක කිරීමට මඟපෙන්වීම සහ මෙහෙයවීම.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ විෂයපථයට පහත කරුණු ඇතුළත් වේ.

- ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ තනතුර සඳහා පත්කිරීම සහ උසස් කිරීම සඳහා අවශ්‍යවන සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික ආකල්ප නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට නව සාමාජිකයින් තෝරාගැනීම/පත්කිරීමට හෝ බැංකුවේ සමස්ථ පරමාර්ථ කරා ඔවුන් විසින් සිදුකරන කාර්යසාධනය සහ දායකත්වය මත ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය නැවත පත්කිරීම හෝ දීර්ඝකිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ක්‍රියාවට නැංවීම.
- 3 (3) නියෝගයේ දෙන ලද නිර්ණායක තුළ දක්වා ඇති සහ ව්‍යවස්ථාවන් තුළ දක්වා ඇති පරිදි තනතුර දැරීමට අධ්‍යක්ෂවරු සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බව සහතික කිරීම.
- වරින් වර අමතර/නව ප්‍රවිනත්වයේ අවශ්‍යතාව සහ අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විශ්‍රාම යාම සඳහා අනුප්‍රාප්ත වැඩපිළිවෙලක් සලකා බැලීම සහ නිර්දේශ කිරීම.

කමිටු දෙකම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඔවුන්ගේ නිර්දේශ සිදුකරයි.

සංයුතිය සහ රැස්වීම්

කමිටු දෙකම බැංකුවේ සභාපති විසින් මෙහෙයවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් තුනක් (3) සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු රැස්වීම් හතරක් (4) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ පවත්වන ලදී.

මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන ප්‍රධානී තීරණ ගැනීමට කමිටු සාමාජිකයින්ට හැකියාව ඇති කිරීමට පසුබිම සහ අනෙකුත් අදාළ තොරතුරු සහ විශ්ලේෂණ සාමාන්‍යාධිකාරී තුළින් සියලුම පත්‍රිකා ඉදිරිපත් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම කමිටුවල ලේකම්වරයා වේ. අංශ හෝ ඒකක ප්‍රධානීන් අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ට අදාළ කාර්යයන් පිළිබඳ මතය සඳහා ආරාධනය කෙරේ.

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සෑම රැස්වීමකටම සහභාගි වන අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ රැස්වීම්වලට ආරාධනයෙන් සහභාගි වේ.

එක් එක් කමිටුවේ රැස්වීමක් සඳහා සණසූරණය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු දෙදෙනෙකු වේ.

කමිටුව අවම වශයෙන් කාර්තුමය ලෙස රැස්වේ.

වසර තුළ කමිටු සාමාජිකයින් වෙනස් කරන ලද අතර පැමිණීමේ විස්තර පහත පරිදි වේ:

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින්

නම	පැමිණීම/ පැවති ගණන
ප්‍රසන්න ප්‍රේමරත්න මහතා - සභාපති (2018 මැයි 1 ඉල්ලා අස්විය)	2/4
ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා - සභාපති (2018 ඔක්තෝබර්1 දින සිට පත්කරන ලදී)	2/4
ෂමාරා හේරත් මහත්මිය - අධ්‍යක්ෂ (2018 මැයි 1 ඉල්ලා අස්විය)	2/4
එම්.සී.එම්. මුනීර් මහතා - අධ්‍යක්ෂ (2018 පෙබරවාරි 28 ඉල්ලා අස්විය)	1/4
නීල් ද අල්විස් මහතා - අධ්‍යක්ෂ (2018 ජූලි 12 දින සිට පත්කරන ලදී)	2/4
ඩබ්ලිව්. ඒ.පී. අබේසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 27 ඉල්ලා අස්විය)	3/4
කේ. අමරසිංහ මහතා - විධායක අධ්‍යක්ෂ (2018 ජූලි 12 දින සිට පත්කරන ලදී)	2/4
ටී.ඒ. ආරියපාල මහතා - බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී	
කේ.එම්.ජේ.එස්. කරුණාතිලක මහතා - මානව සම්පත් සංවර්ධන සහ පරිපාලන ප්‍රධානී	
ආර්.එම්.ටී. රාජපක්ෂ මහතා - කමිටුවේ ලේකම්	

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සාමාජිකයින්

නම	පැමිණීම/ පැවති ගණන
ප්‍රසන්න ප්‍රේමරත්න මහතා - සභාපති (2018 මැයි 1 ඉල්ලා අස්විය)	1/3
ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා - සභාපති (2018 ඔක්තෝබර්1 දින සිට පත්කරන ලදී)	2/3
ෂමාරා හේරත් මහත්මිය - අධ්‍යක්ෂ (2018 මැයි 1 ඉල්ලා අස්විය)	1/3
එම්.සී.එම්. මුනීර් මහතා - අධ්‍යක්ෂ (2018 පෙබරවාරි 25 ඉල්ලා අස්විය)	1/3
ඩබ්ලිව්. ඒ.පී. අබේසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ (2018 නොවැම්බර් 27 ඉල්ලා අස්විය)	2/3
නීල් ද අල්විස් මහතා - අධ්‍යක්ෂ (2018 ජූලි 12 දින සිට පත්කරන ලදී)	2/3
ආර්.එම්.ටී. රාජපක්ෂ මහතා - කමිටුවේ ලේකම්	

කටයුතුවල සාරාංශය

2018 මැයි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සභාපති වූ ප්‍රසන්න ප්‍රේමරත්න මහතාගේ ඉල්ලා අස්වීම සහ එම කමිටු දෙකේම අධ්‍යක්ෂවරියක් වූ ෂමරා හේරත් මහත්මිය ඉල්ලා අස්වීම අනුව කමිටු දෙක නැවත පිහිටුවීමේ අවශ්‍යතාව සලකාබලන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති ලෙස ජේ.ටී.එස්.පී. කාරියවසම් මහතා පත්කිරීමත් සමඟ, ඔහු මෙම කමිටු දෙකේම සභාපති ලෙස පත්කරන ලදී. පසුකාලීනව මෙම කමිටු දෙකේ සාමාජිකයෙන් ලෙස නීල් ද අල්විස් මහතා පත්කරන ලදී.

කමිටුවේ ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ රැස්වීම්වල වාර්තා නිර්දේශ සහිතව ඉදිරිපත් කරයි. සමාලෝචිත වසර තුළ මෙම කමිටු දෙක විසින් සිදුකරන ලද නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව

විෂයපථය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ අදාළත්වයේ මට්ටම සහතික කිරීමට සහ තොරතුරු තාක්ෂණ පාලනයේ වර්ධනය ඉල්ලුම් සම්බන්ධව බැංකුවට සහයවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව පිහිටුවා ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සඳහා සමස්ථ ක්‍රමෝපාය සකස් කිරීම සඳහා සහ ගනුදෙනුකාර සේවා සහ අභ්‍යන්තර කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට බැංකුවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ලබාදීමට මෙම කමිටුව වගකීමට බැඳිසිටී.

කමිටුවේ සංයුතිය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

කමිටු සාමාජිකයින්

- කේ.බී. රාජපක්ෂ මහතා - කමිටුවේ සභාපති/අධ්‍යක්ෂ
- එම්.ජේ.පී. සල්ගාදු මහතා - සාමාජික/අධ්‍යක්ෂ
- නීල් ද අල්විස් මහතා - සාමාජික/අධ්‍යක්ෂ

සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන තොරතුරු නිලධාරී/ප්‍රධාන අවදානම් නිලධාරී ආයතන කළමනාකරණයේ සාමාජිකයින් වන අතර ඔවුන් ආරාධිතයින් ලෙස මෙම කමිටුවලට සහභාගි වේ. බැංකුවේ ඕනෑම නිලධාරියෙක්ට ආරාධනය මත රැස්වීම්වලට සහභාගි වියහැක.

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ සණසූරණය සාමාජිකයින් දෙදෙනෙකි. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව නියාමන අවශ්‍යතා සපුරාලමින් 2018 වසර තුළ රැස්වීම් දෙකක් පවත්වා ඇත.



සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව
(BITSC)

අවදානම් කළමනාකරණ රාමුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මුහුණ දෙන සියලුම අවදානම් සඳහා ඒකාබද්ධ සහ ප්‍රමාණවත් ලබාදී ඇති බව සහතික කිරීමට බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපිත කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ මත පදනම් වී ස්ථාපිත කරන ලදී. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපිත කිරීම තුළින් බැංකුවේ අවදානම් පැතිකඩ නියාමනය කිරීම සහ අවදානම් සාධක පාලනයකර අවම කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සිදුකරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ප්‍රධාන රාජකාරි

අධ්‍යක්ෂ මණ්ඩලයට පහත කරුණු පිළිබඳ නිර්දේශ ලබා දේ -

- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම.
- ඇගයීම් ප්‍රතිඵල මත පදනම් වී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියේ වැඩි දියුණු කිරීම්.

කමිටුවේ සංයුතිය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන අතර ඉන් හතරක් විධායක නොවන සාමාජිකයින් වේ. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනලද ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූලය:

1. කේ.බී. රාජපක්ෂ මහතා - කමිටුවේ සභාපති/ විධායක නොවන අධ්‍යක්ෂ

2. කේ.බී. විජේරත්න මහතා - සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ

3. එම්.ජේ.පී. සල්ගාදු මහතා - සාමාජික/ විධායක නොවන අධ්‍යක්ෂ

4. ඩබ්ලිව් ඒ.පී. අබේසිංහ මහතා 2018 නොවැම්බර් දක්වා සාමාජික/ක්‍රියාකාරී අධ්‍යක්ෂ

5. නීල් ද අල්විස් මහතා - සාමාජික 2018 ජූලි 12 සිට සාමාජික/විධායක නොවන අධ්‍යක්ෂ

6. කේ. අමරසිංහ මහතා - සාමාජික 2018 ජූලි 12 සිට සාමාජික/විධායක අධ්‍යක්ෂ

7. ටී.ඒ. ආරියපාල මහතා - සාමාණ්‍යාධිකරී/ප්‍රවිනි

8. ටී. කුහාන් මහතා - ප්‍රධාන අවදානම් නිලධාරී

2018 වසර තුළ අවදානම් නිලධාරී ආරාධනාවන් මත රැස්වීම්වලට සහභාගි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ආයතනික කළමනාකරණය නියෝජනය කරන කමිටුවේ සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරයක් මෙම වාර්ෂික වාර්තාවේ 33 සිට 37 දක්වා පිටුවල විස්තර කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම කමිටුවේද ලේකම් වේ.

යොමු නිර්දේශ

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කමිටුවේ යොමු නිර්දේශ පහත දැක්වේ:

1. බැංකුවට විස්තරාත්මක අවදානම් කළමනාකරණ රාමුවක්, සුදුසු අනුකූලතා සහ පද්ධති ක්‍රියාත්මකව ඇති බව සහතික කිරීම.
2. බැංකුවේ සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු වෙත මෙයටම සීමා නොවූවද ණය, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ ක්‍රමෝපායික කිරීතිනාම අවදානම් ඇතුළු සියලුම සියලුම අවදානම් වර්ග තක්සේරු කිරීම.
3. ස්ථාපිත පවරන ලද බලතලවලට අනුකූලව අවදානම් තීරණ ගනු ලබන බව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතාවන් මත පදනම් වී කමිටුව විසින් නියමකළ ඉවසුම් සීමාවෙන් ඔබ්බට ගනුලබන අවදානම් අවම කිරීමට ගනු ලබන බව සහතික කිරීම.
4. බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ඵලදායීත්වය සහ අවදානම් කළමනාකරණ කාර්යයයේ ශක්තිමත්භාවය නියාමනය සහ ඇගයීම.
5. අභ්‍යන්තරව නියමකළ අවදානම් රුචියට අනුව කාර්යසාධනය වරින් වර තක්සේරු කිරීම.
6. බැංකුවේ අනුකූලතා වාර්තා සහ වාර්තාව සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව සමාලෝචනය කිරීම.
7. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අදාළ ගැටළු සමාලෝචනය කිරීම.
8. බාසල් III මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම සහ නියාමන මාර්ගෝපදේශ පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීම. මෙම වාර්තාවේ අවදානම් කළමනාකරණ කොටස පිටු අංක 42 සිට 53 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර ඉන් යොමු නිර්දේශවලට අනුව පිළිගැනීමේ මට්ටම සහ වසර තුළ ජයග්‍රහණ සහ ප්‍රධාන අවදානම් අවම කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්පූර්ණයෙන් ආවරණ කරයි.

රැස්වීම්

වසර තුළ කමිටුව තුන් වරක් මුණ ගැසුන අතර කමිටුවේ සණපූරණය හේතු කොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ විසින් නියම කරන අවම අවශ්‍යතාවට අනුකූල වී නොමැත.

වාර්තාකරණය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල කටයුතු රැස්වීමේ වාර්තා ඉදිරිපත් කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ. බැංකුවේ අවදානම් පැතිකඩ සහ විශේෂ කරුණු පිළිබඳ වාර්තාව මෙම කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා වෙන වෙනම ඉදිරිපත් කෙරේ. සමාලෝචිත වසර තුළ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකරනු ලබන නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.



සභාපති
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පහත සඳහන් නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කර ඇත:

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS);
2. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත
3. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති
4. 1988 අංක 30 දරන බැංකු පනත සහ එයට සිදුකළ සංශෝධන
5. මෙයටම සීමා නොවූවද ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් නියෝගය ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විෂේශිත බැංකු වෙත නිකුත් කරන ලද නියෝග, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ. සහ
6. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත.

මූල්‍ය ප්‍රකාශන සහ අනාවරණ ඉදිරිපත් කිරීම තුළ භාවිතා කරන ලද ආකෘති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී විෂේශිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා විශේෂිත ආකෘතිපත්වලට අනුකූල වේ.

බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති 2012 ජනවාරි 1 දින සිට බලාත්මක වූ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති බැංකුව විසින් ස්ථර වශයෙන් යොදා ගනී. තුලනාත්මක තොරතුරු පවත්නා වසරේ ඉදිරිපත් කිරීමට අනුකූලවීම පිණිස අවශ්‍ය අවස්ථාවලදී නැවත සඳහන් කරනු ලැබ ඇත. සියලුම වැදගත් අයිතම අනාවරණය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මගින් පැහැදිලි කර ඇත. මේ සමඟ ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන තුළින් බැංකුවේ තත්ත්වය, ආදායම් ප්‍රකාශය සහ වසර සඳහා බැංකුවේ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බව අපගේ උපරිම දැනුමට අනුව අපි සහතික වෙමු.

එමෙන්ම, බැංකුවට දැකියහැකි අනාගතය තුළ එහි මෙහෙයුම් කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අපි විශ්වාස කරන අතර ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම යොදා ගෙන ඇත.

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය මූල්‍ය ප්‍රකාශනවල අවංකකම සහ විෂයමූලිකබව සඳහා වගකිම පිළිගනී. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඇස්තමේන්තු සහ විනිශ්චයන් සාධාරණ සහ විචක්ෂණ පදනමක් මත සිදුකරනු ලැබ ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවලින් සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹුකිරීම සහ ගනුදෙනුවල ආකෘතිය සහ හරය සහ බැංකුවේ කටයුතුවල තත්ත්වය සාධාරණව ඉදිරිපත් කිරීම සඳහා එම පදනම භාවිතා කරනු ලබයි.

මෙය සහතික කිරීම සඳහා, අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය, ඇගයීම සහ යාවත් කරනු ලබන වත්කම් ආරක්ෂා කිරීම සඳහා, වංචා මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැලැක්වීම සහ සොයාගැනීම සඳහා මධ්‍ය බැංකුකරණ ක්‍රමයක භාවිතය සමඟ අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම තුළ සුදුසු සහ ප්‍රමාණවත් ආරක්ෂාව බැංකුව රැගෙන ඇත.

බැංකුවේ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථිර වශයෙන් අනුගමනය කරන බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණක විසින් කලින් කල විගණන පවත්වා ඇත. කෙසේවෙතත්, අභ්‍යන්තර පාලනය සහ ගිණුම්කරණය පිළිබඳ යම් පද්ධති විසින් ලබාදෙන සහතික මත බර තැබීමේදී හඳුනාගත යුතු ආවේනික සීමා පවතී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති දෙපාර්තමේන්තුව විගණනය කරයි. විගණකාධිපති විසින් නිකුත් කරන ලද වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 94 පිටුවේ දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සියලුම ගනුදෙනු නිවැරදිව සහ සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල වාර්තා කරන බවට සහ මූල්‍ය වාර්තාකරණය සහ අනාවරණයට අදාළ SLFRS/LKAS සහ අනෙකුත් නියාමන විධිවිධාන ඇතුළුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල ක්‍රියාවලි සහතික කරන බවට සාධාරණ සහතික ලබාදීම සඳහා මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මතාව සහ ඵලදායිත්වය සමාලෝචනය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 80 සහ 81 පිටුවේ දැක්වෙන අතර ඒ තුළින් යම් වැදගත් කරුණු සාකච්ඡා

කිරීම සඳහා විගණන කමිටු රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයින් වෙත සම්පූර්ණ සහ නිදහස් පිවිසීම බාහිර විගණකවරුන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට ඇති බව සහතික කරමු.

පහත කරුණු අපගේ උපරිම දැනුමට අනුව අපි සහතික කරමු:

- බැංකුව අදාළ සියලුම නීති, නියමයන්, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලවී ඇති බව
- අනුකූල නොවූ අවස්ථා නොමැති බව
- වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ සටහන 38.2 හි අනාවරණය කරන දෑ හැර බැංකුවට එරෙහිව කිසිදු නඩුකටයුත්තක් නොමැති බව
- වාර්තා කරන දිනයට බැංකුවේ සියලුම බදු, රේගුබදු, අයබදු සහ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සේවකයින් වෙනුවෙන් සහ සම්බන්ධයෙන් ගෙවියයුතු සියළුම දායකත්වයන්, අයබදු සහ බදු අවශ්‍ය අවස්ථාවේදී ගෙවා ඇති බව.

ටී. කුහාන්
වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී

පී.එස්. එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

2019 මැයි 10

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ රාමුවට අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙම ප්‍රකාශයෙන් පැහැදිළි වේ. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවේ 94 පිටුවේ විගණකවරුන්ගේ වාර්තාව තුළ දක්වේ.

මූල්‍ය ප්‍රකාශන

බැංකුවේ සියලුම ගනුදෙනු පිළිබඳ සුදුසු ගිණුම් පොත් පරිදි පවත්වාගෙන යාම, එක් එක් වර්ෂය අවසානයට බැංකුවේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන පරිදි පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුකූලව සහ අනෙකුත් ව්‍යවස්ථාපිත/නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. ආදායම් ප්‍රකාශය, විස්තරාත්මක ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ එයට අදාළ සටහන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් විය යුතුය.

වාර්ෂික වාර්තාව තුළ ඉදිරිපත් කරන 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම තුළ, වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම, ස්ථිරව යොදාගැනීම සහ ප්‍රමාණවත්ව අනාවරණය කිරීම සිදුකර ඇති බව සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ ක්‍රියාවලිය තුළ ගනුදෙනුවල ආකෘතිය සහ හරය විධිමත්ව පිළිබිඹුවීම සඳහා අවශ්‍ය තැන්වලදී සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයන් සිදුකර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරතී.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත, 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් ව්‍යවස්ථාපිත/නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් පිළිබිඹු කරයි.

අඛණ්ඩතා පැවැත්ම

දැකියහැකි අනාගතය සඳහා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බැංකුවට ප්‍රමාණවත් සම්පත් පවත්නා බවට හා මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ පදනම භාවිතය සාධාරණ බවට අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධති සහ අවදානම් කළමනාකරණය සඳහා සහ බැංකුවේ වත්කම් ආරක්ෂාකර සුරක්ෂිත කරගැනීම සඳහා සහ වංචාව සහ අවපාලනය වැලැක්වීම සඳහා ශක්තිමත් පාලන වාතාවරණයක් පවත්වා ගැනීම කෙරෙහි සැලකියයුතු අවධානයක් යොමුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. බැංකුව සම්පූර්ණයෙන් තුරන්කළ නොහැකි ආවේනික අවදානම් පිළිබඳ අවධානය යොමු කරමින්, විවිධ ක්‍රම සහ වෙනත් පාලනයන් සහතික කරමින් ඒවා අවම කිරීමට ගතහැකි පියවර ගෙන ඇත. මූල්‍ය වාර්තාකරණ පද්ධති මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීම සඳහා සැලසුම්කර ඇති බව සහතික කරමින් බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවක් වාර්ෂික වාර්තාවේ 91 සහ 92 පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂවරු සහ කළමනාකාරිත්වය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ක්‍රියාවට නංවා ඇත. වැදගත් අවදානම් නියාමනය සහ කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපිතකර ඇති අතර සාකච්ඡාව සඳහා නිරන්තර පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත අවදානම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කර ඇත.

අදාළ නීති, රෙගුලාසි, නියමයන්, උපදෙස් සහ මාර්ගෝපදේශවලට අනුකූලතාව අනුකූලතා අංශය විසින් නියාමනය කරන අතර කලින් කල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

විගණන කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටිවල ඵලදායීත්වය ශක්තිමත් කිරීමේදී සැලකියයුතු කාර්යභාරයක් ඉටු කරයි. විගණන කමිටු වාර්තාව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව පිළිවෙලින් වාර්ෂික වාර්තාවේ 80 සහ 85 පිටුවල දක්වා ඇත.

විගණකාධිපති වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඇතුළුව බැංකුවේ සියලුම වාර්තා ලබාගැනීමට ඉඩ සලසා දුන් අතර ඔහු විසින් සුදුසුයයි සලකනු ලබන පරීක්ෂණ කරගෙනයාමට සෑම අවස්ථාවක්ම ලබා දී ඇත.

අනුකූලතාව

අධ්‍යක්ෂවරුන්ගේ දැනුවත්භාවය සහ විශ්වාසයට අනුව, මූල්‍ය වසර අවසානයේදී බැංකුව විසින් ගෙවිය යුතු සියලුම බදු සහ රජය වෙත ගෙවිය යුතු අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ අනෙකුත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත ආයතනවලට සිදුකළ යුතු ගෙවීම් අදාළ අවස්ථාවන් හී ගෙවා ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

ඉහත දක්වා ඇති ප්‍රකාශයෙන් පෙන්නුම් කර ඇති පරිදි ඔවුන්ගේ වගකීම්, ඔවුන් ඉටු කර ඇති බවට අධ්‍යක්ෂවරු විශ්වාසය පළ කරති.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2019 මාර්තු 26

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/F/RDB/IC/2018 මගේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 25 June 2019

සභාපති
ප්‍රාදේශිය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිගේ ස්වාධීන වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය ("ප්‍රකාශය") පිළිබඳ සහතික කිරීම ලබා දේ.

කළමනාකරණයේ වගකීම

2007 අංක 12 බැංකු පනත් නියෝගයේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මඟපෙන්වීමට අනුකූලව ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මගේ වගකීම සහ SLSAE 3050 සමඟ අනුකූලවීම

මගේ වගකීම වන්නේ ඉටුකරන ලද කාර්යය මත පදනම් වී ප්‍රකාශනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තාවක් නිකුත් කිරීමයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සහතික කිරීමේ සහභාගිත්වයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති SLSAE 3050 - අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුව සඳහා සහතික කිරීමේ වාර්තාවට අනුකූලව මම මෙම කාර්යය ඉටුකළෙමි.

ඉටු කරන ලද කාර්යයේ සාරාංශය

අධ්‍යක්ෂවරුන් විසින් සකස් කරන ලද ලියකියවිලි මගින් බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ පද්ධතිය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් යොදා ගෙන ඇති ක්‍රියාවලිය නිසි ලෙස පිළිබිඹු කිරීමට සහය දක්වනවාද යන්න තක්සේරු කිරීම සඳහා මම මෙම කාර්යය ඉටු කළෙමි.

සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් මූලික වශයෙන් බැංකුවේ සේවකයින්ගේ විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලියට සහාය වන නියැදි පදනමක් මත ලේඛනවල පැවැත්ම සඳහා සීමා විය.

SLSAE 3050 අනුව මාගේ ප්‍රකාශනයෙහි සියලු අවධානම් සහ පාලනයන් ආවරණය කරන්නේද යන්න සලකා බැලීමට හෝ බැංකුවේ අවධානම් සහ පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායීතාවය පිළිබඳ මතයක් සැකසීම අවශ්‍ය නැත. එමෙන්ම SLSAE 3050 අනුව, මා විසින් වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කරන කිසියම් වැදගත් ගැටළුවක වැදගත් අභ්‍යන්තර පාලන අංශ සමඟ කටයුතු කිරීම සඳහා විස්තර කර ඇති ක්‍රියාවලි ඇත්ත වශයෙන්ම ගැටළුවලට පිළියම් සපයන්නේද යන්න සලකා බැලීම ද අවශ්‍ය නැත.

නිගමනය

සිදුකරන ලද ක්‍රියාපටිපාටි මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමය සැලසුම හා ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධය, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය හා නොගැලපෙන බව මාහට විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මගේ අවධානයට යොමු වී නොමැත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

අවශ්‍යතාව

මෙම වාර්තාව 2007 අංක 12 බැංකු පනත් නියෝගයේ 3 (8) (ii) (අ) වගන්තියට අනුකූලව නිකුත් කර ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම් වී පිළියෙල කර ඇත.

වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලනය සඳහා සහ එහි ඵලදායිත්වය සහ ප්‍රමාණාත්මතාව සඳහා වගකීමට බැඳී සිටී. කෙසේවෙතත්, එවැනි ක්‍රමයක් බැංකුවේ ප්‍රතිපත්ති සහ ව්‍යාපාර අරමුණු අත්කර ගැනීමට අසමත්වීමේ අවදානම ඉවත් කිරීමට වඩා පිළිගතහැකි අවදානම් පැතිකඩ තුළ බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීමට සැලසුම් කරයි. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධති කළමනාකරණ සහ මූල්‍ය තොරතුරුවල වැරදි ප්‍රකාශයන්ට සම්පූර්ණ සහතිකයක් නොවූවත් සාධාරණ සහතිකයක් පමණක් ලබාදිය හැකි අතර මූල්‍ය අලාභ සහ වංචා වාර්තා කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචන ක්‍රියාවලිය

අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල සමාලෝචනය කරන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකුවේ අධ්‍යක්ෂවරුන් සඳහා මඟපෙන්වීමට එකඟ වේ. එම මඟපෙන්වීම තුළ දෙන ලද අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා මූලධර්ම සැලකිල්ලට ගනිමින් අභ්‍යන්තර පාලන පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරු කර ඇත.

මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කිරීමට බැංකුව පියවර ගෙන ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

බැංකුව විසින් මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කරමින් අවදානම සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම තුළ සහ මෙම අවදානම් අවමකර පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම සහ නියාමනය තුළ කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ.

ක්‍රියාවලියේ ප්‍රධාන අංග

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණාත්මතාව සහ අවංකකම සමාලෝචන කිරීමේදී ස්ථාපිත කරනු ලැබ ඇති මූලික ක්‍රියාවලින්ට පහත දෑ ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල ඵලදායිත්වය සහ අනුමත කරනු ලැබ ඇති බැංකුවේ මෙහෙයුම් ආයතනික පරමාර්ථ, ක්‍රමෝපාය සහ වාර්ෂික අයවැය මෙන්ම ප්‍රතිපත්ති සහ ව්‍යාපාර නියෝගවලට අනුකූල බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වැනි අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපිත කර ඇත.
- අධ්‍යක්ෂ මණ්ඩලය එහි සියලුම ගනුදෙනු තුළ බැංකුවේ මූල්‍ය සහ අනෙකුත් පාලනයන්ට අදාළව මෙහෙයුම් අත්පොතක් අනුමත කර ඇත. අත්පොත තුළ දක්වා ඇති ක්‍රියාපටිපාටි කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට දැනුම් දී ඇත.
- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටිවලට අනුකූලතාව සහ ආදර්ශ සහ චක්‍රිය ක්‍රියාපටිපාටි භාවිතයෙන් අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිත්වය පරීක්ෂා කර අනුකූල නොවීම සම්බන්ධයෙන් වැදගත් සොයා ගැනීම් ඉස්මතු කර දක්වයි. සෑම ඒකකයක් සහ ශාඛාවන් තුළම විගණනය සිදුකරන අතර ස්වාධීන සහ විෂයමූලික වාර්තාවක් ලබාදීම සඳහා තක්සේරුකළ අවදානම් මට්ටම විසින් වාරගණන තීරණය කරනු ලබයි. වාර්ෂික විගණන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරයි. අභ්‍යන්තර විගණනයේ සොයාගැනීම් කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කෙරේ.
- බැංකුවේ විගණන කමිටුව අභ්‍යන්තර විගණනය, නියාමන බලධාරීන් සහ කළමනාකරණය විසින් හඳුනාගන්නා අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කරන අතර අවදානම් කළමනාකරණයේ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායිත්වය ඇගයීමට ලක් කරයි. එමෙන්ම, ඔවුන් විගණනයේ විෂයපථය සහ අභ්‍යන්තර පාලනයේ තත්ත්වය මත විශේෂ අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය කරයි. විගණන කමිටු රැස්වීම්වල වාර්තා කාලීන පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සභාගත කරයි.

- 2018 දී, SLFRS – 9, "මූල්‍ය උපකරණ" ඇතුළත්වන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති බැංකුව යොදා ගන්නා ලදී. ඉහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීමට මූලිකව භාවිතාකළ ක්‍රියාවලිය සහ ක්‍රියාපටිපාටි බාහිර විගණක, නියාමකයින් සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රතිචාර මත පදනම් වී තවදුරටත් ශක්තිමත් කරන ලදී. බැංකුව තවදුරටත් ණය සහ අත්තිකාරම් මත හානිකරණය පිළිබඳ ක්‍රියාවලිය, මූල්‍ය ප්‍රකාශන අනාවරණ සහ අවදානම් කළමනාකරණය ශක්තිමත් කර ඇත.

සහතික කිරීම

ඉහත ක්‍රියාවලි මත පදනම් වී, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධති මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකය ලබාදීම සඳහා සැලසුම්කර ඇති බව සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර සිටී.

බාහිර විගණකවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනය කිරීම

බාහිර විගණකවරු විසින් 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අභ්‍යන්තර පාලනය පිළිබඳ ඉහත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සමාලෝචනය කර ඇති අතර, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ ඵලදායිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය විසින් යොදා ගෙන ඇති ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සමඟ ප්‍රකාශනය අනුකූල නොවන බව ප්‍රකාශ කිරීමට තරම් හේතු ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහතික වේ.

සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

සභාපති

අධ්‍යක්ෂ

2019 මාර්තු 26

7.

මූල්‍ය වාර්තා

2018 වසරේදී බැංකුව 18%ක දළ ආදායමක්, 13%ක ශුද්ධ මෙහෙයුම් ආදායමක් සහ 9%ක බදු පෙර මෙහෙයුම් ලාභයක් වශයෙන් වැඩිවීමක් අත් කරගෙන ඇත. කෙසේ වෙතත් බදු පසු ලාභය බදුකරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් හේතු කොට ගෙන පහත වැටීමක් පෙන්නුම් කරන ලදී.

මුළු වත්කම් 5%කින් වර්ධනය වූ අතර කොටස්හිමියන්ගේ ස්කන්ධය තුළ 53%ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. පසුව සඳහන්කළ වර්ධනය සඳහා බැංකුවේ කොටස් නිකුතුව මගින් ලංකාපුත්‍ර සමාගමේ 100%ක කොටස් හිමිකම අත්කර ගැනීම ප්‍රධාන වශයෙන් හේතු විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. BAF/F/RDB/1/18/12
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 21 June 2019

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1.1 මතය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ("බැංකුව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

කරුණක් අවධාරණය

මාගේ මතය තත්වාගණනය නොකරමින්, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 22.2 කෙරෙහි ඔබේ අවධානය යොමු කරන අතර 2016 වසරේ රජයේ අයවැය යෝජනා අනුව බැංකුව විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සියයට සියයක් කොටස් අත්පත් කර ගෙන ඇති බවත්, එමඟින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා කර ඇති බවත් එහි සඳහන් වේ. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සමස්ත කොටස් අයිතිය රු. බිලියන 4.176 ක ගැනුම් ප්‍රතිෂ්ඨාවකට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කරගත් අතර, 2018 දෙසැම්බර් 31 දිනට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරයට පක්ෂව නව කොටස් නිකුතුවක් මඟින් ගැනුම් ප්‍රතිෂ්ඨාව පියවන ලදී. කෙසේ වෙතත්, කොටස් අවලංගු කිරීම හෝ නව කොටස් නිකුත් කිරීම ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ පොත් වලට ගෙන නොතිබූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ මුළු අරමුදල් රු. බිලියන 5.386 ක් විය. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තහවුරු කළ පරිදි පාලන බලය මුදල් අමාත්‍යාංශය සතු වූ බැවින් ඉහත ආයෝජනය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පරිපාලිත සමාගමක් වීමට සුදුසුකම් නොලබයි.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ප්‍රධාන විගණන කරුණු

මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තීය විනිශ්චය අනුව ප්‍රවර්තන කාල පරිච්ඡේදය සඳහා වඩාත් වැදගත් කරුණු ප්‍රධාන විගණන කරුණු වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණන මතය ගොඩනැගීමේදී විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බැලූ අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ.

ප්‍රධාන විගණන කාරණය	මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කරන ලද ආකාරය
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත බැංකුවේ මාරුවීම ඇතුළුව ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ දීමනාව: අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දේ සඳහා වන හානිකරණ දීමනාව ප්‍රධාන විගණන කරුණක් ලෙස මාගේ විගණනයේදී සලකන ලදී. ණය සහ අත්තිකාරම් ලෙස වාර්තාගත අගයන්ගේ ප්‍රමාණාත්මකභාවය (සහ ඒ සඳහා වූ හානිකරණ දීමනාව), කළමනාකරණය විසින් සිදු කරන ලද හානිකරණ ඇස්තමේන්තුවල විෂයගතභාවය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත සංක්‍රමණය වීම, (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9) එය ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකීම සඳහා වූ මාගේ පදනම තහවුරු කරන ලදී. 2018 දෙසැම්බර් මස 31 දිනට බැංකුවේ මුළු වත්කම් වලින් සියයට 75 ප්‍රතිශතයක් අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ වටිනාකම රු.මි. 133,433 (සටහන 20) වූ අතර ශුද්ධ හානිකරණ දීමනාව රු. මිලියන 1,410 (සටහන 10) විය. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 වෙත මාරුවීමේදී බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත වූ බලපෑම මූල්‍ය ප්‍රකාශන සටහන 4 හි දක්වා ඇත. වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දේ සඳහා වන හානිකරණ දීමනාව තක්සේරු කිරීම සංකීර්ණ හස්තමය ගණනය කිරීම් මඟින් සිදුකර තිබුණි. එම ගණනය කිරීම සඳහා කළමනාකරණය විසින් යොදාගත් සැලකිය යුතු ඇස්තමේන්තු සහ උපකල්පන, ඒවායේ සංවේදීභාවය සහ හානිකරණ දීමනාව සඳහා පදනම සටහන 3.1.1.7 හි දක්වා ඇත.	හානිකරණ දීමනාවේ සාධාරණභාවය තක්සේරු කිරීම සඳහා, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා නිර්මාණය කරන ලද මාගේ විගණන ක්‍රියාපටිපාටි අතර, පහත සඳහන් දෑ ද ඇතුළත් විය: ■ අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා වන හානිකරණ දීමනාව ඇස්තමේන්තු කිරීම පිළිබඳ වූ පාලනයන් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් ඵලදායකත්වය, දෝෂයන්ගේ ප්‍රමාණය තක්සේරු කිරීම සමාලෝචනය සහ හානිකරණ ප්‍රතිපත්ති විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කිරීමද ඇතුළත්ව මා විසින් ඇගයීමට ලක් කරන ලදී. ■ පාදක වූ ගණනය කිරීම් සහ දත්ත සෝදිසි පරීක්ෂාවට භාජනය කරන ලදී. ■ ඉහත සඳහන් කරුණු වලට අමතරව, පහත දැක්වෙන කේන්ද්‍රගත ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කරන ලදී: අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා - හානිකරණය සඳහා වෙන් වෙන්ව ඇගයීම: ■ හානිකරණ සිදුවීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද ප්‍රධාන නිර්ණායක මා විසින් තක්සේරු කරන ලදී. ■ හානිකරණ දර්ශක පවත්නා අවස්ථාවන්හිදී අපේක්ෂිත අනාගත මුදල් ■ ප්‍රවාහයන්ද, වට්ටම් අනුපාත සහ සුරැකුම් වල වටිනාකම අගය කිරීම මා විසින් තක්සේරු කරන ලදී. අනාගත අයකර ගැනීම් පිළිබඳව ඉකුත් වර්ෂවල කරන ලද ඇස්තමේන්තු අගයන් සහ සත්‍ය අයකර ගැනීම් මා විසින් සසඳා බලන ලදී. ■ ණය අය කර ගැනීමේ ඉහළ අවදානමක් ඇති ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දී ඇති විට, හානිකරණ අවස්ථාවක් පැහැනැඟීමට ඇති ඉඩකඩ තීරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද ප්‍රධාන නිර්ණායකයන් සහ එවැනි අතිරේක හානිකරණ සම්බන්ධයෙන් කළමනාකරණ ඇස්තමේන්තුවල සාධාරණභාවය මා විසින් තක්සේරු කරන ලදී. අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා - හානිකරණය සඳහා සමස්තයක් ලෙස තක්සේරු කිරීම: ■ බැංකුවේ මූලාශ්‍ර ලේඛන සහ තොරතුරු තාක්ෂණ පද්ධතිවල තොරතුරු වලට එකඟ වීම සහ හානිකරණ දීමනාව නැවත ගණනය කිරීම මඟින් හානිකරණ ගණනය කිරීම් සඳහා භාවිතා කරන ණය සහ ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් පාදක වූ තොරතුරු වල සම්පූර්ණභාවය, අදාළත්වය සහ නිරවද්‍යතාවය මා විසින් පරීක්ෂා කරන ලදී. ■ විවිධ වර්ගයේ ණය සඳහා කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන්ට අනුව භාවිතා කරන ලද සාර්ව ආර්ථික සහ අනෙකුත් සාධකවල සාධාරණභාවය ප්‍රසිද්ධ දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සසඳමින් මා විසින් සළකා බලන ලදී. ■ සටහන 20 හි දක්වා ඇති පරිදි අදාළ මූල්‍ය ප්‍රකාශන හෙලිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවයද මා විසින් තක්සේරු කරන ලදී. ■ සටහන 4 හි දක්වා ඇති පරිදි ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 යොදා ගැනීමේ මූලික බලපෑම සම්බන්ධයෙන් බැංකුවේ හෙලිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවයද මා විසින් තක්සේරු කරන ලදී. සංක්‍රමණයේ ප්‍රමාණාත්මක බලපෑම පිළිබඳ පරීක්ෂා මෙයට ඇතුළත් වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2018 රු.	2017 රු.
දළ ආදායම	5	26,070,610,605	22,016,071,577
පොළී ආදායම		24,865,108,981	20,908,493,021
පොළී වියදම්		(12,959,526,709)	(11,233,284,493)
ශුද්ධ පොළී ආදායම	6	11,905,582,272	9,675,208,528
ගාස්තු හා කොමිස් ආදායම		1,186,795,173	1,101,825,405
ගාස්තු හා කොමිස් වියදම්		(259,105,166)	(181,086,441)
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	7	927,690,007	920,738,964
ශුද්ධ වෙළෙඳ ලාභය/(අලාභය)	8	1,215,762	1,079,185
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	9	17,490,689	4,673,967
මුළු මෙහෙයුම් ආදායම		12,851,978,730	10,601,700,644
හානිකරණ අයකිරීම්	10	(1,409,784,095)	(443,866,831)
ශුද්ධ මෙහෙයුම් ආදායම		11,442,194,635	10,157,833,813
අඩු කළා - මෙහෙයුම් වියදම්			
කාර්ය මණ්ඩල වියදම්	11	(5,877,946,793)	(4,980,435,598)
ක්ෂයකිරීමේ සහ ක්‍රමක්ෂය වියදම්		(319,020,738)	(326,101,075)
වෙනත් වියදම්	12	(1,638,896,765)	(1,419,302,464)
මහා භාණ්ඩාගාරයට ගෙවන ලද බදු		–	(125,000,000)
එකතු කළ අගය මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය		3,606,330,339	3,306,994,676
මූල්‍ය සේවා මත බදු	13	(1,503,248,448)	(1,116,268,931)
බදු පෙර ලාභය		2,103,081,891	2,190,725,745
බදු වියදම්	14	(1,029,495,530)	(906,796,239)
වසර සඳහා ලාභය		1,073,586,361	1,283,929,506
කොටසකට ඉපැයීම්			
කොටසක ඉපැයුම - මූලික	15	7.69	9.23

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුකූලව පිළියෙල කර ඇති නමුත් පූර්ව කාලසීමාවන්හී ප්‍රමාණ නැවත සඳහන් කර නොමැත.

මෙම වාර්තාවෙහි පිටු අංක 103 සිට 180 දක්වා දැක්වෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක්වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වෙයි. විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 94 හි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2018 රු.	2017 රු.
වසර සඳහා ලාභය		1,073,586,361	1,283,929,506
විස්තීර්ණ ආදායම්/(වියදම්)			
ආදායම් ප්‍රකාශයට නැවත වර්ග කරනු නොලබන වෙනත් විස්තීර්ණ ආදායම			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණනක අලාභ	33.3	(111,149,773)	(236,286,599)
ඉහත අගයන් මත විලම්බිත බදුකරණයේ බලපෑම	26.2	31,121,936	66,160,248
ශුද්ධ බදු මත වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම		(80,027,837)	(170,126,351)
වසර සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම		993,558,524	1,113,803,154

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දැක්වේ.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුකූලව පිළියෙල කර ඇති නමුත් පූර්ව කාලසීමාවන්හී ප්‍රමාණ නැවත සඳහන් කර නොමැත.

මෙම වාර්තාවෙහි පිටු අංක 103 සිට 180 දක්වා දැක්වෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක්වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වෙයි. විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 94 හි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	සටහන	2018 රු.	2017 රු.
වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	17	689,184,136	572,294,808
බැංකු තැන්පතු	18	6,496,628,053	6,682,475,675
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ	19	115,600	146,500
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබියයුතු	20	133,432,804,004	127,508,812,394
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන – ණය සහ අනෙකුත් උපකරණ	21	27,757,513,965	28,130,079,911
අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අගයේදී ස්කන්ධ උපකරණ	22	4,176,342,999	–
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්	22	–	50,000
කල්පිරෙන තෙක් රඳවා සිටින මූල්‍ය වත්කම්	23	–	2,512,362,500
දේපල, පිරියත හා උපකරණ	24	1,275,785,603	1,204,892,835
අස්පෘශ්‍ය වත්කම්	25	60,787,719	37,842,762
විලම්බිත බදු වත්කම්	26	467,332,859	343,878,698
වෙනත් වත්කම්	27	2,580,824,487	2,266,365,532
මුළු වත්කම්		176,937,319,425	169,259,201,615
වගකීම්			
බැංකුවෙත ගෙවිය යුතු	28	11,098,334,822	10,729,312,134
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	29	141,559,973,557	139,827,364,797
ණය නිකුත් කිරීම් සහ වෙනත් ණයට ගත් අරමුදල්	30	4,707,852,534	4,707,852,534
පවත්නා බදු වගකීම්	31	473,833,076	365,502,454
වෙනත් වගකීම්	32	2,460,286,430	2,320,526,315
විශ්‍රාම පාරිතෝෂික	33	1,926,924,377	1,695,894,720
මුළු වගකීම්		162,227,204,796	159,646,452,955
ස්කන්ධය			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	34	8,047,229,930	3,870,936,931
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	35	717,331,468	663,652,150
රඳවාගත් ඉපයීම්	36	2,315,905,812	1,716,908,747
වෙනත් සංචිත	37	3,629,647,420	3,361,250,831
මුළු කොටස් හිමියන්ගේ ස්කන්ධය		14,710,114,630	9,612,748,660
මුළු ස්කන්ධය හා වගකීම්		176,937,319,425	169,259,201,615
අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්	38	212,759,167	406,561,172

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රමාණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුකූලව පිළියෙල කර ඇති නමුත් පූර්ව කාලසීමාවන්හී ප්‍රමාණ නැවත සඳහන් කර නොමැත.

මෙම වාර්තාවෙහි පිටු අංක 103 සිට 180 දක්වා දැක්වෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක්වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වෙයි. විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 94 හි දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධානවල අනුකූලව පිළියෙළ කර ඇති බවට මෙයින් සහතික කරමි.

පී. එස්. එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

ටී. කුහාන්
සාමාන්‍යාධිකාරී/ප්‍ර.වි.නි. (වැඩබලන)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර මෙය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකොට පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

ජේ. ටී. එස්. පී. කාරියවසම්
සභාපති

කේ. බී. විජේරත්න
අධ්‍යක්ෂ

2019 මැයි මස 10 වන දින
කොළඹදී ය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	සටහන	2018 රු.	2017 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
බදු පෙර ලාභය		3,606,330,339	3,306,994,676
ගැලපීම්:			
බදු පෙර ලාභය තුළ ඇතුළත් මුදල් නොවන අයිතම	41	2,009,117,605	1,077,334,374
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	42	(7,759,296,804)	(24,958,618,433)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	43	2,335,364,021	34,542,627,172
වෙනත් නැවත වර්ග කිරීම්		–	30,154
නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්මට ගෙවනලද දායකය	33.1	(125,672,259)	(47,155,929)
මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු		(1,025,230,834)	(1,093,435,620)
බදු ගෙවීම්	31	(958,313,173)	(897,233,601)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(1,917,701,106)	11,930,542,793
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම්	24	(363,021,456)	(303,997,879)
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිලදී ගැනීම්	25	(50,630,424)	(20,602,627)
ස්ථාවර තැන්පත්වල ආයෝජන (මාස තුනට වැඩි)		(1,493,138,238)	(16,220,888,212)
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල්		12,009,452	1,017,097
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද (භාවිත කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහ		(1,894,780,666)	(16,544,471,622)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
සාමාන්‍ය කොටස් නිකුතුවෙන් ශුද්ධ ලැබීම්	34	–	2,500,000,000
උපකාරක ණය නිකුතුවෙන් ශුද්ධ ලැබීම්	30.1	–	2,000,000,000
ණයකර මත ගෙවූ පොළී	30.1	(535,784,685)	(460,163,717)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		(535,784,685)	4,039,836,283
මුදල් හා මුදල් සමාන දෑ හී ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)		(4,348,266,457)	(574,092,545)
මුදල් හා මුදල් සමාන දෑ හී ආරම්භක ශේෂය		13,987,283,176	14,561,375,721
මුදල් හා මුදල් සමාන දෑ හී අවසාන ශේෂය		9,639,016,719	13,987,283,176
මුදල් හා මුදල් සමාන දෑ සැසඳීම			
මුදල් හා මුදල් සමාන දෑ	17	689,184,136	572,294,808
බැංකුවල ඇති වාසිදායක ශේෂයන්			
බැංකු සමඟ ස්ථාපන	18	6,496,692,932	6,682,475,675
මාස තුනට වඩා අඩු ස්ථාවර තැන්පතු	21.2	2,520,602,739	6,897,553,288
බැංකුවල ඇති අවාසිදායක ශේෂයන්	28	(67,463,088)	(165,040,596)
		9,639,016,719	13,987,283,176

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රමාණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුකූලව පිළියෙල කර ඇති නමුත් පූර්ව කාලසීමාවන්හී ප්‍රමාණ නැවත සඳහන් කර නොමැත.

මෙම වාර්තාවෙහි පිටු අංක 103 සිට 180 දක්වා දැක්වෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වෙයි. විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 94 හි දක්වා ඇත.

	ප්‍රකාශිත ප්‍රාග්ධනය සටහන 34 රු.	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල සටහන 35 රු.	විශේෂ සංචිත අරමුදල සටහන 37 රු. ග	සාමාන්‍ය සංචිත අරමුදල සටහන 37 රු.	රඳවාගත් ඉපයීම් සටහන 36 රු.	එකතුව රු.
2017 ජනවාරි 1 දිනට ශේෂය	1,370,936,931	599,455,675	453,846,003	2,586,422,452	988,284,444	5,998,945,505
වසර සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	–	–	–	–	1,283,929,506	1,283,929,506
වෙනත් විස්තීර්ණ ආදායම්	–	–	–	–	(170,126,351)	(170,126,351)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–	–	1,113,803,154	1,113,803,154
හිමිකම තුළ සෘජුව හඳුනාගන්නා ලද, කොටස් හිමියන් සමග සිදු කරන ලද ගනුදෙනු						
නිකුත් කළ ප්‍රකාශිත ප්‍රාග්ධනය	2,500,000,000	–	–	–	–	2,500,000,000
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරුකිරීම්	–	64,196,475	–	–	(64,196,475)	–
විශේෂ සංචිත අරමුදල වෙත මාරුකිරීම්	–	–	64,196,475	–	(64,196,475)	–
සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරුකිරීම්	–	–	–	256,785,901	(256,785,901)	–
මුළු එකතුව තුළ සෘජුව හඳුනාගන්නා ලද, කොටස් හිමියන් සමග සිදු කරන ලද ගනුදෙනු	2,500,000,000	64,196,475	64,196,475	256,785,901	(385,178,851)	2,500,000,000
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	3,870,936,931	663,652,150	518,042,478	2,843,208,353	1,716,908,747	9,612,748,660
2018 ජනවාරි 1 දිනට ශේෂය	3,870,936,931	663,652,150	518,042,478	2,843,208,353	1,716,908,747	9,612,748,660
SLFRS 9 සම්මත කිරීමේ බලපෑම (සටහන 4)					(72,485,552)	(72,485,552)
2018 ජනවාරි 1 දිනට SLFRS 9 යටතේ නැවත ශේෂය	3,870,936,931	663,652,150	518,042,478	2,843,208,353	1,644,423,196	9,540,263,108
වසර සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම						
වසර සඳහා ලාභය	–	–	–	–	1,073,586,361	1,073,586,361
වෙනත් විස්තීර්ණ ආදායම්	–	–	–	–	(80,027,837)	(80,027,837)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	–	–	–	–	993,558,524	993,558,524
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගන්නා ලද, කොටස් හිමියන් සමග සිදු කරන ලද ගනුදෙනු						
නිකුත් කළ ප්‍රකාශිත ප්‍රාග්ධනය	4,176,292,999	–	–	–	–	4,176,292,999
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කර යවන ලද	–	53,679,318	–	–	(53,679,318)	–
විශේෂ සංචිත අරමුදල වෙත මාරු කර යවන ලද	–	–	53,679,318	–	(53,679,318)	–
සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරු කර යවන ලද	–	–	–	214,717,272	(214,717,272)	–
ස්කන්ධය තුළ සෘජුව හඳුනාගන්නා ලද, කොටස් හිමියන් සමග සිදු කරන ලද ගනුදෙනු	4,176,292,999	53,679,318	53,679,318	214,717,272	(322,075,908)	4,176,292,999
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	8,047,229,930	717,331,468	571,721,796	3,057,925,624	2,315,905,812	14,710,114,630

මෙම වාර්තාවෙහි පිටු අංක 103 සිට 180 දක්වා දැක්වෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන මූල්‍ය ප්‍රකාශනවලට සටහන් සමගින් මෙකී මූල්‍ය ප්‍රකාශන කියවිය යුතු වෙයි. විගණකාධිපතිගේ වාර්තාව පිටු අංක 94 හි දක්වා ඇත.

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍යය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට, ප්‍රාදේශීය සංවර්ධන බැංකු වර්ගීකරණය යටතේ දිස්ත්‍රික් මට්ටමින් බැංකු ස්ථාපිත කරන ලද 1985 වර්ෂය තරම් ඈතට දිව යන ඉතිහාසයක් ඇත. පසුව, 1997 වර්ෂයේ දී එවැනි බැංකු දාහතක් ඒකාබද්ධ කොට පළාත් මට්ටමේ බැංකු හයක් පිහිටුවන ලද අතර එම බැංකු රජරට, රුහුණු, වයඹ, ඌව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකු වශයෙන් ක්‍රියාත්මක විය. 2010 වර්ෂයේ මැයි මාසයේ දී මෙම බැංකු හය ඒකාබද්ධ කර ජාතික මට්ටමේ බැංකුවක් නිර්මාණය කරන ලද අතර එම බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස නම් කරන ලදී. 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස මෙම බැංකුව ස්ථාපිත කරන ලද අතර බැංකුවේ ලියාපදිංචි කාර්යාලය කැළණිය, වෙදමුල්ල, නුවර පාරේ අංක. 933 දරණ ස්ථානයේ පිහිටුවා ඇත.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ස්ථිර, පුහුණුව ලබන සහ කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 3,381 ක් විය (2017 දෙසැම්බර් 31 දිනට එම සංඛ්‍යාව 3,361 ක් විය).

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ, වාණිජ, පශු සම්පත් හා ධීවර කටයුතු සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමත්, ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා මූල්‍ය සහය ලබාදීම මඟින් කාන්තාවන් සවිබල ගැන්වීම තුළින් ශ්‍රී ලංකාවේ සමස්ත සංවර්ධනය උදෙසා පහසුකම් සැලසීම යි.

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි කැපී පෙනෙන වෙනස්කම් සිදු නොවීය.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම

2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ එහි සංශෝධන පනත්වල විධිවිධාන, 1988 අංක 30 දරණ බැංකු පනතේ හා එහි සංශෝධන පනත්වල විධිවිධාන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාර බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වෙයි.

1.4 අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශයට පත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2019 මැයි 10 වන දින අනුමත කරන ලදී.

2. සැකසීමේ පදනම

2.1 තක්සේරු කිරීමේ පදනම (මිනුම්කරණය මත)

පහත සඳහන් වැදගත් අයිතම දෙක හැර සෙසු මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කරනු ලැබ ඇත:

- වට්ටම් කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව පිළිබඳ වගකීම ආයුගණකව ගණනය කරනු ලබන අතර එය වට්ටම් කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගය ලෙස හඳුනාගනු ලබයි.
- වෙළඳාම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම් සාධාරණ අගය මත ගණනය කරනු ලබයි.

2.2 අනුකූලතා ප්‍රකාශය

2018 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/LKASs) අනුකූලව ද, 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එහි සංශෝධන පනත්වල නියමයන්ට හා 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනතේ සහ එහි සංශෝධන පනත්වල නියමයන්ට අනුකූලව ද සකස් කරනු ලැබ ඇත. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම ද, 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පනතේ සහ එහි සංශෝධන පනත්වල නියමයන්ට අනුකූලව සිදු කරනුලැබ ඇත.

2.3 ව්‍යවහාර සහ වාර්තා කරන මුදල් ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන ආර්ථික පසුබිම තුළ ව්‍යවහාර වන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබයි. අන්‍යාකාරයකින් දක්වා ඇති අවස්ථාවන්හි දී හැර ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

බැංකුව විසින් ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එක් එක් අයිතමය ඒවායේ ස්වභාවය අනුව වර්ග කර, ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාව පරිපූර්ණ රටාව නිරූපණය වන අනුපිළිවෙළකින් සකසා ඇත. මූල්‍ය ප්‍රකාශවලට බලපෑමක් සිදු කෙරෙන උද්ධමනාත්මක සාධක සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් සිදු කර නොමැත. වාර්තා කරන දිනෙන් මාස 12 ඇතුළත (ජංගම) සහ වාර්තා කරන දිනෙන් මාස 12 ඉක්ම වූ කාලයකට පසුව (ජංගම නොවන) ආපසු අයකර ගැනීම් හෝ පියවීම් පිළිබඳ විශ්ලේෂණයක් 44 වන සටහනෙහි දක්වා ඇත.

2.5 ප්‍රමාණවත් බව හා එකතුව

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 1 – LKAS 1 – "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම" ට අනුකූලව සමාන ආකාරයේ ප්‍රමාණාත්මක අයිතම ඇතුළත් එක් එක් පංතිය මූල්‍ය ප්‍රකාශයේ වෙන වෙනම දක්වා ඇති අතර අසමාන ආකාරයේ කාර්යය අයිතම ද ප්‍රමාණාත්මක නම් වෙන වෙනම දක්වා ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර ඇති අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කර ඇත්තේ හඳුනාගත් ප්‍රමාණ හිලව් කිරීමට නෛතිකව බලාත්මක කළ හැකි හිමිකමක් ඇත්නම් සහ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ එක්වර වත්කම් නිරවුල්කොට, බැරකම් පියවීමට අපේක්ෂා කරන්නේනම් පමණි. කවර හෝ ගිණුම්කරණ ප්‍රමිතියක් මඟින් නියම කර ඇත්නම් හෝ අවසර දී ඇත්නම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ නිශ්චිතව අනාවරණය කර ඇත්නම් මිස ආදායම් ප්‍රකාශවල ආදායම් හෝ වියදම් හිලව් කර නොමැත.

2.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති 7 – LKAS 7 – "මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය" ට වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත. මුදල් හා මුදල් සමාන වත්කම්වලට අතැති මුදල්, නියමිත මුදල් ප්‍රමාණයට සැනෙකින් පරිවර්තනය කළ හැකි එහෙත් වටිනාකම වෙනස්වීමේ අවම අවදානමක් ඇති කෙටි කාලීන අධි ද්‍රවශීලි ආයෝජන ඇතුළත් වෙයි.

මුදල් හා මුදල් සමාන වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශවල 16, 18 සහ 19 වන සටහන්වල දක්වා ඇත.

මුදල් හා මුදල් සමාන වත්කම් තුළ අත ඇති මුදල්, බැංකු තැන්පතු ශේෂ, ඒක්ෂණ මුදල් හා කෙටි දැන්වීම් මත ශුද්ධ අවාසිදායක ශේෂ අඩංගු වෙයි.

2.7 සැලකිය යුතු ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීම අවශ්‍ය වන අතර, ඒවායින් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සහ පාදක වූ අනාවරණයන් මෙන්ම අසම්භාව්‍ය වගකීම් අනාවරණය කෙරෙහි බලපෑමක් ඇත. අනාගත කාලසීමාවන් තුළ බලපාන වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයට වැදගත් ගැලපීමක් අවශ්‍යවන ප්‍රතිඵලවලින් මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාව ඇතිවිය හැකිය. බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලිය තුළ, ඉදිරි මූල්‍ය වසර තුළ වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයට වැදගත් ගැලපීමක් ඇතිකරන වැදගත් අවදානමක් සහිත වාර්තාකරණ දිනයට අනාගත සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතා පිළිබඳ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍රයන් සම්බන්ධයෙන් පහත සඳහන් තීරණ සහ උපකල්පන කළමනාකරණය විසින් සිදුකර ඇත. අනාගත සංවර්ධනය පිළිබඳ පවත්නා වාතාවරණයන් සහ උපකල්පන බැංකුවේ පාලනයෙන් තොර වාතාවරණයන් හේතු කොට ගෙන වෙනස්විය හැකි අතර ඒවා සිදුවුවහොත් සහ සිදුවන අවස්ථාවල උපකල්පන තුළ පිළිබිඹු කෙරේ.

වැදගත් කළමනාකරණ තීරණ සහ/හෝ ඇස්තමේන්තු සහිත මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණ කෙරෙහි වඩා වැදගත් බලපෑම සහිත අයිතම අදාළ තීරණ/ ඇස්තමේන්තු සම්බන්ධයෙන් පහත සඳහන් ලැබේ.

2.7.1 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් සහිත බැංකුවක් ලෙසින් බැංකුවේ ස්ථාවරත්වය පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව එහි කළමනාකාරීත්වය විසින් අගැයීමට ලක් කර ඇති අතර පෙනෙන්නට තිබෙන ඉදිරි අනාගතය තුළ සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් බැංකුව සතු වන බවට කළමනාකාරීත්වය සෑහීමට පත්වී සිටිති. තවද, අඛණ්ඩ පැවැත්මක් සහිත බැංකුවක් ලෙසින් බැංකුවේ ස්ථාවරත්වය පිළිබඳව සැලකිය යුතු සැකයක් මතුවීමට තරම් ප්‍රමාණවත් අවිනිශ්චිතතා කිසිවක් පිළිබඳව කළමනාකාරීත්වය දැනුවත් වී නොමැත. එබැවින් අඛණ්ඩ පැවැත්ම යන පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම තවදුරටත් සිදු කෙරෙනු ඇත.

2.7.2 ණය හා අත්තිකාරම් මත හානිකරණ අලාභ

සියලුම මූල්‍ය වත්කම් වර්ගීකරණ තුළ SLFRS 9 සහ LKAS 39 යන ද්විත්වය යටතේ හානිකරණ අලාභ අගයකිරීම සඳහා විශේෂයෙන් හානිකරණ අලාභ තීරණය කිරීමේදී සහ ණය අලාභවල වැදගත් වැඩිවීමක් තක්සේරු කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ කාලය සහ ඇපවල වටිනාකම තක්සේරුව තුළ තීරණ අවශ්‍යය. විවිධ අත්තිකාරම් මට්ටම් තුළ ඇතිවිය හැකි සාධක, වෙනස්වීම් ගණනාවක් මගින් මෙම ඇස්තමේන්තු මෙහෙයවනු ලබයි.

බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ විවිධ යෙදවුම් සහ ඒවායේ අනෝන්‍ය රැඳියාවන්ගේ තේරීම සම්බන්ධයෙන් පාදක වූ උපකල්පන ගණනාවක් සහිත සංකීර්ණ ආදර්ශවල නිමැවුම් වෙති. තීරණ සහ ඇස්තමේන්තුවන අපේක්ෂිත ණය අලාභ ආදර්ශවල මූලිකාංගවලට පහත දෑ ඇතුළත්ය:

- ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් තිබේද යන්න තක්සේරු කිරීම සඳහා බැංකුවේ නිර්ණායකය සහ මූල්‍ය වත්කම් සඳහා එම අත්තිකාරම් ජීව කාල අපේක්ෂිත ණය අලාභ (LTECL) පදනම සහ ගුණාත්මක තක්සේරු කිරීමක් මත ඇගයිය යුතුය.
- සාමූහික පදනමක් මත ඒවායේ අපේක්ෂිත ණය අලාභ (ECL) තක්සේරු කරන අවස්ථාවේදී මූල්‍ය වත්කම් කාණ්ඩ කිරීම.
- විවිධ සූත්‍ර සහ යෙදවුම්වල තේරීම ඇතුළුව අපේක්ෂිත ණය අලාභ ආදර්ශ සංවර්ධනය.
- සාර්ව ආර්ථික ක්‍රියාදාම සහ විරැකියා මට්ටම් සහ ඇපවල වටිනාකම් වැනි ආර්ථික යෙදවුම් සහ PDs, EADs සහ LGDs අතර සම්බන්ධය තීරණය කිරීම.
- අපේක්ෂිත ණය අලාභ ආදර්ශවලට ආර්ථික යෙදවුම් ව්‍යුත්පන්න කිරීම සඳහා ඉදිරිය දකින සාර්ව ආර්ථික ක්‍රියාදාම සහ ඒවායේ විභවතා බර තැබීම් තේරීම.

2.7.3 බදුකරණය

බැංකුව ආදායම් බද්දට යටත් වන බැවින් බදු නීතිවල අදාළත්වය පිළිබඳ අර්ථනිරූපණය සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන අවස්ථාවේ දී වත්මන් විලම්බිත සහ වෙනත් බදු සඳහා වෙන් කළ යුතු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චය කිරීමට සිදුවෙයි.

පුළුල් පරාසයක විහිදුනු ව්‍යාපාරික සබඳතා සහ වත්මන් කොන්ත්‍රාත් ගිවිසුම්වල පවතින සංකීර්ණතාවය හා දිගුකාලීන ස්වභාවය යන කරුණු මත තථ්‍ය ප්‍රතිඵල හා සකසනු ලබන ඇස්තමේන්තුවල වෙනස්කම් මතු වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස 13 වන සහ 26 වන සටහන්වල සඳහන් මූල්‍ය ප්‍රකාශයන්හි මුලින් වාර්තා කර ඇති බදු ආදායම හා වියදම සහ විලම්බිත බදු ගැළපීම් කිරීමට සිදුවෙයි.

අදාළ බදු අලාභ පියවා ගනු ලැබිය හැකි බදු අයකළ හැකි ලාභ අනාගතයේ පැවතීමේ සම්භාවිතාවයේ ප්‍රමාණයට බදු අලාභ සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබෙයි. මනා ලෙස කාලය සැලසුම් කිරීම හා අනාගතයේ පැවතිය හැකි බදු අය කළ හැකි ලාභ මට්ටම සහ අනාගත බදු සැලසුම්කරණ උපාය මාර්ග මත පදනම්ව පිළිගනු ලැබිය හැකි විලම්බිත බදු වත්කම් ප්‍රමාණය නිශ්චය කිරීමට නිවැරදි විනිශ්චයක් අවශ්‍ය වෙයි.

2.7.4 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය සහ ඒවායේ වර්තමාන බැඳීම් ආයුගණක අගැයීම් උපයෝගී කර ගනිමින් නිශ්චය කරනු ලැබෙයි. ආයුගණක ඇගයීමේ දී වට්ටම් අනුපාතික, වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතිකය හා අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් ආදිය පිළිබඳ උපකල්පන ප්‍රයෝජනයට ගැනෙයි. මෙම සැලසුම්වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එකි ඇස්තමේන්තු කැපී පෙනෙන අවිනිශ්චිතතාවලට ලක්වෙයි. එකී සියලුම උපකල්පන එක් එක් වාර්තා කරන දිනයේ දී සමාලෝචනයට ලක් කෙරෙයි.

යෝග්‍ය වට්ටම් අනුපාතිකය තීරණය කිරීමේ දී, නිශ්චිත ප්‍රතිලාභ බැඳියා අපේක්ෂිත කාලපරිච්ඡේදයට අනුරූපී තක්සේරු කළ කල්පිරීමක් සහිත ශ්‍රී ලංකා රජයේ සුරැකුම් පත් පොළී අනුපාතික කළමනාකාරීත්වය විසින් සැලකිල්ලට ගනු ලබයි.

මරණ අනුපාතිකය ප්‍රසිද්ධියට පත් කර ඇති මර්ත්‍යතා වගු පදනම් කර ගනිමින් මර්ත්‍යතා අනුපාතිකය සකස් කර ඇත. ඉදිරි වැටුප් වර්ධක හා විශ්‍රාම වැටුප් වර්ධක, අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාතික සහ බැංකුවේ අපේක්ෂිත ඉදිරි වැටුප් වර්ධක අනුපාතික මත පදනම් වෙයි.

2.7.5 දේපළ හා උපකරණවල ඵලදායි ජීව කාලය

බැංකුව සිය වත්කම්වල අවශේෂ වටිනාකම, ඵලදායි ජීවකාලය සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සෑම වාර්තා කරන දිනකදී ම සමාලෝචනය කරනු ලබන අතර මෙම අගයන්, අනුපාතික, ක්‍රමවේද තක්සේරු කිරීමේ දී කළමනාකාරීත්වය විසින් විනිශ්චය කිරීම සිදු කරනු ලබන බැවින් ඒවා අවිනිශ්චිතතාවයන්ට යටත් වෙයි.

2.7.6 බැඳීම් සහ අවිනිශ්චිතතා

සියලු හඳුනාගත් බැරකම් නිශ්චය කිරීම සඳහා සෑම සුසංජානන අවදානමක්ම සැලකිල්ලට ගනු ලැබෙයි.

අවිනිශ්චිත අනාගත සිදුවීම් මඟින් පැවැත්ම සනාථ කෙරෙන ඉදිරියේදී ඇති විය හැකි බැඳීම් හෝ අසම්භාවී ආර්ථික ප්‍රතිලාභ පැවරීමක් ඇති හෝ විශ්වසනීය ආකාරයකින් මැනීමට නොහැකි වර්තමාන බැඳීම් අවිනිශ්චිත බැරකම් ලෙස හැඳින්වේ. අවිනිශ්චිත බැරකම් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනු ලැබ නොමැති නමුත් එවැනි බැරකම් උද්ගතවීම බොහෝ කලකට පසුව සිදු විය හැකි නම් මිස ඒවා පිළිබඳ අනාවරණය කරනු ලැබ තිබෙයි.

2.7.7 මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ වටිනාකම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් මූල්‍ය වත්කම්වල හා මූල්‍ය බැරකම්වල සාධාරණ වටිනාකම සක්‍රීය වෙළඳපොළ තුළින් ලබා ගත නොහැකි බැවින් ගණිතමය ආදර්ශ භාවිතා කිරීම ඇතුළු විවිධ තක්සේරු ක්‍රමවේදයන් එම වටිනාකම් නිශ්චය කිරීම සඳහා උපයෝගී කර ගැනෙයි. හැකි සෑම විටම මෙකී ආදර්ශයන්හි යෙදවුම් නිරීක්ෂණය කරනු ලැබිය හැකි වෙළඳපොළවල් තුළින් ලබා ගන්නා අතර එවැනි දත්ත ලබා ගත නොහැකි නම් සාධාරණ වටිනාකම් තීරණය කිරීමට විනිශ්චය කිරීම් යම් පමණකට යොදා ගනු ලබන අතර එමගින් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතා කිරීමෙන් ඇතිවිය හැකි බලපෑම අවම කර ගත හැකි වෙයි.

3. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ප්‍රමිති අර්ථකථනය

3.1 විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී බැංකුව විසින් අදාළ කරගනු ලබන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති බැංකුවේ මෙම මූල්‍ය ප්‍රකාශ මඟින් ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් දක්වා ඇත්තේනම් මිස නිත්‍ය වශයෙන් අදාළ කරගනු ලැබ තිබෙයි.

3.1.1 මූල්‍ය උපකරණ – මූලික හඳුනාගැනීම සහ ඇගයීම

3.1.1.1 හඳුනාගැනීම

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ හැර මූල්‍ය වත්කම් සහ වගකීම් මූලිකවම වෙළෙඳ දිනයට හඳුනා ගනී. එනම් බැංකුව එම උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙක් බවට පත්වන දිනයයි. විධිමත් ආකාරයේ වෙළඳාම, වෙළෙඳ පොල තුළ රෙගුලාසියකින් හෝ සම්මුතියකින් පොදුවේ ස්ථාපිත කාලරාමුවක් තුළ වත්කම් බෙදාහැරීමට අවශ්‍යවන මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ අලෙවි කිරීම මෙයට ඇතුළත්ය.

ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට අරමුදල් මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් හඳුනා ගනී. බැංකුව වෙත අරමුදල් මාරු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂ බැංකුව හඳුනා ගනී.

3.1.1.2 මූල්‍ය උපකරණ මූලිකව අගය කිරීම

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය උපකරණය කළමනාකරණය කිරීම සඳහාවන ගිවිසුම්ගත නියමයන් සහ ව්‍යාපාර ආදර්ශය මත රඳා පවතී. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයේදී වාර්තා කළ මූල්‍ය වත්කම් සහ වගකීම් හැර මූල්‍ය උපකරණ ගනුදෙනු පිරිවැය එකතුකර හෝ අඩුකරමින් මූලිකවම ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලබයි. වෙළෙඳ ලැබීම් ගනුදෙනු මිලට අගය කරනු ලබයි. මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයක සාධාරණ අගය ගනුදෙනු මිලෙන් වෙනස්වන අවස්ථාවක, බැංකුව පහත විස්තර කරන පරිදි දින 1 ලාභය හෝ අලාභය සඳහා ගණනය කරයි.

3.1.1.3 දින 1 හි ලාභය හෝ අලාභය

ආරම්භයේදී උපකරණයේ ගනුදෙනු මිල සාධාරණ අගයෙන් වෙනස්වන අවස්ථාව සහ සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනුවල නිරීක්ෂණය කළහැකි යෙදවුම් පමණක් භාවිතා කරන ඇගයීමේ ශිල්පයක් මත පදනම් වන අවස්ථාවක, බැංකුව ශුද්ධ වෙළෙඳ ආදායම තුළ ගනුදෙනු මිල සහ සාධාරණ අගය අතර වෙනස හඳුනා ගනී. යෙදවුම් කිහිපයක් නිරීක්ෂණය කළ නොහැකි ආදර්ශ මත සාධාරණ අගය පදනම් වන අවස්ථාවක, ගනුදෙනු මිල සහ සාධාරණ අගය අතර වෙනස වෙනස්වන අතර ආදායම් ප්‍රකාශනය තුළ පමණක් හඳුනා ගනී. යෙදවුම් නිරීක්ෂණය කළ හැකි හෝ උපකරණය හඳුනා නොගන්නා අවස්ථාවක එය අලාභයකි.

3.1.1.4 මූල්‍ය වත්කම් සහ වගකීම් අගය කිරීමේ වර්ගීකරණ

2018 ජනවාරි 1 සිට, බැංකුව පහත පරිදි අගයකරමින් වත්කම් සහ වත්කම්වල ගිවිසුම්ගත නියමයන් කළමනාකරණය සඳහා ව්‍යාපාර ආදර්ශය මත පදනම් වී එහි සියලුම මූල්‍ය වත්කම් වර්ගීකරණය කරයි:

- සටහන 3.1.1.4.1 හි විස්තර කරන පරිදි ක්‍රමක්ෂය පිරිවැයට
- සටහන 3.1.1.1.4.4 සහ 3.1.1.1.4.5 හි විස්තර කරන පරිදි අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI)
- 3.1.1.1.4.7 හි විස්තර කරන පරිදි ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට (FVPL)

බැංකුව ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට එහි ව්‍යුත්පන්න සහ වෙළෙඳ කළඹ වර්ගීකරණය කර අගය කරනු ලබයි. අගය කිරීමේ හෝ හඳුනාගැනීමේ නොගැලපීම් ඉවත් කරන්නේ නම් හෝ සැලකියයුතු ලෙස අඩු කරන්නේනම් බැංකුවට ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය උපකරණ නම්කරනු ලැබිය හැකිය.

2018 ජනවාරි 1 දිනට පෙර, බැංකුව එහි මූල්‍ය වත්කම් ණය සහ අත්තිකාරම් (ක්‍රමක්ෂය පිරිවැයට), ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට, අලෙවිය සඳහා තබා ඇති හෝ කල්පිරෙන තෙක් රඳා සිටින (ක්‍රමක්ෂය පිරිවැයට) ලෙස වර්ගීකරණය කරන ලදී.

ණය බැඳීම් සහ මූල්‍ය ඇප නොවන මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැයට හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනු ලබන්නේ ඒවා අලෙවිය සඳහා තබා ඇත්නම් සහ ව්‍යුත්පන්න උපකරණ හෝ සාධාරණ අගයට නම්කිරීම් යොදාගන්නේනම් පමණි.

3.1.1.4.1 බැංකුවලින් ලැබියයුතු, ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්, ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්

2018 ජනවාරි 1 දිනට පෙර, බැංකුවලින් ලැබියයුතු සහ ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්වලට පහත දැහැර සක්‍රිය වෙළෙඳපොලක් තුළ ලැයිස්තුගත නොකළ ස්ථාවර හෝ තීරණය කළහැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් ඇතුළත්ය:

- බැංකුව වහාම හෝ ආසන්න කාලය තුළ විකිණීමට අපේක්ෂා කරන,
- මූලික හඳුනාගැනීම මත බැංකුව ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට හෝ අලෙවිය සඳහා තබා ඇති ලෙස නම්කරන,
- බැංකුවට අලෙවිය සඳහා තබා ඇති ලෙස නම්කළ ණයවල පිරිහීම නිසා නොවන එහි සියලුම මූලික ආයෝජන සැලකියයුතු ලෙස ආවරණය කළ නොහැකි,

2018 ජනවාරි 1 සිට, පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන්නේ නම් පමණක් බැංකුව, බැංකුවලින් ලැබියයුතු සහ ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් සහ අනෙකුත් මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමට මූල්‍ය වත්කම් තබාගැනීමේ පරමාර්ථය ඇති ව්‍යාපාර ආදර්ශයක් තුළ මූල්‍ය වත්කම් තබාගැනීම
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් තුළින් හිඟව ඇති මූලික ප්‍රමාණය මත මුල්මුදල සහ පොළිය ගෙවීම් පමණක්වන මුදල් ප්‍රවාහ සඳහා විශේෂිත දින

මෙම කොන්දේසිවල විස්තර පහත විස්තර කෙරේ.

3.1.1.4.1 (අ) ව්‍යාපාර ආදර්ශය අගයකිරීම

බැංකුව එහි ව්‍යාපාර පරමාර්ථ අත්කර ගැනීමට මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය වඩාත් හොඳින් පිළිබිඹුවන මට්ටමක දී එහි ව්‍යාපාර ආදර්ශය තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආදර්ශය උපකරණයෙන් උපකරණයට යන පදනමක් මත අගය කරනු නොලැබුවත් එකතුකළ කළඹේ ඉහළ මට්ටමකදී පහත සඳහන් නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ:

- ව්‍යාපාර ආදර්ශය සහ එම ව්‍යාපාරය තුළ දරන මූල්‍ය වත්කම්වල කාර්යසාධනය තක්සේරු කර ආයතනයේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට වාර්තා කරන ආකාරය,
- ව්‍යාපාර ආදර්ශයේ (සහ එම ව්‍යාපාරය තුළ දරන මූල්‍ය වත්කම්) කාර්යසාධනයට බලපාන අවදානම් සහ විශේෂයෙන්, එම අවදානම් කළමනාකරණය කරන ආකාරය,
- ව්‍යාපාරයේ කළමනාකරුවන්ට ගෙවීම් සිදුකරන ආකාරය (නිදසුනක් ලෙස ගෙවීම් කළමනාකරණය කරන වත්කම්වල සාධාරණ අගය මත හෝ එකතුකරන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වේද යන්න)
- විකුණුම්වල අපේක්ෂිත වාරගණන, වටිනාකම සහ කාලය බැංකුවේ තක්සේරු කිරීම තුළ වැදගත් අංග වෙති.

"දුර්වලම අවස්ථා" හෝ "පීඩන අවස්ථා" ක්‍රියාදාම සැලකිල්ලට නොගනිමින් සාධාරණව අපේක්ෂිත ක්‍රියාදාම මත ව්‍යාපාර ආදර්ශ අගය කිරීම පදනම් වේ. මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහ බැංකුවේ මූලික අපේක්ෂාවන්ගෙන් වෙනස් ආකාරයකින් උපලබ්ධිවේනම්, බැංකුව එම ව්‍යාපාර ආදර්ශය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් කරනු නොලැබුවත් අළුතින් උත්පාදිත හෝ අළුතින් මිලදීගත් මූල්‍ය වත්කම් අඛණ්ඩව ඇගයීමේදී එවැනි තොරතුරු ඇතුළත් කරනු ලබයි.

3.1.1.4.1 (ආ) SPPI පරීක්ෂණය

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවරක් ලෙස, SPPI පරීක්ෂණය සපුරාලන්නේද යන්න හඳුනා ගැනීමට මූල්‍ය උපකරණවල ගිවිසුම්ගත නියමයන් බැංකුව ඇගයීමට ලක් කරයි.

මෙම පරීක්ෂණයේ අරමුණ සඳහා මූලධර්මය මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථ දක්වන අතර මූල්‍ය වත්කමේ කාලය තුළ වෙනස් විය හැකිය. (නිදසුනක් ලෙස වාරිකය/වට්ටමේ මුල් මුදල හෝ ක්‍රමක්ෂය ආපසු ගෙවීම)

ණයදීමේ වැඩපිළිවෙලක් තුළ පොළියේ වඩාත් වැදගත් අංග වන්නේ නියමානුකූලව මුදලේ කාලීන අගයේ ප්‍රතිෂ්ඨාව සහ ණය අවදානමයි. SPPI තක්සේරු කිරීම සිදු කිරීම සඳහා, බැංකුව විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම් නම්කරන ලද ව්‍යවහාර මුදල සහ පොළි අනුපාතය නියම කරන කාලසීමාව වැනි අදාළ සාධක සලකා බලයි.

මෙයට වෙනස්ව, මූලික ණයදීමේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් තුළ අවදානම්වලට නිරාවරණය හෝ වෙනස්වීම් අවම කිරීමට හඳුන්වාදෙන ගිවිසුම්ගත නියමයන් මගින් හිඟව පවත්නා මුදල මත මුල් මුදල හෝ පොළිය ගෙවීම පමණක් වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඇති නොකරයි. එවැනි අවස්ථාවලදී, මූල්‍ය වත්කම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට අගයකිරීම අවශ්‍යය.

3.1.1.4.2 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වාර්තාකළ ව්‍යුත්පන්න

ව්‍යුත්පන්නයක් යනු පහත සඳහන් ලක්ෂණ තුන සහිත මූල්‍ය උපකරණයක් හෝ වෙනත් ගිවිසුමකි:

- නියමිත පොළි අනුපාතය, මූල්‍ය උපකරණයක මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විනිමය හුවමාරු අනුපාතය,
- මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගතකරණය හෝ ණය දර්ශකය හෝ අනෙකුත් විචල්‍යතාවල වෙනසට ප්‍රතිචාරාත්මකව එහි වටිනාකම වෙනස් වේ. එසේවුවත්, මූල්‍ය නොවන විචල්‍යතා අවස්ථාවකදී, ගිවිසුමක පාර්ශ්වකරුවෙකුට විශේෂ නොවේ (එනම් "පාදක වූ").
- එයට මූලික ශුද්ධ ආයෝජනයක් හෝ වෙළෙඳපොල සාධකවල වෙනස්වීමට සමාන ප්‍රතිචාරයක් ඇතැයි අපේක්ෂිත අනෙකුත් වර්ගයේ ගිවිසුම් සඳහා අවශ්‍ය වියහැකි දෑට වඩා කුඩා මූලික ශුද්ධ ආයෝජනයක් අවශ්‍ය නොවීම.
- එය අනාගත දිනයක දී නිරවුල් කිරීම.

මේ වනවිට බැංකුව කිසිදු පාර්ශ්වයක් සමඟ ව්‍යුත්පන්නයන්ට ඇතුළත් වී නොමැත.

3.1.1.4.2 (අ) ඇතුළත්කළ ව්‍යුත්පන්න

සංයුක්ත උපකරණයක මුදල් ප්‍රවාහයන් හි බලපෑම තනි ව්‍යුත්පන්නයකට සමාන ආකාරයකින් වෙනස් වේ. ඇතුළත්කළ ව්‍යුත්පන්නයක් නියමිත පොළි අනුපාතය, මූල්‍ය උපකරණයක මිල, වෙළෙඳ ද්‍රව්‍ය මිල, විනිමය හුවමාරු අනුපාතය, මිල හෝ අනුපාත දර්ශක, ණය ශ්‍රේණිගතකරණය හෝ ණය දර්ශකය හෝ අනෙකුත් විචල්‍යතාවකට අනුව වෙනස්කළ යුතු ගිවිසුමක් මගින් වෙනත් ආකාරයකින් අවශ්‍ය වියහැකි සමහර හෝ සියලුම මුදල් ප්‍රවාහ ඇති කරයි. එසේවුවත්, මූල්‍ය නොවන විචල්‍යතා අවස්ථාවකදී, ගිවිසුමක පාර්ශ්වකරුවෙකුට විශේෂ නොවන මූල්‍ය උපකරණයකට අමුණන ලද නමුත් එම උපකරණයෙන් ස්වාධීනව ගිවිසුම්ගතව හුවමාරු කළහැකි හෝ එම උපකරණයෙන් වෙනස් ඇපයක් ඇති ව්‍යුත්පන්නයක් ඇතුළත්කළ ව්‍යුත්පන්නයක් නොවූවත් වෙනම මූල්‍ය උපකරණයකි.

LKAS 39 යටතේ, මූල්‍ය වත්කම්, වගකීම් සහ මූල්‍ය නොවන සත්කාර ගිවිසුම්වල ඇතුළත්කළ ව්‍යුත්පන්න වෙනම ව්‍යුත්පන්න ලෙස සලකන ලද අතර ව්‍යුත්පන්නයක නිර්වචනය සපුරාලන්නේනම්, ඒවායේ ආර්ථික ලක්ෂණ අවදානම් සත්කාර ගිවිසුමට සමීපව සම්බන්ධ නොවේනම් සහ සත්කාර ගිවිසුම අලෙවිය සඳහා තබා නොමැතිනම් හෝ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කර නොමැතිනම් සාධාරණ අගයට වාර්තා කෙරේ (ඉහත නිර්වචනය පරිදි). සත්කාරයෙන් වෙන්කළ ඇතුළත්කළ ව්‍යුත්පන්නයක් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සාධාරණ අගයේ වෙනස්වීම් සහිත වෙළෙඳ කළඹ තුළ සාධාරණ අගයට ගෙන යන ලදී.

2018 ජනවාරි 1 සිට, SLFRS 9 හඳුන්වාදීමත් සමඟ, බැංකුව මූල්‍ය වගකීම් සහ මූල්‍ය නොවන සත්කාර ගිවිසුම්වල ඇතුළත් කළ ව්‍යුත්පන්න සඳහා මෙලෙස ගණනය කරයි. ඉහත දක්වා ඇති පරිදි ව්‍යාපාර ආදර්ශය සහ SLFRS 9 තක්සේරු කිරීම් මත පදනම් වී මූල්‍ය වත්කම් වර්ගීකරණය කෙරේ. දැනට බැංකුව සතුව කිසිදු ඇතුළත්කළ ව්‍යුත්පන්න නොමැත.

3.1.1.4.3 අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

බැංකුව අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය කරනු ලබන්නේ එවා මිලදී ගෙන ඇති අවස්ථාවේදී හෝ වෙළෙඳ කටයුතු තුළින් කෙටිකාලීන ලාභ ඇති කිරීම සඳහා මූලිකවම නිකුත්කර ඇති හෝ කෙටි කාලීන ලාභ ගැනීමේ නූතන රටාවක සාක්ෂියක් තිබීම සඳහා එක්ව කළමනාකරණය කරන මූල්‍ය උපකරණ කළඹක කොටසක් සාදන අවස්ථාවේදීය. අලෙවිය සඳහා තබා ඇති වත්කම් සහ වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තාකර අගය කරනු ලබයි. සාධාරණ අගය තුළ වෙනස්වීම් ශුද්ධ වෙළෙඳ ආදායම තුළ හඳුනා ගනී. පොළී සහ ලාභාංශ ආදායම හෝ වියදම ගිවිසුමේ අයිතමවලට අනුව හෝ ගෙවීම් අයිතිය ස්ථාවර වී ඇති අවස්ථාවේදී ශුද්ධ වෙළෙඳ ආදායම තුළ වාර්තා කෙරේ.

මෙම වර්ගීකරණය තුළට ආසන්න කාලයේදී විකිණීමේ හෝ නැවත මිලදීගැනීමේ අරමුණ සඳහා මූලිකවම අත්කර ගෙන ඇති ණය සුරුකුම්පත්, ස්කන්ධ, කෙටි ස්ථාපිත සහ ගනුදෙනුකාර ණය ඇතුළත් වේ.

3.1.1.4.4 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ණය උපකරණ (2018 ජනවාරි 1 සිට අදාළ ප්‍රතිපත්තිය)

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලන අවස්ථාවේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ පිලිබඳ SLFRS 9 යටතේ නව වර්ගීකරණය බැංකුව යොදා ගනී:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අයකර ගැනීම සහ මූල්‍ය
- වත්කම් විකිණීම මගින් අත්කරගන්නා පරමාර්ථය වන ව්‍යාපාර ආදර්ශයක් තුළ උපකරණය තබාගැනීම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත නියමයන් SPPI පරීක්ෂණය සපුරාලීම.

මෙම උපකරණ LKAS 39 යටතේ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන ලෙස පෙර වර්ගීකරණය කර ඇති වත්කම්වලින් බොහෝ දුරට සමන්විත වේ.

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සාධාරණ අගය තුළ වෙනස්වීම් නිසා ඇතිවන ලාභ හෝ අලාභ සහිත සාධාරණ අගයට පසුකාලීනව මනිනු ලැබේ. පොළී ආදායම සහ විනිමය හුවමාරු ලාභ සහ අලාභ ක්‍රමක්ෂය පිරිවැයට මනිනලද මූල්‍ය වත්කම් මෙන් සමාන ආකාරයෙන් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී. එකම සුරුකුම තුළ එක් ආයෝජනයකට වැඩි ආයෝජන බැංකුව විසින් දරන අවස්ථාවක, ඒවා පෙර පිවිසි පෙර පිටවුම් පදනම මත බැහැරකළයුතු යයි අපේක්ෂා කෙරේ. හඳුනා නොගැනීම මත, අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ අනෙකුත් විස්තරාත්මක ආදායමේ සිට ආදායම් ප්‍රකාශනය දක්වා නැවත වර්ගීකරණය කෙරේ.

3.1.1.4.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ උපකරණ (2018 ජනවාරි 1 සිට අදාළ ප්‍රතිපත්තිය)

මූලික හඳුනාගැනීම මත, බැංකුව එහි සමහර ස්කන්ධ ආයෝජන වෙනස්කළ නොහැකි ලෙස LKAS 32 – "මූල්‍ය උපකරණ" ඉදිරිපත් කිරීම: යටතේ ස්කන්ධය පිළිබඳ නිර්වචනය සපුරාලන අවස්ථාවේදී අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ ලෙස වර්ගීකරණය කිරීමට අවස්ථානුකූලව තෝරා ගන්නා අතර අලෙවිය සඳහා තබා නොගනී. එවැනි වර්ගීකරණය උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය කෙරේ.

මෙම ස්කන්ධ උපකරණ මත ලාභ සහ අලාභ ලාභයට ප්‍රතිවක්‍රියකරණය නොකරයි. ලාභාංශ ආදායම් ප්‍රකාශනය තුළ ශුද්ධ වෙළෙඳ ලාභ/(අලාභ) ලෙස හඳුනා ගන්නේ උපකරණයේ පිරිවැය කොටස අයකරගැනීමක් ලෙස එකී ලද මුදලින් බැංකුව ප්‍රතිලාභ ලබන අවස්ථාව හැර ගෙවීමේ අයිතිය ස්ථාපිත වන අවස්ථාවේදීය. මෙම කුමණ අවස්ථාවේදී වුවත් එවැනි ලාභ අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ වාර්තා කෙරේ. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට (FVOCI) ස්කන්ධ උපකරණ හානිකරණ තක්සේරු කිරීමට යටත් නොවේ.

3.1.1.4.6 නිකුත්කළ ණය සහ අනෙකුත් ණයටගත් අරමුදල්

මූලික අගයකිරීමෙන් පසු, නිකුත්කළ ණය සහ අනෙකුත් ණයටගත් අරමුදල් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීනව මනිනු ලබයි. ක්‍රමක්ෂය පිරිවැය නිකුත්කළ අරමුදල් සහ එලදායී පොළී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය මත යම් වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමින් ගණනය කරනු ලබයි. වගකීමක් සහ ස්කන්ධ සංරචකයක් යන දෙකම අඩංගු සංයෝගී මූල්‍ය උපකරණයක් නිකුත්කරන දිනයට වෙන් කෙරේ.

3.1.1.4.7 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

මෙම වර්ගය තුළ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් යනු අලෙවිය සඳහා තබා නොමැති සහ මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් නම්කර ඇති හෝ SLFRS 9 යටතේ සාධාරණ අගයේදී මැනීමට නීතියෙන්ම අවශ්‍යවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්ය. පහත සඳහන් නිර්ණායකයක් සපුරාලන අවස්ථාවේදී මූලික හඳුනා ගැනීම මත කළමනාකරණය විසින් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පමණක් උපකරණයක් නම්කරනු ලබයි. එවැනි නම් කිරීම උපකරණයෙන් උපකරණය යන පදනම මත තීරණය කෙරේ:

- වත්කම් හෝ වගකීම් අගය කිරීමෙන් හෝ වෙනස් පදනමක් මත ඒවා මත ලාභ හෝ අලාභ හඳුනාගැනීමෙන් වෙනත් ආකාරයකින් ඇතිවිය හැකි නොගැලපෙන සැලකීම නම්කිරීම මගින් ඉවත් කිරීම හෝ සැලකියයුතු ලෙස අඩු කිරීම, හෝ

- වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි 1 දක්වා වත්කම්) මූල්‍ය වගකීම් (හෝ LKAS 39 යටතේ මූල්‍ය වත්කම් හෝ දෙකම) සමූහයක කොටසක් වන අතර ලේඛණගත අවදානම් කළමනාකරණයක් හෝ ආයෝජන ක්‍රමෝපායකට අනුකූලව සාධාරණ අගය පදනමක් මත කළමනාකරණය කර ඒවායේ කාර්යසාධනය අගයනු ලැබීම, හෝ

- ගිවිසුම මගින් වෙනත් ආකාරයකින් අවශ්‍ය කරන මුදල් ප්‍රවාහ සැලකියයුතු ලෙස වෙනස් නොකරන්නේනම් හෝ සමාන උපකරණයක් ඇතුළත්කළ ව්‍යුත්පන්නය (ව්‍යුත්පන්න) වෙන්කිරීම තහනම්කර ඇති බවට පළමුව සලකන අවස්ථාව තරමක් පැහැදිලිනම් හෝ විශ්ලේෂණ නොමැතිනම් මිස ඇතුළත්කළ ව්‍යුත්පන්න එකක් හෝ කිහිපයක් අඩංගු වගකීම් (සහ LKAS 39 යටතේ 2018 ජනවාරි 1 දක්වා වත්කම්).

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ වෙනස්වීම් බැංකුවට අයත් ණය අවදානම තුළ වෙනස්වීම් නිසා ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගයට නම්කළ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හැර ලාභය සහ අලාභය තුළ වාර්තා කෙරේ. සාධාරණ අගය තුළ එවැනි වෙනස්වීම් අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් ස්වකීය ණය සංචිතය තුළ වාර්තා කරන අතර ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවක්‍රියකරණය නොකරයි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම්කළ උපකරණ මත උපයන හෝ දරනු ලබන පොළිය යම් වට්ටම්/වාරික සහ උපකරණයේ කොටස සැලකිල්ලට ගනිමින් එලදායී පොළී අනුපාතය (EIR) භාවිතයෙන් පිළිවෙලින් පොළී ආදායම හෝ පොළී වියදම තුළ උපචය කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට අනිවාර්යයෙන්ම මැනිම අවශ්‍යවන වත්කම්

මත උපයන ලද පොළිය ගිවිසුම්ගත පොළී අනුපාතය භාවිතයෙන් වාර්තා කෙරේ. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනිනලද ස්කන්ධ උපකරණවලින් ලාභාංශ ආදායම ගෙවීමේ අයිතිය ස්ථාවර වන අවස්ථාවේදී ශුද්ධ වෙළෙඳ ලාභය/(අලාභය) ලෙස ආදායම් ප්‍රකාශනය තුළ වාර්තා කෙරේ.

3.1.1.4.8 මූල්‍යමය ඇප, ණයවර ලිපි සහ නොලියූ ණය බැඳීම්

බැංකුව මූල්‍යමය ඇප, ණයවර ලිපි සහ ණය බැඳීම් නිකුත් කරයි.

මූල්‍යමය ඇප වාරිකය ලැබීමේදී සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන (විධිවිධාන තුළ) තුළ මුලිකවම හඳුනා ගනී. මූලික හඳුනාගැනීමෙන් පසු, එක් එක් ඇපය යටතේ බැංකුවේ වගකීම ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ මූලිකව හඳුනාගත් ප්‍රමාණය සහ, LKAS 39 යටතේ ඇපයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන යම් මූල්‍ය බැඳීමක් නිරවුල් කිරීමට අවශ්‍යවන වියදම පිළිබඳ හොඳම ඇස්තමේන්තුව හෝ SLFRS 9 යටතේ 32 සටහනේ දක්වා ඇති අපේක්ෂිත ණය අලාභ වෙන්කිරීම යන දෙකෙන් වඩා ඉහළ අගයට මනිනු ලබයි. ලද වාරිකය ඇපයේ ජීවකාලය පුරා සරල මාර්ගික පදනමක් මත ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම තුළ ආදායම ප්‍රකාශනයෙහි හඳුනා ගනී.

නොලියූ ණය බැඳීම් සහ ණයවර ලිපි යනු බැඳීමේ කාලය තුළ ගනුදෙනුකරුට නියමකල නියමයන් සහිත ණයක් ලබාදීමට බැංකුවට අවශ්‍යවන බැඳීම්ය. LKAS 39 යටතේ මූල්‍ය ඇප ගිවිසුම්වලට සමානව,එය හාරවූර ගිවිසුමක් වූයේනම් වෙන්කිරීමක් සිදුකරන ලද නමුත් 2018 ජනවාරි 1 සිට, මෙවැනි ගිවිසුම් අපේක්ෂිත ණය අලාභ අවශ්‍යතාවල විෂයපථයට (ECL) අයත් වේ.

ලබාදීමට එකඟ වී ඇති ණය වෙළෙඳපොල කොන්දේසි මත වන අවස්ථාවක, මූල්‍යමය ඇප, ණයවර ලිපි සහ නොලියූ ණය බැඳීම්වල නාමික ගිවිසුම්ගත වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා නොකෙරේ. මෙවැනි උපකරණවල නාමික වටිනාකම් සමඟ එයට අනුරූප අපේක්ෂිත ණය අලාභ සටහන 38 හි අනාවරණය කෙරේ.

3.1.1.4.9 කල්පිරීම තෙක් රඳවාගන්නා මූල්‍ය වත්කම් (2018 ජනවාරි 1ට පෙර අදාළ ප්‍රතිපත්තිය)

කල්පිරීම තෙක් රඳවාගන්නා මූල්‍ය වත්කම් යනු බැංකුවට කල්පිරීම තෙක් රඳවාගැනීමට අපේක්ෂාව සහ හැකියාව සහිත ස්ථිර හෝ තීරණය කළහැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික හඳුනාගැනීමෙන් පසු, කල්පිරීම තෙක් රඳවාගන්නා මූල්‍ය වත්කම් හානිකරණය අඩුකළ ඵලදායී පොළී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට පසුකාලීනව මනිනු ලබයි. ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ "පොළී ආදායම" තුළ ඇතුළත් කෙරේ. එවැනි වත්කම් හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී.

3.1.1.4.10 අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් (2018 ජනවාරි 1 ට පෙර අදාළ ප්‍රතිපත්තිය)

අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්වලට ස්කන්ධය සහ ණය සුරුකුම්පත් ඇතුළත්ය. "අලෙවිය සඳහා තබා ඇති" ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ උපකරණ යනු LKAS 39 හි දක්වා ඇති වර්ගීකරණ මූලධර්ම යටතේ "අලෙවිය සඳහා තබා ඇති ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නම් නොකළ" ලෙස වර්ගීකරණය නොකළ උපකරණ වේ. මෙම වර්ගීකරණය තුළ ණය සුරුකුම්පත් අනිශ්චිත කාලසීමාවක් රඳවාගැනීමට අපේක්ෂා කරන අතර, ද්‍රවශීලතා අවශ්‍යතාවට ප්‍රතිචාරාත්මකව හෝ වෙළෙඳපොල කොන්දේසිවල වෙනස්වීම්වලට ප්‍රතිචාරාත්මකව අලෙවි කරනු ලැබිය හැකිය.

මූලික හඳුනාගැනීමෙන් පසු, අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගයට පසුකාලීනව මනිනු ලබයි. උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ "අලෙවිය සඳහා තබා ඇති සංචිත" තුළ "අනෙකුත් විස්තරාත්මක ආදායම/වියදම" තුළින් ස්කන්ධය තුළ සෘජුවම හඳුනා ගනී. වත්කම බැහැර කරන අවස්ථාවේදී, ස්කන්ධය තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්ඡිත ලාභ හෝ අලාභ මූල්‍ය වත්කම් මත ලාභ යටතේ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනී. බැංකුව සමාන සුරුකුම්පත්වල එක් ආයෝජනයට වැඩිපුර දරන අවස්ථාවක, පෙර පිවිසි පෙර පිටවුම් පදනමක් මත බැහැර කරනු ඇති බවට ඒවා සලකනු ලැබේ. "අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්" දරමින් උපයන පොළිය ඵලදායී පොළී අනුපාතය භාවිතයෙන් "පොළී ආදායම" ලෙස වාර්තා කෙරේ.

"අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්" දරමින් උපයන ලාභාංශ ගෙවීම ලැබීම සඳහා අයිතිය ස්ථාපිත වන අවස්ථාවේදී "මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ" ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනී. එවැනි ආයෝජන හානිකරණයෙන් ඇතිවන අලාභ "ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම්" යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගන්නා අතර, "අලෙවිය සඳහා තබා ඇති සංචිත" තුළින් ඉවත් කරනු ලබයි.

"අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්" පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 22 හි දැක්වේ.

3.1.1.5 මූල්‍ය වත්කම් සහ වගකීම් නැවත වර්ගීකරණය

2018 ජනවාරි 1 සිට, බැංකුව ව්‍යාපාරික මාර්ගයක් අත්කරගැනීම, පැහැරකිරීම හෝ අවසන් කිරීම වැනි විශේෂ අවස්ථාවලදී හැර බැංකුව එහි මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය නොකරයි. මූල්‍ය වගකීම් කිසිදු අවස්ථාවක නැවත වර්ගීකරණය නොකරයි. බැංකුව 2017 සහ 2018 දී එහි මූල්‍ය වත්කම් හෝ වගකීම් නැවත වර්ගීකරණය කර නොමැත.

3.1.1.6 මූල්‍ය වත්කම් හෝ වගකීම් හඳුනා නොගැනීම

3.1.1.6.1 නියමයන් සහ කොන්දේසිවල පසුකාලීන වෙනස්වීම හේතු කොට ගෙන නැවත හඳුනා නොගැනීම

හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට හඳුනා නොගත් ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගත් වෙනස සමඟ අළුත් ණය මුදලක් බවට එය පත්වන ප්‍රමාණයට නියමයන් සහ කොන්දේසි නැවත සාකච්ඡා කර ඇති අවස්ථාවකදී ගනුදෙනුකරුවෙක් වෙත ණයක් වැනි මූල්‍ය වත්කමක් බැංකුව හඳුනා නොගනී. අළුතින් හඳුනාගත් ණය POCI ලෙස සලකනු ලබන්නෙම් මිස අපේක්ෂිත ණය අලාභ මැනීමේ අරමුණ සඳහා අදියර 1 ලෙස වර්ගීකරණය කෙරේ.

ගනුදෙනුකරුවෙක් වෙත ණයක් හඳුනා නොගන්නේද යන්න ඇගයීමේදී අනිකුත් කරුණු අතර බැංකුව පහත සඳහන් සාධක සලකා බලයි:

- ණය මුදලේ ව්‍යවහාර මුදල් වර්ගයේ වෙනස
- ස්කන්ධ ලක්ෂණයක් හඳුන්වාදීම
- ඇපයේ වෙනස
- වෙනස්කිරීම උපකරණය තවදුරටත් SPPI නිර්ණායකය සපුරාලන්නේ නොමැති බව

සැලකියයුතු ලෙස වෙනස්වන මුදල් ප්‍රවාහය තුළ වෙනස්කිරීම ඇති නොවේනම්, හඳුනා නොගැනීම තුළ වෙනස්කිරීම ඇති නොවේ. මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් කළ මුදල් ප්‍රවාහ තුළ වෙනස මත පදනම් වී, හානිකරණ අලාභයක් දැනට වාර්තා කර නොමැති ප්‍රමාණයට වෙනස්කිරීමේ ලාභයක් හෝ අලාභයක් බැංකුව වාර්තා කරයි.

3.1.1.6.2 විශේෂිත වෙනස්කිරීමකදී නොවෙන අනෙකුත් හඳුනා නොගැනීම්

3.1.1.6.2 (අ) මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය කල්පිරී ඇති අවස්ථාවක මූල්‍ය වත්කමක් (හෝ අදාල තැන්වලදී, මූල්‍ය වත්කමක කොටසක්, හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා ගනී. එමෙන්ම මූල්‍ය වත්කම මාරුකර ඇත්නම් සහ මාරුකිරීම හඳුනා නොගැනීම සඳහා සුදුසුකම් ලබයිනම් බැංකුව මූල්‍ය වත්කමක් හඳුනා නොගනී.

බැංකුව පහත අවස්ථාවලදී මූල්‍ය වත්කම මාරු කර ඇත-

- මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලබාගැනීමේ එහි ගිවිසුම්ගත අයිතිය බැංකුව මාරු කර ඇති අවස්ථාව, හෝ
- මුදල් ප්‍රවාහ අයිතිය රඳවා ගනු ලැබුවත්, "පසුකර යැවීමේ" වැඩපිළිවෙලක් යටතේ යම් තෙවැනි පාර්ශ්වයකට සැලකිය යුතු ප්‍රමාදයක් නොමැතිව සම්පූර්ණයෙන් ලද මුදල් ප්‍රවාහ ගෙවීමට බැඳීමක් හාරගෙන ඇති අවස්ථාව

පසුකර යැවීමේ වැඩපිළිවෙල යනු මූල්‍ය වත්කමක ("මුල් වත්කම") මුදල් ප්‍රවාහ ලබාගැනීමේ ගිවිසුම්ගත අයිතිය බැංකුව රඳවා ගනු ලැබුවත් පහත සඳහන් කොන්දේසි තුන සපුරාලන අවස්ථාවේදී ආයතන එකක් හෝ කිහිපයක් ("ආනුෂංගික ප්‍රදානලාභියා") වෙත එවැනි මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් බැංකුව හාරගෙන ඇති ගනුදෙනු වේ:

- ණයට දෙන ලද මුදල සහ වෙළෙඳපොල අනුපාතවලට උපචිත පොළිය සම්පූර්ණයෙන් අයකරගැනීමට අයිතිය සහිත කෙටිකාලීන අත්තිකාරම් හැර මුල් වත්කමෙන් සමාන මුදලක් අයකරගෙන ඇතිනම් මිස ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත මුදල් ගෙවීමට බැංකුවට වගකීමක් නොමැති අවස්ථාව,
- ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත සුරැකුමක් ලෙස නොවන මුල් වත්කම බැංකුවට විකිණීමට හෝ ඔඩපනය කිරීමට නොහැකි අවස්ථාව,
- සැලකියයුතු ප්‍රමාදයක් නොමැතිව ආනුෂංගික ප්‍රදානලාභීන් වෙනුවෙන් බැංකුව අයකරන යම් මුදල් ප්‍රවාහ ප්‍රේෂණය කිරීමට බැංකුවට ඇති අවස්ථාව,

ඊට අමතරව, එකතුකළ දිනය සහ ආනුෂංගික ප්‍රදානලාභීන් වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය දිනය අතර කාලසීමාව තුළ උපයනලද පොළිය ඇතුළුව මුදල් හෝ මුදලට සමාන දෑ හි ආයෝජනයන සඳහා හැර එවැනි මුදල් ප්‍රවාහ නැවත ආයෝජනය කිරීමට බැංකුවට හිමිකම නොමැත.

හඳුනා නොගැනීම සඳහා මාරුකිරීමක් සුදුසුකම් ලබන්නේ පහත අවස්ථාවලදී පමණි:

- බැංකුව සැලකියයුතු අයුරින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන මාරුකර ඇති අවස්ථාව, හෝ,
- බැංකුව සැලකියයුතු අයුරින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන මාරුකර හෝ රඳවාගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය මාරුකර ඇති අවස්ථාව,

පැවරුම්ලාභියාට වත්කම සම්පූර්ණයෙන්ම අසම්බන්ධිත තෙවැනි පාර්ශ්වයකට අලෙවි කිරීමට ප්‍රායෝගික හැකියාව ඇත්නම් සහ ඒකපාර්ශ්විකව සහ මාරුකිරීම මත අමතර සීමා කිරීම් පැනවීමක් නොමැතිව එම හැකියාව ක්‍රියාවට නැංවීමට හැකියාව ඇත්නම් පමණක් පාලනය මාරුකළයුතු බවට බැංකුව සලකනු ලබයි.

පැවරුම්ලාභියාට වත්කම සම්පූර්ණයෙන්ම අසම්බන්ධිත තෙවැනි පාර්ශ්වයකට අලෙවි කිරීමට ප්‍රායෝගික හැකියාව ඇත්නම් සහ ඒකපාර්ශ්විකව සහ මාරුකිරීම මත අමතර සීමා කිරීම් පැනවීමක් නොමැතිව එම හැකියාව ක්‍රියාවට නැංවීමට හැකියාව ඇත්නම් පමණක් පාලනය මාරුකළයුතු බවට බැංකුව සලකනු ලබයි.

බැංකුව සැලකියයුතු අයුරින් වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රදාන මාරුකර නොමැති සහ පාලනය රඳවාගෙන ඇති අවස්ථාවක, බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පමණක් වත්කම තවදුරටත් හඳුනා ගනී. මෙම

අවස්ථාවේදී, බැංකුව ආශ්‍රිත වගකීමක් ද හඳුනා ගනී. මාරුකළ වත්කම් සහ ආශ්‍රිත වගකීම බැංකුව විසින් රඳවාගෙන ඇති අයිතීන් සහ බැඳීම් පිළිබිඹු කරන පදනමක් මත මනිනු ලබයි.

මාරුකළ වත්කම මත ඇපයක ස්වරූපයක් ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කමේ මුල් ධාරණ අගය සහ බැංකුවට ගෙවීමට අවශ්‍ය වියහැකි ප්‍රතිෂ්ඨාවේ උපරිම ප්‍රමාණය යන දෙකෙන් පහළ අගයට මනිනු ලබයි. අඛණ්ඩ මැදිහත්වීම මාරුකළ වත්කම මත ලිඛිත හෝ මිලදීගැනීමේ විකල්පයක (හෝ දෙකම) ස්වරූපයක් ගන්නේනම්, අඛණ්ඩ මැදිහත්වීම මිලදී ගැනීම මත බැංකුවට ගෙවීමට අවශ්‍ය වියහැකි වටිනාකමට මනිනු ලබයි. සාධාරණ අගයට මනින ලද වත්කමක් මත ලිඛිතව තබන ලද විකල්පයක් වන අවස්ථාවකදී, ආයතනයේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය මාරුකළ වත්කමේ සාධාරණ අගය සහ විකල්ප ක්‍රියාත්මක මිල යන දෙකෙන් අඩු අගයට සීමා වේ.

3.1.1.6.2 (අා) මූල්‍ය වගකීම්

වගකීම යටතේ බැඳීම මුදාහරින, අවලංගු වන හෝ කල්පිරෙන අවස්ථාවක මූල්‍ය වගකීමක් හඳුනා නොගනී. පවත්නා මූල්‍ය වගකීමක් සැලකියයුතු වෙනස් නියමයන් මත හෝ පවත්නා වගකීමක නියමයන් සැලකියයුතු ලෙස වෙනස්වන පරිදි එම ණයකරුගේ වෙනත් ණයකින් ප්‍රතිෂ්ඨාපනය කරන අවස්ථාවක, එවැනි හුවමාරුවක් හෝ වෙනස්කිරීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලබයි. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

3.1.1.7 මූල්‍ය වත්කම් හානිකරණය (2018 ජනවාරි 1 ට අදාළ ප්‍රතිපත්තිය)

3.1.1.7.1 අපේක්ෂිත ණය අලාභ මූලධර්මය පිළිබඳ දළ විශ්ලේෂණය

ඉහත විස්තර කළ පරිදි, ඉදිරිය දකින අපේක්ෂිත ණය අලාභ ප්‍රවේශයක් සහිතව LKAS 39 හි දරන ලද අලාභ ප්‍රවේශය වෙනුවට SLFRS 9 යොදා ගැනීම මූලිකවම බැංකුවේ ණය අලාභ හානිකරණ ක්‍රමය මූලිකවම වෙනස් කර ඇත. 2018 ජනවාරි 1 සිට, "මූල්‍ය උපකරණ" ලෙස මෙම සෑම කොටසකම සඳහන් කරන ණය බැඳීම් සහ මූල්‍යමය ඇප ගිවිසුම් සමඟ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට නොදරන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් අත්තිකාරම බැංකුව වාර්තා කරමින් සිටී. ස්කන්ධ උපකරණ SLFRS 9 යටතේ හානිකරණයට යටත් නොවේ.

මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු ජීවකාල අපේක්ෂිත ණය අලාභයේ කොටස වන අතර එය වාර්තාකරණ දිනයෙන් පසු මාස 12ක් ඇතුළත වියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම් ඇතිවන අපේක්ෂිත ණය අලාභය නියෝජනය කරයි. ජීවකාල අපේක්ෂිත ණය අලාභ සහ මාස 12 අපේක්ෂිත ණය අලාභ යන දෙකම මූල්‍ය උපකරණවල පාදක කළඹේ ස්වභාවය මත රැඳෙමින් තනි තනි පදනමක් හෝ සාමූහික පදනමක් මත ගණනය කෙරේ. සාමූහික පදනමක් මත මනින ලද මූල්‍ය වත්කම් කාණ්ඩ කිරීම සඳහා බැංකුවේ ප්‍රතිපත්තිය පහත විස්තර කෙරේ. මූල්‍ය උපකරණයක ඉතිරි ජීව කාලය තුළ සිදුවන පැහැර හැරීමේ අවදානම තුළ වෙනස සැලකිල්ලට ගනිමින් මූලික හඳුනා ගැනීමේ සිට මූල්‍ය උපකරණයේ ණය අවදානම සැලකියයුතු ලෙස වැඩිවී තිබේද යන්න පිළිබඳ එක් එක් වාර්තාකරන කාලසීමාව අවසානයේදී තක්සේරුවක් සිදු කිරීමට බැංකුව ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ඇත.

ඉහත ක්‍රියාවලිය මත පදනම් වී, බැංකුව එහි ණය පහත විස්තර කරන පරිදි අදියර 1, අදියර 2, අදියර 3 සහ POCI තුළට කාණ්ඩ කරයි:

අදියර 1: ණය පළමුව හඳුනාගන්නා අවස්ථාවේදී, බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ මත පදනම් වී අත්තිකාරමක් හඳුනා ගනී. අදියර 1 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 2 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

අදියර 2: ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි. අදියර 2 ණයට ණය අවදානම වර්ධනය වී ඇති පහසුකම් සහ අදියර 3 සිට නැවත වර්ගීකරණය කර ඇති ණය ඇතුළත්ය.

අදියර 3: ණය හානිකරණය වී ඇති බවට සලකන ණය. බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා අත්තිකාරමක් වාර්තා කරයි.

POCI: මිලදීගත් හෝ උත්පාදිත හානිකරණය වූ ණය (POCI) වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. POCI වත්කම් මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගයට වාර්තා කරන අතර ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතයක් මත පදනම් වී පොළි ආදායම පසුකාලීනව හඳුනා ගනී. අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් සිදුවන ප්‍රමාණයට පමණක් හඳුනාගනී නැතිනම් මුදා හරී. වාර්තාකරණ දිනයට බැංකුවට POCI වත්කම් නොමැත.

හිඟව ඇති මුළු ප්‍රමාණය හෝ එයින් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවන් බැංකුවට නොමැති මූල්‍ය වත්කම් සඳහා, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගය අඩු කරනු ලබයි. මෙය මූල්‍ය වත්කම් (අර්ධ වශයෙන්) හඳුනා නොගැනීමක් ලෙස සලකනු ලබයි.

3.1.1.7.2 අපේක්ෂිත ණය අලාභ (ECLs) ගණනය කිරීම

ඵලදායී පොළි අනුපාතයට ආසන්නවීමට වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟය මැනීම සඳහා සම්භාවිතාව බර තබන ලද ක්‍රියාදාම හතරක් මත පදනම් වී බැංකුව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟයක් යනු ගිවිසුමකට අනුකූලව ආයතනයකට ගෙවියයුතු මුදල් ප්‍රවාහ සහ ආයතනය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ශිල්ප පහත කෙටියෙන් දක්වන අතර එහි ප්‍රධාන අංග පහත පරිදි වේ.

PD: පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ පැහැර හැරීම සිදුවියහැකි බව පිළිබඳ ඇස්තමේන්තුවකි. පහසුකම මෙයට පෙර හඳුනාගෙන නොමැතිනම් සහ තවමත් කළඹ තුළනම්, පැහැරහැරීමක් තක්සේරු කළ කාලසීමාව තුළ එක්තරා අවස්ථාවකදී පමණක් සිදුවිය හැක.

EAD: පැහැර හැරීමේදී නිරාවරණය යනු බැඳුණු පහසුකම සහ මඟහැරුණු ගෙවීම්වල උපචිත පොළිය මත පහළවැටීම් අපේක්ෂිත ගිවිසුම මගින් හෝ වෙනත් ආකාරයකින් උපලේඛනගත මුල් මුදල සහ පොළිය නැවත ගෙවීම ඇතුළුව වාර්තාකරන දිනයෙන් පසු නිරාවරණ තුළ අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් අනාගත පැහැරහැරීමේ දිනයක නිරාවරණය පිළිබඳ තක්සේරුවකි.

LGD: අලාභ ලබන පැහැර හැරීම යනු දෙනලද යම් කාලයකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවක ඇතිවන අලාභය පිළිබඳ තක්සේරුවකි. ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හිඟ සහ යම් ඇප මුදාහැරීම ඇතුළුව ණයකරු ලබාගැනීමට අපේක්ෂා කරන ප්‍රමාණය අතර වෙනස මත එය පදනම් වේ. එය සාමාන්‍යයෙන් පැහැර හැරීමේදී නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, බැංකුව විසින් මූලික සිදුවීම, හොඳම සිදුවීම සහ නරකම සිදුවීම ලෙස ක්‍රියාදාම තුනක් සලකා බලයි. මේවා එකින් එක එකිනෙකට වෙනස් PDs, EADs සහ LGDs හා බැඳේ. අදාළ වන අවස්ථාවේදී, ණය අයකර ගැනීමේ හැකියාව සහ ඇපවල වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලබාගතහැකි ප්‍රමාණය ඇතුළුව පැහැර හැරි ණය අයකර ගැනීමට අපේක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් විවිධ ක්‍රියාදාම පිළිබඳ තක්සේරුවක් ද ඇතුළත් කරයි.

හානිකරණ අලාභ සහ මුදාහැරීම් මූල්‍ය වත්කමේ දළ ධරණ අගයේ ගැලපීමක් ලෙස ගණනය කරන වෙනස්කිරීමේ අලාභ හෝ ලාභ සඳහා ගණනය කර වෙන වෙනම අනාවරණය කෙරේ.

අපේක්ෂිත ණය අලාභ ක්‍රමයේ ශිල්ප පහත සාරාංශ කෙරේ:

අදියර 1 : මාස 12 අපේක්ෂිත ණය අලාභ වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි මූල්‍ය උපකරණයක් මත පැහැර හැරීමේ සිදුවීම්වලින් ඇතිවන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන ජීවකාල අපේක්ෂිත ණය අලාභවල කොටසක් ලෙස ගණනය කෙරේ. වාර්තා කරන දිනයෙන් පසු මාස 12 තුළ සිදුවියහැකි පැහැර හැරීමක් පිළිබඳ අපේක්ෂාව මත පදනම් වී මාස 12 අපේක්ෂිත ණය අලාභ දීමනාව බැංකුව විසින් ගණනය කරයි. මෙම අපේක්ෂිත මාස 12 පැහැර හැරීමේ සම්භාවිතාවන් පුරෝකථන EAD සඳහා යොදා ගන්නා අතර අපේක්ෂිත LGD වලින් ගුණකර මුල් ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි. ඉහත විස්තර කළ පරිදි මෙම එක් එක් ක්‍රියාදාමය සඳහා මෙම ගණනය කිරීම සිදු කරයි.

අදියර 1: ණය මුදලක් ආරම්භයේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් පෙන්නුම්කර ඇති අවස්ථාවක, බැංකුව ජීවකාල අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාවක් වාර්තා කරයි. ශිල්ප ක්‍රම විවිධ ක්‍රියාදාම භාවිතය ඇතුළුව ඉහත විස්තරකල දෙයට සමාන වන නමුත් PDs සහ LGDs උපකරණයේ ජීවකාලය තුළ තක්සේරු කෙරේ. අපේක්ෂිත මුදල් හිඟය ඵලදායී පොළි අනුපාතයට ආසන්න කිරීමකට වට්ටම් කරනු ලබයි.

අදියර 3: ණය හානිකරණය වී ඇති බවට සලකන ණය සඳහා. එවැනි ණය සඳහා ජීවකාල අපේක්ෂිත ණය අලාභ බැංකුව හඳුනා ගනී. මෙම ක්‍රමය 100%ට PD සැකසුම සහිත අදියර 2 වත්කම්වලට සමානය.

POCI: POCI වත්කම් යනු මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම්ය. ණය ගලපන ලද ඵලදායී පොළි අනුපාතය මගින් වට්ටම්කළ ක්‍රියාදාම හතර සම්භාවිතා බරතැබීමක් මත පදනම් වී මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනාගනී. වාර්තාකරණ දිනයට බැංකුවට POCI වත්කම් නොමැත.

මූල්‍ය ඇප ගිවිසුම්: ණයමුදලක් සහ නොලියූ බැඳීමක් යන දෙකම ඇතුළත් ණය කාඩ්පත් සහ චක්‍රිය පහසුකම් සඳහා, අපේක්ෂිත ණය අලාභ ගණනය කර ණය සමඟ එකට ඉදිරිපත් කරයි. ණය බැඳීම් සහ ණයවර ලිපි සඳහා, වෙන්කිරීම් තුළ අපේක්ෂිත ණය අලාභය හඳුනා ගනී.

3.1.1.7.3 තනි තනිව වැදගත් ණය සඳහා අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම

බැංකුව පළමුවෙන් බැංකුවට තනි තනිව වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනිව අපේක්ෂිත ණය අලාභය තක්සේරු කරයි. එවැනි වත්කම් හානිකරණය නොකරන බවට බැංකුව තීරණය කරන අවස්ථාවක (අදියර 3 නොව), සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයක් තුළ වත්කම් ඇතුළත් කරන අතර හානිකරණය සඳහා තනි තනිව ඒවා තක්සේරු කරයි.

කෙසේවෙතත්, හානිකරණය සඳහා තනි තනිව තක්සේරු කරන සහ හානිකරණ අලාභයක් හඳුනාගන්නා හෝ අඛණ්ඩව හඳුනා ගන්නා වත්කම් හානිකරණය පිළිබඳ සාමූහික තක්සේරු කිරීමක් තුළ ඇතුළත් නොකෙරේ.

මුල් ඵලදායී පොළි අනුපාතයට මූල්‍ය වත්කමක අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කරමින් සහ මූල්‍ය වත්කමේ වර්තමාන ධාරණ අගය සමඟ ඇති වූ වර්තමාන වටිනාකම සසඳමින් මනින ලද අලාභයේ ප්‍රමාණයට වත්කම් හානිකරණය කරයි. තනි තනිව වැදගත් ගිණුම් මත හානිකරණය අවශ්‍ය අවස්ථාවලදී වඩාත් විධිමත්ව සමාලෝචනය කරයි.

මෙයට සාමාන්‍යයෙන් දරන ලද ඇප බලාත්මක කිරීමේ හැකියාව, කාලය සහ සත්‍ය සහ අපේක්ෂා කළහැකි ලැබීම් මුදල පිළිබඳ නැවත තක්සේරු කිරීමක් ඇතුළත්ය. ස්ථාපිත අලාභ ඇස්තමේන්තුව තුළ අඩුවීමක් පිළිබඳ සාධාරණ සහ විෂය මූලික සාක්ෂියක් ඇති අවස්ථාවේදී තනි තනිව තක්සේරු කළ හානිකරණය පමණක් මුදා හරී. හානිකරණය කළ වත්කම් මත පොළිය වට්ටම දිගහැරුම තුළින් අඛණ්ඩව හඳුනා ගනී.

තනි තනිව වැදගත් මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත ණය අලාභ තීරණය කරන අවස්ථාවේදී, පහත සඳහන් සාධක සලකා බලනු ලැබේ:

- නොලියන ලද අනාවරණ ඇතුළුව ගනුදෙනුකරුවාට එකතුකළ අනාවරණය;
- ගනුදෙනුකරුගේ ව්‍යාපාර ආදර්ශයේ ස්වශක්තතාව සහ මූල්‍ය දුෂ්කරතාවලින් පරිබාහිරව සාර්ථකව අලෙවි කිරීම සහ ණය බැඳීම් සේවා කිරීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ ඇති කිරීම සඳහා ඒවායේ හැකියාව;
- අපේක්ෂිත ලැබීම් සහ අයකරගැනීම් ප්‍රමාණය සහ කාලය;
- බැංකුවට ඉදිරියෙන් හෝ සමානව ශ්‍රේණිගතකරණ වෙනත් ණයකරුවන්ගේ ප්‍රමාණය සහ වෙනත් ණයකරුවන් බැංකුවට තවදුරටත් සහයවීමේ සම්භාවිතාව;
- එකතුකළ ප්‍රමාණය තීරණය කිරීමේ සංකීර්ණතාව සහ සියලුම ණයකරුවන්ගේ හිමිකම් ශ්‍රේණිගතකරණය සහ නෛතික සහ රක්ෂණ අවිනිශ්චිතා ප්‍රත්‍යක්ෂවන ප්‍රමාණය;
- ඇප (හෝ වෙනත් ණය අඩුකිරීම්) උපලබ්ධි කළහැකි වටිනාකම සහ සාර්ථකව නැවත අයත්කර ගැනීමේ හැකියාව;
- හිඟමුදල් අයකරගැනීම හා සම්බන්ධ යම් පිරිවැය අඩුවිය හැකිවීම;
- දේශීය ව්‍යවහාර මුදලින් නම් කර නොමැතිනම් ණයවල ව්‍යවහාර මුදලින් ලබාගැනීමට සහ ගෙවීම් කිරීමට ණයකරුගේ හැකියාව; සහ
- ඈවරකිරීම හෝ බුන්වත්වීම මත ලබාගතහැකි ලාභාංශය.

3.1.1.7.4 අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ

අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මනින ලද ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ සාධාරණ අගයේ පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මෙම මූල්‍ය වත්කම්වල ධාරණ අගය අඩු නොකරයි. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන්නේ නම් ඇතිවිය හැකි දිමනාවට සමාන මුදලක් ආදායම් ප්‍රකාශනයට අනුරූප අයකිරීමක් සමඟ සමුච්චිත හානිකරණ ප්‍රමාණයක් ලෙස අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනා ගනී. අනෙකුත් විස්තරාත්මක ආදායම තුළ හඳුනාගත් සමුච්චිත අලාභ වත්කම හඳුනා නොගැනීම මත ලාභ හෝ අලාභයට ප්‍රතිවක්‍රිය කෙරේ.

3.1.1.7.5 මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම්

මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය කළ මූල්‍ය වත්කම් සඳහා, අලාභ දීමනාව තුළ මූලික හඳුනා ගැනීමේ සිට ජීවකාල අපේක්ෂිත ණය අලාභවල සමුච්චිත වෙනස්වීම් පමණක් බැංකුව හඳුනා ගනී.

3.1.1.7.6 ඉදිරිය දකින තොරතුරු

අපේක්ෂිත ණය අලාභ ආදර්ශය තුළ, පහත කරුණු වැනි ආර්ථික යෙදවුම් ලෙස ඉදිරිය දකින තොරතුරු පිළිබඳ පුළුල් පරාශයක් මත බැංකුව විශ්වාසය තබයි –

- දළ දේශීය නිෂ්පාදිත වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොළි අනුපාත
- ඇ.එ.ඩො.: රුපියල් හුවමාරු අනුපාතය
- විරැකියා අනුපාත

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිතා කරන යෙදවුම් සහ ආදර්ශ මූල්‍ය ප්‍රකාශනවල දිනයට වෙළෙඳපොළේ සියලුම ගතිලක්ෂණ සෑමවිටම ග්‍රහනය කර නොගනී. මෙය පිළිබිඹු කිරීම සඳහා, එවැනි වෙනස්වීම් සැලකියයුතු ලෙස වැදගත් වන අවස්ථාවේ ගුණාත්මක ගැලපීම් හෝ ආවරණ තාවකාලික ගැලපීම් ලෙස අවස්ථානුකූලව සිදු කෙරේ.

- සාමාන්‍ය LTV
- රජයේ ප්‍රතිපත්ති
- ක්ෂේත්‍රයේ ව්‍යාපාරයේ තත්ත්වය
- නියාමන බලපෑම

3.1.1.7.7 ඇප තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් මත ණය අවදානම් අවම කිරීම සඳහා, හැකි සෑම අවස්ථාවකදීම බැංකුව ඇප භාවිතා කිරීමට උත්සාහ දරයි. ඇප මුදල්, සුරැකුම්, ණයවර ලිපි/ඇප, නිශ්චල දේපල, ලැබීම්, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය

නොවන වත්කම් සහ ජාලකරණ ගිවිසුම් වැනි ණය වර්ධනයන් වැනි විවිධ ආකාරයේ ස්වරූපයක් ගනී. SLFRS 9 යටතේ බැංකුව එහි ණයදීමේ වැඩපිළිවෙල තුළින් පවරාගන්නා ඇප සඳහා බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වන්නේ LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියයි.

3.1.1.7.8 නැවත අත්කරගත් ඇප

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ නැවත අත්කරගත් වත්කමක් එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා වඩා හොඳින් භාවිතා කළ හැකිය යන්න හෝ විකිණිය යුතුය යන්න තීරණය කිරීමයි. එහි අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත්යයි තීරණය කළ වත්කම් ඒවා නැවත අත්කරගත් වටිනාකම හෝ මුල් සුරැකුම් වත්කමේ ධාරණ අගය යන දෙකින් අඩු අගයට ඒවාට අදාළ වත්කම් වර්ගීකරණයට මාරු කෙරේ. විකිණීම වඩාත් හොඳ විකල්පයක් වන බවට තීරණය කරනු ලබන වත්කම් ඒවායේ සාධාරණ අගයට (මූල්‍ය වත්කම් නම්) සහ බැංකුවේ ප්‍රතිපත්තියට සමගාමීව නැවත අත්කර ගත් දිනයට මූල්‍ය නොවන වත්කම් සඳහා විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ අගයට අලෙවිය සඳහා තබා ඇති වත්කම්වලට මාරු කරනු ලබයි.

බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර රටාවට අනුව, බැංකුව එහි පාරිභෝගික කළඹ තුළ දේපල හෝ අනෙකුත් වත්කම් භෞතිකව නැවත අත්කර නොගන්නා නමුත් පොදුවේ වෙන්දේසියකදී හිඟ ණය නිරවුල් කිරීමට අරමුදල් අයකර ගැනීමට බාහිර නියෝජිතයින් සේවයේ යොදවනු ලබයි. යම් අතිරික්ත අරමුදල් ගනුදෙනුකරුවන්ට/බැඳීම් ආපසු ගෙවනු ලැබේ. මෙම ව්‍යවහාරයේ ප්‍රතිඵලයක් ලෙස, නෛතිකව නැවත අත්කරගැනීමේ ක්‍රියාවලීන් යටතේ නේවාසික දේපල ශේෂ පත්‍රයේ වාර්තා නොකෙරේ.

3.1.1.7.9 කපාහැරීම්

SLFRS 9 යටතේ බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය LKAS 39 යටතේ බැංකුව තුල පැවති ප්‍රතිපත්තියට සමාන වේ. බැංකුව අයකරගැනීමේ කාර්යය නවතා ඇති අවස්ථාවේදී පමණක් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම මූල්‍ය වත්කම් කපා හරිනු ලබයි. කපාහරිනු ලබන මුදල සමුච්චිත අලාභ දීමනාවට වඩා ඉහළ නම්, දළ ධාරණ අගයට අනුව යොදා ගනු ලබන දීමනාවට එකතු කිරීමක් ලෙස වෙනස පළමුව සලකනු ලැබේ. යම් පසුකාලීන අයකර ගැනීම් ණය අලාභ වියදමට බැර කෙරේ.

3.1.1.8 සහන සහ වෙනස්කරන ලද ණය

බැංකුව සමහර අවස්ථාවල නැවත අත්කර ගැනීම හෝ වෙනත් ආකාරයෙන් බලයෙන් ඇප අයකරගැනීමට වඩා ණයකරුගේ මූල්‍යමය දුෂ්කරතාවන්ට ප්‍රතිචාරයක් ලෙස ණය මුදලේ මුල් නියමයන්ට අනුග්‍රහ ලබාදීම හෝ වෙනස්කිරීම් සිදුකරයි. ණයකරුගේ වර්තමාන හෝ අපේක්ෂිත මූල්‍ය දුෂ්කරතාවල ප්‍රතිඵලයක් ලෙස එවැනි අනුග්‍රහ හෝ වෙනස් කිරීම් ලබාදෙන ලද අවස්ථාවේදී ණයමුදලක් සහන ලෙස බැංකුව සලකනු ලබන අතර, ණයකරු මූල්‍යමය වශයෙන් යහපත්ව සිටියේනම් බැංකුව එයට එකඟ නොවේ. මූල්‍ය දුෂ්කරතාවන් පිළිබඳ දර්ශකවලට ගිවිසුම් පැහැර හැරීම් හෝ ණය අවදානම් දෙපාර්තමේන්තුව විසින් මතුකරන ලද වැදගත් ගැටළු ඇතුළත් වේ. සහනවලට ගෙවීම් වැඩපිළිවෙල දීර්ඝ කිරීම සහ අලුත් ණය කොන්දේසි පිළිබඳ එකඟතා සම්බන්ධ වේ. නියමයන් නැවත සාකච්ඡා කළ පසු, යම් හානිකරණ නියමයන් වෙනස් කිරීමට පෙර ගණනය කළ මුල් ඵලදායි පොළී අනුපාතය භාවිතයෙන් මනිනු ලබයි. අනාගත ගෙවීම් අඛණ්ඩව සිදුවන බවට සහතික කිරීමට සහයවීම සඳහා සහන ණය නියාමනය කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. හඳුනා නොගැනීමේ තීරණ සහ අදියර 2 සහ අදියර 3 අතර වර්ගීකරණය සිද්ධියෙන් සිද්ධිය යන පදනමක් මත තීරණය කෙරේ. මෙවැනි ක්‍රියාපටිපාටි ණයක් සම්බන්ධයෙන් අලාභයක් හඳුනා ගනීනම්, එය අයකර ගන්නාතුරු හෝ කපාහරිනතුරු හානිකරණය කළ අදියර 3 සහන වත්කමක් ලෙස අනාවරණය කර කළමනාකරණය කෙරේ.

2018 ජනවාරි 1 දින සිට, ණය මුදල නැවත සාකච්ඡාකර හෝ වෙනස්කර ඇති නමුත් හඳුනා නොගැනීමක් කර නොමැති අවස්ථාවක, බැංකුව 46.2 සටහනේ දක්වා ඇති පරිදි ණය අවදානම තුළ සැලකිය යුතු වැඩිවීමක් තිබේද යන්න නැවත තක්සේරු කරයි. එමෙන්ම බැංකුව වත්කම් අදියර 3 ලෙස වර්ගීකරණය කළ යුතුද යන්න සලකා බලයි.

3.1.1.9 පූර්වාවරණය කරන ලද වත්කම්

පූර්වාවරණය කරන ලද වත්කම්, ණය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බේරුම් කිරීමෙන් අත්කරගත් දේපළ නියෝජනය කරන අතර පූර්වාවරණය කරන ලද වත්කම්වල වත්මන් වෙළඳපොළ අගය හා අදාළ ණය මුදලේ හිඟහිටි මුදල එකී දේපළ අත්කරගත් වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ ණය තෘප්තිමත් කිරීමේ දී ඇතිවන ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනයක් සේ හඳුනාගනු ලබයි.

3.1.1.10 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර හඳුනා ගනු ලැබූ ප්‍රමාණ හිලව් කිරීම සඳහා තත් අවස්ථාවේ බලාත්මක යම් නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම උපලබ්ධිකොට බැරකම පියවීමට එකවර ක්‍රියා කිරීමට යම් අපේක්ෂාවක් ඇත්නම් පමණක් අදාළ ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තා කරනු ලැබෙයි. ගෙවීම් පැහැර හැරීමක දී සියලුම බැරකම් එකවර පියවීම පිළිබඳ ගිවිසුම් සම්බන්ධයෙන් මෙය පොදුවේ අදාළ නොවන බැවින් ආශ්‍රිත වත්කම් හා බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දළ වශයෙන් දක්වා ඇත.

3.1.2 දේපල, පිරියත සහ උපකරණ

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒ නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ආකාරයෙන් මැනිය හැකිනම් දේපල, පිරියත සහ උපකරණ (PPE) පිළිගනු ලබයි.

දේපල, පිරියත සහ උපකරණ වල (PPE) පිරිවැයෙන් ඒවයේ දෛනික සේවා කිරීමේ පිරිවැය අත්හැර උපචිත ක්ෂයකිරීම් හා වටිනාකමේ උපචිත හානිකරණ අඩුකොට දක්වනු ලබයි. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලයේ වෙනස්කම් යෝග්‍ය පරිදි ක්ෂයකිරීම් කාලපරිච්ඡේදය හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මඟින් ගණන්දීම සිදු කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලදී වෙනස්කම් සේ සලකනු ලබයි.

වත්කම් භාවිතය සඳහා පවත්නා අවස්ථාවේ සිට ආරම්භ කර ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලයේ ක්ෂයවීම සරල මාර්ග පදනමින් ආදායම් ප්‍රකාශයේ දක්වනු ලබයි.

ගොඩනැගිලි	5% වාර්ෂිකව
පරිගණක උපකරණ	20% වාර්ෂිකව
කාර්යාලයීය උපකරණ	20% වාර්ෂිකව
මෝටර් රථ	20% වාර්ෂිකව
ගෘහ භාණ්ඩ	15% වාර්ෂිකව
යකඩ සේප්පු	10% වාර්ෂිකව
බෙදුම් හා සවිකිරීම්	20% වාර්ෂිකව

පසු වියදම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒම සසම්භාවී වන විට එම වියදම් ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

දේපල, පිරියත සහ උපකරණ වලට (PPE) අයත් යම් අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතාව තුළින් කිසිදු ආර්ථික ප්‍රතිලාභයක් ලබාගත නොහැකි විට එහි ධාරණ අගය පිළිගැනීම අහෝසි කරනු ලැබෙයි. කිසියම් වත්කමක් පිළිගැනීම අහෝසි කරනු ලැබීමක දී ඇති වන (බැහැර කිරීමේ ශුද්ධ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරනු ලබන) ලාභය හෝ අලාභය අදාළ වත්කම පිළිගැනීම අහෝසි කරනු ලැබූ වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම්/ආදායම්/වියදම් යටතේ දක්වනු ලැබෙයි.

සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්ය ඒවායේ පිරිවැය මත දක්වනු ලබන අතර ඒවා ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සෘජුව දරණ ලදුව ප්‍රාග්ධනීකරණයට නියමිත ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වෙයි.

3.1.3 කල්බදු

යම්කිසි සැලසුමක් එම සැලසුමේ අන්තර්ගතය මත කල් බද්දක් ද නැත්නම් කල්බදු ඇතුළත්වන්නක් ද යන්න තීරණය කරන අතර එම සැලසුම ඉටුකිරීමට විශේෂිත වත්කමක් හෝ වත්කම් භාවිතා කරනවා ද යන්න එම සැලසුම එකී වත්කම් භාවිතා කිරීමට අයිතියක් ප්‍රකාශ කරනවා ද යන්න මත කරන තක්සේරුවක් අවශ්‍යවෙයි.

3.1.3.1 කල්බදු – බැංකුව බදුකරු ලෙස

බද්දට ගත් අයිතමය හිමිකරුට ආනුශංගික වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ ප්‍රමාණාත්මකව බැංකුවට පැවරෙන මූල්‍ය කල්බදු ක්‍රම කල්බදු ආර්ම්භයේ සිට බද්දට ගත් දේපලෙහි සාධාරණ අගය මත එය පහළ මට්ටමක පවතින්නේ නම් අවම බදු ගෙවීමේ වර්තමාන අගය මත හෝ ප්‍රාග්ධනීකරණය කරනු ලැබෙයි. කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු සහ කල් බදු වගකීම්වල අවකරණය අතර බෙදා වෙන් කරන අතර එවිට පවතින වගකීම්වල ශේෂය මත ස්ථාවර පොළී අනුපාතයක් ලබා ගත හැකිය. මූල්‍ය ගාස්තු ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි අයකර තිබෙයි.

කල්බදු කාල සීමාව අවසානයේ සමාගම අයිතිය තහවුරු කරගත හැකි යැයි සාධාරණ නිශ්චිත බවක් නොමැති විට ප්‍රාග්ධනිත කල්බදුකරණය කරන ලද වත්කම් කල් බදු කාලසීමාව සහ ඇස්තමේන්තු කරන ලද වත්කමේ ප්‍රයෝජනවත් කාල සීමාව යන දෙකින් වඩාත් කෙටි වන්නේ කුමක් ද එය මත ක්ෂයවීම් කරනු ලැබෙයි. ක්ෂය කළ හැකි කල්බදුකරණය කරන ලද වත්කම් සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය 3.1.2 සටහනේ පැහැදිලි කර තිබෙන හිමි කරගෙන ඇති ක්ෂය කළ හැකි වත්කම් සමඟ අනුකූලවෙයි.

ක්‍රියාත්මක කල් බදු ගෙවීම් කල් බදු කාලසීමාව තුළ සරල මාර්ග පදනම මත ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනෙයි.

3.1.4 අස්පෘශ්‍ය වත්කම්

බැංකුවේ වෙනත් අස්පෘශ්‍ය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල අගය ඇතුළත් වෙයි.

අස්පෘශය වත්කමක් හඳුනාගන්නේ එහි වියදම විශ්වසනීය ලෙස මැනිය හැකිවීමත් එයට ආරෝපණය කළ හැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒමේ හැකියාවත් මතය.

වෙනම අත්පත්කරගත් අස්පෘශ්‍ය වත්කම් මූලිකව වියදම මත හඳුනාගනු ලැබෙයි. මූලික හඳුනාගැනීම අනුව යමින් අස්පෘශ්‍ය වත්කම් වියදම් රහිතව ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂයක් සහ ඕනෑම සමුච්චිත හානි කරන අලාභයක් මත ගෙන යනු ලැබෙයි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් කාල සීමාව තක්සේරු කරනු ලබන්නේ පරිමිත හෝ අපරිමිත වශයෙනි. පරිමිත ප්‍රයෝජනවත් කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂ කාලය සහ ක්‍රමක්ෂය ගණනය කරන ක්‍රමය සමාලෝචනය කිරීම අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම වසර අවසානයේ දී සිදුකරනු ලැබෙයි. වත්කම්වල අන්තර්ගත වී ඇති අපේක්ෂිත ප්‍රයෝජනවත් කාල සීමාවන්හි හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන් හි අපේක්ෂිත පරිභෝජන රටාවෙහි වෙනස්කම් යෝග්‍ය පරිදි ක්‍රමක්ෂ කාලය හෝ ක්‍රමය වෙනස් කිරීම මඟින් හෝ වාර්තාකරන අතර ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබෙයි. පරිමිත කාල සීමාවක් සහිත අස්පෘශ්‍ය

වත්කම් මත ක්‍රමක්ෂ වියදම ආදායම් ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වා තිබෙයි.

අස්පෘශ්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාල සීමාව තුළ ඒවායේ වියදම ඒවායේ අවශේෂ වටිනාකමට ලියා තැබීම සඳහා සරල මාර්ග පදනම යොදාගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබෙයි:

- පරිගණක මෘදුකාංග – වසර 3

3.1.5 මූල්‍ය නොවන වත්කම් හානිවීම

සෑම වාර්තා කරන දිනකම යම් කිසි වත්කමක් හානි වන්නේ ද යන්න පිළිබඳ ඇගැවීමක් තිබෙනවා ද කියා බැංකුව තක්සේරු කරනු ලබයි. එවන් යම්කිසි ඇඟවීමක් තිබෙන විට හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ විට බැංකුව වත්කමෙහි ප්‍රතිලබ්ධිය අගය ඇස්තමේන්තු කරනු ලබයි.

වත්කමක ධාරණ අගය එහි ප්‍රතිලබ්ධිය අගය අභිබවා යන්නේ නම් හානිකරණ අලාභයක් හඳුනාගත හැකිය. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත හැකිය.

3.1.6 මූල්‍ය ඇප

ණය උපකරණයේ කොන්දේසිවලට අනුකූලව ගෙවීමට තිබෙන යම් කිසි ගෙවීමක් කිරීමට විශේෂිත ණය කරුවෙක් අපොහොසත් වුවහොත් ඇතිවන අලාභය ධාරකයාට ප්‍රතිපූරණය කිරීම සඳහා ගෙවීමට සිදුවන විශේෂිත ගෙවීම් වලට අවශ්‍ය වන කොන්ත්‍රාත් "මූල්‍ය ඇප" ලෙස හැඳින්වෙයි. "ණය වගකීම්" යනු පූර්වයෙන් නිශ්චය කරන ලද නියමයන් සහ කොන්දේසි යටතේ ණය ලබාදීමට ඇති ස්ථාවර බැඳීම වෙයි.

වෙළඳපොළ පොළී අනුපාතයට වඩා පහළ අගයක ණයක් ලබාදීම සඳහා වන මූල්‍ය ඇප හෝ වගකීම් නිසා ඇතිවන වගකීම් මූලික වශයෙන් සාධාරණ අගය මත ගණනය කරන අතර මූලික සාධාරණ අගය ඇපයේ කාල සීමාව හෝ බැඳීම මත ක්‍රමක්ෂය කරනු ලැබෙයි. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමක් සිදුවිය හැකි විට මෙම වගකීම නිරවුල් කිරීම සඳහා වන ඕනෑම අපේක්ෂිත ගෙවීමක වර්තමාන අගය සහ මෙම ක්‍රමක්ෂය කරන ලද ප්‍රමාණයේ ඉහළ මට්ටමට පසුව වගකීම ගෙන යනු ලැබෙයි. වෙළඳපොළ පොළී අනුපාතයට වඩා පහළින් ණයක් සැපයීමට මූල්‍ය ඇප සහ බැඳීම් අපගේ වෙනත් වගකීම් වල ඇතුළත් කර තිබෙයි.

3.1.7 විශ්‍රාමික ප්‍රතිලාභ

3.1.7.1 නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලසුම්/පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 – LKAS 19 – "සේවා නියුක්ති ප්‍රතිලාභ" හි නිශ්චය කර ඇති අකාරයට නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

3.1.7.2 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබෙයි.

අරමුදල යටතේ තිබෙන පූර්ණ වගකීම් තහවුරු කර ගැනීම සඳහා සෑම වසරකම අවසානයේ ආයුග ණක ඇගයීමක් සිදුකරනු ලබයි. මෙම ඇගයීම 2017 දෙසැම්බර් 31 දින ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් සුදුසුකම්ලත් ආයුගණකයන් වන "Messrs Actuarial and Management Consultants (Pvt) Limited" ආයතනය විසින් සිදුකරන ලදී.

ආයුගණක ලාභ සහ අලාභ හඳුනාගැනීම: සැලසුමට අනුව බැංකුවේ වගකීම් ගණනය කිරීමේදි පැන නගින මුළු ආයුගණක ලාභ සහ අලාභ බැංකුව විසින් හඳුනාග නු ලබන්නේ ඒවා ඇතිවන කාලසීමාව තුළ පැන නගින වෙනත් පරිපූර්ණ ආදායම් තුළය.

අරමුදල්කරණය සැලසුම් කිරීම: පාරිතෝෂික වගකීම් බාහිරව අරමුදල්කරණය නොකරෙයි.

3.1.7.3 නිශ්චිත දායකත්ව විශ්‍රාම සැලසුම

"නිශ්චිත දායකත්ව සැලසුමක් යනු යම් කිසි ආයතනයක් වෙනත් ආයතනයකට (අරමුදලක්) නිශ්චිත දායකත්වයක් දක්වන සහ එම අරමුදලට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19" LKAS 19 – "සේවා නියුක්ති ප්‍රතිලාභ" හි සඳහන් ආකාරයට සේවකයන්ට වර්තමානයේ සහ පූර්ව කාලය තුළ අදාළවන ප්‍රතිලාභ හෝ සියලුම සේවකයන්ට ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් වත්කම් නොමැති නම් වැඩිදුර දායකත්වයක් දැක්වීම සඳහා නීතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් නැති පශ්චාත් සේවා නියුක්ති සැලසුමකි.

නිශ්චිත දායකත්ව සැලසුමකට ගෙවිය යුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ලබා දී ඇති සේවයට සමානුපාතික වන අතර ඒවා ගෙවීමට තිබෙන සෑම අවස්ථාවකදීම "පුද්ගලික වියදම්" යටතේ සටහන් කරනු ලැබෙයි. නොගෙවූ දායකත්වයන් වගකීම් ලෙස සටහන් වෙයි.

1. සේවක අර්ථසාධක අරමුදල
   බැංකුවේ සහ සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය පිළිවෙළින් 15% සහ 10% ක් වෙයි.
2. සේවක භාරකාර අරමුදල
   බැංකුව සේවක භාරකාර අරමුදලට 3% දායකත්වයක් සපයයි.

3.1.8 ප්‍රතිපාදන

කිසියම් පසුගිය සිද්ධියක් නිසා බැංකුවට යම් වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ඇති විට සහ ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත කෙරෙන සම්පත් පිටපතට ගලා යාමක් තිබෙන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය විය හැකි විටක සහ විශ්වසනීය ඇස්තමේන්තුවක් වගකීමේ ප්‍රමාණයට සකස් කළ හැකි විටක ප්‍රතිපාදන හඳුනාගනු ලැබෙයි. ඕනෑම ප්‍රතිපාදනයකට අදාළ වියදම් ඕනෑම ප්‍රතිපූර්ණයක ආදායම් ප්‍රකාශ ජාලයේ ඉදිරිපත් කර ඇත.

3.1.9 ආදායම් සහ වියදම් හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලාවිත් ආදායම විශ්වසනීයව මැනගත හැකිවීමේ හැකියාව ඇති විට ආදායම හඳුනාගනු ලැබෙයි. ආදායම හඳුනාගැනීමට පෙර පහත සඳහන් විශේෂිත නිර්ණායක සපුරාලීම අවශ්‍ය වෙයි.

3.1.9.1 පොළී සහ සමාන ආදායම් හා වියදම්

ක්‍රමක්ෂය කරන ලද වියදම මත ගණනය කරන ලද සියලු මූල්‍ය උපකරණ, පොළී අනුපාත සහිත මූල්‍ය වත්කම් වෙළඳාම සඳහා තිබෙන දේ ලෙස වර්ගීකරණය කර ඇති අතර ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය මත නියම කර ඇති මූල්‍ය උපකරණ, පොළී ආදායම හෝ වියදම (EIR) භාවිතා කර වාර්තා කරනු ලැබෙයි. (EIR) යනු මූල්‍ය උපකරණයට අපේක්ෂිත ජීවන කාලය හෝ කෙටි කාලසීමාවක් හරහා සුදුසු පරිදි මූල්‍ය වගකීම් හෝ මූල්‍ය වත්කම්වල ශුද්ධ ධාරණ අගයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නියම වශයෙන් ම වට්ටම් කරන අනුපාතයයි. මෙම ගණනය කිරීමේ දී සියලුම ගිවිසුම්ගත කොන්දේසි සැලකිල්ලට ගන්නා අතර උපකරණ වලට සෘජුවම අදාළවන ගාස්තු හෝ වෘද්ධිමය වියදම් අතුළත් වන අතර එය (EIR) හි අවශ්‍යම අංගයක් වන නමුත් අනාගත ණය අලාභයක් නොවෙයි.

බැංකුව සිය ගෙවීම් හෝ ලැබීම් ඇස්තමේන්තු සංශෝධනය කරන්නේ නම් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් වල ධාරණ අගය ගළපනු ලැබෙයි. ගළපන ලද ධාරණ අගය මූලික (EIR) පදනම් කරගෙන ගණනය කරනු ලබන අතර ධාරණ අගයේ වෙනස මූල්‍ය වත්කම් සඳහා "පොළී හා සමාන ආදායම්" සහ "පොළී හා සමාන වියදම්" ලෙස සටහන් කරනු ලැබෙයි. කෙසේ වෙතත් මුදල් ලැබීම් ආපසු අයකර ගැනීම වර්ධනය වීම නිසා බැංකුව පසුව අනාගත මුදල් ලැබීම් වැඩි කරනු ලැබූ නැවත වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් (3.1.1.5. සටහන බලන්න) සඳහා එම වැඩි වීම ඇස්තමේන්තුවේ වෙනස සිදු කළ දින සිට (EIR) වලට කරන ලද ගැළපීමක් ලෙස සටහන් කර ඇත.

හානිකරණ අලාභයක් නිසා මූල්‍ය වත්කමක හෝ සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක වාර්තාගත අගය අඩු කළ විට පොළී ආදායමේ හානිකරණ අලාභය මැන බැලීම සඳහා අනාගත මූල්‍ය ප්‍රවාහය වට්ටම් කිරීමට යොදා ගත් පොළී අනුපාතය යොදා ගෙන හඳුනාගැනීම සිදු වෙයි.

3.1.9.2 ගාස්තු සහ කොමිස් ආදායම

ගනුදෙනුකරුවන්ට සපයන විවිධ වූ සේවාවන් මාලාවක් තුළින් බැංකුව ගාස්තු සහ කොමිස් ආදායම් උපයා ගනියි. ගාස්තු ආදායම පහත සඳහන් ප්‍රභේදයන්ට බෙදිය හැකිය.

3.1.9.3 යම්කිසි කාලසීමාවක් පුරා ලබාදෙන සේවාවලින් උපයා ගන්නා ගාස්තු ආදායම

යම්කිසි කාලසීමාවක් පුරා ලබාදෙන සේවා සඳහා උපයා ගන්නා ගාස්තු එම කාලය තුළ උපචිත වෙයි. මෙම ගාස්තු වලට කොමිස් ආදායම, ණය සේවා ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු සහ ගනුදෙනුකරුවාගෙන් නැවත අය කර ගන්නා ලිපි ලේඛන ගාස්තු ඇතුළත් වෙයි.

ලබා ගැනීමට හැකියාව ඇති ණය සඳහා ණය බැඳීම් ගාස්තු සහ වෙනත් ණයට සම්බන්ධ ගාස්තු විලම්බනය කර (යම්කිසි වර්ධනීය පිරිවැයක් තිබේ නම් එය සමඟ) ණය මත ඇති (EIR) සඳහා කරන ගැළපීමක් ලෙස හඳුනාගැනෙයි. යම්කිසි ණයක් ලබා ගැනීමට ඇති හැකියාව අඩු නම් ණය බැඳීම් ගාස්තු සරල මාර්ග පදනම යටතේ බැඳියාව ඇති කාලසීමාව තුළ හඳුනාගනු ලැබෙයි.

3.1.10 බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 – LKAS 12 – "ආදායම් බදු" අනුව බදු වියදම යනු වර්තමානයේ සහ විලම්භනය කරන ලද කාල සීමාව සහ ලාභ හා අලාභ තීරණය කිරීමේ දී ඇතුළත්වන මුළු ප්‍රමාණයයි. ආදායම් බදු වියදම ආදායම් ප්‍රකාශයේ සෘජුව "ස්කන්ධ ප්‍රාග්ධනය" සහ "වෙනත් විස්තීර්ණ ආදායම්", යන අයිතමයන්ට අදාළවන ප්‍රමාණයට ව්‍යතිරේකව ස්කන්ධ ප්‍රාග්ධනය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගනියි.

3.1.10.1 පවත්නා බදු

පවතින වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ පවත්නා බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ බදු අධිකාරය වෙත ගෙවීමට තිබෙන හෝ ආපසු අයකර ගැනීමට තිබෙන ප්‍රමාණය මතය. ප්‍රමාණය ගණනය කිරීමට භාවිතා කරන බදු අනුපාත සහ නීති වාර්තා කරන දිනට ක්‍රියාත්මක හෝ ක්‍රියාත්මක යැයි අපේක්ෂිත ඒවා වෙයි.

ඒ අනුව, බදුකරණය සඳහා ප්‍රතිපාදන පදනම් වන්නේ 2006 අංක 10, දරණ දේශීය ආදායම් පනත සහ 2017 අංක 24 දරණ පනත එයට කරන ලද සංශෝධනත් මූල්‍ය ප්‍රකාශයේ 14 වන සටහනේ දක්වා ඇති අනුපාතිකයන්ටත් අනුව බදුකරණය සඳහා ගැළපුම් කරන ලද වසර සඳහා වන ලාභය මතය.

3.1.10.2 විලම්බිත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනයේ ඇති තාවකාලික වෙනස මත විලම්බිත බදු හඳුනාගනියි. පහත සඳහන් කාරණාවලදී හැර සියලුම බදු අය කෙරෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනාගැනේ.

- විලම්බිත වගකීම ඉස්මතු වන්නේ මූලික අවස්ථාවේදීම කීර්තිනාමය හඳුනාගැනීමෙන් හෝ ව්‍යාපාරික සංකලනයක් නොවන වත්කමක් හෝ වගකීමක් කෙරෙන් සිදුවන ගනුදෙනුවක් මඟින් ගිණුම්කරණ ලාභයටවත් බදු ගෙවිය යුතු ලාභයටවත් බලපෑමක් නොවන්නේනම් වන විට.
- පරිපාලිත සමාගම්වල කරන ලද ආයෝජන වලට අදාළ බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව සහ එම තාවකාලික වෙනස්කම්වල ප්‍රතිවර්තනයෙහි කාල නිර්ණය කිරීම පාලනය කළ හැකි අවස්ථාවල සහ තාවකාලික වෙනස පෙනෙන අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවක් නොමැති අවස්ථාවලදී.

සියලුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිතා නොකළ බදු ණය සහ භාවිතා නොකළ බදු අලාභවල ඉදිරියට ගෙන යාම සඳහා සහ පහත සඳහන් අවස්ථාවල හැර අඩු කළ හැකි තාවකාලික වෙනස සහ භාවිතා නොකළ බදු ණය සහ භාවිතා නොකළ බදු අලාභ වල ඉදිරියට ගෙන යාමට එදිරිව බදු අය කළ හැකි ලාභය තිබේයැයි සිතන ප්‍රමාණයට විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබයි:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළ විලම්බිත බදු වත්කම් යම් කිසි ගනුදෙනුවකදී ව්‍යාපාර සම්බන්ධයෙන් නොමැති වත්කමක හෝ වගකීමක් ලෙස මූලිකව හඳුනාගෙන ඇති අවස්ථාවක දී සහ ගනුදෙනු සිදුකරන අවස්ථාවේ ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකළ හැකි ලාභයට හෝ අලාභයට බල නොපාන අවස්ථාවක දී,
- පරිපාලිත සමාගම් වල කරන ලද ආයෝජන වලට සම්බන්ධ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගන්නේ තාවකාලික වෙනස පෙනෙන අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත සහ තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි තත්ත්වයට එදිරිව බදු අයකළ හැකි ආදායම පවතින තත්ත්වයක් මත පමණක් වෙයි.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර එය විලම්බිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් උපයෝජනය කිරීමට ඉඩ දෙන පරිදි ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් ඇති වීමට ඇති හැකියාව නොමැති වන තත්ත්වයට අඩු කරනු ලබයි. හඳුනානොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අයකළ හැකි ලාභය විසින් විලම්බිත බදු වත්කම් නැවත අයකර ගැනීමට ඉඩදීමට ඇති හැකියාවේ ප්‍රමාණයට හඳුනාගනු ලැබෙයි.

වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක මට්ටමේ පවතින බවට අපේක්ෂිත බදු අනුපාත (සහ බදු නීති) පදනම්ව වත්කම උපලබ්ධි වන විට හෝ වගකීම නිරවුල් කරන විට වසර තුළ අදාළ කරගැනීමට අපේක්ෂිත බදු අනුපාතය මත විලම්බිත බදු වත්කම් සහ වගකීම් ගණනය කරනු ලැබෙයි.

සම කොටස්වල සෘජුවම හඳුනාගත් අයිතමයන්ට අදාළ පවතින බදු සහ විලම්බිත බදු සම කොටස්වල යළි හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශය තුළ හඳුනානොගනියි.

බදු අයකළ හැකි ආයතනයට සහ එම බදුකරණ අධිකාරියට අදාළ පවතින බදු වගකීම් වලට සහ විලම්බිත බදු වලට එදිරිව පවතින බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව බලාත්මක වන අයිතියක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබෙයි.

3.1.10.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු

මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කරන්නේ 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සහ එහි ඊට පසුව කරන ලද සංශෝධනවලට අනුකූලව වෙයි. මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ පදනම වන්නේ එකතු කළ අගය මත බද්දට පෙර ගිණුම්ගත ලාභය සහ නියමිත අනුපාතයන්ට අනුව ගණනය කළ සේවක පාරිශ්‍රමික සහ ආර්ථික ක්ෂයවීම් සඳහා ගළපන ලද ආදායම් බදු වෙයි.

3.1.10.4 මූල්‍ය සේවා මත අයකරන ජාතිය ගොඩනැඟීමේ බද්ධ (NBT)

ජාතිය ගොඩනැඟීමේ බද්ද ගණනය කරන්නේ 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැඟීමේ බදු පනත හා 2014 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක ඊට කරන ලද සංශෝධන වලට අනුකූලව වෙයි. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැඟීමේ බද්ද ගණනය කරනු ලබන්නේ මූල්‍ය සේවා මත එකතු කළ අගය බදු මත සඳහා භාවිතා කරන ලද අගය එකතු කිරීමෙන් 2% වශයෙනි.

3.1.10.5 ලාභාංශ මත රැඳවුම් බද්ද (WHT)

දේශීය පරිපාලිත සමාගම්වල බදු අය කළ හැකි ලාභයෙන් බෙදාහරින ලාභාංශ මුලාශ්‍රයේදීම 10% ක අඩු කිරීමක් සිදුකරගන්නා අතර බැංකුවේ බදු වගකීම්වලට එදිරිව හිලව් කිරීමක් සිදුනොවේ.

	20,000,000	2,000,000,000	**2,000,000,000**	2,000,000,000			

31. ප්‍රවර්තන බදු වගකීම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ජනවාරි මස 1 වන දිනට ශේෂය	365,502,454	295,870,977
වසර සඳහා ලාභය මත පදනම් වර්තන බදු (සටහන 14)	1,072,147,126	978,574,649
පසුගිය වසර සම්බන්ධයෙන් වැඩිපුර වෙන් කිරීම (සටහන 14)	(5,503,331)	(11,709,571)
බදු ගෙවීම	(958,313,173)	(897,233,601)
එකතුව	473,833,076	365,502,454

32. වෙනත් වගකීම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
මූල්‍ය වගකීම්		
විවිධ ණය හිමියන්	129,239,225	167,509,776
වෙනත් ගෙවිය යුතු දෑ	1,585,380,091	1,630,373,968
මාර්ගස්ථ අන්තර් බැංකු ගනුදෙනු	60,604	838,179
	1,714,679,920	1,798,721,924
මූල්‍ය නොවන වගකීම්		
වෙනත් ගෙවිය යුතු දෑ	743,890,842	521,804,392
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ වෙන්කිරීම – ණය ආශ්‍රිත බැඳීම් සහ අසම්භාව්‍යතා	1,715,667	අදාල නැත
	745,606,509	521,804,392
එකතුව	2,460,286,430	2,320,526,315

33. විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් (සටහන 33.1)	1,926,924,377	1,695,894,720
	1,926,924,377	1,695,894,720

33.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගත් ශුද්ධ වත්කම්/(වගකීම්)

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය	1,695,894,720	1,278,903,024
වර්ෂය තුළදී සිදුකළ වෙන්කිරීම් (සටහන 33.2)	265,384,959	227,861,027
ඉල්ලා අස්වූ සේවකයින් සඳහා ගෙවිය යුතු	(19,832,817)	–
බැඳීම් මත ශුද්ධ ආයුගණක (ලාභය)/අලාභය (සටහන 33.3)	111,149,773	236,286,599
	2,052,596,635	1,743,050,650
බැංකුව විසින් ගෙවන ලද ප්‍රතිලාභ	(125,672,259)	(47,155,929)
	1,926,924,376	1,695,894,720

33.2 ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනීම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ප්‍රවර්තන සේවා පිරිවැය	178,400,760	80,787,179
පොළී පිරිවැය	86,984,199	147,073,848
ආදායම් ප්‍රකාශය තුළ මුළු හඳුනාගැනීම්	265,384,959	227,861,027

33.3 වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනීම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
බැඳීම් මත ශුද්ධ ආයුගණක (ලාභ)/අලාභ	111,149,773	236,286,599
වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ මුළු හඳුනාගැනීම්	111,149,773	236,286,599

33.4 වෘත්තීය ජීවගණකයෙකු වන ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පෞද්ගලික) සමාගම විසින් 2018 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික අරමුදල සඳහා ජීවගණන අගය කිරීම සිදුකරන ලදී. මෙහිදී ජීවගණක විසින් අරමුදල තක්සේරු කිරීම සඳහා තක්සේරු ක්‍රමය ලෙස ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 19 (සේවක ප්‍රතිලාභ) හි දක්වා ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගෙන ඇත.

ජීවගණන උපකල්පිතය	2018	2017
දෙසැම්බර් 31 දිනට වට්ටම් අනුපාතය	11.50%	10.30%
අනාගත වැටුප් වර්ධක අනුපාතය	8% (2021 ජනවාරි 1 දිනට නියමිත වැඩිවීම සමඟ සෑම වසර 3 කට වරක්)	8% (2018 ජනවාරි 1 දිනට නියමිත වැඩිවීම සමඟ සෑම වසර 3 කට වරක්)
මරණ අනුපාතය	A1967/70 මරණ අනුපාත ලැයිස්තුව	A1967/70 මරණ අනුපාත ලැයිස්තුව
විශ්‍රාමික වයස	අවුරුදු 60	අවුරුදු 57
සක්‍රියව සහභාගිවන්නන්ගේ අපේක්ෂිත අනාගත සාමාන්‍ය වැඩකරන ජීවකාලය අවුරුදු 15 කි. (2017 දී අවුරුදු 14)		

33.5 ආයුගණක තක්සේරුවේදී භාවිත කරන ලද උපකල්පනවල සංවේදීතාව

පාරිතෝෂික වගකීම ගණනය කිරීමේදී අනිකුත් සියලු විචල්‍යන් ස්ථාවර යැයි උපකල්පනය කරමින් යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනවල සාධාරණව විය හැකි වෙනසකට සංවේදීතාව පහත වගුව පෙන්නුම් කරයි.

මුළු විස්තීර්ණ ආදායමෙහි සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සංවේදීතාව යනු වට්ටම් අනුපාතිකයෙහි සහ වැටුප් වර්ධක අනුපාතිකයෙහි උපකල්පිත වෙනස්කම් වර්ෂය වෙනුවෙන් මුළු විස්තීර්ණ ආදායම සහ සේවක ප්‍රතිලාභ බැඳීම මත ඇතිකරන බලපෑම වේ.

		2018		2017	
වට්ටම් අනුපාතිකයෙහි වැඩි වීම/(අඩු වීම)	වැටුප් වර්ධක අනුපාතිකයෙහි වැඩි වීම/(අඩු වීම)	ආදායම් ප්‍රකාශය මත සංවේදීතාව බලපෑම වර්ෂය සඳහා ප්‍රතිඵල වල වැඩි වීම/(අඩු වීම) රු.	නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය බැරකමෙහි වැඩි වීම/(අඩු වීම) රු.	ආදායම් ප්‍රකාශය මත සංවේදීතාව වර්ෂය සඳහා ප්‍රතිඵල වල වැඩි වීම/(අඩු වීම) රු.	නිශ්චිත ප්‍රතිලාභ වර්තමාන අගය බැරකමෙහි වැඩි වීම/(අඩු වීම) රු.
1%	–	127,505,630	(127,505,630)	91,608,580	(91,608,580)
(1%)	–	(144,428,389)	144,428,389	(103,547,903)	103,547,903
–	1%	(156,697,174)	156,697,174	(112,448,206)	112,448,206
–	(1%)	140,131,523	(140,131,523)	101,046,505	(101,046,505)

34. ප්‍රකාශිත ප්‍රාග්ධනය

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
සාමාන්‍ය කොටස්		
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය (සාමාන්‍ය කොටස් 137,093,693)	3,870,936,931	1,370,936,931
කොටස් නිකුතුව*	4,176,292,999	2,500,000,000
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	8,047,229,930	3,870,936,931

*2018 දෙසැම්බර් 31 දින, රු. 4,176,293,000.00ක වටිනාකම සඳහා බැංකුවේ කොටස් නිකුතුවක් මගින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ පාලන හිමිකම සහිත කොටස් අයිතිය 100%ක් බැංකුව විසින් අත්කර ගන්නා ලදී. නිකුත්කළ කොටස් ගණන 158,013,356ක් විය.

35. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	663,652,150	599,455,675
කාලපරිච්ඡේදය තුළ පැවරීම්	53,679,318	64,196,475
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	717,331,468	663,652,150

36. රඳවාගත් ආදායම්

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය	1,716,908,747	988,284,444
වර්ෂය සඳහා ලාභය	1,073,586,361	1,283,929,506
වෙනත් විස්තීර්ණ ආදායම්	(80,027,837)	(170,126,351)
වෙනත් සංචිත වෙත පැවරීම්	(322,075,908)	(385,178,851)
SLFRS 9 යොදා ගැනීමේ බලපෑම (සටහන 4)	(72,485,552)	–
දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	2,315,905,812	1,716,908,747

37. වෙනත් සංචිත

(අ) බැංකුව – ප්‍රවර්ථන වර්ෂය (2018)

	ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය රු.	සංචලන/ මාරුකිරීම් රු.	දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය රු.
පොදු සංචිතය	2,843,208,353	214,717,272	3,057,925,624
විශේෂ සංචිත අරමුදල	518,042,478	53,679,318	571,721,796
එකතුව	3,361,250,831	268,396,590	3,629,647,420

(ආ) බැංකුව – පෙර වර්ෂය (2017)

	ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය රු.	සංචලන/ මාරුකිරීම් රු.	දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය රු.
පොදු සංචිතය	2,586,422,452	256,785,901	2,843,208,353
විශේෂ සංචිත අරමුදල	453,846,003	64,196,475	518,042,478
එකතුව	3,040,268,455	320,982,376	3,361,250,831

පොදු සංචිතය යනු රඳවාගත් ලාභ ගිණුමෙන් ලාභයෙන් යම්කිසි ප්‍රමාණයක් පොදු සංචිතයට හුවමාරු කිරීමේ ප්‍රතිඵලයකි. පොදු සංචිතය පිහිටුවීමේ අරමුණ වන්නේ ඇතිවීමට ඉඩ ඇති අනාගත නොදන්නා බැරකම් වෙනුවෙන් වියදම් දැරීමයි.

38. අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්

බැංකුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදු කිරීමේ දී, ගනුදෙනුකාර හවතුන්ගේ මූල්‍ය හා ආයෝජන අවශ්‍යතාවන්ට ඉඩ සැලසීම, වෙළඳ කටයුතු සිදු කිරීම සහ තමන්ගේම අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීම සඳහා සිය ගනුදෙනුකාර හවතුන්ට නෛතික උපයෝජනය සහිත බැඳීම් භාර ගැනීම සහ අසම්භාව්‍ය බැරකම්වලට යටත් වීම සිදු කරයි. මෙම මූල්‍ය සාධන පත්‍ර පොළී හෝ ගාස්තු උත්පාදනය කරන අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වත්කම් සහ බැරකම් ලෙස හඳුනාගත් මෙම අගයන්ට වැඩියෙන් ණය අවදානම ධාරණය කරයි. කෙසේවෙතත්, මෙම ගනුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස කිසිදු සැලකිය යුතු අලාභ අපේක්ෂා නොකෙරේ.

මෙම අසම්භව්‍යතා සහ බැඳීම් පහත ප්‍රමාණනය කර ඇත:

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.	2017 රු.
ඇප බැඳුම්කර කාර්යසාධනය	130,591,381	133,565,207
වෙනත් අවිනිශ්චිත අයිතම	83,883,453	272,995,965
අඩුකළා: අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය – ඇප	(1,715,667)	n/a
මුළු එකතුව	212,759,167	406,561,172

38.1 ණය අලාභ සඳහා නිරාවරණය මත පදනම් වී ස්ථාවර තැන්පතුවල ආයෝජනය පිළිබඳ විශ්ලේෂණය

2018 දෙසැම්බර් 31 වැනි දිනට	අදියර 1 රු.	අදියර 2 රු.	අදියර 3 රු.
ඇප සහ කාර්යසාධක බැඳුම්කර	–	130,591,381	130,591,381
අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය (සටහන 38.1.1)	–	(1,715,667)	(1,715,667)
	–	128,875,714	128,875,714

38.1.1 අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය – ස්ථාවර තැන්පතුවල ආයෝජනය

දෙසැම්බර් 31 වැනි දිනට	2018 රු.
ජනවාරි 1 දිනට ශේෂය	1,228,713
වසර සඳහා අයකිරීම	486,954
වසර තුළ කපාහැරි ප්‍රමාණය	–
විනිමය හුවමාරු අනුපාත වෙනස්වීම් ඇතුළුව අනෙකුත් ගැලපීම්	–
	1,715,667

38.2 බැංකුවට එරෙහි නෛතික වගකීම

සිදුකරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හේතු කොට ගෙන බැංකුකරණ ක්ෂේත්‍රය තුළ නඩුකිම යනු පොදු සිදුවීමකි. නෛතික හිමිකම් කළමනාකරණය සඳහා බැංකුවට විධිමත් පාලන සහ ප්‍රතිපත්ති ඇත. වෘත්තිය උපදේශ ලබාගෙන ඇති විට සහ අලාභ ප්‍රමාණය සාධාරණව ඇස්තමේන්තුකළ පසු, බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි බලපෑමක් තිබිය හැකි හිමිකම්පෑම්වල අහිතකර බලපෑම් ගණනය කිරීමට බැංකුව ගැලපීම් සිදුකරයි. වසර අවසානයේදී, බැංකුවට නෛතික හිමිකම්පෑම් කිහිපයක් තිබුණි.

(1) අභියාචනාධිකරණය – කොළඹ – CA (Writ) 84/2014

මෙම නඩුව බැංකුවේ සේවිකාවක්වන ඩී.ජී.එල්. ජයන්ති මහත්මිය විසින් වැටුප් වර්ධක දෙකක් සහ වසර පහක කාලයක් සඳහා උසස්වීම් නැවැත්වීම සඳහා සම්බාධක ඇතුළුව ඇය වෙත දෙන ලද විනයානුකූල ලිපිය අවලංගු කරන මෙන් සර්ටියෝරාරි පහිණයක් නිකුත් කරන මෙන් ඉල්ලා ගොනු කර ඇත. පෙත්සම මගින් ඇය බැංකුවේ විනය සංග්‍රහයේ වලංගුතාව පිළිබඳ තර්ක කර ඇත. මෙම නඩුවේ ලිඛිත ඉදිරිපත් කිරීම ගොනු කිරීමට 2019 මාර්තු 25 දින නියම කරන ලදී. අධිකරණය විනය නියෝගයේ වලංගුතාව සලකා බලා එහි තීරණය ලබා දෙනු ඇතැයි අපගේ මතය වේ.

(2) අභියාචනාධිකරණය – කොළඹ – CA(Writ) 343/2014

මෙම නඩුව බැංකුවේ සේවිකාවක්වන එච්.එම්.එන්.එම්. හේරත් මහත්මිය විසින් ඇය වෙත දෙන ලද විනයානුකූල ලිපිය අවලංගු කරන මෙන් සර්ටියෝරාරි පහිණයක් නිකුත් කරන මෙන් ඉල්ලා ගොනු කර ඇති අතර පෙත්සම මගින් ඇය බැංකුවේ විනය සංග්‍රහයේ වලංගුතාව පිළිබඳ තර්ක කර ඇත. තීරණය 2019 මාර්තු 28 දින ලබා දෙනු ලැබේ. එහි තීරණය අපට පක්ෂපාතීව ලැබෙනු ඇතැයි අපගේ මතය වේ.

(3) අභියාචනාධිකරණය – කොළඹ – CA(Writ) 191/2014

මෙම නඩුව බැංකුවේ සේවකයෙක් වන එම්.කේ. ෆැන්සිස් මහතා විසින් ගොනු කර ඇත. වනික් ඉන්කෝපරේෂන් හී ඔහු විසින් සිදුකර තිබූ නීති විරෝධී ආයෝජන වෙනුවෙන් ඔහුගේ සේවය අවසන් කරන ලද අතර මාතර කම්කරු විනිශ්චය සභාව විසින් ඔහුව නැවත සේවයේ පිහිටුවන මෙන් එහි නියෝගය ලබා දී තිබුණී. ඔහු 3-1 ශ්‍රේණියේ නැවත සේවයේ පිහිටුවන ලද අතර ඔහුගේ ඉල්ලීම වන්නේ බැංකුව විසින් ප්‍රධාන කළමනාකාර ශ්‍රේණියේ ඔහුව නැවත සේවයේ පිහිටුවිය යුතු බවයි. මෙම නඩුව 2019 මැයි 17 දින විමසීම සඳහා නියම කරන ලදී.

(4) අභියාචනාධිකරණය – කොළඹ – CA(Writ) 366/2014

මෙම නඩුව බැංකුවේ සේවකයෙක් වන පී. වගාච්චි මහතා විසින් ඔහුගේ වැඩ තහනම් කිරීමේ නියෝග තීරණය අවලංගු කිරීමට සර්ටියෝරාරි පහිණයක් නිකුත් කරන මෙන් ඉල්ලා ගොනු කර ඇත. තිස්සමහාරාම ශාඛාවේදි සිදුකරන ලද මූල්‍ය විෂමාචාර හේතු කොට ගෙන ඔහුගේ වැඩ තහනම් කරන ලදී. ඔහුට විරුද්ධව අභ්‍යන්තර පරීක්ෂණය තුළ වැඩදුර පියවර ගැනීම වලක්වමින් අතුරු තහනම් නියෝගයක් අධිකරණය නිකුත් කර ඇත. මෙම නඩුවේ ලිඛිත ඉදිරිපත් කිරීම ගොනු කිරීමට 2019 මාර්තු 25 දින නියම කරන ලදී. CA(Writ) 343/2014 කාරණය සම්බන්ධ තීරණය අපට පක්ෂපාතී වන්නේනම්, එය මෙම නඩුව සඳහා ද පූර්වාදර්ශයක් වනු ඇති බව අපගේ මතය වේ.

(5) ශ්‍රේෂ්ඨාධිකරණය – SC/HC/CALA/114

ඔමෙම නඩුව අභියාචන නඩුවක් වන අතර එයින් ට්‍රැක්ටරයක් මිලදී ගැනීමට ලබාදෙන ලද ණය මුදලක් ආපසු අයකරගැනීමක් සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ සිවිල් අභියාචනා පිළිබඳ මහාධිකරණයේ තීන්දුවට එරෙහිව බැංකුව අභියාචනය කර ඇත. මෙම නඩුව පොලොන්නරුව දිස්ත්‍රික් උසාවියේ 1990 අංක 2 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ගොනු කරන ලද අතර තීන්දුව පැමිණිලිකරුට පක්ෂපාති විය. දිස්ත්‍රික් උසාවියේ තීරණය සහ සිවිල් අභියාචනා පිළිබඳ මහාධිකරණයේ තීන්දුවට එරෙහිව බැංකුව අභියාචනා කරන ලදී. මෙම කරුණ 2019 ජූනි 10 දින විවාදයට ගැනීමට නියම කරන ලදී. අපගේ ලියවිලිවල දුර්වලතා හේතු කොට ගෙන මෙම තීරණය අපට පක්ෂපාති නොවනු ඇති බව අපගේ මතය වේ.

(6) ශ්‍රේෂ්ඨාධිකරණය – SC/Appeal/179/16

මෙය ඒ. පේමදාස මහතා විසින් ගන්නා ලද ණය සඳහා ඇපයක් ලෙස බැංකුවට උකස් කර තිබුණු ඉඩමේ අයිතිකරුවන එස්. ධම්මික මහතාට තංගල්ල සිවිල් අභියාචනා පිළිබඳ මහාධිකරණ විසින් පක්ෂව දෙන ලද තීන්දුවට එරෙහිව අභියාචනා නඩුවට අවසරයකි. උකස්කරු ගෙවීම් පැහැර හැරි විට, බැංකුව 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ඉඩම වෙන්දේසි කරන ලද අතර එච්. ආරියදාස මහතා විසින් ඉඩම මිලදී ගන්නා ලදී. සිවිල් අභියාචනා පිළිබඳ මහාධිකරණයේ මතය වූයේ යම් තෙවන පාර්ශ්වයක් විසින් අයත්කරගත් ඉඩමක් වෙන්දේසි කළ නොහැකි බවයි. එච්. ආරියදාස මහතා එකි නියෝගයට එරෙහිව අභියාචනය කරන ලදී. යම් තෙවන පාර්ශ්වයක් විසින් අයත්කරගත් ඉඩමක් වෙන්දේසි කළ නොහැකි බවට අධිකරණයේ මතය වන්නේනම්, ආරියදාස මහතා බැංකුවෙන් වන්දි ඉල්ලා සිටින බවයි.

(7) ශ්‍රේෂ්ඨාධිකරණය – SC/CALA/Appeal 168(2016)

රජරට සංවර්ධන බැංකුවේ සේවිකාවක් වූ කේ.ජී.පී.එම්. නිර්මලතා මහත්මිය විසින් එකී බැංකුව තුළ සේවය කරමින් සිටින විට ඇයගේ රැකියාවේ වරප්‍රසාද අහිමිවීම වෙනුවෙන් 21814/එම් අංකය යටතේ අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ නඩුවක් ගොනු කර ඇත. රජරට සංවර්ධන බැංකුව වෙනුවට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ආදේශ කිරීම සඳහා විරෝධතාවක් බැංකුව ගොනු කර ඇත. කෙසේ වෙතත්, දිස්ත්‍රික් උසාවිය මෙන්ම සිවිල් අභියාචන මහාධිකරණය විසින් එම විරෝධතාව පිළි නොගන්නා ලදී. එම තීරණයෙන් අගතියට පත්ව, බැංකුව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කර ඇති අතර එය 2019 සැප්තැම්බර් 23 දින විවාදයට ගැනීම සඳහා නියම කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අපට පක්ෂපාති නොවනු ඇති බව අපගේ මතය වේ.

(8) ශ්‍රේෂ්ඨාධිකරණය – SC Appeal 39/2016

විසිදාගම මහතාගේ සේවය අවසන් කිරීමට විරුද්ධව ඔහු වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය විසින් ඔහුව නැවත සේවයේ පිහිටුවන මෙන් ඉල්ලා බදුල්ල කම්කරු විනිශ්චය සභාව වෙත අයදුම්පතක් ගොනු කරන ලදී. කම්කරු විනිශ්චය සභාව විසින් විසිදාගම මහතාට පක්ෂව එහි තීන්දුව දී ඇති අතර බැංකුව බදුල්ල දිස්ත්‍රික් උසාවියට සහ පසුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචන කරන ලදී. 2019 ජූලි 2 දින විවාදයට ගැනීම සඳහා නියම කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අපට පක්ෂපාති නොවනු ඇති බව අපගේ මතය වේ.

(9) කම්කරු විනිශ්චය සභාව – කොළඹ නඩු අංකය – Case No. LT 01/57/2011

මෙම කම්කරු විනිශ්චය සභා අයැදුම යූ.බී. රංජිත් මහතාගේ සේවය අවසන් කිරීමට විරුද්ධව ඔහු වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය (CBU) විසින් ඔහුව නැවත සේවයේ පිහිටුවන මෙන් හෝ වන්දි ලබාදෙන මෙන් ඉල්ලා ගොනු කරන ලදී. පාලකුඩා ශාඛාවේදී ඔහු විසින් සිදුකරන ලද මූල්‍ය විෂමාචාර සඳහා ඔහුගේ සේවය අවසන් කරන ලදී. මෙම කාරණයේදී, කම්කරු විනිශ්චය සභාව බැංකුවට පක්ෂපාතීව එහි තීරණය ලබා දී ඇති අතර ලංකා බැංකු සේවක සංගමය කොළඹ මහාධිකරණයේ අභියාචනය කර ඇති අතර එම අභියාචන කරුණ මෙතෙක් ආරම්භ කර නොමැත. අභියාචනය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(10) කම්කරු විනිශ්චය සභාව – කුලියාපිටිය – 46/කුලි/03/2016

මෙය කුලියාපිටිය කම්කරු විනිශ්චය සභාව වෙත ඩී.එම්.පී. රුක්මල් දසනායක මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම සහ පසුගිය වැටුප් ඉල්ලා සිදුකරන ලද අයැදුමකි. මෙහි ඊලඟ දිනය 2019 මාර්තු 12 වේ. බැංකුවට ඔහුගේ විෂමාචාර ඔප්පු කිරීමේ ස්ථාවරයක් නොමැති බැවින්, අධිකරණය නැවත සේවයේ පිහිටුවීමක් නියෝග කරනු ඇති බව අපගේ මතය වේ.

(11) කම්කරු විනිශ්චය සභාව – මීගමුව – 21/386/2016

ජේ.එස්. පතිරණ මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලමින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 අප්‍රේල් 2 දින නියම කරන ලදී. බැංකුවට අභියාචක විසින් සිදුකරන ලද විෂමාචාර ඔප්පු කිරීමට හැකි වන බව අපගේ මතය වේ.

(12) කම්කරු විනිශ්චය සභාව – මහනුවර – 03/248/08

කේ.බී.එම්. කපිල ප්‍රදීප්ත මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව මෙම නඩුව ගොනු කර ඇති අතර ඔහු නැවත සේවයේ පිහිටුවීම සහ පසුගිය වැටුප් ඉල්ලා ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 පෙබරවාරි 5 දින නියම කරන ලදී.

(13) කම්කරු විනිශ්චය සභාව – කළුතර – 18/KT/351

එච්.ඒ.ආර්. සිල්වා මහතා විසින් මෙම අයැදුම කලුතර කම්කරු විනිශ්චය සභාව වෙත සිදුකර ඇත. බේරුවල ශාඛාවේදී ඔහු විසින් සිදුකරන ලද මූල්‍ය විෂමාචාර හේතු කොට ගෙන ඔහුගේ සේවය අවසන් කරන ලදී. ඔහු නැවත සේවයේ පිහිටුවීම සහ පසුගිය වැටුප් ඉල්ලා ඇත. මේ අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහු විසින් සිදුකරනු ලබන වංචාව සඳහා කලුතර මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් ගොනු කර ඇත. කම්කරු විනිශ්චය සභාවේ කාරණය මහේස්ත්‍රාත් උසාවියේ කාරණය අවසන් වන තුරු පසෙකින් තබන ලදී. තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(14) කම්කරු විනිශ්චය සභාව – රත්නපුර – 6R/7569/17

බැංකුවේ සේවිකාවක් වන එම්. වික්‍රමසූරිය මහත්මිය විසින් ඇයගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා සිටිමින් මෙම අයදුම ගොනු කර ඇත. ඇය විසින් සිදුකරන ලද මූල්‍ය විෂමාචාර හේතු කොට ගෙන ඇයගේ වැඩ තහනම් කරන ලදී. මෙම නඩුව විමසීම සඳහා 2019 අප්‍රේල් 26 දින නියම කරන ලදී. බැංකුවට අභියාචක විසින් සිදුකරන ලද විෂමාචාර ඔප්පු කිරීමට හැකි වන බව අපගේ මතය වේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැල්මඩුල්ල මහේස්ත්‍රාත් උසාවියේ ඇයට විරුද්ධ නඩුවක් ගොනු කර ඇත.

(15) කම්කරු විනිශ්චය සභාව – කලුතර – 18/KT/734

බැංකුවේ සේවකයෙක් වන අරුණ ශාන්ත මහතා විසින් නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා සිටිමින් මෙම අයදුම ගොනු කර ඇත. ඔහු 2013 වසර සඳහා සේවයට වාර්තා කර නොමැත. මෙම අයැදුම පරිදි, මෙය ඔහුගේ වෛද්‍ය කොන්දේසි නිසා සිදුවී ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 අප්‍රේල් 4 දින නියම කරන ලදී. තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(16) කම්කරු විනිශ්චය සභාව – මීගමුව – 21/475/2017

එල්.ඒ.එස්. ගුණරත්න මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලමින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 අප්‍රේල් 1 දින නියම කරන ලදී. බැංකුවට විත්තිය වෙනුවෙන් පෙනී සිටීමට හැකි වන බව අපගේ මතය වේ.

(17) කම්කරු විනිශ්චය සභාව – කලුතර – 18/KT/748/18

තේ පිළියෙල කිරීම සහ ගොඩනැගිල්ල පිරිසිදු කිරීම සඳහා සහයවීමට බදුරලිය ශාඛාවට පැමිණි එච්.ඩී. මාලනී මහත්මිය විසින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 අප්‍රේල් 4 දින නියම කරන ලදී. තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(18) කම්කරු විනිශ්චය සභාව – බදුල්ල – 05/20573/2018

සෝමරත්න මහතා විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලමින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2018 අප්‍රේල් 24 දින නියම කරන ලදී. තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(19) කම්කරු විනිශ්චය සභාව – මහනුවර – 03/20/2018

වී.පී.එන්.ආර්. රණසිංහ මහතා වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය විසින් ඔහුගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලමින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 මාර්තු 14 දින නියම කරන ලදී. බැංකුවට අභියාචක විසින් සිදුකරන ලද විෂමාචාර ඔප්පු කිරීමට හැකිවුවහොත්, තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(20) කම්කරු විනිශ්චය සභාව – පලාපත්වල – 39/07/2015

ඩබ්ලිව්.එම්.පී.පී. වීරකොන් මහත්මිය විසින් ඇයගේ සේවය අවසන් කිරීමට විරුද්ධව සහ නැවත සේවයේ පිහිටුවීම ඉල්ලමින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 මාර්තු 19 දින නියම කරන ලදී. බැංකුවට අභියාචක විසින් සිදුකරන ලද විෂමාචාර ඔප්පු කිරීමට හැකිවුවහොත්, තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

(21) දිස්ත්‍රික් උසාවිය - කොළඹ නඩු අංකය: DMR 2230/2011

ඉමදූව ශාඛාවේ ගනුදෙනුකරුවෙක් වන, කේ.කේ.ජී.ඩී.ආර්.එස්. විජේතිලක මහත්මිය විසින් ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනත් ගනුදෙනුකරුවෙකුගේ ජාතික හැඳුනුම්පත් අංකයට පිටපත් කිරීම මගින් සහ ණය තොරතුරු කාර්යාංශයට ඇය පැහැර හැරි ගනුදෙනුකරුවෙක් ලෙස ඇය වාර්තා කිරීම වෙනුවෙන් ඇති වූ අපකීර්තිය වෙනුවෙන් රු. 20,000,000.00 ක් අලාභයක් ඉල්ලා සිටිමින් මෙම නඩුව ගොනු කර ඇත. තීන්දුව 2019 අප්‍රේල් 3 දින ලබා දෙනු ලැබේ. අපකීර්තිය සම්බන්ධයෙන් නෛතික අවශ්‍යතා ස්ථාපිත කිරීමට පැමිණිලිකාරිය අසමත් වන බවට සහ තීන්දුව අපට පක්ෂව ලැබෙනු ඇති බව අපගේ මතය වේ.

(22) දිස්ත්‍රික් උසාවිය – අනුරාධපුරය – 20324/M

ට්‍රැක්ටරයක් මිලදී ගැනීමට බැංකුවෙන් ණයක් ලබා ගෙන ඇති තම පියාවන එන්.ජී. රණසිංහ මහතාගේ මරණය වෙනුවෙන් අලාභ ඉල්ලා පැමිණිලිකරුවන, අනුර රණසිංහ මහතා විසින් බැංකුවට එරෙහිව මෙම නඩුව ගොනු කර ඇත. අලාභ ලෙස රු. 2,000,000.00ක් ඔහු ඉල්ලා ඇත. මෙම නඩුව විමසීම සඳහා 2019 ජූනි 11 දින නියම කරන ලදී. පැමිණිලිකරුට අපකීර්තිය සම්බන්ධයෙන් අවශ්‍යතා ස්ථාපිත කිරීමට නොහැකිවන බවට අපගේ මතය වේ.

(23) වාණිජ මහාධිකරණය – කොළඹ – CHC/338/2015/MR

රු. 8,500,000.00ක ණයක් සඳහා උකස්කළ දේපල වෙන්දේසි කිරීමට විරුද්ධව එස් ඇන්ඩ් එච් ක්‍රියේෂන් (පුද්ගලික) සමාගම විසින් මෙම නඩුව ගොනු කර ඇති අතර වෙන්දේසිය පැවැත්වීම තහනම් කරමින් උසාවිය අතුරු නියෝගයක් නිකුත් කර ඇත. මෙම නඩුව විමසීම මත නිරවුල් කිරීම සඳහා 2019 මාර්තු 21 දින නියම කරන ලදී.

(24) වාණිජ මහාධිකරණය – කොළඹ – CHC/92/2018/MR

රු. මිලියන 5ක ණයක් සඳහා උකස්කර ඇති උකස්කළ දේපල වෙන්දේසි කිරීම වැලැක්වීම සඳහා මැදිරිගිරිය ශාඛාවේ ගනුදෙනුකරුවන් දෙදෙනෙක් විසින් මෙම නඩුව ගොනු කර ඇත. මෙම කරුණ නියෝගය සඳහා 2019 අප්‍රේල් 30 දින නියම කරන ලදී. තීරණය බැංකුවට පක්ෂපාතීව ලැබෙනු ඇති බවට අපගේ මතය වේ.

39. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

"සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – 24 හි සම්බන්ධිත පාර්ශ්ව ලෙස නිර්වචනය කරනු ලැබ ඇති පාර්ශ්ව, එනම් සැලකිය යුතු ආයෝජකයන්, ප්‍රධාන කළමනාකරණ පිරිස්, ප්‍රධාන කළමනාකරණ පිරිස්වල සමීප පවුලේ සාමාජිකයන් සහ වෙනත් සම්බන්ධිත ආයතන සමඟ බැංකුව ගනුදෙනු වලට එළඹී ඇත.

සහන අනුපාතික මත සියලු කාර්ය මණ්ඩලවලට ඒකාකාර ලෙස අදාළ වන යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සිදුකර ඇති ගනුදෙනු හැරුණු කොට, ණය දීමේ ක්‍රියාකාරකම්, පිළිගැනීම් හා ස්ථාපනය, ශේෂ පත්‍රයෙන් පිට ගනුදෙනු සහ වෙනත් බැංකු හා මූල්‍ය සේවා සාමාන්‍ය ව්‍යාපාර කටයුතු යටතේ අතේ දුරින් පදනම්න් වාණිජ අනුපාතික වලට යටත් ව සිදුකරනු ලැබේ.

39.1 මව් සහ අත්‍යන්තර පාලන පාර්ශ්වය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රජය සතු බැංකුවකි.

39.2 බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස

"සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ට අනුකූලව, බැංකුවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සම්බන්ධ බලතල සහ වගකීම ඇති තැනැත්තන් ප්‍රධාන කළමනාකරණ පිරිස ට අයත් වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්, අනුකූලතා නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, ප්‍රධාන කළමනාකරණ පිරිසට අයත් වේ.

39.2.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ප්‍රතිලාභ

	2018 රු.	2017 රු.
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	144,706,138	109,320,058
පශ්චාත් සේවක ප්‍රතිලාභ	–	–
එකතුව	144,706,138	109,320,058

39.2.2 බැංකුවේ ප්‍රධාන කළමනාකරුවන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සම්බන්ධ ගනුදෙනු, පිළියෙල කිරීම් සහ ගිවිසුම්

	2018 රු.	2017 රු.
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි අයිතම		
වත්කම්		
ණය සහ ලැබීම්	29,623,384	37,298,432
එකතුව	29,623,384	37,298,432
වගකීම්		
තැන්පතු	85,532,058	71,887,329
එකතුව	85,532,058	71,887,329
ලාභාලාභ හිණුමේ අයිතම		
පොළී ආදායම	2,004,840	2,622,421
පොළී වියදම	7,314,328	5,722,345
එකතුව	9,319,169	8,344,766

39.2.2.1 ප්‍රධාන කළමනාකරුවන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සඳහා ලබාදුන් පහසුකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි

ණය වර්ගය	වෙනත් නියමයන් හා කොන්දේසි	2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.	2018 දෙසැම්බර් 31 දින සුරකුම් විස්තර	
			වර්ගය	වටිනාකම රු.
කාර්ය මණ්ඩල නිවාස ණය	සේවකයන් සියලු දෙනාටම හෝ නිශ්චිත කාණ්ඩවලට හෝ ඒකාකාරව අදාළ වන අනුමත යෝජනා ක්‍රම යටතේ වන කාර්ය මණ්ඩල ණය හැරුණු කොට නියමයන් හා කොන්දේසි සම්බන්ධතාවක් නොමැති පාර්ශ්ව සමඟ සන්සන්දනීය ගනුදෙනුවල නියමයන්ට සමාන වේ.	10,574,977	ඉඩම්	58,959,538
කාර්ය මණ්ඩල වාහන ණය		8,125,751	මෝටර් රථ	16,993,763
මුදල් ආපසු ණය		2,335,800	ස්ථාවර තැන්පතු	2,748,000
පරිභෝජන හා වෙනත් ණය		8,586,856		
		29,623,384		

ණය වර්ගය	වෙනත් නියමයන් හා කොන්දේසි	2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.	2017 දෙසැම්බර් 31 දින සුරකුම් විස්තර	
			වර්ගය	වටිනාකම රු.
කාර්ය මණ්ඩල නිවාස ණය	සේවකයන් සියලු දෙනාටම හෝ නිශ්චිත කාණ්ඩවලට හෝ ඒකාකාරව අදාළ වන අනුමත යෝජනා ක්‍රම යටතේ වන කාර්ය මණ්ඩල ණය හැරුණු කොට නියමයන් හා කොන්දේසි සම්බන්ධතාවක් නොමැති පාර්ශ්ව සමඟ සන්සන්දනීය ගනුදෙනුවල නියමයන්ට සමාන වේ.	10,580,905	ඉඩම්	61,756,783
කාර්ය මණ්ඩල වාහන ණය		14,741,291	මෝටර් රථ	29,344,344
මුදල් ආපසු ණය		3,523,205	ස්ථාවර තැන්පතු	4,105,000
පරිභෝජන හා වෙනත් ණය		8,453,030		
		37,298,432		

ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMPs) සහ ප්‍රධාන මූල්‍ය කළමනාකරුවන් (CFMs) වෙත මුළු නිරාවරණය බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 0.3%ක් නියෝජනය කරයි.

39.2.3 මිලදී ගත් භාණ්ඩ හා සේවා

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට පාලනය හා/හෝ හවුල් පාලනය ඇති ආයතන වෙතින් වර්ෂය තුළ දී මිලට ගන්නා ලද භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර පහත දැක්වේ:

	2018 රු.	2017 රු.
භාණ්ඩ හා සේවා මිලදී ගැනීම්	–	2,649,210
එකතුව	–	2,649,210

39.3 සැලකිය යුතු ආයෝජකයා හා සම්බන්ධිත ආයතනය සමග ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි – LKAS 24 – 25 වැනි පරිච්ඡේදයට අනුව "සම්බන්ධිත පාර්ශව හෙළදරව්කිරීම"ට අනුව, ශ්‍රී ලංකා රජය, සැලකිය යුතු ආයෝජකයන් සහ එහි සම්බන්ධිත ආයතන සමඟ ගනුදෙනු සම්බන්ධයෙන් 18 වැනි පරිච්ඡේදය යටතේ හෙළිදරව් අවශ්‍යතාවයන්ගෙන් බැංකුව නිදහස්කර ඇත.

ශ්‍රී ලංකා රජයේ බැඳියාවක් පවතින ආයතන ගණනාවකට බැංකුවේ සැලකිය යුතු බැඳියාවන් ඇත.

බැංකුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 යටතේ තනිව වැදගත් වන ගනුදෙනු හා වෙනත් ගනුදෙනු සාමූහිකව හෙළිදරව් කර ඇති නමුත් සැලකිය යුතු ආයෝජක සහ එයට සම්බන්ධිත ආයතන සමඟ ගනුදෙනු තනි තනිව හෙළිදරව් කර නොමැත. බැංකුව ශ්‍රී ලංකා රජය හා එයට සම්බන්ධිත ආයතන සමඟ ගනුදෙනු, විධිවිධාන සහ ගිවිසුම් වලට එළඹී ඇත. වර්ෂය තුළ දී සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ දිනට සැලකිය යුතු මූල්‍ය ගනුදෙනු පහත සඳහන් පරිදි වේ.

	2018 රු.	2017 රු.
මහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂිත බදු	–	(125,000,000)
එකතුව	–	(125,000,000)

	හිඟ ශේෂය	
	2018 රු.	2017 රු.
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි අයිතම		
වත්කම්		
ණය සහ ලැබිය යුතු දෑ	278,035,660	320,379,150
එකතුව	278,035,660	320,379,150
වගකීම්		
තැන්පතු	26,084,007,658	20,072,193,145
එකතුව	26,084,007,658	20,072,193,145
ලාභාලාභ ගිණුමේ අයිතම		
පොළී ආදායම	16,426,398	47,231,606
පොළී වියදම	3,023,168,595	1,741,012,384
එකතුව	3,039,594,994	1,788,243,990

39.3.1 තවදුරටත් පහත පරිදි ශ්‍රී ලංකා රජය හා ඊට සම්බන්ධිත ආයතන සමඟ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ ගනුදෙනු සඳහා එළඹ ඇත:

භාණ්ඩාගාර බිල්පත් හා මුදල් වෙළඳපොළහි ආයෝජනය

ව්‍යවස්ථාපිත ගාස්තු හා වරිපනම් බදු ගෙවීම

ප්‍රධාන වශයෙන් දුරකථන, විදුලිය හා ජලය සමන්විත උපයෝගිතා සඳහා ගෙවීම්

විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා ගෙවීම් (සේවක ආර්ථ සාධක අරමුදල/සේවක භාරකාර අරමුදල)

39.4 සම්බන්ධිත පාර්ශ්ව සමඟ මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය

සේවකයන් සියලු දෙනාටම හෝ නිශ්චිත කාණ්ඩ වලට හෝ ඒකාකාරව අදාළ වන අනුමත යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට ප්‍රදානය කරන ලද අනුග්‍රහය හැරුණු කොට, සම්බන්ධතාවක් නොමැති සන්සන්දනීය පාර්ශව සමඟ ගනුදෙනුවල නියමයන්ට සමානවන නියමයන් හා කොන්දේසි සහිතව බැංකුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු වලට එළඹෙයි.

40. ඇප ලෙස ඔඩපනය කරන ලද වත්කම්

2018 සහ 2017 දෙසැම්බර් 31 දිනට බැරකම් වෙනුවෙන් අතිරේක ඇප ලෙස ඔඩපනය කර තිබූ, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගත් මුළු මූල්‍ය වත්කම් පහත වගුවල දැක්වේ:

2018

	පහසුකම් වර්ගීකරණය	පහසුකම් වටිනාකම රු. මිලියන	ආරක්ෂිතයේ වර්ග	සුරක්ෂිතයේ වටිනාකම රු. මිලියන	2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන
1	බැංකු අයිරාව (ලංකා බැංකුව)	1,326	FD 80912939	510.129	–
			FD 74353124	206.807	
			FD 82300125	242.000	
			FD 74817306	253.330	
			FD 74588793	236.170	
			FD 74619066	236.184	
2	බැංකු අයිරාව (මහජන බැංකුව)	200	FD – 14-6001-000131896	327.446	–

2017

	පහසුකම් වර්ගීකරණය	පහසුකම් වටිනාකම රු. මිලියන	ආරක්ෂිතයේ වර්ග	සුරක්ෂිතයේ වටිනාකම රු. මිලියන	2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන
1	බැංකු අයිරාව (ලංකා බැංකුව)	1,912	FD – 74353124	184.402	–
			FD – 81290454	242.000	
			FD – 74817306	225.483	
			FD – 74588793	208.884	
			FD – 74619066	208.897	
			FD – 80912939	510.129	
			FD – 79767742	650.000	
2	බැංකු අයිරාව (මහජන බැංකුව)	200	FD – 14-6001-000131896	327.446	–

41. බදු පෙර ලාභයට අයත් මූල්‍ය නොවන අයිතම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	2018 රු.	2017 රු.
දේපල, පිරියත හා උපකරණ ක්ෂය	24	291,335,272	285,315,658
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	25	27,685,466	40,785,417
සළුල පොළී අනුපාතික ගැලපීම්		126,180,269	(607,989)
හානිකරණ අයකිරීම්	10	1,409,784,095	443,866,831
උකස් ණය සඳහා ප්‍රාග්ධනිත අලාභ	12	–	30,828
ලිය ඉසුරු සාධාරණ මිල ගැළපීම		(97,919,405)	(53,347,726)
මහ භාණ්ඩාගාරයට ගෙවූ අය බදු		–	125,000,000
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණවල වෙනස්වීම්	8	30,900	7,700
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා අයකිරීම	11	265,384,959	227,861,027
අනිකුත් අරමුදල්වල හැසිරීම		(424,266)	9,282,836
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ/(අලාභ)	9	(11,206,047)	(860,208)
අක්‍රිය ණය අයකරගැනීම්		(1,733,639)	
එකතුව		2,009,117,605	1,077,334,374

42. මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2018 රු.	2017 රු.
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබියයුතු දෑ තුළ ශුද්ධ වෙනස	(7,444,837,849)	(22,245,731,384)
වෙනත් වත්කම්වල වෙනස්වීම්	(314,458,955)	(200,331,421)
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස – ණය සහ අනෙකුත් උපකරණ	0	(2,512,555,629)
එකතුව	(7,759,296,804)	(24,958,618,434)

43. මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	2018 රු.	2017 රු.
බැංකුවට ගෙවිය යුතු දෑ වල ශුද්ධ වෙනස	466,600,195	832,999,585
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ වල ශුද්ධ වෙනස	1,729,003,711	32,796,251,932
වෙනත් වගකීම්වල ශුද්ධ වෙනස්වීම්	139,760,114	913,375,655
එකතුව	2,335,364,021	34,542,627,172

44. මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

44.1 සාධාරණ අගයේ බල ධූරාවලිය

පළමු මට්ටම - අනන්‍ය උපකරණ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළෙහි ප්‍රකාශිත වෙළඳපොළ මිල (ගැළපීම් නොකරන ලද) යෙදවුම්

දෙවන මට්ටම - සෘජුව (මිල වශයෙන්) හෝ වක්‍රව (එනම් මිලෙන් ලබාගත්) නිරීක්ෂණය කළ හැකි පළමු මට්ටමේ ඇතුළත් කර ඇති ප්‍රකාශිත මිල ගණන් වලට අමතර යෙදවුම්. සමාන උපකරණ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළෙහි ඇති ප්‍රකාශිත වෙළඳපොළ මිල; අනන්‍ය හෝ සමාන උපකරණ සඳහා ප්‍රකාශිත මිල භාවිතා කරමින් ඇගයුමට ලක් කරන ලද උපකරණ මෙම වර්ගීකරණය තුළට ඇතුළත් වේ.

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්. නිරීක්ෂණය කළ හැකි දත්ත පදනම් කර නොගත් යෙදවුම් ඇතුළත් වන ඇගයුම් තාක්ෂණයන් සඳහා වන සියලු උපකරණ මෙම කාණ්ඩයට අයත් වන අතර නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වල උපකරණ තක්සේරුවේ සැලකිය යුතු බලපෑමක් තිබේ.

44.2 සාධාරණ අගය මත ගණනය කරන ලද මූල්‍ය උපකරණ

සාධාරණ වටිනාකම් මිනුම් වර්ගීකරණය කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලි මට්ටමින් සාධාරණ වටිනාකම මත වාර්තා කරන දිනයට වාර්තා වී ඇති මූල්‍ය උපකරණවල විශ්ලේෂණයක් පහත වගුවෙන් දක්වා තිබේ.

දෙසැම්බර් 31 වැනි දිනට	2018			
	පළමු මට්ටම රු.	දෙවන මට්ටම රු.	තෙවන මට්ටම රු.	එකතුව රු.
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	115,600	–	–	115,600
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	–	–	4,176,342,999	4,176,342,999
	115,600	–	4,176,342,999	4,176,458,599

දෙසැම්බර් 31 වැනි දිනට	2017			
	පළමු මට්ටම රු.	දෙවන මට්ටම රු.	තෙවන මට්ටම රු.	එකතුව රු.
අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම්	146,500	–	–	146,500
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්			50,000	50,000
	146,500	–	50,000	196,500

සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම් යනු ලැයිස්තුගත ස්කන්ධ සහ ලැයිස්තුගත නොකළ ස්කන්ධ වේ. ලැයිස්තුගත ස්කන්ධ සඳහා, වාර්තාකරණ දිනයට සක්‍රීය වෙළෙඳපොල තුළ ලැයිස්තුගත වෙළෙඳපොල මිල බැංකුව භාවිතා කරයි. සාධාරණ අගය විශ්වාසයෙන් අගය කළ නොහැකි බැවින් ලැයිස්තුගත නොකළ ස්කන්ධ පිරිවැයට අගය කරනු ලබයි.

44.3 සාධාරණ අගය මත ගණනය නොකරන ලද මූල්‍ය උපකරණ

පහත දක්වා ඇත්තේ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගය මත ගෙන නොගිය බැංකුවේ මූල්‍ය උපකරණ වල සාධාරණ අගයන්හි සහ ධාරණ අගයන් අතර පංති අනුව කරන ලද සන්සන්දනයකි.

		2018		2017	
	සාධාරණ අගය	ධාරණ අගය රු.	සාධාරණ අගය රු.	ධාරණ අගය රු.	සාධාරණ අගය රු.
මූල්‍ය වත්කම්					
මුදල් සහ මුදල් සමාන දෑ	දෙවන මට්ටම	689,184,136	689,184,136	572,294,808	572,294,808
බැංකු තැන්පතු	දෙවන මට්ටම	6,496,628,053	6,496,628,053	6,682,475,675	6,682,475,675
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස – ණය සහ අනෙකුත් උපකරණ	දෙවන මට්ටම	27,757,513,965	27,757,513,965	28,130,079,911	28,130,079,911
කල්පිරීම් සඳහා රඳවා ඇති මූල්‍ය ආයෝජන	දෙවන මට්ටම	අදාල නැත	අදාල නැත	2,512,362,500	2,512,362,500
වෙනත් ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ ලැබීම් - අපහායනය හැර					
උකස්	දෙවන මට්ටම	11,454,807,949	11,454,807,949	10,260,859,056	10,260,859,056
සේවක ණය	දෙවන මට්ටම	3,478,770,159	3,478,770,159	3,506,188,568	3,506,188,568
කෙටිකාලීන	දෙවන මට්ටම	9,181,224,723	9,181,224,723	7,891,927,873	7,891,927,873
දිගුකාලීන	දෙවන මට්ටම	113,654,880,532	113,654,880,532	108,665,870,018	108,665,870,018
වෙනත් වත්කම්	දෙවන මට්ටම	1,448,173,102	1,448,173,102	1,238,738,759	1,238,738,759
		174,161,182,619	174,161,182,619	169,460,797,167	169,460,797,167
මූල්‍ය වගකීම්					
බැංකුවලට ගෙවිය යුතු	දෙවන මට්ටම	11,098,334,822	11,098,334,822	10,729,312,134	10,729,312,134
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	දෙවන මට්ටම	141,559,973,557	141,559,973,557	139,827,364,797	139,827,364,797
නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල්	දෙවන මට්ටම	4,707,852,534	4,707,852,534	4,707,852,534	4,707,852,534
වෙනත් වගකීම්	දෙවන මට්ටම	1,714,679,920	1,714,679,920	1,798,721,924	1,798,721,924
		159,080,840,833	159,080,840,833	157,063,251,389	157,063,251,389

44.3.1 මූල්‍ය වත්කම් වල සාධාරණ අගය සහ සාධාරණ අගය මත ගෙන නොගිය වගකීම් සඳහා මිනුම් පදනම

සාධාරණ අගය ධාරණ අගයට ආසන්න වන වත්කම්

කෙටි කාලීන කල් පිරීමක් තිබෙන (මාස තුනකට අඩු) මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා ධාරණ අගය ඒවායෙහි සාධාරණ අගයට ආසන්න වන බව උපකල්පනය කෙරේ. මෙම උපකල්පනය ඉල්ලුම් තැන්පත් සහ විශේෂිත කල් පිරීමේ දිනයක් නොමැති ඉතිරිකිරීමේ ගිණුම් වලට ද අදාළ වේ.

ගනුදෙනුකරුවන් වෙත ලබාදී ඇති ණය සහ ලැබිය යුතුදෑ

ගනුදෙනුකරුවන්ට ඇති අත්තිකාරම් සහ ණය ආයෝජන වල සම්පූර්ණ ප්‍රමාණයෙන් 56% කට වඩා ප්‍රමාණයකට වසරකට වඩා අඩු කාලයක එකඟ වූ පරිණත දිනයක් තිබේ. එමනිසා ගනුදෙනුකරුවන්ට ඇති ණය සහ අත්තිකාරම් වල සාධාරණ වටිනාකම වාර්තා කරන දින වන විට ඔවුන්ගේ ධාරණ අගයට ආසන්න වේ.

ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ

ගනුදෙනුකරුවන්ගේ තැන්පතුවලින් 69% කට වැඩි ප්‍රමාණයක් ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි හෝ වසරකට අඩු එකඟ වූ පරිණත දිනයක් සහිත ඒවා වේ. වසරකට වඩා වැඩි එකඟවූ පරිණත දිනයක් සහිත ගනුදෙනුකරුවන්ගේ තැන්පතු කල් නොපිරූ ඉහළ දැමීමකට යටත් වේ. කල් නොපිරූ ඉහළ දැමීමක දී ගනුදෙනුකරුවන්ට ගෙවන මුදල එම දිනට එහි ධාරණ අගයට ද්‍රව්‍යාත්මක වශයෙන් වෙනස් නොවේ. එම නිසා වාර්තා කරන දිනයට ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ඔවුන්ගේ ධාරණ අගයට ආසන්න වේ.

45. ප්‍රවර්තන සහ ප්‍රවර්තන නොවන අතර විශ්ලේෂණය

2018

දෙසැම්බර් 31 වැනි දිනට	මාස 12ක් ඇතුළත රු.	මාස 12 කින් පසු රු.	මුළු එකතුව රු.
මූල්‍ය වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	689,184,136	–	689,184,136
බැංකුව සමඟ ඇති ශේෂයන්	6,496,628,053	–	6,496,628,053
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	115,600	–	115,600
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබියයුතු	53,728,408,245	79,704,395,759	133,432,804,004
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් – ණය සහ අනෙකුත් උපකරණ	24,728,225,353	3,029,288,612	27,757,513,965
අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	4,176,292,999	50,000	4,176,342,999
දේපල හා පිරියත	–	1,275,785,603	1,275,785,603
අස්පෘෂ්‍ය වත්කම්	–	60,787,720	60,787,720
විලම්බිත බදු වත්කම්	467,332,859	–	467,332,859
වෙනත් වත්කම්	1,467,422,023	1,113,402,464	2,580,824,487
මුළු වත්කම්	91,753,609,268	85,183,710,159	176,937,319,427
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	2,834,899,559	8,263,435,262	11,098,334,822
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු	95,579,855,991	45,980,117,566	141,559,973,557
නිකුත් කළ ණය හා වෙනත් ණයටගත් අරමුදල්	–	4,707,852,534	4,707,852,534
චර්තන බදු වගකීම්	473,833,076	–	473,833,076
වෙනත් වගකීම්	1,805,846,878	654,439,552	2,460,286,430
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	158,021,671	1,768,902,705	1,926,924,376
මුළු වගකීම්	100,852,457,176	61,374,747,619	162,227,204,795
කල්පිරීමේ පරතරය	(9,098,847,908)	23,808,962,540	14,710,114,631
සමුච්චිත පරතරය	(9,098,847,908)	14,710,114,631	–

දෙසැම්බර් 31 වැනි දිනට	මාස 12ක් ඇතුළත රු.	මාස 12 කින් පසු රු.	මුළු එකතුව රු.
මූල්‍ය වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	572,294,808	–	572,294,808
බැංකුව සමඟ ඇති ශේෂයන්	6,682,475,675	–	6,682,475,675
වෙළඳාම් කිරීම සඳහා රඳවාගත් මූල්‍ය වත්කම්	–	146,500	146,500
වෙනත් ගනුදෙනුකරුවන්ට ලබාදුන් ණය සහ ලැබීම්	46,319,034,702	81,189,777,692	127,508,812,394
ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය ආයෝජන - ණය සහ අනෙකුත් උපකරණ	27,613,144,980	516,934,932	28,130,079,912
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්		50,000	50,000
කල්පිරෙන තෙක් රඳාසිටින මූල්‍ය වත්කම්	–	2,512,362,500	2,512,362,500
දේපල හා පිරියත	–	1,204,892,835	1,204,892,835
අස්පෘෂ්‍ය වත්කම්	–	37,842,762	37,842,762
විලම්බිත බදු වත්කම්	343,878,698		343,878,698
වෙනත් වත්කම්	2,266,365,532	–	2,266,365,532
මුළු වත්කම්	83,797,194,395	85,462,007,220	169,259,201,616
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	2,682,328,034	8,046,984,101	10,729,312,134
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු	96,528,410,196	43,298,954,601	139,827,364,797
නිකුත් කළ ණය හා වෙනත් ණයටගත් අරමුදල්	–	4,707,852,534	4,707,852,534
චර්තන බදු වගකීම්	365,502,454	–	365,502,454
වෙනත් වගකීම්	2,320,526,316	–	2,320,526,316
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	–	1,695,894,720	1,695,894,720
මුළු වගකීම්	101,896,766,999	57,749,685,956	159,646,452,955
කල්පිරීමේ පරතරය	(18,099,572,604)	27,712,321,264	9,612,748,661
සමුච්චිත පරතරය	(18,099,572,604)	9,612,748,661	–

46. අවදානම් කළමනාකරණය

46.1 හැඳින්වීම

බැංකුවේ කටයුතුවල දී අවදානම යනු ආවේණික කාරණයක් වන නමුත් අවදානම් සීමාවන්ට සහ අනෙකුත් පාලනයන්ට යටත්ව අබණ්ඩව සිදුකරන හඳුනාගැනීම්, මැනීම් සහ අධීක්ෂණයන් තුළින් එය කළමනාකරණය කරනු ලබයි. මෙම අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය බැංකුවේ අබණ්ඩ ලාභදායීත්වයට තීරණාත්මක ලෙස බලපාන අතර බැංකුවෙහි සිටින සෑම පුද්ගලයෙක්ම තමන්ගේ වගකීම් වලට අදාළ අවදානමට නිරාවරණය වීම සම්බන්ධයෙන් වග විය යුතුය. බැංකුව ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් අවදානම්වලට නිරාවරණය වේ.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොළ අවදානම
- මෙහෙයුම් අවදානම

46.1.1 අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සමස්ත වගකීම් තිබෙන්නේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම වගකීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට (ඉඟාඑක) තම බලය පවරා තිබෙන අතර එය බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම සහ අධීක්ෂණය කිරීමේ වගකීම දරයි. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. මෙම කමිටුවේ රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වෙන අතර එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි පරිදි යාවත්කාලීන කරනු ලැබේ.

බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම සඳහාත් ඒ සඳහා යෝග්‍ය අවදානම් සීමාවන් සහ පාලනයන් සකස් කිරීම සඳහාත් ස්ථාපිත කර ඇති සීමාවන්ට අනුව කටයුතු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහාත් බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කර තිබේ. වෙළඳපොළ තත්ත්වයන්, නිෂ්පාදන සහ ලබා දෙන සේවාවන් හි ඇතිවන වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධතීන් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

46.1.2 වත්කම් හා වගකීම් කමිටුව

වත්කම් හා වගකීම් කමිටුවෙහි ප්‍රධානත්වය සාමාන්‍යාධිකාරීවරයා විසින් දරන අතර මූල්‍ය දෙපාර්තමේන්තුවේ සහ ණය දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගෙන් සහ බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරීගෙන් එය සමන්විත වේ. නියාමන අවශ්‍යතා සපුරාගන්නා අතරම බැංකුවේ ද්‍රවශීලතාව යහපත් මට්ටමක තබා ගැනීම පිණිස බැංකුවේ වත්කම් සහ බැරකම් මෙන්ම සමස්ත ද්‍රවශීලතා තත්ත්වය අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම සඳහා කමිටුව නිරන්තරයෙන් රැස්වේ.

46.1.3 අවදානම් මැනීම සහ වාර්තාකරණය

අවදානමේ ස්වාභාවය සහ කර්මාන්තයේ ඇති යහපත් පරිචයන් මත පදනම්ව යෝග්‍ය ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් බැංකුවේ අවදානම් මනිනු ලැබේ. සීමාන්තික අවස්ථා/ඇති විය හැකි ඉතාමත්ම අයහපත් සිද්ධීන් වල බලපෑම හඳුනාගැනීම සඳහා ආතති පරීක්ෂාවක් ද බැංකුව විසින් සිදු කරන අතර එහි ප්‍රතිඵල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට කලින් කල ට වාර්තා කරයි. අවදානම් අධීක්ෂණය සහ පාලනය කිරීම මූලිකව සිදු කරනු ලබනුයේ බැංකුව විසින් ස්ථාපිත කරන ලද ප්‍රතිපත්ති, සීමාවන් සහ පර්යන්තයන් පදනම් කරගෙනය. මෙම සීමාවන්, බැංකුවේ ව්‍යාපාර ක්‍රමෝපායන් සහ වෙළඳපොළ පරිසරය සහ බැංකුව විසින් පිළිගැනීමට අපේක්ෂිත අවදානම් මට්ටම ද (අවදානම් අභිරුචිය) පිළිබිඹු කරයි.

46.1.4 අවදානම ලිහිල් කිරීම

තම සමස්ත අවදානම් කළමනාකරණයේ කොටසක් වශයෙන් තම අවදානම අවම කිරීම සඳහා බැංකුව විවිධ වර්ග වල ඇප ලබා ගනියි. පිළිගතහැකි ඇපවල ස්වභාවය, අවශ්‍ය කරන ආරක්ෂක සීමාව ආදිය පිළිබඳ විස්තර පැහැදිලිව බැංකුවේ ණය ප්‍රතිපත්තිහි අර්ථ දක්වා ඇති අතර ඉන් යම්කිසි අපගමනය වීමක් වන්නේ නම් එයට විශේෂිත අනුමැතියක් අවශ්‍ය වේ. කෙසේවෙතත් අදාළ නැවත ගෙවීමේ ද්විතීයික මූලාශ්‍රයක් ලෙස පමණක් අනුමත කිරීමේ බලධාරීන් ඇප වල උපයෝජ්‍යතාව සලකා බලනු ඇත.

46.2 ණය අවදානම

ණය අවදානම යනු ණය සුරැකුම්පත්වලින් ගනුදෙනුකරුවන්ට/වෙනත් බැංකු සහ ආයෝජන වලට ලබා දෙන බැංකුවේ ණය සහ අත්තිකාරම් වලින් මූලික වශයෙන් පැන නගින, ණය ගත්තෙකු හෝ මූල්‍ය උපකරණයකට ප්‍රතිපාර්ශ්වයක් විසින් තම ගිවිසුම්ගත බැඳීම් වලට අනුව ක්‍රියාකිරීමට අපොහොසත් වීම මත බැංකුවට සිදුවන මූල්‍යමය අලාභය වේ. සෘජු අරමුදල්කරණ නිරාවරණයන් තුළින් ඇතිවන ණය අවදානමට අමතරව ණය අවදානම් සහිත ඇප ආදී වක්‍ර බැරකම්වලට ද බැංකුව නිරාවරණය වේ. දැඩි ණය අවදානම් කළමනාකරණයක් සහතික කිරීම සඳහා බැංකුව (තනි බැඳීම් ණය පැහැර හැරීමේ අවදානම්, රටේ සහ ආංශික සංකේන්ද්‍රණ අවදානම් වැනි) ණය අවදානම් නිරාවරණයේ සියලු අංග සලකා බැලීම සහ ශක්තිමත් කිරීම සිදු කරයි.

46.2.1 හානිකරණ තක්සේරුකිරීම (2018 ජනවාරි 1 සිට අදාළ ප්‍රතිපත්තිය)

46.2.1.1 බැංකුවේ අභ්‍යන්තර ශ්‍රේණිගතකරණ ක්‍රියාවලිය

භාණ්ඩාගාරය, වෙළෙඳාම සහ අන්තර් බැංකු සම්බන්ධතා

බැංකුවේ භාණ්ඩාගාරය, වෙළෙඳාම සහ අන්තර් බැංකු සම්බන්ධතා සහ ප්‍රතිපාර්ශ්වයන් මූල්‍ය සේවා ආයතන, බැංකු, ප්‍රාථමික වෙළෙන්දන්, හුවමාරු සහ නිෂ්කාශනාගාරවලින් සමන්විත වේ. මෙවැනි සම්බන්ධතා සඳහා, බැංකුවේ භාණ්ඩාගාර ඒකකය මූල්‍ය තොරතුරු වැනි පොදුවේ ලබාගතහැකි තොරතුරු විශ්ලේෂණය කරයි.

ණය පිළිබඳ අංශමය වර්ගීකරණය

වාර්තාකරණ අරමුණ සඳහා බැංකුවේ ණය වර්ගීකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ අංශමය වර්ගීකරණය පරිදි ඇතුළත් කරනු ලැබ ඇත. මුළු අංශමය වර්ගීකරණයෙන්, මෙම වාර්තාව කළඹවල ප්‍රමාණයට අනුව ප්‍රධාන ඉහළ අංශයන් තුළ ඒවා වර්ගීකරණය කර ඇත.

2018, බැංකුවේ අවසාන පොත්වලට අනුව, මෙම වර්ගීකරණය යටතේ ඉහළම අංශය නිවාස ණය වන අතර ඉන්පසුව ප්‍රතිමූල්‍ය/පොළී සහන ණය, වාණිජ, කෘෂිකර්මය, කර්මාන්ත, උකස්කර සහ වෙනත් (ඉදිකිරීම වැනි) ණය පැවතිණ

අංශ අනුව කළඹ

(1) නිවාස ණය: නිවාස ණය 2018 දෙසැම්බර් 31 දිනට 27.45%ක් සමඟ ඉහළම අංශමය ණය සංකේන්ද්‍රණය පවත්වා ගනී. නිවාස ණය කාලීන ණය – නිවාස සහ සෘජු තිළිණ ණයවලින් සමන්විතය.

(2) ප්‍රතිමූල්‍ය/පොළී සහන: ප්‍රතිමූල්‍ය/පොළී සහන ණය 2 වැනි ඉහළම ණය සංකේන්ද්‍රණය සතුවේ. මෙම ණය යෝජනා ක්‍රම රජයේ ආයතන විසින් ලබාදෙන ප්‍රතිමූල්‍ය සහ පොළී සහන පහසුකම් තුළින් ක්‍රියාත්මක කරයි.

(3) කාලීන ණය වාණිජ: ව්‍යාපාර අරමුණු: සිල්ලර, තොග සහ වෙනත් සඳහා ලබාදෙන ණය.

(4) කාලීන ණය කෘෂිකර්මයථ කෘෂිකර්මය, කෘෂි උපකරණ, වගාව, ධීවර, පශු සම්පත් සහ ඔඩපන ණය මෙම වර්ගය යටතට අයත්ය.

(5) කාලීන ණය – කර්මාන්තථ ප්‍රවාහනය, සංචාරක කර්මාන්තයට ණය සහ සේවා ක්ෂේත්‍ර වෙත ණය මෙම වර්ගය යටතට අයත්ය.

(6) කාලීන ණය – වෙනත්: අනෙකුත් සියලුම අංශ (පාරිභෝගික ණය, විශ්‍රාම ණය සහ අනෙකුත් විශේෂිත ණය යෝජනා ක්‍රමවලින් සමන්විත).

(7) ලියඉසුර – කාන්තා ව්‍යවසායිකාවන් සඳහා පොළී රහිත ණය යෝජනා ක්‍රමය.

ආයතනික ණය (සේවා, නිෂ්පාදන සහ කර්මාන්ත ණය)

ආයතනික ණය සඳහා, බැංකුවේ විශේෂ ණය සේවකයින් විසින් ණයකරුවන් ඇගයීමට ලක් කරයි. ණය අවදානම් තක්සේරුව ගනුදෙනුකරුගේ හැසිරීම මත පදනම් වන අතර ණයවල තත්ත්වය පසුගිය හිඟ තත්ත්වයන් මත පදනම් වේ. එමෙන්ම, ගනුදෙනුකරුවෙක් පිළිබඳ අවදානම ඇගයීමේදී බැංකුව පහත සඳහන් අංග සලකා ලබයි

- සේවාදායකයා විසින් පිළියෙල කරන පුරෝකථන සහ අයවැය සමඟ ඓතිහාසික මූල්‍ය තොරතුරු. මෙම මූල්‍ය තොරතුරුවලට උපලබ්ධි සහ අපේක්ෂිත ප්‍රතිඵල, නුඹුන්වත් අනුපාතය, ද්‍රවශීලතා අනුපාත සහ සේවාදායකයාගේ මූල්‍ය කාර්යසාධනය මැනීම සඳහා යම් වෙනත් අදාළ අනුපාත ඇතුළත්ය. මෙවැනි දර්ශකවලින් කිහිපයක් සේවාදායකයා සමඟ ගිවිසුම් තුළ ග්‍රහනය කර ගන්නා අතර එමනිසාම වඩා ඉහළ අවධානයකින් තක්සේරු කෙරේ.
- සේවාදායකයා පිළිබඳව බාහිර පාර්ශ්වයන්ගෙන් පොදුවේ ලබාගතහැකි තොරතුරු ග්‍රහනය කර ගන්නා අතර එයට ණය තොරතුරු කාර්යාංශය විසින් ලබාදෙන තොරතුරු ඇතුළත් වේ.මෙයට ශ්‍රේණිගතකරණ ආයතන විසින් නිකුත් කරනු ලබන බාහිර ශ්‍රේණිගතකරණ ශ්‍රේනි, ස්වාධීන විශ්ලේෂණ වාර්තා, සේවාදායකයා කර්මාන්තය පිළිබඳ අදාළ තොරතුරු ඇතුළත් සහ ණය විශ්ලේෂණයට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අදාළවන පුවත් නිවේදන සහ ලිපි ඇතුළත් වේ.
- සමාගමේ කාර්යසාධනය සඳහා අදාළ සේවාදායකයාගේ කළමනාකරණය පිළිබඳ වෙනත් විෂයමූලික සහ සහය තොරතුරු.

පරිභෝජන ණයදීම සහ පාරිභෝගික ණය

පරිභෝජන ණයදීම නිවාස ණය, පරිභෝජන ණය සහ පුද්ගල ණයවලින් සමන්විත වේ. පාරිභෝගික උකස්කර සමඟ මෙවැනි ණය සහ සමහර අඩු සංකීරණ කුඩා ව්‍යාපාර ණය මූලිකවම පසුගිය හිඟ මගින් ශ්‍රේණිගත කෙරේ. (ආයතන සහ පාරිභෝගික ණය ලකුණු ආදර්ශ): ණය තොරතුරු කාර්යාංශයේ වාර්තා) ආදර්ශවලට අනෙකුත් ප්‍රධාන යෙදවුම් වන්නේ:

- පරිභෝජන ණය නිෂ්පාදන: සීමා සහ එහි වෙනස්වීම භාවිතය, ආර්ථික කොන්දේසි, නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ වාර්තා මත පදනම් වී පුද්ගල ආදායම/වැටුප් මට්ටම්වල වෙනස්වීම්, ආපසු ගෙවීමේ මූලාශ්‍ර, පුද්ගල ණයගැති බව සහ අපේක්ෂිත පොළි නැවත මිලකරණය.
- පාරිභෝගික උකස්කර, දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, විරැකියා අනුපාත, ජංගම ගිණුම්වල වාර්තා මත පදනම් වී පුද්ගල ආදායම/වැටුප් මට්ටම්වල වෙනස්වීම්, පුද්ගල ණයගැති බව සහ අපේක්ෂිත පොළි නැවත මිලකරණය.

බැංකුවේ පැහැර හැරීම් තත්ත්වය

පැහැර හැරීම් තත්ත්වය	විස්තරය
අදියර 1	
විධිමත්	ක්‍රියාත්මක
දින 1 - 30	ක්‍රියාත්මක
අදියර 2	
දින 31 - 60	ක්‍රියාත්මකවීම යටතේ
දින 61 - 90	ක්‍රියාත්මකවීම යටතේ
අදියර 3	
දින 90ට ඉහළ	ක්‍රියාත්මක නොවන

46.2.1.2 පැහැර හැරීමේදී නිරාවරණය

පැහැර හැරීමට සහ වියහැකි පෙර ගෙවීම් කරා ප්‍රවේශ වෙමින් නිරාවරණය වැඩි කිරීම සඳහා සේවාදායකයාගේ හැකියාව ආමන්ත්‍රණය කරමින් හානිකරණ ගණනය කිරීමට යටත් මූල්‍ය උපකරණවල දළ ධාරණ අගය පැහැර හැරීමේදී නිරාවරණය (EAD) තුළින් නියෝජනය කරයි.

අදියර 1 ණයක් සඳහා පැහැර හැරීමේදී නිරාවරණය ගණනය කිරීම සඳහා, මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා මාස 12 තුළ වියහැකි පැහැරහැරීමේ සිදුවීම් බැංකුව තක්සේරු කරයි. කෙසේවෙතත්, අදියර 1 ණයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයේ සිට මාස 12 තුළ පැහැර හැරීම අපේක්ෂා කරන්නේනම් සහ ආරක්ෂා කරගැනීමට සහ පසුව නැවත පැහැර හැරීමට ලක්වන්නේනම්, එවිට සම්බන්ධිත පැහැර හැරීමේ සිදුවීම් සියල්ලම සැලකිල්ලට ගනී. අදියර 2 සහ අදියර 3 සඳහා, පැහැර හැරීමේදී නිරාවරණය උපකරණයේ ජීවකාලය තුළ සිදුවීම් සඳහා සලකා බලනු ලබයි.

බැංකුව විවිධ ක්‍රියාදාමවලට අනුරූපවෙමින් කාලීනව විවිධ ස්ථානවලදී වියහැකි නිරාවරණ ප්‍රතිඵල පරාශය ආදර්ශ කිරීම මගින් පැහැර හැරීමේදී නිරාවරණය තීරණය කරයි. බැංකුවේ ආදර්ශවල ප්‍රතිඵල මත පදනම් වී එක් එක් ආර්ථික ක්‍රියාදාමයට් බඤඹ 9 ඹෘ පවරනු ලබයි.

46.2.1.3 අලාභ දෙන පැහැර හැරීම (LGD)

ආයතනික සහ ආයෝජන බැංකුකරණ මූල්‍ය උපකරණ සඳහා, අලාභ දෙන පැහැර හැරීමේ වටිනාකම් ණය කළමනාකරුවන් විසින් අවම වශයෙන් සෑම මාස තුනකට වරක් තක්සේරු කරන අතර බැංකුවේ ණය දෙපාර්තමේන්තුවේ ණය ප්‍රධානී විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබයි. ණය අවදානම් තක්සේරුව නිශ්චිත අලාභ දෙන පැහැර හැරීමේ අනුපාතයක් තුළ ඇතිවන ප්‍රමිතිගත අලාභ දෙන පැහැර හැරීම තක්සේරු කිරීමේ රාමුවක් මත පදනම් වේ. මෙවැනි අලාභ දෙන පැහැර හැරීමේ අනුපාත දරා සිටින ඇපවලින් අයකරගැනීමට හෝ උපලබ්ධිකර ගැනීමට අපේක්ෂිත ප්‍රමාණයට සාපේක්ෂව අපේක්ෂිත පැහැර හැරීමේදී නිරාවරණය සැලකිල්ලට ගනී.

අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ ඇස්තමේන්තුවට අදාළ වන ප්‍රධාන ලක්ෂණ මත පදනම් වී බැංකුව එහි පාරිභෝගික ණය නිෂ්පාදන වඩා කුඩා සමජාතීය කළඹවලට අංශ කරයි. යොදා ගනු ලබන දත්ත ඓතිහාසිකව රැස්කරගත් දත්ත මත පදනම් වන අතර, පුළුල් ගනුදෙනු ලක්ෂණ පරාශයකට (උදා- නිෂ්පාදන වර්ගය, පුළුල් ඇප වර්ග පරාසය) මෙන්ම ණයකරුගේ ලක්ෂණවලට සම්බන්ධ වේ.

46.2.1.4 ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීම

බැංකුව අපේක්ෂිත ණය අලාභවලට යටත් සියලුම වත්කම් අඛණ්ඩව නියාමනය කරයි. උපකරණයක් හෝ උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය අලාභවලට හෝ ජීවකාල අපේක්ෂිත ණය අලාභවලට යටත්වන්නේද යන්න තීරණය කිරීම පිණිස, මූලික හඳුනා ගැනීමේ සිට ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් තිබේද යන්න බැංකුව තක්සේරු කරයි. ගනුදෙනුකරු පසුගිය හිඟ දින 30 ඉක්මවන අවස්ථාවේදී ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීම බැංකුව තිරණය කරයි.

එමෙන්ම බැංකුව ගණුදෙනුකරුවෙක්/පහසුකමක් මුර ලැයිස්තුවට විතැන්කිරීම හෝ ගිණුම සහන බවට පත්වීම වැනි වත්කමක් සඳහා ණය අවදානම තුළ සැලකියයුතු වැඩිවීමක් ඇතිකිරීම සඳහා ද්විතියික ගුණාත්මක ක්‍රමයක් බැංකුව යොදා ගනී.

46.2.1.5 සාමූහික පදනමක් මත අගයකළ මූල්‍ය වත්කම් කාණ්ඩ කිරීම

බැංකුව තනි තනි පදනමක් මත අපේක්ෂිත ණය අලාභ ගණනය කරන වත්කම් පන්තිවලට මුළු නිරාවරණයෙන් රු.මි. 2 තනි තනිව සැලකියයුතු සිමාවට ඉහළ සියලුම ගනුදෙනුකරුවන් ඇතුළත් වේ.

බැංකුව සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය අලාභ ගණනය කරන වත්කම් පන්තිවලට ඇතුළත් වන්නේ

- රු.මි. 2 තනි තනිව සැලකියයුතු සිමාවට පහළ සියලුම ගනුදෙනුකරුවන්

බැංකුව පහත විස්තර කරන පරිදි මෙම නිරාවරණ වඩා කුඩා සමජාතීය කළඹවලට කාණ්ඩ කරයි:

- නිෂ්පාදන වර්ගය
- ඇප වර්ගය
- ව්‍යාපාරයේ ස්වභාවය
- භාවිතාකරණ/වක්‍රිය ප්‍රමාණය
- ආදායම/නැවත ගෙවීමේ මූලාශ්‍රය
- ණය මුදල
- LTV
- LTI
- ආපසුගෙවීමේ ඉතිහාසය

46.2.1.6 භූගෝලීය කලාප අනුව විවිධ ආර්ථික ක්‍රියාදාම යටතේ අපේක්ෂිත ණය අලාභ (ECL) ආදර්ශයට යෙදවුම් පිළිබඳ විශ්ලේෂණය

අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු කිරීමේ ප්‍රවේශය පිළිබඳ දළ විශ්ලේෂණයක් සටහන 3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය සහ සටහන 3.1.1.7.1 අපේක්ෂිත ණය අලාභ මූලධර්ම පිළිබඳ දළ විශ්ලේෂණය තුළ දක්වා ඇත. සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාව සහතික කිරීමට, බැංකුව තෙවැනි පාර්ශ්ව මූලාශ්‍රවලින් ඌබ* භාවිතාකළ දත්තලබාගන්නා අතර එහි අවදානම් දෙපාර්තමේන්තුව තුළ ආර්ථික විද්‍යාඥයින් කණ්ඩායමක් විවිධ ක්‍රියාදාමවලට ආරෝපනය කළහැකි බර තීරණය කිරීම ඇතුළුව අපේක්ෂිත ණය අලාභ ආදර්ශ සඳහා යෙදවුම්වල නිරවද්‍යතාව සත්‍යාපනය කරයි. අපේක්ෂිත අලාභවල ප්‍රධාන ධාවකයින් සහ බැංකුවේ මූලික අවස්ථා ඇස්තමේන්තුව, මූලික අවස්ථාව මත පදනම් අපේක්ෂිත ණය අලාභ සමඟ 2017 සහ 2018 දෙසැම්බර් 31 දිනට විවිධ ආර්ථික ක්‍රියාදාම භාවිතයේ බලපෑම සඳහා භාවිතාකළ උපකල්පන පහත වගුවේ දක්වා ඇත.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා එක් එක් ආර්ථික ක්‍රියාදාමය තුළ භාවිතා කළ ප්‍රධාන ඉදිරිය දකින ආර්ථික විචල්‍යතා/උපකල්පනවල වටිනාකම පහත වගුවෙන් පෙන්නුම් කරයි. "පසුකාලීන වර්ෂ" සඳහා සංඛ්‍යාවලින් දීර්ඝ කාලීන සාමාන්‍යය නියෝජනය කරන අතර එබැවින් එක් එක් ක්‍රියාදාමය සඳහා සමාන වේ.

ප්‍රධාන ධාවක	ECL ක්‍රියාදාමය	පවරන ලද සම්භාවිතාව	2019	2020	2021	2022	2023	පසුකාලීන වර්ෂ
දළ දේශීය නිෂ්පාදන (GDP) වර්ධනය %								
	මූලික අවස්ථාව	30	3.80	3.80	3.80	3.80	3.80	3.80
	හොඳම අවස්ථාව	30	3.92	4.03	4.15	4.27	4.32	4.32
	නරකම අවස්ථාව	40	3.62	3.58	3.54	3.50	3.40	3.40
උද්ධමන අනුපාත %								
	මූලික අවස්ථාව	30	4.30	4.30	4.30	4.30	4.30	4.3
	හොඳම අවස්ථාව	30	4.09	4.04	4.00	3.95	3.83	3.83
	නරකම අවස්ථාව	40	4.44	4.57	4.71	4.84	4.90	4.90
පොළී අනුපාතය %								
	මූලික අවස්ථාව	30	11.94	11.94	11.94	11.94	11.94	11.94
	හොඳම අවස්ථාව	30	11.18	11.00	10.81	10.63	10.23	10.23
	නරකම අවස්ථාව	40	12.48	12.98	13.49	14.02	14.25	14.25
නුවමාරු අනුපාතය (ඇ.ඒ.ඩො. සිට රු. දක්වා %)								
